In **Inland Revenue (Amendment) Bill [S.C.S.D. 64-71/2022 at page 27]** it was held that the notion of equitable taxation has no place in the analysis Court must make in determining whether the tax is manifestly unreasonable or discriminatory for purposes of Article 12(1) of the Constitution.

Moreover, the State must have the freedom to adopt as well as amend or change policy depending on the circumstances provided that the policy or the transformation of policy into legislative framework is constitutional. It is best left to the Government to decide on such matters which affects the interests of the economic progress and fiscal management of the country. Merely because the Act did away with the previous policy of providing for criminal process to recover outstanding tax, it does not *ipso facto* make a subsequent reversion to that policy unconstitutional.

***Clause 31(4) of the Bill***

Clause 31 of the Bill seeks to amend Section 163 of the Act by including new sections 163(4A) to (4H). These provisions are brought under Chapter XVI of the Act titled *Recovery of Tax* which spells out different measures that can be taken to recover tax due.

Section 160 of the Act states that the Commissioner-General may proceed with *any remedy* under Chapter XVI once the *taxpayer is in default pursuant to Section 152*.

Section 152(1) of the Act allows the Commissioner-General to send a notice to a taxpayer demanding payment when a tax is not paid by the date on which it became due and payable. Section 152(3) states that a *taxpayer shall be in default, twenty-one days after service of notice* in respect of any amounts remaining unpaid as of that date.

Thus, the provisions in Chapter XVI of the Act, and in particular Section 163 may be invoked only 21 days after the service of notice in terms of Section 152.

Section 163(1) of the Act states that tax that is due and payable shall be a debt to the Government and shall be payable to the Commissioner-General. The Bill does not seek to amend this provision.

Section 163(2), (3) and (4) of the Act provides for institution of civil proceedings to recover the debt and incidental matters. The only amendment the Bill seeks to make to these provisions is to limit its application to a period prior to April 1, 2026.

Hence, the Act continues to provide for the recovery by civil proceedings of any tax in default which will, if and when the Bill is enacted, apply only for the period prior to April 1, 2026.

Clause 31(4) of the Bill introduces new provisions to recover tax in default after April 1, 2026 by permitting institution of proceedings (which the State refers to as *recovery proceedings* whereas the Petitioners refer to as *criminal proceedings*). It provides for a certificate to be tendered to the Magistrate where a person *fails to pay tax when it is due*. Even this procedure may be resorted only where a *taxpayer will be in default, which is twenty-one days after service of notice* contemplated by Section 152.

The constitutionality of this provision must be examined in the context of the existing statutory framework for administrative review or appeals to the Tax Appeals Commission (TAC).

Section 139 of the Act allows a taxpayer to request the Commissioner-General to review an assessment or other decision. Section 140 allows a person aggrieved by a decision of administrative review under Section 139 to appeal to the TAC.

Section 142 of the Act states that notwithstanding a request for administrative review or appeal to the TAC, tax payable under an assessment shall remain due and payable, and recovered despite the request for review or appeal, unless the Commissioner-General grants an extension of time under Section 151.

The statutory framework explained above was part of the bill which was challenged for its constitutionality in **Inland Revenue Bill** [Decisions of the Supreme Court on Parliamentary Bills (2016-2017), Vol. XIII, 105]. However, the provisions permitted for recovery proceedings to be instituted notwithstanding a request for administrative review or appeal to the TAC, was not impugned. This is understandable as there is nothing unconstitutional in permitting it to be done as there were no penal consequences.

However, it is different where statutory provision is made permitting institution of proceedings (which the State refers to as *recovery proceedings* whereas the Petitioners refer to as *criminal proceedings*) which can result in the taxpayer being sentenced to imprisonment notwithstanding the pending of a request for administrative review or appeal to the TAC. That is arbitrary and irrational and therefore contrary to Article 12(1) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.

The inconsistency will cease if the following amendments are made:

1. Clause 31(4) of the Bill to be amended by adding the following proviso to the proposed Section 163(4A)(a) of the Act:

   *"Provided that no such certificate shall be submitted where a taxpayer has requested for an administrative review of the tax payable pursuant to Section 139 or appealed to the Tax Appeals Commission pursuant to Section 140(1) of the Act and such application is pending."*

2. Clause 31(4) of the Bill to be amended by the deletion of the words "by reasons only of the fact that an appeal is pending against the assessment in respect of which the tax in default is charged" in the proposed Section 163(4C) of the Act.

***Clause 34 of the Bill***

Clause 34 introduces a new Chapter XVIIA titled *Prosecution of Offences* and contains a new Section 185A which stipulates that if compliance is not forthcoming in terms of Section 86, 93, 102, 123 and 126 of the Act, the Commissioner General shall serve a notice on such person informing of the institution of legal proceedings against such person within 30 days of serving the notice.

The Petitioners submit that by these provisions' "minor" failures of a taxpayer such as failure to furnish a return etc. are sought to be criminalized which is obnoxious and disproportionate and inconsistent with Articles 3, 4(c), 4(d), 12 and 14(1)(g) of the Constitution. We do not see any inconsistency. Criminal proceedings can be instituted only subsequent to a notice being issued and time granted for compliance.

***Summary of the Determination***

The Bill can be passed by a simple majority of Parliament EXCEPT Clause 31(4) of the Bill. Clause 31(4) of the Bill is arbitrary and irrational and therefore contrary to Article 12(1) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.

This inconsistency will cease if the following amendments are made:

1. By adding the following proviso to the proposed Section 163(4A)(a) of the Act: "Provided that no such certificate shall be submitted where a taxpayer has requested for an administrative review of the tax payable pursuant to Section 139 or appealed to the Tax Appeals Commission pursuant to Section 140(1) of the Act and such application is pending."
2. By the deletion of the words "by reasons only of the fact that an appeal is pending against the assessment in respect of which the tax in default is charged" in the proposed Section 163(4C) of the Act.

***Interpretation of the Act subsequent to Proposed Changes***

In order to add clarity to the proposed amendments, we set out below the legal position after these amendments are made:

1. Where a taxpayer has made a self-assessment in terms of which he admits his tax liability, this admitted tax liability must be paid by him in accordance with the provisions of the Act. The failure to do so allows the Commissioner-General to recover the tax in default through any measures specified in the Act including the amendments sought to be made by the Bill.
2. Where a taxpayer has made a self-assessment in terms of which he admits his tax liability, but the return of income is rejected and an assessment is made by the Commissioner-General imposing a higher tax liability, the taxpayer must pay the tax liability declared in his self-assessment, notwithstanding that he has requested for administrative review or appealed to the TAC against the assessment, and such review or appeal is pending. The

failure to do so allows the Commissioner-General to recover the tax in default through any measures specified in the Act including the amendments sought to be made by the Bill.

3. Where a taxpayer has requested for administrative review or appealed to the TAC against an assessment, and such review or appeal is pending, the tax payable under such assessment shall not be sought to be recovered by submitting a certificate to the relevant Magistrates Court as envisaged by the Bill.

4. Where a Stated Case is pending before the Court of Appeal and where the Court, acting in terms of Section 11A(7) of the Tax Appeals Commission Act No. 23 of 2011, makes an interim determination as regards the amount of tax recoverable by the Commissioner General in respect of the amount of tax in dispute, such amount of tax may be recovered through any of the procedures for recovery of tax specified in Chapter XVI of the Act including the new procedures sought to be introduced by the Bill including by filing a certificate before the relevant Magistrates Court.

We place on record our deep appreciation of the assistance given by all learned President's Counsel and Counsel for the Petitioners and the learned DSG.

Janak De Silva
**Judge of the Supreme Court**

Arjuna Obeyesekere
**Judge of the Supreme Court**

Sampath K. B. Wijeratne
**Judge of the Supreme Court**

## II

## මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

நிதிசார் கொடுக்கல்வாங்கல்களை அறிக்கையிடல் (திருத்தம்) சட்டமூலம் மற்றும் பயங்கரவாதி நிதியளிப்பை ஒடுக்குதல் மீதான சமவாய (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

FINANCIAL TRANSACTIONS REPORTING (AMENDMENT) BILL AND CONVENTION ON THE SUPPRESSION OF TERRORIST FINANCING (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද **"මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් 2026 අප්‍රේල් 22 දින පෙත්සම් තුනක පිටපත් ද, 2026 අප්‍රේල් 24 දින එක් පෙත්සමක පිටපතක් සහ **"ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් 2026 අප්‍රේල් 22 දින පෙත්සම් දෙකක පිටපත් ද, 2026 අප්‍රේල් 24 දින එක් පෙත්සමක පිටපතක් ද මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## III

## මැතිවරණ සම්බන්ධයෙන් වන නීති (පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නීති හැර) සමාලෝචනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහාත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් පත් කිරීම

தேர்தல்கள் தொடர்பான சட்டங்களை (மாகாண சபை தேர்தல்களுடன் தொடர்பான சட்டங்கள் நீங்கலாக) மீளாய்வு செய்து பாராளுமன்றத்துக்கு அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்

SELECT COMMITTEE TO REVIEW THE LAWS DEALING WITH ELECTIONS (EXCLUDING LAWS DEALING WITH PROVINCIAL COUNCIL ELECTIONS) AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD: APPOINTMENT OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"මැතිවරණ සම්බන්ධයෙන් වන නීති (පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නීති හැර) සමාලෝචනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහාත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ" සේවය කිරීම සඳහා ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් මවිසින් පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

## විගණකාධිපතිවරයාගේ වාර්තාව

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XXIII කොටස;

[ගරු ගරු කථානායකතුමා]

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XXVII කොටස;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXX කොටස සහ නවවැනි කාණ්ඩයේ XLVII කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LV කොටස සහ නවවැනි කාණ්ඩයේ XXX කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLVII හා XLVIII කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXXIII, XXXIV හා XXXV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XLII කොටස සහ සිව්වැනි කාණ්ඩයේ XXV කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2481/02 of 23rd March, 2026;

(ii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2482/08 of 31st March, 2026;

(iii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985

and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2482/12 of 02nd April, 2026; and

(iv) Annual Economic Review of the Central Bank of Sri Lanka for the year 2025.

I move that these Regulations and Economic Review be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I present the Report on the submission of observations and steps taken in terms of the Standing Order No. 119(4) of Parliament with regard to the matters mentioned on the Delimitation Commission in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා කිතුල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020 සහ 2021 වර්ෂ සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, (351 අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වගන්තිය සමඟ කියවිය යුතු 52 වගන්තිය යටතේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 23 දින සාදන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ නියෝග. (2026 පෙබරවාරි 13 දිනැති අංක 2475/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද);

(ii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ නියම. (2026 ජනවාරි 16 දිනැති අංක 2471/52, අංක 2471/53, අංක 2471/54 සහ අංක 2471/55 දරන අති විශේෂ ගැසට් පත්‍රවල පළ කරන ලද);

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

(iii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ නියෝග. (2026 ජනවාරි 05 දිනැති අංක 2470/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(iv) බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, මේ කරුණු හතරේ අඩංගු මූලිකම දේවල් ටික කියන්න.

පළමුවැනි එකේ තිබෙන්නේ කොළඹ වරාය නගරය ගැන. ඒක එච්චර සංකීර්ණ දෙයක් නොවෙයි. සාමාන්‍යයෙන් රට ගිහිල්ලා ආවාම එක්වරයි Duty Free එකට යන්න පුළුවන්, ඩොලර් 2,000ක් වෙනකම් වියදම් කරන්න. නමුත් මේ අනුව එක වතාවක් නොවෙයි, කිහිපවාරයක් Duty Free එකට අවුරුද්දක් ඇතුළත යන්න පුළුවන් ඩොලර් 2,000ක් දක්වා වියදම් කරන්න.

දෙවැනි එකේ තිබෙන්නේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට කරන ලද යම් යම් වෙනස්කම්. ඒවා සරල වෙනස්කම්. හැබැයි, ඒ එක වෙනස්කමක් ගැන අපි දීර්ඝව සාකච්ඡා කළා. ඒ කියන්නේ, වරාය නගරය ඇතුළේ කම්කරු නීතිය, TEWA එක බලපවත්වන්නේ නැහැ කියලා කලින් තිබුණා. ඒ ගැන තීරණයක් ගන්න අධිකරණයට ගියාම අධිකරණයෙන් කියලා තිබුණා, සම්පූර්ණයෙන්ම පනත අයින් කරන්න බැහැ, පනතේ කොටස් අයින් කරන්න ඕනෑ කියලා. ඒ අනුව පනතේ 2, 11, 12 කියන කොටස් තමයි අයින් කළේ. ඒවා අයින් කරන්න කියලා උසාවියෙන් කියලා තිබුණු නිසා රජය විසින් තමයි අයින් කළේ. මා ඒ එක කාරණයක් පෙන්වා දෙන්න ඕනෑ. ඒක තමයි, යම් ආයතනයකින් සේවකයෙකුගේ සේවය අවසන් කරනවා නම් ඒ සඳහා කම්කරු කොමසාරිස්ගේ නියෝගයක් හා නිර්දේශයක් මෙච්චර කල් අවශ්‍ය වෙලා තිබුණා.

දැන් මේ පනත යටතේ එහෙම නියෝගයක් අවශ්‍ය වන්නේ නැහැ. මීට පස්සේ, වරාය නගරයේ සේවකයෙකුගේ සේවාව අවසන් කරනවා නම්, ඒක ඒ අදාළ ආයතනයට කරන්න පුළුවන්. ඒකට කම්කරු කොමසාරිස්ගේ නිර්දේශයක් අවශ්‍ය නැහැ. මේක යම්කිසි විධියකට ආන්දෝලනාත්මක කාරණාවක්. අපි ඒ ගැන කමිටුවේදී සාකච්ඡා කළා. ඒ කාරණය මෙතැනදී විවාදයට ගන්න පුළුවන්.

තුන්වැනි එක තමයි මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග. ඒක ලොකු දෙයක් නොවෙයි. රුපියල් ලක්ෂ 10ක් ගෙවලා තමන්ට කැමැති ඉදිරි නොම්මරයක් වාහනයට ලබාගන්න පුළුවන්, නොම්මර 10,000ක් - 9,999ක් - වෙනකල්.

හතරවැනි එක තමයි, බේරාගැනීම්, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත. ඒක වැදගත්ම දෙයක්. මේ ගැන කාලයක් තිස්සේ - අවුරුදු 2ක්, 3ක් තිස්සේ - සාකච්ඡා වෙලා තිබෙනවා. ඒකේ කොටසක් තිබෙනවා. ඒ කොටසට විතරක් මම මෙතැනදී අවධානය යොමු කරන්නම්. ඒ ගැන තමයි දීර්ඝ වශයෙන් අපේ කමිටුවේ සාකච්ඡා වුණේ. ඒ කියන්නේ, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරවලට මේ දවස්වල *parate* execution ක්‍රියාත්මක කරනවා, ණය ගෙවා ගන්න බැරි වුණාම. දැන් මේ පනත් කෙටුම්පතින් වෙන්නේ, liquidation වෙනුවට restructuring කියන policy එකට වෙනස් වෙන එක. ඒ MSMEsවලට දවස් 60ක කාලයක් තමයි තිබෙන්නේ අධිකරණයට ගිහිල්ලා තමන්ට ණය දීපු කෙනා සමඟ සාකච්ඡාවකට ඇවිල්ලා විසඳුමකට එන්න. ඒ සඳහා දවස් 60ක කාලය මදි. ඒ දවස් 60ක් කියන එක දවස් 90ක් දක්වා දිසා අධිකරණයෙන් හතර වරක් දීර්ඝ කරගන්න හැකියාව දැනට තිබෙනවා. නමුත්, කමිටුව හැටියට අපි දීර්ඝ වශයෙන් මේ ගැන සාකච්ඡා කළා. මම කිව්වා, මම මේ කරුණු පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කරනවා කියලා. ඒ කාලය දින 60 ඉඳලා දින 180ක් වාගේ ප්‍රමාණයකට කල් දමාගන්න පුළුවන් නම් ඇත්ත වශයෙන්ම ඒක සාධනීය වෙනවා.

බොහොම ස්තුතියි.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

වාර්තාව 1

(i) 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(ii) 2023 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 සහ 2024 වර්ෂ සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(v) 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තා

වාර්තාව 2

(i) 2022 සහ 2023 වර්ෂ සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා සහ ගිණුම්;

(ii) 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තා සහ වාර්ෂික ගිණුම්;

(iii) 2022 සහ 2023 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තා සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන;

(iv) 2023 සහ 2024 වර්ෂ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තා හා ගිණුම්; සහ

(v) 2022 සහ 2023 වර්ෂ සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම මෙන්න මේ කාරණයත් අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමියගේ අවධානයට යොමු කරනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ Convocation එක මේ මාසයේ 22වැනි දා පැවැත්වෙනවා. එදිනම, ඒ Convocation එකට යන ළමයින්ටම නීති විද්‍යාලයේ Evidence and Procedure paper එකත් තිබෙනවා. ඒකේ ගැළපීමක් නැහැ. එක්කෝ, ඒ ළමයින්ට මේකෙන් එකක් අත්හරින්න වෙනවා. ඒ නිසා නීති විද්‍යාලයේ විදුහල්පතිතුමා සමඟ කථා කරලා, එම දිනය පොඩ්ඩක් වෙනස් කරලා දෙන්න කියලා මම කාරුණික ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභා වාර්තා පිළිගැන්වීම යටතේ, ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)

Hon. Speaker, I present a petition from Mr. Hilmi Imamdeen of No. 139/2, Rabbadallawatta, Bandawa, Polgahawela.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, කහටගස්දිගිලිය, දිගන්හල්මිල්ලවැව, අංක 29 යන ලිපිනයෙහි පදිංචි සිරිපාලගේ සමන්ත දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, රත්මලාන, බොරුපන පාර, අභය මාවත, අංක 6 ඒ යන ලිපිනයෙහි පදිංචි වජිර පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, මහරච්චිමුල්ල, ඉහළ කලල්පිටිය යන ලිපිනයෙහි පදිංචි කේ.පී. මංජු මහේෂ් කරුණානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 107/2024 - (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### බස්නාහිර පළාත සඳහා පළාත්බද මහාධිකරණයක් පිහිටුවීම: වර්තමාන තත්ත්වය
### மேல் மாகாணத்துக்கான மாகாண மேல் நீதிமன்றத்தை தாபித்தல்: தற்போதைய நிலை
### ESTABLISHMENT OF PROVINCIAL HIGH COURT FOR WESTERN PROVINCE: CURRENT SITUATION

233/2024

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බස්නාහිර පළාතේ සිවිල් අභියාචනා බලය ක්‍රියාත්මක කරනු ලබන පළාත්බද මහාධිකරණයක්, පානදුර අධිකරණ පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට නිර්දේශ කර ඇති බව දන්නේද;

(ii) එම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) පානදුර, 'සිවිල් අභියාචනා මහාධිකරණය' හැකි ඉක්මනින් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i ) மேல் மாகாணத்தில் சிவில் மேன்முறையீட்டு அதிகாரத்தை நடைமுறைப்படுத்துகின்ற மாகாண மேல் நீதிமன்றத்தை பாணந்துறை நீதிமன்ற வளாகத்தில் தாபிப்பதற்கு விதப்புரை வழங்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii ) அந்த விதப்புரையை நடைமுறைப்படுத்து வதற்கு இற்றைவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) பாணந்துறை, 'சிவில் மேன்முறையீட்டு மேல் நீதிமன்றத்தை' இயன்றளவு விரைவில் தாபிப் பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether he is aware of the recommendation made to establish a Provincial High Court exercising civil appellate jurisdiction for the Western Province at the Panadura Courts Complex;

(ii) the steps that have been taken to implement that recommendation; and

(iii) whether action will be taken to establish the "Civil Appellate High Court" in Panadura as soon as possible?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

සිවිල් අභියාචන මහාධිකරණය ස්ථාපිත කිරීමට නිර්දේශ කිරීම ගරු අගවිනිසුරුතුමා සභාපතිත්වය දරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. මෙතෙක් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් එවැනි නිර්දේශයක් සිදු කොට නොමැත. එසේ නමුත් 2021 වර්ෂයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු සමයවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද අධිකරණ කලාප නිර්ණය කිරීමේ කමිටු වාර්තාවේ පානදුර සිවිල් අභියාචන මහාධිකරණයක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මෙම වාර්තාව ඉතා හොඳ වාර්තාවක් වුවත් එය ක්‍රියාත්මක කළ හැක්කේ අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ ගරු අගවිනිසුරුතුමා විසින් එයට එකඟතාව ලබා දී ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුවයි. මෙතෙක් එම වාර්තාවේ සම්පූර්ණ නිර්දේශ ගැසට් කර නොමැති බැවින් එහි නිර්දේශ ක්‍රියාත්මක කළ හැක්කේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මතයි. උක්ත වාර්තාව නිකුත් කිරීමෙන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය, වර්තමාන ලෝක යුද තත්ත්වය සහ නීතිඥ සංගම්වල ඉල්ලීම් සැලකිල්ලට ගත් විට අධිකරණ කලාප නිර්ණය කිරීමේ වාර්තාව වර්තමානයට ගැළපෙන පරිදි සමාලෝචනයට ලක් කළ යුතුව ඇත.

(ii) කෙසේ වුවද, වර්තමාන රජය සියලු පාර්ශ්වයන්ට සෑම විටම අහුම්කන් දී සාධනීය විසඳුම් ලබා දීමට උත්සාහ කරයි. පසුගිය දිනක පානදුර නීතිඥ සංගමයද කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය සමඟ මා හමු වී පානදුර සිවිල් අභියාචන මහාධිකරණයක් ස්ථාපිත කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව වහාම එම යෝජනාව අධිකරණ පරිපාලන විෂය ක්‍රියාත්මක කරන ගරු අගවිනිසුරුතුමාගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක වන අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ අතර, එහි පිටපතක් ඇමුණුම ලෙස ඉදිරිපත් කරමි.

(iii) පානදුර සිවිල් අභියාචනා මහාධිකරණය ස්ථාපිත කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීමට නීතිඥ සංගමය ද යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇත. එම යෝජනා ද අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරමි. අධිකරණ පරිපාලන විෂය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන අතර, අධිකරණ සඳහා යටිතල පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීම පමණක් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් සිදු කරන බවද නැවත වරක් අවධාරණය කරමි.

(ආ) පැන නොනඟී.

ඇමුණුම **සභාගත*** කරමි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මම ගරු අධිකරණ ඇමතිතුමාටත්, ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වනවා, මේ කාරණය පිළිබඳව දක්වන උනන්දුව සම්බන්ධයෙන්. මේක ඉතා වැදගත් දෙයක්. ගරු ඇමතිතුමනි, පානදුර අධිකරණ සංකීර්ණය, ඉතා පැරණි ඉතිහාසයක් තිබෙන, අධිකරණ කටයුතු හා සම්බන්ධ මූලස්ථානයක් බව ඔබතුමාත් දන්නවා. නමුත් කාලයක් තිස්සේ විවිධ හේතු නිසා ඒ තත්ත්වය අහිමිවෙමින් යනවා. මේ තත්ත්වය තුළ මහජනතාවට විශාල අපහසුතාවක් ඇතිවෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, පානදුර අධිකරණ සංකීර්ණයේ විනිශ්චයකාරවරුන් සඳහා ලබා දිය හැකි පානදුර දිසා අධිකරණයේ ඉඳලා මීටර් 200ක් පමණ දුරින් තිබෙන ද සිල්වා මාවතේ පිහිටි පැරණි දිසා විනිසුරු නිල නිවාසය සම්බන්ධව. ඒ නිල නිවාසය තිබුණු ස්ථානයේ අලුතින් නිල නිවාස දෙකක් ඉදිකිරීමට කටයුතු පටන්ගෙන තිබුණත්, ඒවායේ වැඩ මේ වන විට අත්හැරිලා තිබෙනවා. ඒ වැඩ කටයුතු ඉතා ඉක්මනින් අවසන් කළ යුතුයි. ගරු ඇමතිතුමනි,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඔබතුමා මේ ප්‍රශ්නය ගැන දන්නවා. මම මේ සම්බන්ධයෙන් නැවත ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. අපට ගොඩනැඟිලි පහසුකම් අවශ්‍ය නම් එම ස්ථානයේ තිබෙන පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කරලා නැවත ලබා ගන්න පුළුවන්. මෙය අධිකරණ සංකීර්ණය ආසන්නයේම තිබෙන ගොඩනැඟිල්ලක් නිසා නීතිඥවරුන්ටත්, මහජනතාවටත් අපහසුවක් නැතිව පාවිච්චි කරන්න පුළුවන්. ඒ නිසා ඒ පිළිබඳව මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. ඒ වාගේම මම දැනගන්න කැමැතියි, දිසා අධිකරණ නිල නිවාසය තිබුණු ද සිල්වා මාවතේ පිහිටි අඩක් නිම කර ඇති එම ගොඩනැඟිලි ඉදිකිරීමට දැනට ඔබතුමා පියවර ගන්නවාද, ඒ හරහා මේ නව අධිකරණය සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ගළපා ගන්න පුළුවන්කමක් තිබෙන බව පිළිගන්නවාද කියන කාරණය.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඔබතුමා අහපු කාරණය කෙළින්ම මේ ප්‍රශ්නයේ කොටසක් නොවුණත්, මම දන්නා විධියට උත්තර දෙන්නම්. පානදුර නීතිඥ සංගමයෙන් පැමිණ ඒ අලුත්වැඩියා කටයුතු සහ හිස්ව තිබෙන නිල නිවාස කාමරය ගැන සාකච්ඡා කළා. අපි අධිකරණ සේවා කොමිෂන් සභාවටත් දැනුම් දුන්නා, එතැන නව අභියාචනාධිකරණයක් ස්ථාපිත කරන්න පුළුවන් නම් නව නිල මැදිරියක් හදන්න පුළුවන් කියන කාරණය. මේ පානදුර අධිකරණ පරිශ්‍රයේ එක පැත්තක බිල්ඩින් හැදීමේදී water level සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙන බව ඉංජිනේරුවන් මට කියා සිටියා. කොහොම නමුත් ඔබතුමා කියන ප්‍රශ්නයට අවධානය යොමු වෙලායි තිබෙන්නේ. ඉංජිනේරු කණ්ඩායමත් සමඟ කථා කර ඉදිරියේදී ඒ කටයුතු කරන්න බලන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි.

මීට කලින් පානදුර අධිකරණයේ විනිශ්චයකාරවරුන් උදෙසා පානදුර මුහුදු වෙරළට ආසන්නයේ පිහිටා තිබුණා, මහේස්ත්‍රාත් බංගලාවක්. ඒ මහේස්ත්‍රාත් බංගලාව සුනාමිය අවස්ථාවේ කැඩුණා. ඉන් පසුව ඒ ඉඩම හිස්ව තිබෙනවා. ඒක නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සඳහා පවරා ගත් බව කිව්වත්, ඇත්තවශයෙන්ම සමහර ඒවා අයුතු ලෙස පෞද්ගලික අංශයට අවුරුදු 33කට බදු දීලා තිබෙනවා. ඒ බදු කාලය දැන් අවසන් වෙන්නත් ආසන්නයි. ඒ වාගේම එතැන තවත් ඉඩම් හිස්ව තිබෙනවා. පානදුර අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ප්‍රශ්නය වැදගත් එකක්. මොකද, එය ප්‍රධාන අධිකරණ මධ්‍යස්ථානයක්. එම විනිශ්චයකාරතුමන්ලා දැනට කුලී නිවාසවල ඉන්න එක ගැළපෙන දෙයක් නොවෙයි. ඒක ඔබතුමාත් හොඳාකාරවම දන්නවා. ඒ නිසා මීට කලින්, පානදුර මහේස්ත්‍රාත්තුමා වෙනුවෙන් වෙරළ ආසන්නයේ පිහිටා තිබුණු, දැනට සුනාමියෙන් කැඩී ගොස් ඇති බංගලාව සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න. එය නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධනය කරන්නේ නැත්නම් ඔබතුමාගේ අමාත්‍යාංශයට නැවත පවරාගෙන මහාධිකරණ විනිශ්චයකාරතුමාට සහ මහේස්ත්‍රාත්තුමාට ඒ නිල නිවාස පහසුකම් ලබා දීම සඳහා පියවර ගන්නවාද කියලා මම ඔබතුමාගෙන් විමසන්න කැමතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

අනිවාර්යයෙන්ම ඒ පිළිබඳව අවධානය යොමු කරන්නම්.

## "ද ෆිනෑන්ස්" සමාගම: ඈවර කිරීම සහ තැන්පත්කරුවන්ට වන්දි
## 'த பினான்ஸ்' நிறுவனம்: கலைத்தலும் வைப்பாளர்களுக்கு நஷ்டஈடு வழங்கலும்
## "THE FINANCE" COMPANY: LIQUIDATION AND COMPENSATION TO DEPOSITORS

361/2024

**3. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ද ෆිනෑන්ස්' ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඉල්ලා ඇති බව 2021.02.10 දින පාර්ලිමේන්තුවේදී එවකට විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) එම අනුමැතිය ලබා දුන් දිනය සහ සුදුසු ආයෝජකයෙක් කැඳවූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත ආයතනය ඈවර කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව 2021.02.15 දින වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කළ බවත්;

(ii) එය ඉහත ප්‍රකාශයට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙන් අගතියට පත් එක් තැන්පත්කරුවෙකුට රු.500,000 බැගින් ගෙවනු ලබන දිනය කවරේද;

(ii) ඉහත අරමුදලේ මුදල් භාවිතයෙන් තැන්පත්කරුවන්ගේ සම්පූර්ණ මුදල ගෙවිය හැකිද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) 2019 ජනවාරි මස විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය මසකට රුපියල් බිලියනයක් වන ක්‍රමය යටතේ මහ බැංකුව විසින් රුපියල් මිලියන 950කට අධික මුදලක් උපයා ගැනීම සඳහා 'ද ෆිනෑන්ස්' ආයතනයට ඉඩ ලබාදී, පසුව බලපත්‍රය අවලංගු කළ බව දන්නේද;

(v) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද? ;

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'த பினான்ஸ்' நிறுவனத்தை மறுசீரமைப்பதற்கு அமைச்சரவையின் அனுமதி கோரப்பட்டுள்ளதாக 2021.02.10ஆம் திகதி பாராளுமன்றத்தில் அப்போதைய விடயத்துக்குப் பொறுப்பான இராஜாங்க அமைச்சர் அவர்கள் கூற்றொன்றை வெளியிட்டதை அமைச்சர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி அனுமதி வழங்கப்பட்ட திகதி மற்றும் தகுதியான முதலீட்டாளர் ஒருவரை அழைத்த திகதி யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(ஆ) (i) மேற்படி நிறுவனத்தைக் கலைப்பதற்காக இலங்கை மத்திய வங்கி 2021.02.15ஆம் திகதி வர்த்தக மேல் நீதிமன்றத்தில் வழக்கொன்றைத் தாக்கல் செய்துள்ளதாகவும்;

(ii) அது மேற்படி கூற்றுக்கு முரணானது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) இலங்கை வைப்புக் காப்புறுதி மற்றும் திரவத் தன்மை உதவித் திட்டத்திலிருந்து பாதிக்கப்பட்ட வைப்பாளர் ஒருவருக்கு ரூ. 500,000 வீதம் செலுத்தப்படும் திகதி யாது என்பதையும்;

(ii) மேற்படி நிதியத்தின் பணத்தைப் பயன்படுத்தி வைப்பாளர்களின் முழுமையான பணத்தைச் செலுத்த முடியுமா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) 2019 சனவரி மாதம் விசேட நிலையான வைப்பு வசதிகள் விகிதத்தின்கீழ் மாதத்துக்கு ஒரு பில்லியன் ரூபாய் என்ற அடிப்படையில் மத்திய வங்கி 950 மில்லியன் ரூபாவுக்கும் அதிகமான தொகையை ஈட்டுவதற்கு 'த பினான்ஸ்' நிறுவனத்துக்கு இடமளித்து, பின்னர் அதன் உரிமத்தை இரத்துச் செய்ததை அவர் அறிவாரா என்பதையும்;

(v) ஆமெனில், இது தொடர்பாக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he state -

(i) whether he is aware that the then State Minister in charge of the subject stated in Parliament on 10.02.2021 that the approval of the Cabinet had been sought to restructure 'The Finance Company'; and

(ii) the date on which the said approval was granted and the date on which a suitable investor was called for?

(b) Will he admit that -

(i) the CBSL filed a case in the Commercial High Court on 15.02.2021 to liquidate the said institution; and

(ii) it is inconsistent with the above statement?

(c) Will he also state -

(i) the date on which the Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme pays Rs. 500,000 to each aggrieved depositor;

(ii) whether the total amount due to the depositors can be paid using the money from the above fund;

(iii) if not, what the reasons are;

(iv) whether he is aware that in January, 2019, the Central Bank allowed 'The Finance Company' to earn a sum exceeding Rs. 950 million under the Special Standing Deposit Facility Rate system - at a rate of one billion rupees per month -and subsequently, cancelled its licence; and

(v) if so, the action that will be taken with regard to this?

(d) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2021.02.10 දිනැති පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාවේ සඳහන් පරිදි, ගරු මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් "ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී" ආයතනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ බව සඳහන් කළ නමුත්, එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ගරු රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් නැවත ඉවත් කරගෙන ඇත.

(ii) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉවත් කරගෙන ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු තීරණයක් ලබාගෙන නොමැත.

කෙසේ වෙතත් 2019 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී" ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීමට ප්‍රමාණවත් අවස්ථා ගණනාවක් සහ ප්‍රමාණවත් තරම් කාලයක් ලබා දී තිබුණද, එය සාර්ථක කර ගැනීමට "ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී" ආයතනය අපොහොසත් වී ඇත.

2019 වර්ෂයේ ඉඳලා තමයි දීලා තිබෙන්නේ.

(ආ) (i) "ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී" ආයතනය ඈවර කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2021.02.16වෙනි දින කොළඹ වාණිජ මහාධිකරණයේ අංක CHC/19/2021/CO යටතේ පෙත්සමක් ගොනු කර ඇත.

(ii) ඉහත සඳහන් කළ පරිදි "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගෙන නොමැති බැවින් මෙහි සඳහන් කාරණය පැන නොනඟී.

(ඇ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය 2020.05.22වන දින අවලංගු කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" ආයතනයෙහි තැන්පත්කරුවන් සඳහා රක්ෂණ වන්දි ගෙවීම 2020.06.07වන දින සිට ආරම්භ කරන ලදී.

පසුව, 2021.03.16වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ඇති තැන්පත්කරුවකුට ගෙවිය යුතු උපරිම රක්ෂණ වන්දි මුදල රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී. තවදුරටත්, මුදල් මණ්ඩලය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි පවතිනරෙගුලාසි සංශෝධනය කිරීමටත්, "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" හි ඒ වනවිටත් රක්ෂණ වන්දි මුදල් ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ට වැඩි කළ රුපියල් 500,000ක රක්ෂණ වන්දි මුදල ගෙවීමටත් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව වැඩි කරනු ලැබූ රුපියල් 500,000ක රක්ෂණ වන්දි මුදල "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" හි ඒ වනවිටත් රක්ෂණ වන්දි ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ට ගෙවීම 2021.04.12වන දින සිට ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ පනත්, නියෝග, නීති රීති සහ රෙගුලාසිවලට අනුව, "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" හි තැන්පත්කරුවන්ට රක්ෂණ වන්දි ගෙවීම 2024.05.21වන දින දක්වා සිදු කරන ලදී. ඒ අනුව රුපියල් බිලියන 12.96ක් තැන්පත්කරුවන් 36,479කට ගෙවා ඇත.

(ii) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රම අරමුදලේ මුදල් භාවිත කරමින් අදාළ සාමාජික ආයතනවල සුදුසුකම් ඇති තැන්පත්කරුවන්ට සම්පූර්ණ මුදල ලබා දීමේ හැකියාවක් නැති අතර, රුපියල් 1,100,000ක උපරිමයකට යටත්ව රක්ෂණ වන්දි ගෙවීමට පමණක් හැකියාව ඇත.

(iii) 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කර ඇති නියෝග අනුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ඇති තැන්පත්කරුවෙකුට එක් ආයතනයක් සඳහා ගෙවිය යුතු උපරිම රක්ෂණ වන්දි මුදල රුපියල් 1,100,000කි.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය 2010 වර්ෂයේදී ස්ථාපනය කරන ලද රක්ෂණ යෝජනා ක්‍රමයක් වන අතර ප්‍රධාන වශයෙන්ම ඒ සඳහා අරමුදල් සැපයෙනුයේ බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් නියමිත කාලවලදී ගෙවනු ලබන වාරික මුදල්වලින් වේ. මෙම රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූලික අරමුණ වනුයේ, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත්කරුවන් විසින් කරනු ලබන තැන්පතු, රක්ෂණය කිරීම වන අතර යම් හෙයකින් එම ආයතනවල බලපත්‍රය අවලංගු කළහොත් එම ආයතනවල තැන්පත්කරුවන්ට රුපියල් 1,100,000ක උපරිමයක් දක්වා රක්ෂණ වන්දි ගෙවීම සිදු කිරීම වේ. එමෙන්ම බැංකු (විශේෂ විධිවිධාන) පනත සහ ඒ යටතේ නිකුත් කර ඇති නියෝග අනුව, ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සහ විදේශ විනිමය තැන්පතු යන දෙවර්ගයටම අදාළව සුදුසුකම් ඇති තැන්පත්කරුවෙකුට ගෙවිය යුතු උපරිම වන්දි මුදල, රුපියල් 1,200,000ක සීමාවකට යටත් වේ.

(iv) 2019 ජනවාරි මස රුපියල් මිලියන 950කට අධික තැන්පතු රැස් කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණය, "ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී" ආයතනයේ කළමනාකරණය විසින් ගනු ලැබූවක් වන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද තැන්පතු සීමාව තුළ සිදු කර ඇත.

(v) ඉහත (ඇ)(iv)හි සඳහන් කළ පරිදි එම තැන්පතු රැස් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද සීමාව තුළ සිදු කර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்பதற்கு முன்னர், இந்தியாவில் வரலாற்றுச் சாதனை படைத்திருக்கின்ற தமிழக வெற்றிக் கழகத்தின் தலைவரான தளபதி விஜய் அவர்களுக்கு இலங்கையிலுள்ள தமிழ் மக்களுடைய பிரதான கட்சியாக இருக்கின்ற இலங்கை தமிழரசுக் கட்சி சார்பில் என்னுடைய வாழ்த்துக்களை இந்தப் பாராளுமன்றத்தில் தெரிவித்துக் கொள்கின்றேன். தமிழ்நாட்டு மக்களோடும் தமிழ்நாட்டு அரசோடும் ஈழத் தமிழருடைய பிரச்சினைகள் சம்பந்தமாக நாங்கள் பணியாற்றுவதற்குக் காத்துக்கொண்டு இருக்கின்றோம் என்ற செய்தியை சொல்லிக் கொள்கின்றேன்.

ගරු ඇමතිතුමනි, මේ කාරණාව පිළිබඳව මම 2020 සිට මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරන තුන්වැනි අවස්ථාව මේක. ගරු අමාත්‍යතුමනි, මේක 2008 වසරේ ඉඳන් ආපු ප්‍රශ්නයක්. ද ෆිනෑන්ස් ආයතනය හොඳට කරගෙන ගිය ආයතනයක්. දේශපාලන කාරණා නිසා ලලිත් කොතලාවල මහත්මයා එක්ක පැටලිලා, ද ෆිනෑන්ස් ආයතනය බංකොලොත් ආයතනයක් බවට පත් කිරීමේ වැඩසටහන 2008දී තමයි ආරම්භ කළේ. එතකොට 2008 සිට 2019 දක්වා ඇවිල්ලා, 2019.10.23 දිනයේදී මෙම ද ෆිනෑන්ස් ආයතනයේ ලයිසන් එක cancel කරනවා කියලා දැන දැනම, 2019 ජනවාරි මාසයේදී අලුතින් ආයෝජකයන්ට ඇවිල්ලා ආයෝජනය කරන්න කියලා විශාල මුදලක් වෙන් කරලා advertisement එකක් දැම්මා. ඒ අවස්ථාවේදී රුපියල් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් - රුපියල් මිලියන 950ක් - අලුත් තැන්පත්කරුවන්ගෙන් අරගෙන, ඊට පස්සේ තමයි ඒ ආයතනය වසා දමන්නේ. ගරු අමාත්‍යතුමනි, මේ පිළිබඳව මේ යන ක්‍රියාවලියට පිටින් ගිහිල්ලා ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මේ සඳහා කොමිසමක් පත් කරන්න, එහෙම නැත්නම් අලුත් ක්‍රියාමාර්ගයක් ගන්න. මොකද, Sussex College කියලා ආයතනයක් ද ෆිනෑන්ස් ආයතනයේ මුදල්වලින් පවත්වා ගෙන ගියා කියලා අපට ආරංචි මාර්ග තිබෙනවා.

ඒ වාගේම තමයි, ද ෆිනෑන්ස් ආයතනයට අයත් "ආකාස කඩේ" වාගේ වටිනා බිල්ඩින් විශාල ප්‍රමාණයක් කොළඹ තිබුණා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර ඇතුළේ විශේෂයෙන්ම තිබුණේ රක්ෂණ වන්දි ලබා දීම පිළිබඳවයි. ගරු අමාත්‍යතුමනි, රක්ෂණ වන්දි කියන්නේ, තැන්පත්කරුවන්ට ලැබෙන වෙනම දෙයක්. හැබැයි, මේ තැන්පත්කරුවන්ගේ මුදල් ඒ තැන්පත්කරුවන්ට ලබා නොදී, මේ liquidation process එක හරහා ද ෆිනෑන්ස් ආයතනයේ සේවකයන් තමන්ගේ මුදල් අරගෙන තිබෙනවා. 2008දී මේක Central Bank එක භාර ගන්නා විට ද ෆිනෑන්ස් ආයතනයේ වත්කම් ඒකේ තිබුණු වගකීම්වලට වඩා වැඩියි. හැබැයි, ගරු අමාත්‍යතුමනි, ඒ වාගේ තත්ත්වයකදී මම දකින විධියට, මෙහි හිතාමතාම කරන මහා විශාල කුමන්ත්‍රණයක් තිබෙනවා. මේ පිළිබඳව 2021 වර්ෂයේ Commercial High Court එකේ තිබුණු නඩුවේදීත් නඩුව දාපු පාර්ශ්වයේ අනුමැතිය නැතිව යම් එකඟතාවකට ඒ නීතිඥවරුන් ආපු එකක්.

[ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ, මේ ආණ්ඩුව මැදිහත් වෙලා අලුතින් කමිටුවක් පත් කරලා, මේ අසරණ මිනිස්සුන්ට සහනයක් දෙන්න බැරිද කියන එකයි. මොකද, ලොකු වංචාවක් මේ වෙන්නේ. මම ඔබතුමාගෙන් කරන ඉල්ලීම සහ අතුරු ප්‍රශ්නය වෙන්නේ, මේ ද ෆිනෑන්ස් ආයතනයේ මුදල් තැන්පත් කරපු තැන්පතුකරුවන්ට සාධාරණත්වයක් කරන්න කියන එකයි. මෙතැනදී, රක්ෂණයෙන් ලැබෙන මුදල ගණන් ගන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මනුස්සයෙක් EPF එකේ සල්ලි අරගෙන හෝ ඉඩමක් විකුණා හෝ ලක්ෂ 50ක් විතර දමා තිබෙන්න පුළුවන්. ඒ මුළු ප්‍රමාණයම නැති වෙනකොට, මේ liquidation process එක පිළිබඳව විශාල සැකයක් ඇති වෙනවා. මේක 2008 වසරේ ඉඳලාම ආපු ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොමත්ම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ කාරණා පිළිබඳව අපි තවදුරටත් අධ්‍යයනය කරලා ගත යුතු ක්‍රියාමාර්ග තිබෙනවාද කියා බලන්න යුහුසුලු වෙන්නම්. ඒ වාගේම ඔබතුමා කියපු රුපියල් මිලියන 950 අත්පත් කර ගැනීම සම්බන්ධව කියනවා නම්, ඒ වෙලාවේ පැවැති නීති රීති රාමුව තුළම තමයි මේගොල්ලන් ගිහින් තිබෙන්නේ. මොකද, අර බලපත්‍රය අහෝසි කරනවාය කියන නිවේදනය නිකුත් කළාට පසුව එතැනින් ඉල්ලීම් ඇවිල්ලා තිබෙනවා, මේක revive කරගෙන යන්න පුළුවන්ද කියන කාරණය සම්බන්ධව. ඒක ඒ අනුව දීපු එකක්. කෙසේ වෙතත්, අර බලපත්‍රය තහනම් කළාට පසුව ඒ අවුරුදු හතර ඇතුළතදී නැවත මුදල් එකතු කරගෙන නැහැ. ඒ සීමාවෙන් නවත්වා තිබෙනවා. ඒ වාගේම අර liquidation process එකේදීත් මේ සේවකයන්ට ගෙවීම සිද්ධ කර තිබෙන්නේ අර preferential payment order එකට. එතකොට ව්‍යවස්ථාපිත ගෙවීම් කරලා, සේවකයන්ට ගෙවීම් කරලා, සමස්තයක් වශයෙන් ගත්තාම සුළු ප්‍රමාණයක් තිබෙන්නේ. නමුත් අර preferential payment order එකේ ගිහින් තමයි තැන්පත්කරුවන්ට මේ ගෙවීම් සිද්ධ කර තිබෙන්නේ. නමුත් ඔබතුමා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව අපි සලකා බලන්නම්.

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ වෙනකොට ලංකාව තුළ ආයතන විශාල ප්‍රමාණයක් අර plantation, මේ plantation යනුවෙන් එක එක නම්වලින් පවත්වාගෙන යනවා, ලංකාවේ ඉන්න ජනතාවගේ මුදල්වලට ලොකු පොලියක් ලබා දෙනවා කියන පොරොන්දුව යටතේ. විශේෂයෙන්ම මම නියෝජනය කරන නැඟෙනහිර පළාතේ, මගේ ගමේත් සමහර ආයතන තිබෙනවා, Central Bank එකේ අනුමැතිය නැතුව මුදල් එකතු කරන.

ඔබතුමා දන්නවා ඇති, මේ වෙනකොට ලංකාව තුළ Central Bank එක කෙරෙහිත්, මුදල් අමාත්‍යාංශය කෙරෙහිත් විශාල ආන්දෝලනාත්මක තත්ත්වයක් තිබෙන බව. මොකද, Central Bank එකේ ඩොලර් මිලියන 2.5ක් හැකර් කෙනෙක් මාර්ගයෙන් ගිහින් තිබෙනවා. ඒ නිසා Central Bank එක කෑලි කැලිවලට කැඩීම තුළ මේ වාගේ කාරණා ඉදිරි අනාගතයේදී සිදු නොවෙන්න කටයුතු කළ යුතුයි. ගරු අමාත්‍යතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කැඳවූ අවස්ථාවේ අපි අහපු ප්‍රශ්නවලට ලැබුණු පිළිතුරුවලින් ගොඩක් ඒවා අපට පිළිගන්න පුළුවන් පිළිතුරු නොවෙයි. ඒ කියන්නේ ගරු අමාත්‍යතුමනි, මෙහි වගකීම, ඉදිරි අනාගතයේදී කවුද භාර ගන්නේ? ඔබතුමාත් මුදල් අමාත්‍යාංශයේ වගකිව යුතු නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියටයි කටයුතු කරන්නේ.

Central Bank එකේ කාර්යභාරය පිළිබඳව මම යෝජනාවක් කරන්න කැමැතියි. Internal audit mechanisms, IT audit mechanisms වාගේ මොනවා හෝ audit procedures international standardsවලට අනුව Central Bank එක ඇතුළේ කටයුතු සිදු කරන්න, Central Bank එකේ risk assessment එකක්, audit procedure එකක් වැනි මොනවා හෝ දෙයක් එහෙම අලුතින් හදන්න ක්‍රමවේදයක් තිබෙනවාද?

ගරු කථානායකතුමනි, මම ගිය සතියේ දැක්කා, මට හරියටම මතක නැහැ, කුරුණෑගල හෝ කොහේ හෝ ජනතාවක් ඇවිල්ලා බෝඩ් අල්ලාගෙන- *[බාධා කිරීමක්]* ඒගොල්ලන් තැන්පත් කළ මුදල් ආයෙත් ලබා ගැනීමට. ඒ නිසා මම කියන්නේ මින් ඉදිරියට හෝ මුදල් අමාත්‍යාංශයේ, Treasury එකේ කාරණාවලට - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳමයි, ගරු කථානායකතුමනි. මේ වාගේ නිල නොලත්, එහෙම නැත්නම් ලියාපදිංචි නොකරපු ආයතන වහාම හඳුනාගෙන මේවායින් ජනතාවගේ මුදල් ආරක්ෂා කර ගැනීමේ මොනවා හරි audit ක්‍රමවේදයක් රජයට තිබෙනවාද කියන එක තමයි මම අහන ඊළඟ අතුරු ප්‍රශ්නය.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මහ බැංකුව යටතේ මූල්‍ය ස්ථාවරත්වය අත්පත් කර ගැනීමේදී ප්‍රධාන වශයෙන් බැංකු පිළිබඳ විමර්ශන කටයුතු කරන්න වෙනම අංශයකුත්, බැංකු නොවන ක්ෂේත්‍රයේ විමර්ශනවලට වෙනම අංශයකුත් තිබෙනවා. මූල්‍ය සමාගම් හෝ වෙනත් ආකාරයකට කටයුතු කරන ඒවායෙන් සමහර ඒවා බැංකු නොවන ආයතන, සමහර ඒවා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරපු ඒවා. මේ විධියට, පවතින නීති රීති රාමුවට පිටින් හදාගත්තු ක්ෂුද්‍ර ණය සම්බන්ධයෙනුත් ආයතන ගණනාවක් ස්ථාපිත වෙලා තිබුණා. අපි ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය පත් කර තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී බැංකු නොවන ක්ෂුද්‍ර ණය සම්බන්ධයෙන් කරන සියලු කටයුතු අධීක්ෂණය කිරීමට මැදිහත් වීමේ හැකියාව අපට තිබෙනවා.

## 2010 සිට සංචාරක පැමිණීම්: විස්තර
## 2010இலிருந்து சுற்றுலாப் பயணிகளின் வருகையையும்: விபரம்
## TOURIST ARRIVALS FROM 2010: DETAILS

467/2025

**4.** **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ලියාපදිංචි තරු පන්තියේ හෝටල් සංඛ්‍යාව, ක්‍රියාත්මක වර්ෂ, කාමර ධාරිතාව, සෘජු හා වක්‍ර සේවකයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) එම කාලය සඳහා Airbnbහි ලියාපදිංචි වෙබ් අඩවි සංඛ්‍යාව කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා සංචාරකයින්ගේ පැමිණීම, මුළු ඉපැයීම සහ ඒක පුද්ගල ඉපැයීම කොපමණද;

(iv) ක්‍රියාත්මකව පවතින Booking.com ආයතන සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් උපයා ගත් මුදල සහ ගෙවූ බදු මුදල කොපමණද; යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) සංචාරකයින් නැවතී සිටින සාමාන්‍ය කාලසීමාව කොපමණද;

(ii) වාර්ෂිකව නැවත පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2020 වර්ෂයේ සිට මේ දක්වා සිංගප්පූරුව, තායිලන්තය, ජපානය, ඇමරිකාව, චීනය, එක්සත් රාජධානිය, මැලේසියාව, ඩුබායි, ඉන්දියාව, තුර්කිය, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, වියට්නාමය, ප්‍රංශය සහ කැනඩාව යන රටවලින් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) සංචාරක කර්මාන්තයේ පවතින දුර්වලතා කවරේද;

(ii) එමඟින් ඇති වන අහිතකර බලපෑම් කවරේද;

(iii) එම දුර්වලතා අවම කිරීමට ගත් පියවර කවරේද; යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டில் இருந்து இற்றைவரை பதிவுசெய்யப்பட்டுள்ள நட்சத்திர வகுப்பு ஹோட்டல்களின் எண்ணிக்கை, அவை செயற்பட்டு வரும் வருடங்கள், அவற்றிலுள்ள அறைகளின் எண்ணிக்கை, அங்குள்ள நேரடி யான மற்றும் மறைமுகமான ஊழியர்களின் எண்ணிக்கையை மாவட்ட வாரியாகவும்;

(ii) இதே காலப்பகுதிக்காகப் பதிவுசெய்யப்பட்ட Airbnb இணையத்தளங்களின் எண்ணிக்கை யையும்;

(iii) 2010ஆம் ஆண்டிலிருந்து இற்றைவரையான சுற்றுலாப் பயணிகளின் வருகையையும் மொத்த ஈட்டல்களையும் தனிநபர் ஈட்டல் களையும்;

(iv) இயங்குகின்ற Booking.com நிறுவனங்களின் எண்ணிக்கையையும்;

(v) அவை ஈட்டிய தொகை மற்றும் செலுத்திய வரிகளையும்;

அவர் வெவ்வேறாக குறிப்பிடுவாரா?

(ஆ) (i) விஜயம் செய்யும் சுற்றுலாப் பயணிகள் சராசரி யாகத் தங்கியிருக்கும் காலம்;

(ii) வருடாந்தம் மீண்டும் வருகை தருவோரின் எண்ணிக்கை;

(iii) 2020ஆம் ஆண்டில் இருந்து இற்றைவரை சிங்கப்பூர், தாய்லாந்து, யப்பான், அமெரிக்கா, சீனா, இங்கிலாந்து, மலேசியா, **துபாய்**, இந்தியா, துருக்கி, இந்தோனேசியா, அவுஸ் திரேலியா, வியட்நாம், பிரான்ஸ், கனடா ஆகிய நாடுகளில் இருந்து வருகை தந்தவர் களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சுற்றுலா தொழிற்றுறையின் பலவீனத்தையும்;

(ii) அதன் பாதகமான தாக்கத்தையும்;

(iii) இவ்வாறான பலவீனங்களை நிவர்த்திசெய்ய எடுக்கப்பட்ட நடவடிக்கைகளையும்;

அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he state, separately, the -

(i) number of registered star class hotels, years in operation, room capacity, direct and indirect employees in each district from 2020 to date;

(ii) number of Airbnb registered websites for the said period;

(iii) tourists arrivals, total earnings and per capita earnings from 2010 to date;

(iv) number of Booking.com institutions operating; and

(v) amount earned and taxes paid by them?

(b) Will he also state the -

(i) average stay of tourists visiting;

(ii) number of annual repeat visitors; and

(iii) number of arrivals from Singapore, Thailand, Japan, USA, China, UK, Malaysia, Dubai, India, Turkiye, Indonesia, Australia, Vietnam, France and Canada in each year from 2020 to date, separately?

(c) Will he further state the -

(i) weaknesses of the tourist industry;

(ii) negative impacts thereof; and

(iii) steps taken to ameliorate such weaknesses?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඇමුණුම අනුව,

ලියාපදිංචි තරු පන්තියේ හෝටල් සංඛ්‍යාව 31යි.

ක්‍රියාත්මක වර්ෂ අවසන් තීරුවේ පිළිවෙළින් දක්වා තිබේ.

කාමර ධාරිතාව 4,787යි.

ඍජු හා වක්‍ර සේවකයන් සංඛ්‍යාව - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුව තොරතුරු නොමැත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ii) ඒ පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුව නොමැත.

(iii) වසර 2010 සිට 2025 දක්වා තොරතුරු පහත වගුවේ දක්වා තිබෙනවා.

| **වර්ෂය** | **සංචාරකයන් පැමිණීම්** | **මුළු ආදායම (ඇමෙරිකානු ඩොලර් මිලියන)** | **සංචාරකයෙකුගෙන් ලැබෙන ඒක පුද්ගල ආදායම (ඇමෙරිකානු ඩොලර්)** |
|---|---|---|---|
| 2010 | 654,476 | 576 | 880.09 |
| 2011 | 855,975 | 839 | 980.17 |
| 2012 | 1,005,605 | 1,038 | 1032.21 |
| 2013 | 1,274,593 | 1,716 | 1346.31 |
| 2014 | 1,527,153 | 2,431 | 1591.85 |
| 2015 | 1,798,380 | 2,981 | 1657.60 |
| 2016 | 2,050,832 | 3,519 | 1715.89 |
| 2017 | 2,116,407 | 3,925 | 1854.56 |
| 2018 | 2,333,796 | 4,381 | 1877.20 |
| 2019 | 1,913,702 | 3,607 | 1884.83 |
| 2020 | 507,704 | 683 | 1345.27 |
| 2021 | 194,495 | 507 | 2606.75 |
| 2022 | 719,978 | 1,136 | 1577.83 |
| 2023 | 1,487,303 | 2,068 | 1390.44 |
| 2024 | 2,053,465 | 3,169 | 1543.25 |
| 2025 | 2,362,521 | 3,219 | 1362.53 |

(iv) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුව තොරතුරු නොමැත.

(v) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුව තොරතුරු නොමැත.

(ආ) (i) ඒ පිළිබඳ තොරතුරු පහත table එකෙහි දක්වා තිබෙනවා.

| **වර්ෂය** | **සාමාන්‍ය කාලසීමාව** (රාත්‍රීන්) |
|---|---|
| 2010 | 10.0 |
| 2011 | 10.0 |
| 2012 | 10.0 |
| 2013 | 8.6 |
| 2014 | 9.9 |
| 2015 | 10.1 |
| 2016 | 10.2 |
| 2017 | 10.9 |
| 2018 | 10.8 |
| 2019 | 10.4 |
| 2020 | 8.5 |
| 2021 | 15.1 |
| 2022 | 9.0 |
| 2023 | 8.4 |
| 2024 | 8.4 |
| 2025 | 8.3 |

(ii) 2018 සහ 2024/25 exit survey එක අනුව, සම්පූර්ණ සංචාරක පැමිණීම්වලින් සියයට 18ක් repeat visitorsලා බව හෙළි වී තිබෙනවා.

(iii) මෙහි සඳහන් රටවල ඒ ඒ වර්ෂවලට අදාළව එම තොරතුරු පහත වගුවේ දක්වා තිබෙනවා.

| රට | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 ජනවාරි සහ පෙබරවාරි |
|---|---|---|---|---|---|---|---|
| සිංගප්පූරුව | 2,545 | 557 | 3,770 | 9,551 | 12,591 | 15,086 | 2,508 |
| තායිලන්තය | 1,880 | 247 | 1,725 | 4,922 | 7,246 | 8,595 | 1,951 |
| ජපානය | 6,644 | 392 | 3,087 | 19,583 | 30,429 | 38,153 | 7,135 |
| ඇමෙරිකාව | 16,842 | 6,124 | 22,230 | 46,344 | 59,532 | 65,973 | 15,601 |
| චීනය | 26,147 | 2,417 | 4,715 | 68,789 | 131,681 | 132,035 | 34,183 |
| එක්සත් රාජධානිය | 55,455 | 16,646 | 85,187 | 130,088 | 178,339 | 212,277 | 60,328 |
| මැලේසියාව | 3,494 | 323 | 2,779 | 10,940 | 18,259 | 23,684 | 3,888 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය *ඩුබායි ද ඇතුළත්වේ | 352 | 254 | 1,347 | 2,945 | 4,296 | 5,656 | 368 |
| ඉන්දියාව | 89,357 | 56,268 | 123,004 | 302,844 | 416,974 | 531,511 | 99,740 |
| තුර්කිය | 2,121 | 309 | 1,514 | 3,739 | 6,673 | 8,112 | 2,160 |
| ඉන්දුනීසියාව | 1,114 | 1,856 | 885 | 2,352 | 3,744 | 5,056 | 1,267 |
| ඕස්ට්‍රේලියාව | 20,283 | 4,421 | 30,924 | 67,436 | 89,573 | 109,487 | 21,172 |
| වියට්නාමය | 709 | 52 | 519 | 2,307 | 2,963 | 3,729 | 1,981 |
| ප්‍රංශය | 24,838 | 6,549 | 35,482 | 56,251 | 88,775 | 109,041 | 30,743 |
| කැනඩාව | 12,436 | 5,079 | 26,845 | 43,944 | 42,212 | 46,133 | 10,042 |

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ඇ) (i) සංචාරක කර්මාන්තයේ පවතින දුර්වලතා 13ක් අපි හඳුනාගෙන මේ සමඟ ඉදිරිපත් කර තිබෙනවා.

1. පළාත් මට්ටමින් සංචාරක ආකර්ෂණ ස්ථාන නිසි පරිදි හඳුනාගෙන සංවර්ධනය කිරීමේ සැලසුම් හිඟ වීම හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමාණවත් ලෙස සිදු නොවීම.
2. පර්යේෂණ හා සංවර්ධන - R&D - ක්ෂේත්‍රයේ යාවත්කාලීනතාව හා නව්‍යකරණය සීමිත වීම. එමඟින් සංචාරක ව්‍යාපාරයේ වර්ධනය මන්දගාමී වීම.
3. සංචාරක කර්මාන්තය තුළ ඩිජිටල්කරණය ප්‍රමාණවත් ලෙස භාවිත නොකිරීම හේතුවෙන් සේවා කාර්යක්ෂමතාව අඩු වීම.
4. ජාතික වෙළෙඳ නාමකරණය - branding - සහ ගමනාන්ත අලෙවිකරණය සඳහා නවමු උපාය මාර්ග භාවිත නොකිරීම හේතුවෙන් සංචාරක ක්‍රියාකාරකම් විවිධාංගීකරණය සීමිත වීම. විශේෂයෙන්, digital promotions වාගේ දේවල්.
5. සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණයේ පවතින දුර්වලතා.
6. සංචාරකයින්ට අද්විතීය, අව්‍යාජ හා අත්දැකීම්මය - experience-based - සේවාවන් සැපයීම වෙනුවට සාම්ප්‍රදායික දර්ශනීය ස්ථාන ප්‍රචාරණය මත පමණක් අවධානය යොමු වීම.
7. සංචාරක ක්ෂේත්‍රයට අදාළ ආයෝජන ප්‍රමාණවත් නොවීම සහ සංචාරක ස්ථාන කළමනාකරණයේ පවතින දුර්වලතා.
8. සංචාරක කර්මාන්තයේ හැකියාව පිළිබඳ ජනතාව අතර දැනුවත්භාවය අඩු වීම හේතුවෙන් සමාජ සහභාගිත්වය හා ව්‍යාපාරික අවස්ථා වර්ධනය අඩු වීම.
9. ස්වාභාවික හා මනුෂ්‍යයා විසින් ඇති කරන ආපදා වැනි හදිසි තත්ත්වයන් සම්බන්ධ අවදානම් සංචාරක උපාය මාර්ගික සැලසුම්කරණයට ප්‍රමාණවත් ලෙස ඇතුළත් නොවීම.
10. විශ්වාසදායක දත්ත හිඟය සහ විශේෂඥ දැනුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සාක්ෂි මත පදනම් වූ - evidence-based - නව ව්‍යාපෘති සංවර්ධනය සීමිත වීම.
11. සංචාරක ගමනාන්තවල ධාරිතාව - carrying capacity - පිළිබඳ සම්පූර්ණ හා විද්‍යාත්මක අධ්‍යයන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම ගමනාන්තවල පහසුකම් සංවර්ධනය නිසි ලෙස සැලසුම් කිරීමට නොහැකි වීමත් සංචාරක කර්මාන්තයේ *රූපය* - image - හා ගුණාත්මකභාවයට අහිතකර බලපෑම් ඇති වීමත් සිදුවේ.
12. සංචාරක කර්මාන්තය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය ඔස්සේ රාජ්‍ය හා පෞද්ගලික අංශ සම්බන්ධීකරණය කර ගනිමින් සංචාරක කර්මාන්තයට බලපාන ප්‍රධාන ගැටලු නිරාකරණය කිරීමට සහ නම්‍ය විසඳුම් සෙවීමට කටයුතු කරමින් පවතී.
13. Online Travel Agents - OTAs - හරහා ලියාපදිංචි වී සිටින සේවාදායකයන් සහ ඒ හරහා වන හෝටල් කාමර වෙන් කර ගැනීම් නියාමනය සඳහා OTA සේවාදායකයින් සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.

(ii) ඒවායෙන් ඇති වන අහිතකර බලපෑම් 11ක් හඳුනාගෙන තිබෙනවා.

1. යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රාදේශීය සංචාරක සංවර්ධනය මන්දගාමී වීම.
2. නව්‍ය සංචාරක නිෂ්පාදන හා සේවාවන් සංවර්ධනය නොවීම හේතුවෙන් කර්මාන්තයේ තරගකාරිත්වය අඩු වීම.
3. සේවා සැපයීමේ කාර්යක්ෂමතාව අඩු වීම හේතුවෙන් සංචාරක තෘප්තිය අඩු වීම.
4. සංචාරක ක්‍රියාකාරකම් විවිධාංගීකරණය නොවීම හේතුවෙන් නව වෙළෙඳ පොළ ආකර්ෂණය කිරීමේ අපහසුතාව.
5. ආයතන අතර සම්බන්ධීකරණ දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය සහ සම්පත් නාස්තිය.
6. අත්දැකීම්මය සංචාරක සේවාවන් හිඟවීම හේතුවෙන් සංචාරකයින්ගේ නැවත පැමිණීම අඩු වීම.
7. ආයෝජන හා කළමනාකරණ දුර්වලතා හේතුවෙන් පහසුකම් සංවර්ධනය අඩු වීම සහ ආදායම් අඩු වීම.
8. ජනතාවගේ සහභාගීත්වය අඩු වීම හේතුවෙන් ප්‍රාදේශීය ආර්ථික ප්‍රතිලාභ සීමිත වීම.
9. ආපදා අවදානම් සැලසුම්කරණයට ඇතුළත් නොකිරීම හේතුවෙන් හදිසි අවස්ථාවලදී කර්මාන්තයට දැඩි බලපෑම් ඇති වීම.
10. දත්ත සහ විශේෂඥ දැනුම හිඟවීම හේතුවෙන් දත්ත මත පදනම් නොවූ තීරණ ගැනීම හා නව ව්‍යාපෘති සංවර්ධනය සීමිත වීම.
11. ගමනාන්ත ධාරිතාව නොසලකා හැරීම හේතුවෙන් අධික භාවිතය, පරිසර හානිය සහ සංචාරක රූපයට අහිතකර බලපෑම් ඇති වීම.

    සමස්තයක් වශයෙන් මෙය තිරසාර සංචාරක සංවර්ධනයට බාධාවක් වේ.

(iii) මේ සම්බන්ධයෙන් කරුණු 11ක් හඳුනාගෙන ඉදිරිපත් කර තිබෙනවා.

1. පළාත් මට්ටමින් සංචාරක සංවර්ධන ප්‍රධාන සැලසුම් - master plans - සකස් කර ප්‍රමුඛතාව අනුව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

    ඒවා සකස් කිරීම අපි ආරම්භ කර තිබෙනවා.

    ඒ වාගේම ආයතන අතර තිබෙන සම්බන්ධීකරණ දුර්වලතා අවම කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවලා තීන්දු තීරණ ගැනීමට අපි කටයුතු කර තිබෙනවා.
2. නව්‍ය සංචාරක නිෂ්පාදන හා සේවාවන් සංවර්ධනය සඳහා පර්යේෂණ හා නව්‍යකරණ (R&D) වැඩසටහන් ශක්තිමත් කිරීම.

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

3. සේවා සැපයීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඩිජිටල් තාක්ෂණ හා e-tourism විසඳුම් ක්‍රියාත්මක කිරීම.
4. නව වෙළෙඳ පොළ ආකර්ෂණය කිරීම සඳහා නවීන අළෙවිකරණ සහ වෙළෙඳ නාමකරණ උපාය මාර්ග හඳුන්වා දීම.

   නව වෙළෙඳ පොළ ආකර්ෂණීය ප්‍රවර්ධන වැඩ පිළිවෙළක් - global promotion campaign එකක් - අපි මේ වන කොට ආරම්භ කර තිබෙනවා.
5. රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර ශක්තිමත් සම්බන්ධීකරණ යන්ත්‍රණයක් ස්ථාපනය කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම කිරීම.
6. සංචාරකයින්ට අද්විතීය අත්දැකීම් ලබා දෙන experience-based සංචාරක නිෂ්පාදන සංවර්ධනය කිරීම.
7. දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කිරීම සහ සංචාරක ස්ථාන කළමනාකරණය ශක්තිමත් කිරීම.
8. ප්‍රාදේශීය ජනතාවගේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම සඳහා community-based tourism වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
9. ආපදා අවදානම් කළමනාකරණය සංචාරක උපාය මාර්ගික සැලසුම්කරණයට ඒකාබද්ධ කිරීම සහ සූදානම්භාව වැඩිදියුණු කිරීම.
10. විශ්වාසදායක සංචාරක දත්ත පද්ධති ස්ථාපනය කර විශේෂඥ දැනුම වර්ධනය කිරීම මඟින් evidence-based තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම.
11. ගමනාන්ත ධාරිතාව - carrying capacity - පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයන සිදු කර sustainable visitor management ක්‍රමවේද හඳුන්වා දීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට ලැබුණු පිළිතුර අනුව පෙනෙනවා, ප්‍රශ්නයෙන් සියයට 40කට විතර උත්තර සපයා නැති බව. Airbnb එකේ information නැහැ. ඒ වාගේම revenue එක පිළිබඳව සඳහන් වන්නේ නැහැ. දුන්නු දත්ත අනුව ඒක වාර්තා කරලා අපට ලබා ගන්න දෙයක් නැහැ. ඒ නිසා මට මේ පිළිතුර ප්‍රකාරව ප්‍රශ්න අහන්න බැරි වෙනවා. මේ සම්බන්ධව ප්‍රශ්නය ඉදිරිපත් කරලා මා ඇහුවා, Airbnb එකේ කී දෙනෙකු ඉන්නවාද, ඒකේ revenue එක කීයද ආදිය ගැන. නමුත් ඒවා ගැන තවම පාර්ලිමේන්තුවට වාර්තා කළේ නැහැ. ඒක නොතකා මම සාමාන්‍ය ප්‍රශ්නයක් අහන්නම්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මේක ප්‍රශ්නයක් වෙනවා කියලා දැනගෙන 2025 පෙබරවාරි මාසයේ මම ඔබතුමාගේ ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මේ payment platform එක සම්බන්ධයෙන් control එකක් තිබෙනවාද කියලා මම ඇහුවා. මට මතක විධියට, ඒ කාරක සභාවේදී මේ ගැන අහන අවස්ථාවේදී ඔබතුමාත් හිටියා. එතුමා දැනුවත් කළේ Brisbaneවල මෙවැනි payment platform එකක් හදන කටයුත්තක් කෙරෙනවා, එය 2025 මාර්තුවල ආරම්භ කළා, මේක අවුරුදු දෙකකින් ලබා දෙනවා කියලායි. මේ සම්බන්ධයෙන් මොන වාගේ ප්‍රගතියක්ද තිබෙන්නේ? ඔබතුමා දන්නවා අද මහ බැංකුව තුළින් ගමන් කරන payment platforms ගැන. රටවල් තුනහතරක සංචාරකයන් මේ රටට ඇවිල්ලා ඒ ගෙවීම් කිරීමේදී වෙනත් රටවලට තමයි සල්ලි ටික යන්නේ. ඒකෙන්, ආදායමක් උත්පාදනය කරන්නත් බැරි වෙනවා. ඒකෙන් සැබෑ ආදායම මේ රටට ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි ගිය අවුරුද්දේ සියයට 11කින් සංචාරකයන් වැඩි වුණාට, ආදායම සියයට 8.4කින් අඩු වුණේ. මේ රටට එන්න තිබෙන සල්ලි වෙනින් තැන්වලට යනවා. ආණ්ඩුවත්, ඔබතුමන්ලාත් මේවා ගැන දැන දැනත් ඒවා නිවැරදි කරන්න තිබෙන ස්ථාවරය ඇති කරන්නේ කොහොමද කියන එක ගැන කියන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා. කරුණාකරලා ඔබතුමාට මේ සඳහා උත්තරයක් දෙන්න පුළුවන්ද?

මොකද, මම ඔබතුමාව ඒ සම්බන්ධව ලිඛිතව දැනුවත් කළා. දකුණු පැත්තේ රටවල් තුනක් payment platform එක කෙළින්ම පිටරටට ගෙවනවා. ඉතින් මේකෙන් අපි බිලියන 3ක් හෙව්වාට, ඇත්ත වශයෙන්ම මීට වඩා සියයට 20ක්, 25ක් සොයා ගන්න පුළුවන් කියන මතයේ තමයි අප සිටින්නේ. ඒ නිසා රටට ආදායම උත්පාදනය කරන්න පුළුවන් වන්නේ කොයි ආකාරයෙන්ද, ඔබතුමා එය කරන්න යන්නේ කොහොමද, ඒ සම්බන්ධව නිවැරදි ස්ථාවරය කුමක්ද කියන කාරණා ගැන කරුණාකර දැනුවත් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මතු කරන කාරණය සම්බන්ධයෙන් මම එකඟ වෙනවා. විශේෂයෙන්ම මේක ඉතාම සංවේදී සහ ඉතාම ප්‍රවේශමෙන් කළමනාකරණය කළ යුතු තත්ත්වයක්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සංවේදී වන්නේ කොහොමද කියලා පැහැදිලි කරන්න.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

සංවේදී වන්නේ මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමනි. සංචාරක කර්මාන්තයේ කරගෙන යන පුංචි guest house එකක් අපි උදාහරණයක් විධියට ගනිමු. විශේෂයෙන්ම ඇල්ල වාගේ ප්‍රදේශයක් ගත්තොත්, ඒ ආශ්‍රිතව කාමර 10,000කට අධික ප්‍රමාණයක් තිබෙනවා. ඒගොල්ලන්ගේ ඒ කාමරවලට සංචාරකයන් පැමිණෙන්නේ සම්පූර්ණයෙන්ම මේ platforms හරහායි. Platforms කිහිපයක් තිබෙනවා. මම මේ වෙලාවේ ඒවායේ නම් කියන්න ලැහැස්ති නැහැ. මීට පෙර තිබුණු රජයක් ඒගොල්ලන්ට බදු - VAT එක - ගෙනෙන්න උත්සාහ කළා. එතකොට ඒගොල්ලන් ලැහැස්ති වුණා, ඒගොල්ලන්ගේ ඒ කටයුතුවලින් සම්පූර්ණයෙන් අයින් වෙන්න. එහෙම වුණොත් මොකද වෙන්නේ? විශාල වශයෙන් ප්‍රවර්ධන කටයුත්තක් කර ගන්න ශක්තියක් නැති, විදේශ සංචාරක වෙළෙඳ පොළවලට යන්න බැරි අයට තමා සතු කාමර සංචාරකයන්ට විකුණා ගන්න තිබෙන අවස්ථාව අහිමි වෙලා යනවා. ඒ නිසා තමයි ඒක සංවේදී වෙන්නේ.

දෙවනුව, අපි ඒ අයත් එක්ක සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. උදාහරණයක් විධියට ගිය අවුරුද්ද ගත්තොත්, platform එකක් සම්බන්ධව, list එකක් දීලා ස්පාඤ්ඤය කිව්වා, "මෙන්න මේ අය අපිත් එක්ක registered නැහැ. මේ අය අයින් කරන්න" කියලා. අපට ඒක කරන්න පුළුවන්. එහෙම කළොත් මා

ඉස්සෙල්ලා කිව්වා වාගේ ඒගොල්ලන්ගේ ආර්ථික තත්ත්වයට බලපෑමක් ඇති වෙනවා. ඒ නිසා අපි ඒගොල්ලන් එක්ක සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා, කොහොමද ඒගොල්ලන් tax payment platform එකකට ගෙනෙන්නේ කියලා. ඒ අය tax payment platform එකකට ගෙනාවාට පස්සේ අපි හිතනවා අපට පාලනයකට ගන්න පුළුවන් කියලා. ඒ වාගේම, අවිධිමත් කියපු කණ්ඩායම විධිමත්ව අපේ සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරනවා. *[බාධා කිරීමක්]* ඒක ඇත්ත, ගරු මන්ත්‍රීතුමා. ඒක තමයි මා කලින් කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර කෙටි කරන්න. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අහන ප්‍රශ්නයට පිළිතුරු ලබා දීලා අවසන් කරන්න.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
ඒ අය බදු ගෙවීමේ ක්‍රමය තුළට ගන්න අපි සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. මේ වන කොට සාකච්ඡා දෙකක් පවත්වා තිබෙනවා. අපි තවත් සාකච්ඡාවක් පවත්වමින් තිබෙනවා, තොරතුරු හුවමාරුවට අදාළව. මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේ මෙය ටිකක් වගකීමෙන් කළමනාකරණය කර ගත යුතු තත්ත්වයක්. හැබැයි, දිගින් දිගටම මෙහෙම යන්න අවස්ථාව දෙන්නේ නැහැ. ඒකට අවශ්‍ය වැඩ කටයුතු ගැන සාකච්ඡා කරමින්, අවශ්‍ය කටයුතු සිදු කරමින් තමයි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මා හිතන විධියට, ලංකාව market කරන ප්‍රමාණය මදි. අපේ taglines වෙනස් වෙනවා. වෙනත් රටවල් එක්ක සාපේක්ෂව බලන කොට අපේ ලංකාව market වන ප්‍රමාණය මදි. CNN එක ගත්තොත්, මේ අවුරුද්දේ ඒගොල්ලන්ගේ weather forecast එකේවත් කොළඹ ගැන සඳහන් වෙන්නේ නැහැ.

අප දන්නා පරිදි සංචාරක කර්මාන්තය - tourism industry එක - සාමාන්‍යයෙන් විධිමත්ව තිබෙනවා. මොකද, ඒ හෝටල් හිමියන් සියලුදෙනා ඒක රාශි වෙලා කටයුතු කරගෙන යනවා. ඇයි මේ branding සහ CESS එක - TDL එකක් එකතු කරනවා නේ. ඒකේ බිලියන 13ක් තිබෙනවා. ඇයි ඒවා පාවිච්චි කරන්නේ නැත්තේ, ඒ කර්මාන්තය මීට වඩා ප්‍රවර්ධනය කිරීමේ කටයුත්තට? ලංකාවේ විතරක් නොවෙයි, ජාත්‍යන්තර මට්ටමින් ද ඒක කරන්න ඕනෑ. සංචාරක කර්මාන්තයේ ඉන්න සියලුදෙනාම කියන්නේ අමාත්‍යාංශයෙන් මේකට හරි දිශාවක් - direction එකක් - පෙන්නුම් කර නැහැ කියලායි.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
ගරු කථානායකතුමනි, අපි සංචාරක වෙළෙඳ පොළ ප්‍රදර්ශනවලට සහභාගි වීමේ කටයුතු කරගෙන යනවා වාර්ෂිකව. ගිය අවුරුද්දේ අපි බිලියන 6කට වඩා ඒ වෙනුවෙන් වියදම් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ගෝලීය ප්‍රවර්ධන වැඩ පිළිවෙළ සඳහා බිලියන 5ක වැඩ පිළිවෙළක් සකස් කරලා එය මේ වනකොට Treasury එකේයි තිබෙන්නේ. එය දැන් කැබිනට් අනුමැතියට යවලා තිබෙනවා. ඒ අනුමැතිය ආ ගමන් අපි එය පටන් ගන්නවා. නමුත් කෙටි කාලීනව තවත් බිලියන එකක- විශේෂයෙන් මේ යුද්ධයෙන් ඇති වූ බලපෑමත් එක්ක චීනය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව සහ ස්පාඤ්ඤය වාගේ summer markets හෙවත් අපේ off season එකට ගැළපෙන markets ප්‍රවර්ධන වැඩ පිළිවෙළක් සඳහා අපට මේ වනකොට අනුමැතිය ලැබිලා තිබෙනවා. මා හිතන විධියට අපට තවත් සතියකින් විතර ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න පුළුවන්. ප්‍රවර්ධන වැඩ කටයුතු - විශේෂයෙන් global campaign එක - අපි සැලසුම් කරලායි තිබෙන්නේ. රජයේ පවතින ප්‍රසම්පාදන ක්‍රියාවලියට යටත්ව අපි ඒ වැඩ කටයුතු කරමින් ඉන්නවා.

## ලං.වි.ම. රාජ්‍ය බැංකුවලින් ලබා ගත් ණය: විස්තර
## இ.மி.ச. அரச வங்கிகளிலிருந்து பெற்ற கடன்கள்: விபரம்
## LOANS OBTAINED FROM STATE BANKS BY CEB: DETAILS

568/2025

**5. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂය වන විට ලංකා විදුලිබල මණ්ඩලය විසින් රජයේ බැංකුවලින් ණය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම බැංකුවල නම් කවරේද;

(iii) එම ණයවලින් මේ වන විට ගෙවීමට ඇති ණය මුදල කොපමණද;

(iv) විදුලිබල මණ්ඩලය විසින් බැංකුවලින් ණය ගැනීම අවම කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) 2024ஆம் ஆண்டளவில் இலங்கை மின்சார சபை அரச வங்கிகளில் கடனைப் பெற்றுக் கொண்டுள்ளதா என்பதையும்;

( ii) ஆமெனின், அவ்வங்கிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) பெறப்பட்ட கடன்களில் தற்போது செலுத்த வேண்டிய கடன் தொகை எவ்வளவு என்பதையும்;

( iv) மின்சார சபை வங்கிகளில் கடன் பெற்றுக் கொள்வதைக் குறைப்பதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether the Ceylon Electricity Board (CEB) has obtained loans from State banks as at the year 2024;

(ii) if so, the names of those banks;

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

(iii) the outstanding amount of those loans; and

(iv) the measures being taken by the Ministry to minimize obtaining of loans from banks by the CEB?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුව.

(iii) 2024.12.31 දිනට රාජ්‍ය බැංකුවලින් ලංකා විදුලිබල මණ්ඩලය ලබාගෙන ඇති බැංකු ණයවලට අදාළව 2026.02.28 දිනට බැංකු ණය ශේෂය රුපියල් 11,666,855,608.00ක් වන අතර, ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය ඇමුණුම වශයෙන් ඉදිරිපත් කරමි. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) පිරිවැය ආවරණය වන පරිදි විදුලි අය ක්‍රමය සැකසීම තමයි සාමාන්‍යයෙන් අපි කරන්නේ. එතැනදී අපි ක්‍රම දෙකක් අනුගමනය කරන්න බලාපොරොත්තු වෙනවා. එකක් තමයි, අපේ ජනන පිරිවැය අඩු කර ගන්න එක. අනික් එක තමයි මෙහෙයුම් පිරිවැය අඩු කර ගැනීමේ සැලසුම. ඒ අනුව, බැංකු ණය මුදල් ලබා ගැනීම පුළුවන් තරම් අවම කර ගැනීම තමයි අපේ බලාපොරොත්තුව.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු අමාත්‍යතුමනි, මෙම අමාත්‍යාංශය ආන්දෝලනාත්මක අමාත්‍යාංශයක් බවට පත් නොකර, ජනතාව පීඩාවට පත් නොකරන අමාත්‍යාංශයක් බවට පත් කරලා කටයුතු කරන්න හැකියාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, ප්‍රථමයෙන්ම අපි ඔබතුමාට සුබ පතනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේම තිබුණා, බැංකුවලින් ණය ගන්නට සිද්ධ වෙන්නේ පිරිවැය ආවරණය කර ගැනීමට නොහැකි වීම නිසාය කියලා. ඔබතුමා සහ අපි හැමෝම දන්නා කාරණයක් තිබෙනවා. ඔබතුමාට මෙම අමාත්‍යාංශයට යන්න පවා සිද්ධ වෙන්නේම, ඒ කියන්නේ මේ අමාත්‍යාංශය ඔබතුමා අතට පත් වෙන්නේම, මේ රටට ගල් අඟුරු ගෙන්වීමේදී ඇති වූ ඛේදවාචකය නිසායි. ඒක නිසා ඔබතුමන්ලාත්, අපිත් දන්නා කාරණය තමයි, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් ගතහැකි ධාරිතාව ලබා ගැනීමට හැකියාව ලැබුණේ නැහැයි කියන එක. ඒ ධාරිතාව ලබා ගැනීමට නොහැකි වීමෙන් ඇති වූ හිඟය පියවා ගැනීම සඳහා අපට ද්‍රව ඉන්ධනවලට යන්න සිද්ධ වුණා. ඒක නිසා ලංකා විදුලිබල මණ්ඩලයට අතිරේක පිරිවැයක් - විශාල බරක් - දරන්න සිද්ධ වුණා. ඒ බර ජනතාව මත පටවන්නේ නැහැයි කියලා ජනාධිපතිතුමා එක් අවස්ථාවක කිව්වා. එතුමාගේ කථාවේ තව තැනක කිව්වා, ඒ පිරිවැයෙන් කොටසක් ජනතාව මත පටවන්න සිද්ධ වෙනවා කියලා. ඒත් එක්කම, හෙට අනිද්දා වෙනකොට විදුලි බිල සියයට 20ක් දක්වා නැවත වැඩි කරන්න කියලා ඔබතුමන්ලා ඉල්ලීමක් කර තිබෙනවාය කියලා අපට අහන්න, දකින්න ලැබෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් අහන්නේ, බාල ගල් අඟුරු ගෙන ඒම නිසා බලශක්ති අමාත්‍යාංශයට, නැත්නම් නොරොච්චෝලේ විදුලි බලාගාරයට එල්ල වුණු බලපෑම, ඒ අලාභය ආවරණය කර ගන්න හදන්නේ ජනතාව මත බර පටවලාද, නැත්නම් බැංකු ණය ආධාරයෙන්ද කියලා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු ජනාධිපතිතුමාත් පැහැදිලි කළා වාගේ ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු භාවිතාව නිසා ඇති වන පාඩුව කිසි ලෙසකින්වත් අපි ජනතාව මත, ඒ කියන්නේ විදුලි පාරිභෝගිකයා මත පටවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ වාගේම අපට එයින් කොටසක් අනිවාර්යයෙන්ම අයකර ගන්න පුළුවන්. අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළම තිබෙනවා, අදාළ ආයතනයෙන් අය කරගන්න ඕනෑ කොහොමද කියන කරුණු. ඒ අනුව අපි කටයුතු කරනවා. එහෙම නැතිව අපි කිසිසේත්ම විදුලි පාරිභෝගිකයා මත මේ බර පටවන්නේ නැහැ. ඒක අපි වාර කීපයකදීම සහතික කරලා කියා තිබෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒක පියවන්න ණය ගන්න යනවාද, නැත්නම් කොහොමද කරන්නේ කියන එකට උත්තරයක් හම්බ වුණේ නැහැ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අපි බැංකු ණය හරහා යන්න බලාපොරොත්තු වෙන්නේත් නැහැ. ඒ වාගේම ජනතාව මත පටවන්න බලාපොරොත්තු වෙන්නේත් නැහැ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒක "පැලවත්තෙන්" ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියන එක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ජනතාව මත පටවන්නේත් නැත්නම්, බැංකුවලින් ණය ගන්නේත් නැත්නම් කොහෙන්ද ඒක පියවා ගන්නේ කියන එක ගැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට පැලවත්තෙන් තමයි ගල් අඟුරු වංචාවෙන් වාගේ දේවලින් වෙච්ච පාඩුව ගේන්න වෙන්නේ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද මේ වාගේම තවත් දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කළා. ඔබතුමන්ලා වෘත්තීය සමිති වෙනුවෙන් පෙනී සිටි කණ්ඩායමක්. විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරනකොට ඔබතුමන්ලාගේ නගරාධිපතිතුමෙක් දූරකථනයෙන් කියනවා අපි දැක්කා, "අපි ලක්ෂයක් මරලා හරි මේක ආරක්ෂා කරගන්නවා" කියලා. අද අපට යම් යම් දේවල් පේනවා. දැන් රාජ්‍ය සේවක මහත්වරු සියදිවි නසා ගත්තාය කියනවා. ඒක සැකයට තුඩු දෙනවා, එහෙම කපාගෙන මැරෙන්න

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පුළුවන්ද කියලා. මේ වාගේ තත්ත්වයක් තුළ සේවකයන් මැරෙන්න යනවා. ඔබතුමන්ලා කියපු කාරණාත් එක්ක මේවා ගැළපෙනවා. ප්‍රතිව්‍යුහගතකරණය ගැන ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතිවලින් දීපු පොරොන්දු විශ්වාස කරලා විශාල පිරිසක් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගත්තා. නැත්නම් අයින් වුණා. නමුත් අද වෙනකොට ඒ අයට වන්දි ලබා දීම සිද්ධ වෙලා නැහැ. ඒ අයට වන්දි ලබා දීමට, ඒ අය බලාපොරොත්තු වෙච්ච මුදල් ටික ලබා දීමට ඔබතුමන්ලාට හැකියාව තිබෙනවාද, ඒක කවදාද කරන්නේ, ඒකටත් ඔබතුමන්ලාට බැංකුවල සරණ පතන්නද වෙන්නේ කියලායි මට දැනගන්න ඕනෑකම තිබෙන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, අහලා තිබෙන ප්‍රශ්නයේ මූලික හරය තිබෙන්නේ විදුලිබල මණ්ඩලයේ, *[බාධා කිරීමක්]* එතුමා මට පිළිතුර ලබාදෙන්න අවස්ථාව ලබා දෙනවා නම් හොඳයි. මේ ප්‍රශ්නයේ මූලිකවම ඇතුළත් තිබෙන්නේ විදුලිබල මණ්ඩලය විසින් ලබාගෙන තිබෙන බැංකු ණය පිළිබඳවයි. ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය සෘජුවම ඒකට අදාළ නොවුණත්, ඒ විශ්‍රාම ගිය අයට සාධාරණයක් ඉෂ්ට වෙන්න මම පිළිතුරක් දෙන්නම්. අපි බලාපොරොත්තු වෙනවා කොටස් දෙකක් හැටියට ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය ඒ අයට වන්දි ලබා දෙන්න. අපි බලාපොරොත්තු වෙනවා එහි කොටසක් - සියයට 50ක් - මහා භාණ්ඩාගාරයේ අරමුදල්වලින් ලබා දෙන්න. ඒ සඳහා වන කැබිනට් පත්‍රිකාව අපි දැනටමත් කැබිනට් එකට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ලබන සතිය වෙනකොට අපට ඒ කැබිනට් අනුමැතිය ලැබෙයි කියලා. ඒ අනුව මේ මාසයේ 15වැනි දා වෙනකොට පළමුවැනි සියයට 50 ඒ විශ්‍රාම ගිය අයට ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම, ඉතිරි සියයට 50 ඉතාම කෙටි කාලයක් තුළ ලබා දීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා.

## 2025.02.09 දින රට පුරා විදුලි බලය ඇනහිටීම විමර්ශනය කරන ලද කමිටු: අනාවරණ වූ කරුණු
## 09.02.2025 அன்று ஏற்பட்ட நாடு தழுவிய மின்சாரத் தடை குறித்து விசாரணை நடத்திய குழுக்கள்: வெளிக்கொணரப்பட்ட விடயங்கள்
## COMMITTEES INVESTIGATED INTO NATIONWIDE POWER FAILURE ON 09.02.2025: FINDINGS

642/2025

**6. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025.02.09 දින මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි විදුලිය ඇනහිටීමක් සිදු වූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශයෙන් සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් පත් කරන ලද කමිටු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් කමිටුවේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කමිටු වාර්තා මඟින් අනාවරණ වූ කරුණු කවරේද;

(v) එම විදුලිය ඇනහිටීමට සෘජුව වගකිව යුතු නිලධාරින්ගේ නම් හා තනතුරු නාම කවරේද;

(vi) ඉහත කමිටු වාර්තා මඟින් අනාවරණ වූ කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025.02.09ஆம் திகதி இலங்கை முழுவதுமாக மின் தடை ஏற்பட்டமையை அறிவாரா என்பதையும்;

(ii) அது தொடர்பாக விசாரணைகளை மேற்கொள்வதற்கு வலுசக்தி அமைச்சாலும் இலங்கை மின்சார சபையாலும் நியமிக்கப்பட்ட குழுக்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு குழுவினதும் அங்கத்தவர்களின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) மேற்படி குழுக்களின் அறிக்கைகள் மூலமாக வெளிக்கொணரப்பட்டுள்ள விடயங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி மின்சாரத் தடைக்கு நேரடியாகப் பொறுப்புக்கூற வேண்டிய அலுவலர்களின் பெயர்கள் மற்றும் பதவிப் பெயர்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி குழுக்களின் அறிக்கைகள் மூலமாக வெளிக்கொணரப்பட்டுள்ள விடயங்கள் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that a nationwide power failure occurred in Sri Lanka on 09.02.2025;

(ii) the number of committees appointed by the Ministry of Energy and the Ceylon Electricity Board to investigate causes of the power failure, separately;

(iii) the names of the members of each of those committees, separately;

(iv) the facts revealed by the reports of the committees through their findings;

(v) the names and designations of the officials directly responsible for the power failure; and

(vi) the actions that will be taken in relation to the findings of the committee reports?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) බලශක්ති අමාත්‍යාංශය විසින් එක් කමිටුවක් ද, එවකට පැවැති ලංකා විදුලිබල මණ්ඩලය විසින් එක් කමිටුවක් වශයෙන් කමිටු 02ක් පත් කර තිබේ.

(iii) බලශක්ති අමාත්‍යාංශය පත් කළ කමිටුවේ සාමාජිකයන්:

- මහාචාර්ය ලිලන්ත සමරනායක - සභාපති - විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ඉංජිනේරු නාලක විජේකෝන්, අතිරේක සාමාන්‍යාධිකාරි (ජනන) - ලංකා විදුලිබල මණ්ඩලය
- ඉංජිනේරු බුද්ධික සමරසේකර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය) - ලංකා විදුලිබල මණ්ඩලය
- ඉංජිනේරු රුවන් වීරතුංග, ප්‍රධාන ඉංජිනේරු (පද්ධති මෙහෙයුම්) - ලංකා විදුලිබල මණ්ඩලය
- ඉංජිනේරු දුලාන් ලක්ෂිත (ව්‍යාපෘති කළමනාකරු) -ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලය පත් කළ කමිටුවේ සාමාජිකයන්:

- ඉංජිනේරු එස්. අලගොඩ, අතිරේක සාමාන්‍යාධිකාරි (බෙදාහැරීම් කලාප 1) - සභාපති
- ඉංජිනේරු ඩී.එස්.ආර්. අලහකෝන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ආයතනික සබඳතා)
- ඉංජිනේරු ඒ.ජේ.ඉසෙඩ්.වික්‍රමරත්න, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම් හා නඩත්තු-උතුර)
- ඉංජිනේරු ආචාර්ය එච්.එම්. විජේකෝන් බණ්ඩා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්)
- ඉංජිනේරු පී.පී.සී. දිසානායක, ප්‍රධාන ඉංජිනේරු (වත්කම් කළමනාකරණ තාප විදුලි)
- ඉංජිනේරු එස්.ඒ.පී.සී. සිරිවර්ධන, ප්‍රධාන ඉංජිනේරු (මෙහෙයුම්, කොළඹ නගරය)
- ඉංජිනේරු ඒ.යූ.එස්. රණතුංග, ප්‍රධාන ඉංජිනේරු (සම්ප්‍රේෂණ ග්‍රිඩ් සැලසුම්)
- ඉංජිනේරු ජී.ආර්.එච්.යූ. සෝමප්‍රිය, ප්‍රධාන ඉංජිනේරු (ආරක්ෂණ සංවර්ධන)

(iv) බලශක්ති අමාත්‍යාංශයෙන් පත් කළ කමිටුව මඟින් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. එම සම්පූර්ණ වාර්තාව ඇමුණුම 01 හැටියට මම ඉදිරිපත් කරනවා. මම එහි සාරාංශයක් ඉදිරිපත් කරන්නම්. එහි පහත සඳහන් නිර්දේශ දක්වා තිබෙනවා.

i. පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය සහ පද්ධති ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් වර්තමාන භ්‍රමණ සංචිත - spinning reserves -මාර්ගෝපදේශය/නිර්ණායකය සමාලෝචනය කිරීම.

ii. වර්තමාන සන්දර්භය තුළ පෝෂකවලට එකතු කරන ලද කාවැද්දූ උත්පාදනය සලකා බැලීමෙන්, දැනට පවතින සියලු සංඛ්‍යාත බර අඩු කිරීමේ - UFLS - නිර්ණායක සම්පූර්ණයෙන්ම සමාලෝචනය කළ යුතුය.

iii. හැකි සෑම තැනකම සමමුහුර්ත කන්ඩෙන්සර් - synchronous condenser - ආකාරයෙන් ජල හා තාප බලාගාර ක්‍රියාත්මක කිරීම.

iv. බලශක්ති ගබඩා පද්ධති ක්‍රියාත්මක කිරීම.

v. කොළඹ නගරය තුළ විදුලිය විසන්ධි කිරීමේ ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රමයක් - blackout restoration scheme - වහාම ක්‍රියාත්මක කිරීම.

vi. ලක්විජය බලාගාරය තුළ ආරක්ෂිතව ක්‍රියාවිරහිත කිරීමේ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කිරීම.

vii. පද්ධති ස්ථායිතාව ආරක්ෂා කිරීම සඳහා සියලු බල ප්‍රභව කළමනාකරණය කිරීම.

viii. ස්මාට් මීටර සඳහා අතිරේක ක්‍රියාකාරීත්වයක් හඳුන්වා දීම.

ix. බැටරි බලශක්ති ගබඩා පද්ධති සමඟින් ගෘහස්ථ වහල මත සූර්ය බලශක්ති ස්ථාපනය ප්‍රවර්ධනය කිරීම.

x. ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ සඳහා තීරුබදු දිරිගැන්වීම් - tariff incentives - ආරම්භ කිරීම.

xi. තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් බැටරි බලශක්ති ගබඩා පද්ධති ක්‍රියාත්මක කිරීම.

xii. සම්පත් පුරෝකථන පද්ධතියක් සහිත පුනර්ජනනීය බලශක්ති Desks ස්ථාපිත කිරීම.

**ලංකා විදුලිබල මණ්ඩලය පත් කළ කමිටුව**

කමිටු වාර්තාවේ පරිච්ඡේද 3, 4, 5, 6 හා 7 යටතේ කමිටුව මඟින් අනාවරණ කර ගත් කරුණු සවිස්තරාත්මකව සඳහන් කර ඇත. වාර්තාවේ ඉහත පරිච්ඡේද ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

(v) ඉහත කමිටු වාර්තා දෙකෙහිම සෘජු වග කිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් සඳහන් වී නොමැත.

(vi) බලශක්ති අමාත්‍යාංශය පත් කළ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත දන්වා ඇති අතර, ඒ සඳහා 4දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කොට ඇත.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

<u>ලංකා විදුලිබල මණ්ඩලය පත් කළ කමිටුවේ නිර්දේශ</u>

ඉහත කමිටු වාර්තාවේ නිර්දේශ 24ක් පමණ සඳහන් වන අතර, ඒවායෙන් පහත නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

- ආරක්ෂණ පරාමිතීන් - protection settings - යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරන ලදී.
- පද්ධති පාලන මධ්‍යස්ථානය මඟින් පුනර්ජනනීය බලාගාර නිරීක්ෂණය හා පාලනය සඳහා වන RE Desk පද්ධතිය ප්‍රසම්පාදන අදියරේ පවතී.
- පද්ධති පාලන මධ්‍යස්ථානය මඟින් පුනර්ජනනීය විදුලි උත්පාදනය පුරෝකථනය කිරීමේ මෘදුකාංග පද්ධතිය මේ වන විට මිලදී අරගෙන ක්‍රියාත්මක කර ඇත.
- බැටරි බලශක්ති ගබඩා පද්ධති - BESS - ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.
- නව හබරණ ග්‍රිඩ් උපපොළේ synchronous condenser යෙදවීම සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සැපයීම තහවුරු කරන ලදී. ඒ කටයුතු කරගෙන යෑම සඳහා කටයුතු ආරම්භ කර තිබෙනවා.
- සම්ප්‍රේෂණ පද්ධතිය වැඩිදියුණු කිරීමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.
- විදුලි ඉල්ලුම අඩු ඉරිදා සහ නිවාඩු දින සඳහා පද්ධති පාලන මධ්‍යස්ථානය මඟින් විශේෂ මෙහෙයුම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- හඳුනා ගත් සම්ප්‍රදායික ජනන යන්ත්‍ර පද්ධති අවස්ථිතිය - system inertia - වැඩි කිරීම සඳහා synchronous modeහි ක්‍රියාත්මක වේ.
- සොබාදනවි බලාගාරය යොදාගෙන කොළඹ නගරයේ විදුලි ප්‍රතිස්ථාපනය අත්හදා බලන ලදී.
- අතිරේක පද්ධති පාලන මධ්‍යස්ථානය - Backup System Control Centre - ඇති කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

කමිටු වාර්තාවේ ඉතිරි නිර්දේශද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මම ඔබතුමාට සුබ පතනවා. අපේ හිටපු ඇමතිතුමාට අත්වෙච්ච ඉරණම ඔබතුමාට අත්නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, නොරොච්චෝලේ බලාගාරයෙන් අපේ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 810ක් එකතු කරන්න අපට හැකියාව ලැබුණා. දැන් මේ බාල ගල් අඟුරු හේතුවෙන් මාර්තු මාසයේ එය මෙගාවොට් 630කට, 690කට පහළ වැටුණු බව අපි කවුරුත් දන්නවා. ඒ බාල ගල් අඟුරු නිසා අපට ඩීසල්වලින් විදුලිය නිෂ්පාදනය කරන්න සිදු වුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, ඩීසල්වලින් විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 80ක් වැය වෙනවා. ගල් අඟුරුවලින් විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යන්නේ රුපියල් 23යි. නමුත් දැන් මේ වෙනකොට විදුලිය නිෂ්පාදනය කරන්න ඉන්ධන විශාල ප්‍රමාණයක් වැය වෙනවා. ඒ අනුව මේ වෙනකොට ඩීසල්වලින් විදුලිය නිෂ්පාදනය කරන්න කොච්චර මුදලක් වැය කරලා තිබෙනවාද කියලා ඔබතුමාට පැහැදිලිව කියන්න පුළුවන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මුල් ප්‍රශ්නයට ඍජුවම අදාළ නොවුණත් මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. ඇත්තටම මෙතැන තිබෙන මිථ්‍යා මතයක් තමයි ගල් අඟුරුවල ප්‍රමිතිය බාල වීම නිසා කරන අතිරේක විදුලි ජනනය සම්පූර්ණයෙන්ම ඩීසල්වලින් කරනවාය කියන එක. ඒක වැරදියි. ඒ වාගේම තමයි මේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අවසන් කරන්නේ නැතුව ඒ සඳහා ගිය අතිරේක පිරිවැය කොච්චරද කියන එක සම්පූර්ණයෙන් ගණනය කරන්න බැහැ. මොකද, එක් එක් shipment එකේ, එක් එක් ප්‍රමිතීන්වලට අදාළ ජනන ප්‍රමාණය වෙනස්. ඒ නිසා ක්‍රියාවලිය සම්පූර්ණ කරන්නේ නැතුව වැය වෙච්ච සම්පූර්ණ මුදල අපට කියන්න බැහැ. ඒ වාගේම මම කලිනුත් සඳහන් කළා වාගේ මේ සම්පූර්ණ අතිරේක ජනනය සිදු කරන්නේ ඩීසල්වලින් කියලා කවුරු හරි උපකල්පනය කරනවා නම්, ඒක එහෙම නොවෙයි. දහවල් කාලයේදී අපි සූර්ය බලය ඇතුළු අනෙකුත් ජනන ප්‍රභවයන්ගෙන් විදුලිය නිපදවනවා. රාත්‍රී කාලයේදී අවශ්‍යතාව සඳහා ජලය ඇතුළු අනෙකුත් ප්‍රභව පාවිච්චි කරලා විදුලිය නිපදවනවා. අත්‍යවශ්‍ය මොහොතකදී විතරයි අපි ඩීසල්වලට යන්නේ. ඒ නිසා මේ ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසුව විතරයි අපට නිශ්චිතව ප්‍රමාණය සඳහන් කරන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා අපට තවත් කාලයක් යයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා අහනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ சபாநாயகர் அவர்களே, எங்களுடைய தமிழ் மக்களின் இதயத்தைக் கவர்ந்தவரும், முதன்முதலாகத் தமிழ் நாட்டின் முதலமைச்சர் பதவிக்குத் தெரிவாகியிருப்பவருமான விஜய் அவர்களுக்கு, அடக்கப்பட்ட ஓர் இலங்கைத் தமிழனின் குரலாக எனது பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

முக்கியமாக நான் இங்கு கதைக்க வேண்டிய ஒரு விடயம் மின்சாரத் தடை பற்றியது. அதாவது, வடக்கு மாகாணத்தின் தீவுப் பகுதிகளில் மின்சாரம் முறையாக வழங்கப்படுவதில்லை என்பது மிகப் பெரியதொரு குற்றச்சாட்டு! அண்மைய தினங்களில் நான் நெடுந்தீவுக்கு - Delft - பயணித்தபோது, அங்கேயுள்ள அரைவாசி மக்களுக்கு மின்சாரம் முறையாக வழங்கப்படுவதில்லை என்பதை அறிய முடிந்தது. ஒரு கிழமையின் 7 நாட்களில் கிட்டத்தட்ட 5 நாட்கள் அப்பகுதி மக்களுக்கு மின்சாரம் வழங்கப்படுவதில்லை. கச்சதீவை விஜய்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

கேட்டிருக்கின்ற நிலையில், உங்களுடைய ஜனாதிபதி அதனைத் தர முடியாது என்று சொல்லியிருக்கின்றார். நாங்கள் சொல்லுகிறோம், கச்சதீவை மட்டுமில்லை, முழு யாழ்ப்பாணத்தையுமே தமிழகத்துக்குக் கொடுங்கள்; தமிழக மக்கள் எங்களைப் பாதுகாப்பார்கள் என்று. ஆகவே, எப்போது எங்களுடைய தீவுப் பகுதிகளுக்கு மின்சாரம் வழங்கப்படும்?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, වෙනත් ප්‍රශ්න අහන්නේ නැතිව මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

அகனவා, அகனவා. எப்போது எங்களுடைய தீவுப் பகுதிகளுக்கு மின்சாரம் வழங்கப்படும் என்பதுதான் எனது கேள்வி.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මුලින් සඳහන් කරපු කාරණා මේකට අදාළ වෙන්නේ නැහැ. නමුත්, ලංකාවේම සමස්ත ප්‍රදේශ ආවරණය කිරීම සඳහා එක් එක් තැන්වලට අපට සැලැස්මක් තිබෙනවා. විශේෂයෙන් දූපත් ආශ්‍රිතව සහ අනෙකුත් ප්‍රදේශවලට විදුලි සම්බන්ධතා ලබා දීම සඳහා අවශ්‍ය වන සමහර යටිතල පහසුකම් අපි මේ වෙනකොට සැලසුම් කරලා ක්‍රියාත්මක කරමින් පවතිනවා. එම ක්‍රියාත්මක කිරීම් අවසන් වනකොට තමයි අපට ඒ පිළිබඳව කියන්න වෙන්නේ. ඔබතුමා නිශ්චිත දිනයක් සඳහන් කළොත්, 'මෙන්න, මේ දවස' කියලා, අපට එහෙම කියන්න බැහැ. අපේ තිබෙන මූල්‍ය ශක්තිය මත එයට අදාළ යටිතල පහසුකම් සම්පූර්ණ කරලා, දූපත් විතරක් නොවෙයි සමස්ත දිවයිනම ආවරණය කරන්න බලාපොරොත්තු වෙනවා.

## වර්තමාන කථානායකවරයාගේ නිල නිවස සහ පෞද්ගලික කාර්ය මණ්ඩලය: විස්තර
### தற்போதைய சபாநாயகரின் உத்தியோகபூர்வ இல்லம் மற்றும் தனிப்பட்ட பணியாட்டொகுதி: விபரம்
### OFFICIAL RESIDENCE AND PERSONAL STAFF OF PRESENT SPEAKER: DETAILS

1176/2025

**7. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්තමාන කථානායකවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ නිල නාමයන් සහ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කථානායකවරයාගේ නිල නිවස ලෙස 'කථානායක නිල නිවස' භාවිත කරන්නේද;

(iii) එකී නිල නිවස සඳහා කථානායකවරයා විසින් පත් කරගෙන තිබෙන සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කථානායකවරයාගේ සහ කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා ලබාදී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල අංක, වර්ගය සහ මාසික ඉන්ධන කෝටාවන් වාහන අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වාහන සඳහා ඉන්ධන සපයා ගනු ලබන්නේ කෙසේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) කොළඹ 04, ලෝරිස් පටුමගෙහි පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අයත් මහල් නිවාස සංකීර්ණයෙහි කථානායකවරයා විසින් නිවසක් භාවිත කර තිබේද;

(ii) මේ වනවිටත් එම නිවස භාවිත කරන්නේද;

(iii) එම නිවසේ කුලිය, විදුලි බිල්පත් සහ ජල බිල්පත් සඳහා ගෙවීම් සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்போதைய சபாநாயகரின் தனிப்பட்ட பணியாட்டொகுதியின் ஊழியர்களின் எண்ணிக்கை, அவர்களின் பதவிப் பெயர்கள் மற்றும் கல்வித் தகைமைகள் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) சபாநாயகரின் உத்தியோகபூர்வ இல்லமாக 'சபாநாயகர் உத்தியோகபூர்வ இல்லம்' பயன்படுத்தப்படுகின்றதா என்பதையும்;

(iii) அந்த உத்தியோகபூர்வ இல்லத்துக்கு சபாநாயகரால் நியமிக்கப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள், பதவிகள் மற்றும் கல்வித் தகைமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சபாநாயகர் மற்றும் அவரது ஊழியர்களின் பயன்பாட்டுக்காக வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அந்த வாகனங்களின் இலக்கங்கள், வகைகள் மற்றும் மாதாந்த எரிபொருள் கோட்டா வாகனங்களுக்கு ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அந்த வாகனங்களுக்கு எரிபொருள் எவ்வாறு பெற்றுக்கொள்ளப்படுகிறது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) கொழும்பு 04, லோரிஸ் ஒழுங்கையில் அமைந்துள்ள பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுக்குச் சொந்தமான அடுக்குமாடி குடியிருப்பு வளாகத்தில் சபாநாயகரால் ஒரு வீடு பயன்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வீடு தற்போதும் பயன்படுத்தப்பட்டு வருகின்றதா என்பதையும்;

(iii) அவ்வீட்டின் வாடகை, நீர் மற்றும் மின் பட்டியலுக்கான செலுத்துகைகள் யாரால் செய்யப்படுகின்றது என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) separately, the number of employees on the personal staff of the present Speaker, their official designations and their educational qualifications;

(ii) whether the "Speaker's Residence" is used as the official residence of the Speaker; and

(iii) the number of employees appointed by the Speaker to the aforesaid official residence, their names, positions and educational qualifications?

(b) Will she also inform this House -

(i) the number of vehicles provided for the use of the Speaker and his staff;

(ii) separately, as per each aforesaid vehicle, the registration number, the model and the monthly fuel quota; and

(iii) the procedure by which the fuel is procured for the aforementioned vehicles?

(c) Will she further inform this House -

(i) whether the Speaker has used an apartment within the apartment complex belonging to the Ministry of Public Administration, Provincial Councils and Local Government located at the Lauries Lane, Colombo 04;

(ii) whether the aforesaid house is still being used; and

(iii) the responsible parties for the payment of rent, electricity and water bills of the aforesaid house?

(d) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්තමාන කථානායකවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 12ක් වන අතර, අනුමත සේවක සංඛ්‍යාව 20කි. අදාළ තොරතුරු ඇමුණුම 01හි දක්වා ඇත.

ඇමුණුම 01

| තනතුර/ සංඛ්‍යාව | දැනට තනතුර දරන පුද්ගල නාමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| පෞද්ගලික ලේකම් (01) | චමිර ප්‍රියශංක ගාල්ලගේ මහතා | • දේශපාලන හා ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>• ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය)<br>• ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය<br>• රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (දැනට හදාරමින් සිටියි)<br>• ආචාර්ය උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය (දැනට හදාරමින් සිටියි) |
| සම්බන්ධීකරණ ලේකම් (02) | ඒ.එච්.එම්.ජේ.එම් . අතපත්තු මහතා | • ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය, කැළණිය විශ්වවිද්‍යාලය<br>• පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය, කැළණිය විශ්වවිද්‍යාලය |
| | ඩබ්ලිව්.එම්.ඩී.බී. උඩුගොඩ මහතා | • විද්‍යාවේදී(මැනුම් විද්‍යා) උපාධිය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| මහජන සම්බන්ධතා නිලධාරි (01) | ඒ.ඒ. රාජේන්ද්‍රම් මිය | • ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (මැඩ්‍රාස් විශ්වවිද්‍යාලය) |
| | ජී.ඩී.කෞෂල්‍යා මෙනෙවිය | • වාණිජවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (දැනට හදාරමින් සිටියි) |
| කළමනාකරණ සහකාර (03) | යූ.අයි. අබේසූරිය මහතා | • තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (ICBT)<br>• පරිගණක හා මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව, කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය<br>• මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය (දැනට හදාරමින් සිටියි) |
| | ඩබ්ලිව්.ඩී.එම්. කේ. නන්දසේන මෙනෙවිය | • ප්‍රතිබිම්භ කලා ශ්‍රාස්තවේදී (ගෞරව) උපාධිය, කැළණිය විශ්වවිද්‍යාලය<br>• ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය (දැනට හදාරමින් සිටියි) |
| රියැදුරු (05) | ඩී.එම්.පී. සුරංග මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හා වලංගු රියැදුරු බලපත්‍රයක් සහිතය. |
| | ටී.පී.ආර්.එස්.එන් . කුමාරසිංහ මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හා වලංගු රියැදුරු බලපත්‍රයක් සහිතය. |
| | ඩබ්ලිව්.ඩී.පී. පියමන්ත මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හා වලංගු රියැදුරු බලපත්‍රයක් සහිතය. |
| | වයි.ජී.ඩී. සුසන්ත මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හා වලංගු රියැදුරු බලපත්‍රයක් සහිතය. |
| | එච්.එල්.අයි. උදයංග මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හා වලංගු රියැදුරු බලපත්‍රයක් සහිතය. |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(ii) වර්තමාන කථානායක ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා කථානායක ධුරයට පත්වීමෙන් පසු, එනම් 2024.12.17 දින සිට මේ දක්වා කථානායකවරයාගේ නිල නිවස ලෙස "කථානායක නිල නිවස" ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා භාවිත කරනු නොලබයි.

(iii) එකී නිල නිල නිවස සඳහා පත් කර තිබෙන සේවක සංඛ්‍යාව අටක් වන අතර, අනුමත සේවක සංඛ්‍යාව පහළොවකි. ඔවුන්ගේ නම් හා තනතුරු ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම 02

| තනතුර/ සංඛ්‍යාව | දැනට තනතුර දරන පුද්ගල නාමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| උද්‍යාන අධීක්ෂ (01) | කේ. ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් |
| උද්‍යාන නඩත්තු සහායක (02) | එච්.එම්.එෆ්. අරුණ කමල්රාජ් මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් |
| | ජේ. රම්‍යලාල් හෙට්ටිගොඩ මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් |
| | එම්.එස්.ප්‍රියංජන කුරේ මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් |
| කාමර සේවක (03) | එන්.ඒ.ඩබ්ලිව්. ප්‍රදීප් බන්දුල මහතා | අ.පො.ස. උසස් පෙළ සමත් |
| | එස්.කේ. සිරිසේන මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් |
| සනීපාරක්ෂක කම්කරු (01) | බී.එස්. මංගලසිරි පෙරේරා මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් |
| උද්‍යාන නඩත්තු සහායක (දෛනික ගෙවීම්) (01) | එස්. සමින්ද සොයිසා මහතා | අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා |

(ආ) (i) වාහන සංඛ්‍යාව 07කි. (2026.03.31 දිනට)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම වාහනවල විස්තර අහලා තිබෙනවා. ඒ විස්තර ටික තිබෙනවා. එම වාහනවල number plates කියන්නත් ඕනෑද? මම වාහනවල විස්තර කියන්නම්. Number plates ඉල්ලලා තිබුණු නිසායි මම මේ නැවත අහන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු අගමැතිතුමියනි, මම කිසිම වෙලාවක number plates ඉල්ලලා නැහැ. වාහනවල අංක ඉල්ලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Okay.

මම වාහන 7හි විස්තර කියන්නම්.

(ii) ගරු කථානායකතුමා භාවිත කරන්නේ වාහන 02යි. ඒ, Mitsubishi car එකක් සහ BMW car එකක්. Mitsubishi එක පෙට්‍රල්. BMW එක ඩීසල්.

මෙතෙක් කල් හිටපු සියලුම කථානායකවරුන්ට අසීමිත විධියට ඉන්ධන allowance එකක් තිබුණා. නමුත් මෙතුමා ඒක සීමා කරලා තිබෙනවා. අමාත්‍යවරයෙකුට අදාළ වන fuel allowance එකක් තමයි එතුමා ලබා ගන්නේ; ලීටර් 900ක්. ඒ සියලු විස්තර ඇමුණුම 03 මඟින් දක්වා තිබෙනවා.

ඇමුණුම 03

| අනු අංකය | වාහන අංකය | පන්තිය | වර්ගය | ඉන්ධන වර්ගය | මාසික ඉන්ධන කෝටාව (ලීටර්) | වාහනය අනුයුක්ත කර ඇති නිලධාරියාගේ තනතුර |
|---|---|---|---|---|---|---|
| 01 | CBI-5198 | Motor Car | Mitsubishi | පෙට්‍රල් | පෙර දී අසීමිතව ලබා දුන් මාසික ඉන්ධන ලීටර් ප්‍රමාණය, 2025.03.21 දිනැති පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභා තීරණ අනුව මසකට ඉන්ධන ලීටර් 900ක් ලෙස සංශෝධනය කරන ලදී. | ගරු කථානායකතුමා |
| 02 | KV-0281 | Motor Car | BMW | ඩීසල් | | ගරු කථානායකතුමා |
| 03 | NC-4923 | Motor Coach | Toyota | ඩීසල් | - | ගරු කථානායකතුමාගේ මාධ්‍ය අංශය |
| 04 | CAN-8753 | Motor Car | Nissan | පෙට්‍රල් | 235 | ගරු කථානායකතුමාගේ පෞද්ගලික ලේකම් |
| 05 | PG-9766 | Dual Purpose | Mitsubishi | ඩීසල් | 213 | ගරු කථානායකතුමාගේ සම්බන්ධීකරණ ලේකම් I |
| 06 | PE-1446 | Dual Purpose | Toyota | ඩීසල් | 213 | ගරු කථානායකතුමාගේ සම්බන්ධීකරණ ලේකම් II |
| 07 | KR-1102 | Motor Car | Toyota | පෙට්‍රල් | 213 | ගරු කථානායකතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි |

(iii) ඉහත වාහන සඳහා පාර්ලිමේන්තුව මඟින් ඉන්ධන දීමනාව පමණක් ගෙවීමට කටයුතු කර ඇත.

(ඇ) (i) ඔව්.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක HD/H/GQ/LO/8-1(ii) හා 2025.03.26 දිනැති ලිපිය මඟින් 2025.01.08වැනි දින සිට ගරු කථානායකවරයා ලෙස ධුරය දරන කාල සීමාව සඳහා පමණක් පදිංචිය සඳහා කොළඹ 04, ලෝරිස් පටුමග, අංක 8 -1 දරන රජයේ නිල නිවාසය ගරු කථානායකවරයා වෙත වෙන් කර ඇත.

(ii) ඔව්.

(iii) නිවසේ කුලිය වශයෙන් නිවාසලාභියා වන ගරු කථානායකවරයාගේ මාසික දීමනාවෙන් සියයට 12.5ක් මාසිකව අය කර එය රජයේ ආදායමට බැර කරනු ලබන අතර, එම නිවසෙහි විදුලි බිල්පත් සහ ජල බිල්පත්ද නිවාසලාභියා විසින් ගෙවනු ලබයි.

(ඈ) අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම ගරු අගමැතිතුමියගෙන් විමසන පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මේ නිල නිවස සලකන්නේ උපලේඛනගත නිල නිවසක් විධියටයි. ලංකාවේ ආයතන සංග්‍රහය අනුව උපලේඛනගත නිල නිවාස 03ක් තිබෙනවා. පළමුවෙනි එක ජනාධිපතිතුමාගේ නිල නිවස, දෙවැනි එක අග්‍රාමාත්‍යතුමියගේ නිල නිවස, තුන්වැනි එක කථානායකතුමාගේ නිල නිවස. කිසිම වෙලාවක පාර්ලිමේන්තුවේ තිබෙන කමිටුවකට බැහැ, ඒක වෙන කාටවත් පවරන්න. හැබැයි, දැන් ඒක කරලා තිබෙනවා කියලා නේ, කියන්නේ. මුල් කාලයේ කථානායකතුමා සම්පූර්ණයෙන්ම ඒ නිල නිවස පාවිච්චි කළා, එතුමාගේ රැස්වීම්වලට. මා ළඟ තොරතුරු තිබෙනවා, ඕනෑ නම් ඉදිරිපත් කරන්න පුළුවන්, දින වකවානුත් එක්ක.

දෙවැනි කාරණය තමයි, මේ නිල නිවසේ කථානායකවරයා පදිංචි වෙලා නැත්නම්, එතුමා කොහොමද ඒ නිල නිවස සඳහා අටදෙනෙකුට පත්වීම් දුන්නේ කියන එක. ඒ නිල නිවස සඳහා අටදෙනෙකුට පත්වීම් දීලා තිබෙනවා; සේවකයින් අටක් ඉන්නවා. එක්කෙනෙක් කලින් හිටියා. හත්දෙනෙකුට අලුතෙන් පත්වීම් දීලා තිබෙනවා. කථානායකතුමා නිල නිවසේ නැත්නම් හත්දෙනෙකුට පත්වීම් දුන්නේ ඇයි, එතුමාගේ නමින්? එහෙම කරන්න අයිතියක් තිබෙන්න විධියක් නැහැ. මොකද, ඒක එතුමාගේ නිල නිවසක් නොවෙයි. ඒ නිසා මම අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ඔබතුමියලා ගන්න පියවර මොකක්ද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඔබතුමා සඳහන් කළ පරිදි නිල නිවාස 03ක් තිබෙනවා, අදාළ තනතුරුවලට අයත් වන. ඒවා කවුරුවත් පෞද්ගලික පරිහරණයට යොදාගන්නේ නැහැ, මේ අවස්ථාවේ. නමුත්, නිල වශයෙන් රජයට අවශ්‍ය වන වෙලාවට ඒ නිල නිවාස පාවිච්චි කර තිබෙනවා, රැස්වීම්වලට. උදාහරණයක් හැටියට ඊයේ මාලදිවයිනේ ජනාධිපතිවරයාගේ රාත්‍රී භෝජන සංග්‍රහය තිබුණේ ජනාධිපති නිල නිවසේයි. ඒ විධියට අරලියගහ මන්දිරයත් පාවිච්චි කරනවා. කථානායකතුමාගේ නිල උත්සවවලට, වැඩසටහන්වලට එතුමාත් නිල නිවස පාවිච්චි කරනවා. ඒ අනුව ඒ නිල නිවාසයේ එතුමා හිටියේ නැති වුණත්, maintenance කරමින් ඒක පවත්වාගෙන යනවා. ඔබතුමා දන්නා පරිදි ඒක විශාල මන්දිරයක්, විශාල ground එකකුත් තිබෙනවා. ඒක නඩත්තුව සඳහා කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යනවා. මම කිව්ව පරිදි ඒ සඳහා අනුමත කර තිබෙන කාර්ය මණ්ඩලයට වඩා අඩු ප්‍රමාණයක maintenance staff එකක් පාවිච්චි කරලා තමයි ඒ කටයුතු කරගෙන යන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඒ කියන්නේ, කථානායක නිල නිවස පාවිච්චි වනවා, කථානායකතුමා ඒක වෙන කාටවත් බාර දීලා නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. දෙකක් තිබෙන්න විධියක් නැහැ නේ, ගරු අගමැතිතුමියනි. කථානායක නිල නිවස තිබෙන්නේ කථානායකවරයාට පාවිච්චි කරන්න පුළුවන් විධියට. ඒකේ එතුමා නිදාගන්නවාද, නැද්ද කියන එක අපට අදාළ නැහැ. ඒක විවිධ දේවලට පාවිච්චි කළා වුණත්, Parliamentary Staff Advisory Committee එකෙන් තීන්දුවක් ගත්තා කියලා එතුමා මීට කලින් කියා තිබෙනවා, කථානායක නිල නිවස එතුමා භාවිත කරන්නේ නැහැ කියලා. දැන් ඔබතුමිය කියනවා, විවිධ නිල කටයුතුවලට ඒක භාවිත කරනවා කියලා. එතකොට ඇත්තවශයෙන්ම කථානායක නිල නිවසත් තිබෙනවා. කථානායක නිල නිවසත් පාවිච්චි කරන ගමන්ම එතුමා Lauries Road එකේ තව නිල නිවසකුත් පාවිච්චි කරනවා.

ඊළඟ ප්‍රශ්නය තමයි, Lauries Road එකේ එතුමාගේ නිල නිවස තිබෙන නිවාස සංකීර්ණයේම තව නිල නිවසක් එතුමාගේ පෞද්ගලික ලේකම්වරයාටත් දීලා තිබෙන එක. ඒ නිවාස සංකීර්ණයේ පිහිටි ඒ අදාළ නිල නිවස සම්බන්ධව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නිකුත් කර ඇති ලිපි 2ක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

එම එක් ලිපියක මෙසේ සඳහන් වනවා:

"... 2025.06.06 දින සිට 2030.06.05 දින දක්වා හෝ ගරු කථානායකතුමාගේ පෞද්ගලික ලේකම් ධුරය දරන තෙක් යන දිනයන්ගෙන් පළමුව එළඹෙන දින අදාළ නිවස මෙම අමාත්‍යාංශය වෙත භාරදීමට යටත්ව සිදු කරනු ලබයි."

ඒක දීලා තිබෙන්නේ චමීර ප්‍රියශංක ගාල්ලගේ මහත්මයාට. අමාත්‍ය නිල නිවාස තමයි Lauries Road එකේ තිබෙන්නේ. මම නම් ලංකා ඉතිහාසයේ කවදාවත් කථානායකවරයෙකුගේ පෞද්ගලික ලේකම්වරයෙකුට අමාත්‍ය නිල නිවාසයක් ලබා දුන්නා කියලා දැකලා නැහැ.

කථානායකතුමාත් තව නිල නිවාසයක් අරගෙන තිබෙනවා, එක නිල නිවාසයක් පාවිච්චි කරන ගමන්. සේවකයෝ දාලා කථානායක නිල නිවස නඩත්තු කරන ගමන් එතුමා තව නිල නිවසක ඉන්නවා. එතකොට කථානායකතුමාට නිල නිවාස දෙකයි. එකක් නිදාගන්න පාවිච්චි කරන එක, අනෙක් එක රැස්වීම්වලට පාවිච්චි කරන එක. ඒ එක්කම, ඒ නිවාස සංකීර්ණයෙන්ම එතුමාගේ පෞද්ගලික ලේකම්ටත් නිවාසයක් අරගෙන දීලා තිබෙනවා. එහෙම කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒ නිසා කරුණාකරලා මේකට ඔබතුමන්ලා උත්තරයක් දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම මේක අහන්නේ ගරු අගමැතිතුමියගෙන්, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් නොවෙයි. එතුමියට බාධා කරන්න එපා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

නැහැ, නැහැ, කිසිම බාධාවක් නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමාට උත්තරය නේ ඕනෑ කරන්නේ. *[බාධා කිරීමක්]* අපි තීරණය කරන්නම්, කවුද උත්තරය සපයන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අග්‍රාමාත්‍යතුමියට අවසරය තිබෙනවා, උත්තරය ලබා දීමට වෙන කෙනෙකු nominate කරන්න වුණත්. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහන්න. අපි තීරණය කරන්නම්, කවුද උත්තරය දෙන්නේ කියලා. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා, - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

එහෙම කොහොමද කරන්නේ? *[බාධා කිරීමක්]* යමක් පැහැදිලි කරන්න ඕනෑ නම් එතුමාට ඒක කියන්න දෙන්න. ඔබතුමිය උත්තරය දෙන්න. මම ප්‍රශ්නය අහලා තිබෙන්නේ ඔබතුමියගෙන්, ගරු අගමැතිතුමියනි. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය පැහැදිලියි. හැබැයි, එතුමා ඒ ප්‍රශ්නය සහ උත්තරය විකෘති අන්දමින් සභාගත කරන්න උත්සාහ කළා. ඒකයි මම නැඟිට්ටේ. පළමුවෙනි කාරණය මෙයයි. අපි රජය හැටියට ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා, මේ නිල නිවාස අත්හැරීම සඳහා. ඒ අනුව අපි ඇමති නිල නිවාස අත්හැරියා. දැන් ඇමති නිල නිවාස කියලා එකක් නැහැ නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

හැබැයි, ඒ ඇමති නිල නිවාස ඊළඟ කටයුතු සඳහා භාවිත කරන තෙක් නඩත්තු කිරීම රජයේ වගකීමක්. අපි ඒ අනුව කටයුතු කරගෙන යනවා. ඇමති නිල නිවාස කිහිපයක් අපි මහාධිකරණ තුනකට පරිවර්තනය කළා. එහෙම නේද, හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

47ක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඊළඟට, ආර්ථික කටයුතු සඳහාත් සමහර ඇමති නිල නිවාස යොදා ගැනීමට සැලසුම් කරමින් පවතිනවා. එතෙක් ඒවා නඩත්තු කිරීම කරගෙන යනවා. ජනාධිපති මන්දිරත් එහෙම තමයි. නිල කටයුතු සඳහා භාවිත කරන ජනාධිපති මන්දිරය හැරුණාම ඉතිරි ඒවා නඩත්තු කරගෙන යනවා. හැබැයි, අපි ඒවා ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ ලබා දෙන කටයුතුවලට පරිවර්තනය කිරීම සඳහා තමයි දැන් කටයුතු කරමින් යන්නේ. ගරු කථානායකතුමා එතුමාගේ කටයුතුවලට කථානායක නිල නිවස පාවිච්චි කරලා නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා ඔය ප්‍රශ්නය අහන්නේ ඇයි කියලා මම දන්නවා. මේ හත්දෙනා සේවකයින් හැටියට එහි නඩත්තු කටයුතුවලට විතරයි යොදාගෙන තිබෙන්නේ. එහෙම නැතිව ඒක අයාලෙ යන්න ගියොත් එහෙම විනාශ වනවා. ඊළඟට අපි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කර තිබෙනවා, මේක වැදගත්, ප්‍රයෝජනවත් කටයුත්තකට භාවිත කරන්න. ඒ සඳහා නඩත්තු කිරීමක් පමණයි කරන්නේ. එහෙම නැතිව, එතුමා එක නිවාසයක ඉන්නවා, තව නිවාසයක ඉන්නවා කියන එකක් නොවෙයි මෙතැන තිබෙන්නේ. ඒ නිසා වැරදියට අර්ථ දක්වන්න එපා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මගේ ප්‍රශ්නයට උත්තරය දෙන්නකෝ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඒක තමයි කිව්වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්. දැන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මෙහෙමයි, ගරු කථානායකතුමනි. මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න හදන්නේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා නම් මම අහන්නේ මේකයි. අමාත්‍ය නිල නිවාස 47ක් ලංකාවේ තිබෙනවා. ඒ අමාත්‍ය නිල නිවාසවලින් 3ක් තමයි ඔබතුමන්ලා මහාධිකරණවලට දීලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. ප්‍රශ්නය තේරුණේ නැහැ නේ. අනෙක් නිල නිවාස සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් පත්තරේ දැන්වීමක් දාලා තිබෙනවා. ඒ අනුව

සිල්ලර වෙළෙඳාම් කරන්න පවා ඒවා දෙන්න දැන් ලැහැස්ති කර තිබෙනවා. මා ළඟ තිබෙනවා, ඒ document එක. මම අහන්නේ මේකයි. අපේ හඳුන්නෙත්ති ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා කිව්වා, ජනතාවට නැති කිසි දෙයක් අපට වුවමනා නැහැ කියලා. කථානායකතුමාගේ කාරණය පැත්තකින් තියන්නකෝ. කථානායකතුමාගේ පෞද්ගලික ලේකම්ට මොකටද අමාත්‍ය නිල නිවාසයක් දෙන්නේ? මම ප්‍රශ්නය ඇහුවේ ඒකයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේක පාර්ලිමේන්තු සම්ප්‍රදාය නොවෙයි. ගරු කථානායකතුමාගේ කාර්ය මණ්ඩලය,- *[බාධා කිරීම්]* මට තේරුණා, හොඳට. ගරු කථානායකතුමාගේ කාර්ය මණ්ඩලයේ කිසිවෙකුට ඇමති නිල නිවාස ලබා දීලා නැහැ. සමහර දේවල් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට සිල්ලර වාගේ පෙනෙන්න පුළුවන්. එතුමාට ඒක ලොකු දෙයක් නොවෙන්න පුළුවන්. නමුත් අපි සිල්ලර වැඩවලට ඕවා දෙන්නේ නැහැ. රටේ ආර්ථික කටයුතුවලට වැදගත් වන දේවල්වලට පමණයි අපි ඒවා ලබා දෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක ?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට හොඳම දේ හැටියට මගේ අසල්වැසි ගෙදරට ආවා නම් වැඩේ ඉවරයි නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

## 2022-2024 දක්වා අ.පො.ස. (සා/පෙළ) සහ (උ/පෙළ) අපේක්ෂකයින්: විස්තර

2022-2024 வரையான க.பொ.த. (சாதாரண தர) மற்றும் க.பொ.த. (உயர் தர) பரீட்சார்த்திகள்: விபரம்
GCE (O/L) AND (A/L) CANDIDATES FROM 2022-2024: DETAILS

1632/2025

**8. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වසර 03 තුළ අපොස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම ශිෂ්‍යයන් අතරින් අපොස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(iii) ඉහත (i) සහ (ii) හි සඳහන් ශිෂ්‍ය සංඛ්‍යාව, අදාළ වසරවලදී ප්‍රාථමික අංශයට ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 03 ஆண்டுகளில் க.பொ.த. (சாதாரண தர) பரீட்சைக்குத் தோற்றிய மொத்த மாணவர்களின் எண்ணிக்கை;

(ii) மேற்படி மாணவர்களில் க.பொ.த. (உயர் தர) பரீட்சைக்குத் தோற்றிய மாணவர்களின் எண்ணிக்கை;

(iii) மேலே (i) மற்றும் (ii)இல் குறிப்பிடப்பட்டுள்ள மாணவர்களின் எண்ணிக்கை, அந்தந்த ஆண்டுகளில் ஆரம்பப் பிரிவில் அனுமதிக்கப்பட்ட மாணவர் எண்ணிக்கையின் சதவீதமாக;

ஒவ்வோர் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House, separately, as per each year, the -

(i) total number of students who sat for the GCE (Ordinary Level) Examination in the last three years;

(ii) number of students who sat for the GCE (Advanced Level) Examination, out of the aforesaid number of students; and

(iii) percentage of the students mentioned in (i) and (ii) above, calculated against the total number of students admitted to the primary section in the relevant years?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| විභාග වර්ෂය | සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|
| 2022 | 317,326 |
| 2023 | 322,537 |
| 2024 | 322,704 |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(ii) 2022, 2023, 2024 වර්ෂවල අපොස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතරින් ඊට අනුරූපී විභාග වර්ෂ තුළ අපොස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව පහතින් ඉදිරිපත් කර ඇත.

| අනුරූපී විභාග වර්ෂය | සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|
| 2025 | 221,413 |
| 2026 | උසස් පෙළ විභාගයට මෙතෙක් පෙනී සිට නැත. |
| 2027 | උසස් පෙළ විභාගයට මෙතෙක් පෙනී සිට නැත. |

(iii)

| අපොස (උසස් පෙළ) | | | අපොස (සාමාන්‍ය පෙළ) | | | පළමු ශ්‍රේණියට ඇතුළත් වීම | |
|---|---|---|---|---|---|---|---|
| විභාගය පැවැත් වූ වර්ෂය | විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | පළමු ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | විභාගය පැවැත් වූ වර්ෂය | විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | පළමු ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | වර්ෂය | සිසුන් සංඛ්‍යාව |
| 2025 | 221,413 | 65.29% | 2022 | 317,326 | 93.57% | 2012 | 339,142 |
| - | - | - | 2023 | 322,537 | 92.08% | 2013 | 350,294 |
| - | - | - | 2024 | 322,704 | 95.15% | 2014 | 339,145 |

(ආ) අදාළ නොවේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2026දී ලහි ලහියේ ක්‍රියාත්මක කරන්න ගියා. නමුත්, මොඩියුල පිළිබඳ කාරණය මේ රටේ ආන්දෝලනාත්මක ප්‍රශ්නයක් බවට පත් වුණා. දැන් නම් ඒක යට ගිහිල්ලා, අමතක වෙලා තිබෙනවා. හැබැයි, 2027දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න පටන් ගන්නකොට ආපසු ඒ ප්‍රශ්නය පටන් ගනීවි. 2026දී 1 ශ්‍රේණිය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙනවා. මම ඔබතුමියගෙන් අහන්නේ, 2027දී නැවත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න පටන් ගන්නවාද, මේ වෙනකොට ඒ සඳහා ගුරුවරුන් පුහුණු කරගෙන යනවාද, එහෙම නැත්නම් ඔවුන් පුහුණු කරලා තිබෙනවාද, එහෙමත් නැත්නම් ඔවුන් පුහුණුව සඳහා පළාත් අධ්‍යාපන කාර්යාලවලට මුදල් යවා තිබෙනවාද කියලායි. ඒ වාගේම, 2027දී ස්ථිරවම ඒ කටයුතු පටන් ගන්න දැන් පොත් අච්චු ගහලා, ප්‍රශ්නය විසඳිලාද තිබෙන්නේ? එහෙම කළේ නැත්නම් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න පටන් ගන්න ගිහිල්ලා දෙසැම්බර්, ජනවාරි වනකොට ආපසු පසුගිය අවුරුද්දේ වාගේ ප්‍රශ්නයක් ඇති වෙයිද කියලා දෙමාපියන් අතර සැකයක් තිබෙනවා. ඒක නිසා මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ 2027දී නැවත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න පටන් ගන්නවාද කියන එකයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇසීම පිළිබඳව මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මට ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීමට මේ අවස්ථාව සලසන එක ගැන ඔබතුමාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. 2027දී 6 ශ්‍රේණිය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කරන්න අපි සියලු කටයුතු සූදානම් කරමින් යනවා. 2026දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ආරම්භ කරපු 1 ශ්‍රේණිය දැනට සාර්ථකව කරගෙන යනවා. 2027දී 2 ශ්‍රේණිය සඳහාත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කරනවා. ඒ සඳහා මොඩියුල ක්‍රියාකාරකම් පොත් print කරන්න පටන් අරගෙන තිබෙනවා. 2027දී 6 ශ්‍රේණිය සඳහා අපි සියලුම මොඩියුල වෙනුවෙන් විෂයානුකූලව කමිටු පත් කරලා, ඒ පිළිබඳව සමාලෝචනය කරලා, කරන්න අවශ්‍ය වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කරලා, ඒ කටයුතු සියල්ල දැන් සම්පූර්ණ කර තිබෙනවා. ඒවා මුද්‍රණය කිරීම සඳහා මේ මාසය තුළ යවන්න නියමිතයි. මම කිව්වේ 6 ශ්‍රේණිය පිළිබඳවයි. ගරු කථානායකතුමනි, ඒ වාගේම 6 ශ්‍රේණියේ ගුරුවරු පුහුණු කිරීමත් ජූනි මාසය වෙනකොට ආරම්භ කරන්න සැලසුම් කර තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමියනි, තව මාස හයකින් 6 ශ්‍රේණියේ ප්‍රශ්නය එනවා. ඒ නිසා ඔබතුමිය අධ්‍යාපන ඇමතිතුමිය හැටියට ඒ පිළිබඳව මේ වෙනකොට ජනතාව දැනුවත් කරලා, වැඩසටහන් පටන් ගත්තා නම්, ගියවර වාගේ අසාර්ථක වෙන්නේ නැතුව කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. ඉතිහාසය විෂයය නැහැ කියලා ප්‍රශ්නයක් තිබුණා නේ. ලෝක බැංකුව අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් දෙනවා, ඔබතුමිය ඒ ඩොලර් මිලියන 300න් තමයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න මූලිකව කටයුතු කරන්නේ කියන එකයි රටේ තිබෙන මතය. හැබැයි, ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 300 ලැබුණාද, නැද්ද කියන එක අපි දන්නේ නැහැ. නමුත්, ඔබතුමියගෙන් මම ඉල්ලීමක් කරනවා. 6 ශ්‍රේණිය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගන්නවා නම්, ගුරු පුහුණු වැඩසටහන්, පොත් අච්චු ගහන ඒවා, මොඩියුල සකස් කිරීම ආදී සියල්ල දෙසැම්බර් මාසය වනකොට අවසන් කළොත් ජනවාරි මාසයේ ඒ කටයුතු පටන් ගන්න පුළුවන්. එහෙම නැත්නම් පසුගිය අවුරුද්දේ ඇති වුණු ප්‍රශ්නයම අනිවාර්යයෙන්ම නැවත එනවා, ගරු අගමැතිතුමියනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. කිසිම ප්‍රශ්නයක් ඇති වීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ පිළිබඳ සියලු කටයුතු ඒ සිදු විය යුතු අයුරින් සිදු වෙමින් පවතිනවා. මේ වෙනකොට අපි ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ ජාතික මෙහෙයුම් කමිටුවට අදාළ නියෝජිතයන් හැටියට වෘත්තීය සමිති නියෝජිතයන්ද ඉන්නවා.

එම කමිටුවේ අධීක්ෂණය යටතේ තමයි මේ සියල්ලම සිද්ධ වෙන්නේ. මේකට යම්කිසි විධියක බාධාවක් සිද්ධ වෙනවා නම් එය සිද්ධ වෙන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියන පාර්ශ්වයකින් හෝ ඒක අවුලට පත් කරලා ආණ්ඩුව අපහසුතාවට

පත් කරන්න උත්සාහ කිරීමේ අරමුණින් එයට මැදිහත් වන පාර්ශ්වයකින් මිසක්, මේ ක්‍රියාවලිය තුළ තිබෙන ප්‍රශ්නයක් නිසා නොවෙයි. අපි එම කටයුතු සැලසුම් කරගෙන යනවා. ඒ අනුව ජනවාරි මාසයේදී 6 ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ ආරම්භ කරන්න නියමිතයි. ඒ සඳහා අවශ්‍ය සියලු වැඩ කටයුතු අපි සූදානම් කරමින් පවතින්නේ. ඒ වාගේම ගුරුවරුන්, දෙමව්පියන්, දරුවන් ඇතුළු සියලුදෙනාම දැනුවත් කිරීමේ වැඩසටහන් ජූලි, අගෝස්තු මාස වෙනකොට ආරම්භ කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මා සඳහන් කරන්න කැමැතියි, මේ ප්‍රතිසංස්කරණ සඳහා ලෝක බැංකුවේ ආධාර ලැබී නැති බව.

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය: ජලජීවී ක්ෂේත්‍රයට ලබා දෙන පහසුකම්

## இலங்கை தேசிய நீர் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபை: நீர் உயிரின வளர்ப்புத் துறைக்கு வழங்கப்பட்ட வசதிகள்

## NATIONAL AQUACULTURE DEVELOPMENT AUTHORITY: FACILITIES PROVIDED FOR AQUACULTURE SECTOR

1935/2026

**9. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රට තුළ තිබෙන මිරිදිය ධීවර, ඉස්සන් සහ විසිතුරු මසුන් කර්මාන්ත සඳහා වගකීම් දරන ආයතනය බව දන්නේද;

(ii) එසේ නම්, එම ආයතනය විසින් පසුගිය පාලන කාලයන් තුළ ඉහත ක්ෂේත්‍රවල අවශ්‍යතා අනුව පහසුකම් සලසා දී තිබේද;

(iii) අධිකාරිය සතු මත්ස්‍ය සහ ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) මෙරට වගා කටයුතු සඳහා ප්‍රමාණවත් මත්ස්‍ය සහ ඉස්සන් පැටවුන් ලබා දීමට අධිකාරියට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අධිකාරිය තුළ පසුගිය කාලයේ මූල්‍ය වංචා සිදු වී තිබේද;

(ii) අධිකාරිය සතුව ජලජීවී වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை தேசிய நீர் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபையானது நாட்டின் நன்னீர் மீன்பிடி, இறால் மற்றும் அலங்கார மீன் வளர்ப்புக் கைத்தொழில்களுக்குப் பொறுப்பாக வுள்ள நிறுவனம் என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி அதிகாரசபை கடந்த ஆட்சிக் காலத்தில் குறித்த துறைகளின் தேவை களுக்கு அமைய வசதிகளை செய்து கொடுத்துள்ளதா;

(iii) அதிகாரசபைக்குச் சொந்தமாகக் காணப்படு கின்ற மீன் மற்றும் இறால் இனப்பெருக்க நிலையங்களின் எண்ணிக்கை எத்தனை;

(iv) நாட்டில் வளர்ப்புக்குப் போதுமான மீன் மற்றும் இறால் குஞ்சுகளை வழங்கும் இயலுமையை அதிகாரசபை கொண்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அதிகாரசபையில், கடந்த காலத்தில் நிதி மோசடிகள் இடம்பெற்றுள்ளனவா;

(ii) அதிகாரசபையானது நீர் உயிரின வளர்ப்புத் துறையை அபிவிருத்தி செய்வதற்கான வேலைத்திட்டமொன்றைக் கொண்டுள்ளதா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) whether he is aware that the National Aquaculture Development Authority of Sri Lanka is the authority responsible for the freshwater fisheries, shrimp and ornamental fish industries in the country;

(ii) if so, whether the said Authority has provided the necessary facilities for the above sectors during previous administrations;

(iii) the number of fish and shrimp breeding centres owned by the Authority; and

(iv) whether the Authority has the capacity to provide sufficient fish and shrimp fry for aquaculture activities in the country?

(b) Will he also inform this House -

(i) whether financial irregularities have occurred within the Authority during the recent past; and

(ii) whether the Authority has a programme to develop the aquaculture sector?

(c) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i) ஆம்.

(ii) ஆம்.

(iii)
- அலங்கார மீன் வளர்ப்பு நிலையங்கள் - 03
- நன்னீர் இறால் வளர்ப்பு நிலையங்கள் - 03
- உவர்நீர் இறால் வளர்ப்பு நிலையங்கள் - 01
- நன்னீர் மீன் வளர்ப்பு நிலையங்கள் - 10

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකරම්මහතා]

(iv) • நன்னீர் மீன்வளர்ப்புக்குத் தேவையான மீன்குஞ்சுகளை வழங்கும் திறன் போது மானதாக இல்லை.

• நன்னீர் மீன்வளர்ப்புக்குத் தேவைப்படும் மொத்த மீன் விரலிக் குஞ்சுகளின் எண்ணிக்கை ஏறத்தாழ 480 மில்லியன்.

• கடந்த ஓராண்டில் எங்கள் மீன்வளர்ப்பு நிலையங்கள், மீன்வள சங்கங்களின் கட்டுப்பாட்டில் உள்ள மீன்குஞ்சு வளர்ப்பு நிலையங்கள் மற்றும் தனியார் மீன்குஞ்சு வளர்ப்பு நிலையங்கள் மொத்தம் 67 மில்லியன் மீன் விரலிக் குஞ்சுகளை மட்டுமே வழங்கியுள்ளன. இதனைக் கருத்திற்கொண்டு எதிர்காலத்தில் மீன்வள சங்கங்களையும் தனியார் மீன்குஞ்சு வளர்ப்பு நிலையங்களையும் இனப் பெருக்க மையங்களாக மேம்படுத்தத் தேவையான தொழில்நுட்பங்களை வழங்க நடவடிக்கை எடுக்கப்படும். மேலும், ஒவ்வொரு பொருத்தமான நீர்த்தேக்கத் திலும் 1,000 சதுர மீற்றர் சீமெந்துத் தடாகம் மற்றும் 4,000 சதுர மீற்றர் சேற்றுத் தடாகம் அமைக்கத் திட்டமிடப் பட்டுள்ளது. அத்தோடு இலங்கை நீர் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகார சபைக்கு 3 பெரிய அளவிலான இனப் பெருக்க மையங்களை அமைக்கவும் திட்டமிடப்பட்டுள்ளது.

• அலங்கார மீன் வளர்ப்புக்கான உற்பத்தி யாளர்களுக்கு உயர் தரமான இனப் பெருக்க இருப்புகளை வழங்கவும் ஏற்றுமதியாளர்களுக்குத் தேவையான சிறப்பு மீன் வகைகளை வழங்கவும் ரம்படகல்ல, கினிகத்தேன மற்றும் செவனபிட்டிய ஆகிய இடங்களில் 3 அலங்கார மீன் இனப்பெருக்க மையங்கள் செயற்பட்டு வருகின்றன. ரம்படகல்ல அலங்கார மீன் இனப் பெருக்க பயிற்சி மையமானது, இந்தத் துறையில் புதிதாக நுழைவோருக்கு அடிப்படை பயிற்சியை வழங்கவும் ஏற்கனவே ஈடுபட்டுள்ளவர் களுக்கு மேலதிக பயிற்சியை வழங்கவும் செயற்படுகின்றது.

• உவர் நீர் இறால் வளர்ப்புத் தொழிற் றுறைக்குத் தேவையான இறால் குஞ்சுகள் முழுமையாக தனியார் துறையால் வழங்கப்படுகின்றன.

• நன்னீர் இறால் வளர்ப்புத் தொழிற் றுறைக்குத் தேவையான போதுமான இறால் குஞ்சுகளை வழங்கும் திறன் அதிகாரசபைக்கு உள்ளது.

(ஆ) (i) ஆம்.

2017-2019 காலப்பகுதியில், தம்புள்ளை நீர் வேளாண்மை அபிவிருத்தி நிலையத்தின் வருமானம் வங்கியில் வைப்புச் செய்யப் படாததால் ரூபாய் 1,628,497.50 அளவிலான மோசடி இடம்பெற்றுள்ளது. இது குறித்து மேற்கொள்ளப்பட்ட ஒழுங்கு நடவடிக்கை விசாரணைகளின்போது குற்றவாளிகளாக அடையாளம் காணப்பட்ட இரண்டு அதிகாரிகள் 54,250 ரூபாயை அதிகாரசபைக்குச் செலுத்தி யுள்ளனர். மேலும், குற்றவாளிகளாக கண்டறியப் பட்ட மற்றைய இரண்டு அதிகாரிகளிடமிருந்து மேற்குறித்த தொகையை மீட்டெடுக்க சட்ட நடவடிக்கைகள் தற்போது முன்னெடுக்கப்பட்டு வருகின்றன.

(ii) ஆம்.

**நன்னீர் மீன்பிடிக் கைத்தொழில்**

• நீர்த்தேக்கங்களுக்குத் தேவையான விரலிக் குஞ்சுகளை சேமித்தலுடன் தொடர்புடைய கிராமிய மீன் வள அமைப்புகளுடன் இணைந்து ஒரு திட்டம் தயாரிக்கப்பட்டு செயற்படுத்தப் படுகின்றது. இதன் அடிப்படையில், எதிர் காலத்தில் அனைத்து நீர்த் தேக்கங்களுக்கும் மீன் விரலிக் குஞ்சுகளை விடுவிப்புத் திட்டங்களைத் தயாரிக்க முன்மொழியப் பட்டுள்ளது.

• நீர்த்தேக்கங்களில் வலைக்கூண்டு பயன்படுத்தி உணவுக்கான மீன் வளர்ப்பைப் பிரபலப்படுத்தும் திட்டங்கள் தயாரிக்கப்பட்டு வருகின்றன.

• பொருத்தமான நீர்த்தேக்கங்களுக்கு அருகில் சீமெந்து மற்றும் சேற்றுத் தடாகங்கள் அமைக்கப் பட்டுள்ளன. ஒவ்வொரு நீர்த்தேக்கத்துக்கும் தேவையான மீன் விரலிக் குஞ்சுகளை உற்பத்தி செய்ய தேவையான நடவடிக்கைகள் எடுக்கப் பட்டுள்ளன.

• புதிய 3 மீன் இனப்பெருக்க மையங்களை அமைப் பதற்கான சாத்தியக்கூறு ஆய்வுகள் எதிர் காலத்தில் மேற்கொள்ளப்படவுள்ளன.

• தற்போதுள்ள மீன் இனப்பெருக்க மையங்களை மேம்படுத்தி, மீன் குஞ்சு உற்பத்தியை அதிகரிக்கத் திட்டங்கள் தயாரிக்கப்பட்டு வருகின்றன.

**அலங்கார மீன்பிடிக் கைத்தொழில்**

• அலங்கார மீன் வளர்ப்பாளர்களுக்குத் தேவை யான இனப்பெருக்க இருப்புகள் மற்றும் மீன் குஞ்சுகள் தேசிய நீர் உயிரின வளர்ப்பு அதிகாரசபையின் 3 மையங்கள்மூலம் வழங்கப் படுகின்றன. மேலும், மேம்பட்ட தரமான இனப்பெருக்க இருப்புகள் கொண்ட இனங்களை இறக்குமதி செய்து வழங்குவதற்கான நடவடிக்கை களும் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

• அலங்கார மீன் வளர்ப்புத் தொழிற்றுறைக்காக நிவாரணக் கடன் திட்டங்கள் முன்மொழியப் பட்டுள்ளன.

• தேசிய நீர் உயிரின வளர்ப்பு அதிகாரசபையின் ரம்படகல்ல அலங்கார மீன் உற்பத்தி பயிற்சி மற்றும் இனப்பெருக்க மையத்தின்மூலம் அலங் கார மீன் வளர்ப்புத் தொடர்பான பயிற்சி வகுப்புகள் நடத்தப்படுகின்றன.

- அலங்கார மீன் வளர்ப்புத் தொழிற்றுறையில் அறிவைப் பகிர்ந்துகொள்ளவும் சந்தைப் படுத்தலை மேம்படுத்தவும் "Aqua Planet" போன்ற சர்வதேச ரீதியிலான பாரிய கண்காட்சிகள் அமைச்சினால் ஏற்பாடு செய்யப்பட்டன.

**இறால் வளர்ப்புக் கைத்தொழில்**

- சிறிய மற்றும் நடுத்தர அளவிலான இறால் வளர்ப்புத் திட்டங்களுக்கு நிவாரணக் கடன் திட்டங்கள் செயற்படுத்தப்பட்டு வருகின்றன.
- புத்தளம், கிளிநொச்சி மற்றும் மட்டக்களப்பு பகுதிகளிலுள்ள கரையோர நீர் வேளாண்மை விரிவாக்க மற்றும் கண்காணிப்பு அலகுகள் மூலம் இறால் இனப்பெருக்க மையங்கள் மற்றும் பண்ணைகளுக்கான நோய் கண்ட றிதல் மற்றும் கட்டுப்பாட்டு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன.
- இறால் வளர்ப்புத் தொழிலில் ஈடுபட்டுள்ள வளர்ப்பாளர்களுக்குத் தேவையான தொழில் நுட்ப ஆலோசனைகள் வழங்கப்படுவதுடன், சிறந்த முகாமைத்துவ நடைமுறைகளைப் பின்பற்றி வளர்ப்பது குறித்து தொடர்ந்து பயிற்சியும் வழங்கப்படுகின்றது.
- இறால் கைத்தொழில் துறைக்காக தரவுத்தளம் ஒன்றும் உருவாக்கப்பட்டு வருகின்றது. இதன் மூலம் இறால் தொழிற்றுறைக்கான தரவுகள் புதுப்பிக்கப்பட்டு, நோய் கட்டுப்பாடு மற்றம் அவசர நிலைகளுக்கான முன்னெச்சரிக்கை திட்டம் தயாரிக்கப்படுகிறது.

(இ) பொருத்தமற்றது.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, අපි දන්නවා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය කියන්නේ එක පැත්තකින් ගත්තාම අපේ මත්ස්‍ය නිෂ්පාදන වැඩිදියුණු කර ඒවා අපනයනය කරලා අපේ රටට විදේශ විනිමය ලබා දෙන ක්ෂේත්‍රයක් බව. ඒ අනුව අපි දන්නවා, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය, මිරිදිය ඉස්සන් කර්මාන්තය ඇතුළු ඉස්සන් කර්මාන්තය වැනි ක්ෂේත්‍ර ගත්තාම අපනයනය මූලික කරගෙන අපේ ධීවර කර්මාන්තය තුළ එම ක්ෂේත්‍ර සංවර්ධනය කරන්න ඕනෑ බව. අනෙක් පැත්තෙන්, අපේ දේශීය පරිභෝජනයට අවශ්‍ය මත්ස්‍ය නිෂ්පාදනය සඳහා වැව් මූලික කරගෙන නිෂ්පාදනය වැඩිදියුණු කරන්න ඕනෑ බව අපි දන්නවා. ඇත්තටම අපි දැක්කා, පසුගිය පාලන කාලය පුරාවටම මේ ක්ෂේත්‍රය හරහා අවශ්‍යතාවට සරිලන නිෂ්පාදනයක් රටට ගෙනෙන්න බැරි වුණු බව.

අපේ රටේ වාර්ෂික මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතාව මෙට්‍රික් ටොන් ලක්ෂ හයක් වෙනවා. නමුත් අපට කරදිය ක්ෂේත්‍රයෙන් ගන්න පුළුවන් වන්නේ මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් පමණයි. අපි දන්නවා, කොච්චර උත්සාහ කළත් අපට ඊට වඩා වැඩි නිෂ්පාදනයක් ගන්න බැරි වී තිබෙන බව. ඒ නිසා මත්ස්‍ය අවශ්‍යතාවෙන් මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක ප්‍රමාණයක් අපට මිරිදිය ක්ෂේත්‍රයෙන් තමයි ලබා ගන්න වෙන්නේ. ඇත්තටම ගත්තොත්, මේ වනවිට අපට වාර්ෂිකව මිරිදිය ක්ෂේත්‍රයෙන් නිෂ්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 32,000ක් පමණයි. ඒ අනුව බැලුවාම අපි දහ ගුණයකින් පමණ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. අපි දන්නවා, කාබෝහයිඩ්‍රේට් අඩංගු ආහාර පමණක් ජනතාවට ලබා දෙන්න බැහැ කියන එක. අපි ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවත් සපුරන්න ඕනෑ. ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ ඔබතුමා දැන් ඉදිරිපත් කළා. නමුත් අපට අභියෝගයක් තිබෙනවා, මෙම නිෂ්පාදන වැඩි කරන්නට. මේ තත්ත්වය මත අපි රටේ ජනතාවට අවශ්‍ය ප්‍රෝටීන ප්‍රමාණය ලබා දෙන්න වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු කථානායකතුමනි, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේදී මා සඳහන් කරන්න කැමැතියි, අපේ රටේ ඉස්සන් කර්මාන්තය විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් වුණු ආපදාව නිසා විශාල වශයෙන් හානියට ලක් වුණු බව. එම ව්‍යාපාරය ගොඩ නැඟීම සඳහා අපි දැවැන්ත වැඩ පිළිවෙළක් පටන් ගත්තා. විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඉස්සන් කර්මාන්තයේ නියැළෙන සියලු අය සමඟ සාකච්ඡා කර ඊට අදාළ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. එපමණක් නොවෙයි, අපි අලුතින් හඳුනා ගත් තැන් තිබෙනවා. විශේෂයෙන්ම යාපනය ගත්තාම ඉස්සන් කර්මාන්තය නඟා සිටුවීම සඳහා අපි ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් තෝරා ගෙන තිබෙනවා. ඒ සඳහා ඒ පැත්තට අදාළ ඒ ක්‍රියාමාර්ග අපි ගන්නවා.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා විමසා සිටියා, වැව් ආශ්‍රිත මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා. දැනට අපි ගණන් බලා තිබෙන ආකාරයට වැව් 1,300ක පමණයි මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන්න පුළුවන් වන්නේ. ඒ පිළිබඳවත් අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. පසුගිය කාලයේදී ඒවා නොසලකා හැර තිබුණා. නමුත් අපි, අපේ වැව් පද්ධතිය පුළුල් කරමින් ඒවායේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කරගන්නේ කෙසේද කියන කාරණය සම්බන්ධව සාකච්ඡා කර, දැවැන්ත වැඩ පිළිවෙළක් සකස් කර, දැනට එම කටයුතු ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඉදිරියේදී අපට මේවායේ ප්‍රතිඵල බලාගන්න පුළුවන්.

තව එක කාරණයක් මම කියන්න ඕනෑ. මෙතෙක් කාලයක් ධීවර කර්මාන්තයෙන් ඩොලර් මිලියන 285ක පමණ ලාභයක් තමයි අපට ලැබුණේ. නමුත් මේ අවුරුද්ද ගත්තාම, එය ඩොලර් මිලියන 300ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඉදිරියේදී එය තවත් වැඩිදියුණු කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ රටේ වැව් 33,000ක් තිබෙනවා කිව්වාට ඔබතුමා කිව්වා වාගේම මත්ස්‍ය නිෂ්පාදනය සඳහා වැඩිදියුණු කරන්න වැව් 1,300ක් පමණයි අපට තිබෙන්නේ. හැබැයි මේ වනකොට ඒ වැව් 1,300න්ම වැව් 120ක් පමණයි Business Plan එකක් හදලා මත්ස්‍ය ඇඟිල්ලන් බෝ කරලා මත්ස්‍ය නිෂ්පාදනය සඳහා දායක කරගෙන තිබෙන්නේ. ඒ වාගේම, කාලීන වැව් 5,000ක් පමණ

[ගරු අජිත් ගිහාන් මහතා]

තිබුණත්, මේ ක්ෂේත්‍රය සම්බන්ධව තවම හරියාකාර වැඩ පිළිවෙළක් නැහැ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ තමයි මේ වැව් තිබෙන්නේ. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරන්න අප උත්සාහ කරනවා නම් ඒ සඳහා හොඳ වැඩ පිළිවෙළක් අපට අවශ්‍ය වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේම අපට දඹුල්ල, උඩවලව, ඉඟිනියාගල, කලා වැව සහ ඉරණමඩු ආදි වශයෙන් මිරිදිය ධීවර ක්ෂේත්‍රයේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 5ක් තිබෙනවා. හැබැයි ඒවා තිබියදීත් අපට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය ප්‍රමාණවත් නැහැ. "දිට්වා" සුළි කුණාටු තත්ත්වය නිසා ඒවා තවත් damage වුණා. ඒ නිසා අපට විශාල වශයෙන් මත්ස්‍ය ඇඟිල්ලන් අවශ්‍ය වෙලා තිබෙනවා. මේ වැව් ටික පාවිච්චි කරලා මත්ස්‍ය නිෂ්පාදනය දහගුණයකින් වැඩි කරන්න අප උත්සාහ කරනවා නම් අපට අවශ්‍ය hatcheries ටික, එහෙම නැත්නම් අභිජනන මධ්‍යස්ථාන ප්‍රමාණය වැඩි කරන්න සිදු වෙලා තිබෙනවා. මේ තිබෙන අභිජනන මධ්‍යස්ථාන 5න් දැනට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය ලබා දෙන්නත් බැරි වෙලා තිබෙනවා. ඊට හේතු මොනවාද? පසුගිය කාලය පුරාම මේවා අකර්මණ්‍ය කරලා තිබුණු බව අපට පෙනුණා. මේ නිෂ්පාදන වැඩි වෙලා නැහැ. එහෙම නම් රටේ ජනතාවගේ අවශ්‍යතාව මත නිෂ්පාදනය සිදු කරන්න නම් hatcheries නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ, වැව් පද්ධතිය වැඩිදියුණු කරන්න ඕනෑ, අපට අවශ්‍ය සේවකයන්ගේ, නිලධාරීන්ගේ අර්බුදයක් තිබෙනවාද කියලා සොයා බලන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඔබතුමා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, විශේෂයෙන් ගත්තාම අපේ ධීවර අමාත්‍යාංශය මුහුණ දීපු ප්‍රධානම ප්‍රශ්නයක් තමයි සේවකයන්ගේ හිඟය. විශේෂයෙන්ම අපේ NAQDA එක ගත්තාම, එය විශාල සේවයක් කරන ආයතනයක්. එය විශාල සේවයක් කරන ආයතනයක් වුණාට එහි පුරප්පාඩු බොහොමයක් තිබුණා; තවමත් තිබෙනවා. අන්න ඒවා සම්පූර්ණ කර ගැනීම සඳහා දැනට අපි ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ඒ සියලු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ඔබතුමා මතු කරපු අනෙක් ප්‍රශ්නය ගත්තාම, අපේ මේ වැව් පද්ධතිවල මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා දැනට අපි hatcheries ගණනාවක් පටන් ගෙන තිබෙනවා. එපමණක් නොවෙයි, ගරු කථානායකතුමනි, මේ වන විට අපි ඉස්සන් කර්මාන්තය හෝ මුහුදු කුඩැල්ලන් - sea cucumber - කර්මාන්තයට අදාළව දැවැන්ත වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වනකොට අපි hatcheriesවලට පමණක් නොවෙයි, sea cucumber කර්මාන්තයටත් 1,000කට වැඩි පිරිසක් එකතු කර ගන්න උත්සාහ කරමින් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කරුණු කාරණා සියල්ලත් සැලකිල්ලට ලක් කරමින් ඉදිරියේදී ඒ වැඩ පිළිවෙළත් එක්ක අප සම්බන්ධ වෙනවා කියලා කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1947/2026- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## ලංකා විදුලිබල මණ්ඩලය: 2015 සිට ලැබූ ලාභය හෝ අලාභය
## இலங்கை மின்சார சபை: 2015இலிருந்து ஈட்டிய இலாபம் அல்லது நட்டம்
## CEYLON ELECTRICITY BOARD: PROFIT EARNED OR LOSS INCURRED FROM 2015

107/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ ලාභය හෝ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අලාභ ලබා තිබේ නම්, ඒ සඳහා බලපෑ හේතු කවරේද;

(iii) විදුලිබල මණ්ඩලය මේ වන විට ලාභ ලබන්නේ නම්, එමඟින් විදුලි පාරිභෝගිකයන්ට යම් සහනයක් ලබා දීමට පියවර ගන්නේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විදුලිබල මණ්ඩලය විසින් සමාගම්වලට ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම සමාගම් සමඟ ඇති කර ගත් ගිවිසුම් සම්බන්ධයෙන් සමාලෝචනයක් හෝ ඇගයීමක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ස්ථාවරය කවරේද; යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை, இலங்கை மின்சார சபை ஈட்டியுள்ள இலாபம் அல்லது அடைந்த நட்டம் ஆண்டு வாரியாக வெவ் வேறாக எவ்வளவு என்பதையும்;

(ii) நட்டம் அடைந்திருப்பின், அதில் தாக்கம் செலுத்தியுள்ள காரணிகள் யாவை என்பதையும்;

(iii) மின்சார சபை தற்போது இலாபம் ஈட்டுகின்ற தாயின், அதன்மூலம் மின்சாரப் பாவனையாளர் களுக்கு ஏதேனும் சலுகை வழங்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை, மின்சார சபையால் கம்பனிகளுக்குச் செலுத்தியுள்ள பணத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) அத்தகைய கம்பனிகளுடன் நிறைவேற்றிக் கொண்டுள்ள உடன்படிக்கைகள் தொடர்பான மீளாய்வு அல்லது மதிப்பீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அவ்விடயம் தொடர்பில் அமைச்சின் நிலைப்பாடு யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the profit earned or loss incurred by the Ceylon Electricity Board from the year 2015 up to now, separately for each year;

(ii) if losses were incurred, the reasons for such losses; and

(iii) if the Ceylon Electricity Board is earning a profit at present, whether steps will be taken to provide some relief to electricity consumers?

(b) Will he also inform this House -

(i) the amount of money that has been paid to the companies by the Ceylon Electricity Board from the year 2015 up to now;

(ii) whether a review or an evaluation has been conducted in respect of the agreements entered into with those companies; and

(iii) if so, the stance of the Ministry in this regard?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | ලාභය/(අලාභය) (රුපියල් මිලියන) |
|---|---|
| 2015 | 20,002.42 |
| 2016 | (13,497.34) |
| 2017 | (45,961.07) |
| 2018 | (28,916.07) |
| 2019 | (85,348.19) |
| 2020 | (53,883.85) |
| 2021 | (21,450.37) |
| 2022 | (261,868.69) |
| 2023 | 61,235.68 |
| 2024 | 144,394.48 |
| 2025 | (38,739,948) |

(ii) 2015 වසරේ සිට ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ අලාභයන්ට ප්‍රධාන හේතුව වන්නේ 2014 වසරේ සිට 2022 වසර දක්වා විදුලි ගාස්තු සංශෝධනය නොකිරීමයි. වසරින් වසර ඉන්ධන මිල ගණන් හා විනිමය අනුපාත උච්චාවචනය වුවද පාරිභෝගික විදුලි ගාස්තු අගයන්, ඊට සමගාමීව මහජන උපයෝගිතා කොමිසම විසින් සංශෝධනය නොකළ බැවින් මෙම පාඩුවලට හේතු වන බව නිරීක්ෂණය වේ. ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් **ඇමුණුම 01**** මඟින් දක්වා ඇත.

(iii) දැනට ලංකා විදුලිබල මණ්ඩලය ලාභයක් උපයන්නේ නැත. යම්කිසි ලාභයක් උපයාගන්නා ලද්දේ නම්, එය විදුලි ගාස්තු සංශෝධන මඟින් පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලෙස ලබා දෙනු ඇත.

(ආ) (i) "විදුලිබල මණ්ඩලය විසින් සමාගම්වලට ගෙවා ඇති" යන්නෙහි "සමාගම්" ලෙස අදහස් කරන්නේ කුමන සමාගම්ද යන වග පැහැදිලි නැති බැවින් සෘජු පිළිතුරක් ලබා දිය නොහැක.

(ii) "විදුලිබල මණ්ඩලය විසින් සමාගම්වලට ගෙවා ඇති" යන්නෙහි "සමාගම්" ලෙස අදහස් කරන්නේ කුමන සමාගම්ද යන වග පැහැදිලි නැති බැවින් සෘජු පිළිතුරක් ලබා දිය නොහැක.

(iii) "විදුලිබල මණ්ඩලය විසින් සමාගම්වලට ගෙවා ඇති" යන්නෙහි "සමාගම්" ලෙස අදහස් කරන්නේ කුමන සමාගම්ද යන වග පැහැදිලි නැති බැවින් සෘජු පිළිතුරක් ලබා දිය නොහැක.

(ඇ) අදාළ නැත.

## ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය: 2019 සිට ලැබූ අලාභය සහ ලබාගෙන ඇති ණය
ஸ்ரீலங்கன் விமான சேவை நிறுவனம்: 2019 தொடக்கம் அடைந்த நட்டம் மற்றும் பெற்ற கடன்கள்
SRILANKAN AIRLINES: LOSS INCURRED FROM 2019 AND LOANS OBTAINED

1947/2026

**10. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු එස්. එම්. මරික්කාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon.S.M. Marikkar)

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2019 ජනවාරි 01 දින සිට මේ දක්වා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය ලබා ඇති සම්පූර්ණ අලාභය කොපමණද;

(ii) ඒ අතරින් මෙහෙයුම් අලාභය කොපමණද;

(iii) එම ආයතනය විසින් ගුවන්යානා සඳහා ගෙවනු ලබන වාර්ෂික ලීසිං වාරිකය/ණය වාරිකය කොපමණද;

(iv) එම ලීසිං වාරිකය/ණය වාරිකය ගෙවනු ලබන ගුවන්යානා සංඛ්‍යාව කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ආයතනය විසින් ලබා ගෙන ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු මුළු ණය වාරිකය කොපමණද;

(iii) එම ණය වාරිකයේ ඇති වාරිකය, ප්‍රාග්ධන මුදල හා පොලී මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீலங்கன் விமான சேவை நிறுவனம் 2019 சனவரி 01ஆம் திகதி தொடக்கம் இதுவரையில் அடைந்துள்ள முழுமையான நட்டம் எவ்வளவு என்பதையும்;

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) அதில் தொழிற்பாட்டு நட்டம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நிறுவனத்தால் விமானங்களுக்காகச் செலுத்தப்படும் வருடாந்தக் குத்தகைத் தவணை/ கடன் தவணைக் கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி குத்தகைத் தவணை/கடன் தவணைக் கொடுப்பனவு செலுத்தப்படும் விமானங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிறுவனம் பெற்றுக்கொண்டுள்ள மொத்தக் கடன் தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி கடனுக்காக வருடாந்தம் செலுத்த வேண்டிய மொத்தக் கடன் தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கடன் தவணையிலுள்ள மூலதனத் தொகை மற்றும் வட்டித் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House the -

(i) total loss incurred by the SriLankan Airlines from 01st January, 2019, up to now;

(ii) operation loss, out of aforesaid loss;

(iii) annual lease instalment/loan instalment paid for the aircraft by the SriLankan Airlines; and

(iv) number of aircraft for which aforesaid lease instalment/loan instalment is paid?

(b) Will he also inform this House the -

(i) total amount of loans obtained by the SriLankan Airlines;

(ii) total loan instalment payable annually for the aforesaid loans; and

(iii) instalment capital and the interest of aforesaid loan instalment, separately?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

- 19/20 මූල්‍ය වර්ෂයේ අලාභය - රුපියල් බිලියන (44.1)
- 20/21 මූල්‍ය වර්ෂයේ අලාභය - රුපියල් බිලියන (49.7)
- 21/22 මූල්‍ය වර්ෂයේ අලාභය - රුපියල් බිලියන (163.6)
- 22/23 මූල්‍ය වර්ෂයේ අලාභය - රුපියල් බිලියන (71.3)
- 23/24 මූල්‍ය වර්ෂයේ ලාභය - රුපියල් බිලියන 7.9
- 24/25 මූල්‍ය වර්ෂයේ අලාභය - රුපියල් බිලියන (2.7)
- අලාභ එකතුව - රුපියල් බිලියන (323.5)

• ඉහත සඳහන් කාල පරිච්ඡේදය සඳහා රුපියල් බිලියන 214.6ක මුළු විනිමය අලාභයක් සහ රුපියල් බිලියන 193.5ක මූල්‍ය පිරිවැයක් ඇතුළත් වේ.

• 2019 අප්‍රේල් සිට 2025 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ සමූහයේ මුළු අලාභය රුපියල් බිලියන 323.5කි. 2023/2024 මූල්‍ය වර්ෂයේදී සමූහය රුපියල් බිලියන 7.9ක ලාභයක් වාර්තා කළේය.

(ii)

- 19/20 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් ලාභය - රුපියල් බිලියන 1.5
- 20/21 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් අලාභය - රුපියල් බිලියන (8.1)
- 21/22 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් ලාභය - රුපියල් බිලියන 1.7
- 22/23 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් ලාභය - රුපියල් බිලියන 43.4
- 23/24 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් ලාභය - රුපියල් බිලියන 28.1
- 24/25 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් ලාභය - රුපියල් බිලියන 28.4
- මෙහෙයුම් ලාභ එකතුව- රුපියල් බිලියන 95

• 2019 අප්‍රේල් සිට 2025 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ විනිමය ලාභය/අලාභයට පෙර සමූහයේ මුළු මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 95කි. 2020/2021 මූල්‍ය වර්ෂයේදී සමූහය රුපියල් බිලියන 8.1ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය.

(iii) 2024/2025 මූල්‍ය වර්ෂය සඳහා ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා මුළු බදු කුලිය රුපියල් බිලියන 40.4කි.

(iv) ගුවන් යානා 22

(ආ) (i) 2025 මාර්තු 31 වන දිනට ගෙවිය යුතු මුළු ණය මුදල රුපියල් බිලියන 188.3කි

• ශ්‍රී ලංකා රජය විසින් සහතික කරනු ලබන රුපියල් බිලියන 93.9ක රාජ්‍ය බැංකු ණය, රුපියල් බිලියන 62.7ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර, ලංකා බැංකුවේ බැංකු අයිරා රුපියල් බිලියන 20.2 සහ ගුවන් යානා බදු දෙන්නන් සමඟ කල් දැමූ පියවීම් සැලැස්ම රුපියල් බිලියන 11.5 මෙයට ඇතුළත් වේ.

(ii) 2024/2025 මූල්‍ය වර්ෂය සඳහා මුළු ණය වාරික ආපසු ගෙවීම රුපියල් බිලියන 5.9කි.

(iii) 2024/2025 මූල්‍ය වර්ෂය සඳහා මුළු ප්‍රාග්ධන වාරික ආපසු ගෙවීම රුපියල් බිලියන 5.9ක් වන අතර මුළු පොලී ගෙවීම රුපියල් බිලියන 26.6කි.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් අහලා තිබුණා. එම ප්‍රශ්නයට අද තමයි මට මේ උත්තරය ලැබුණේ. නමුත් ගරු කථානායකතුමනි, මා අහලා තිබෙන කරුණුවලට මේකෙන් උත්තර ලැබිලා නැහැ. මම පළමු කාරණය විධියට ඇහුවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහපු ප්‍රශ්නයට ලේකම් මණ්ඩලය ලබා දුන්- *[බාධා කිරීමක්]* මම ඒ ගැන නැවත සලකා බලන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට එය කියවන්න දුන්නා නම්, ගරු කථානායකතුමනි-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් එය කියවන්න දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒක දැන් ඔබතුමාගේ- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ වරප්‍රසාද ප්‍රශ්නයට උත්තර ලැබිලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මා නැවත වරක්- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒකට උත්තරයක් දෙන්න එපායැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලේකම් මණ්ඩලය ලබා දී ඇති පිළිතුර-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ, ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්නේ මේකයි. මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කර තිබෙනවා. මේ උත්තරයේ තිබෙන්නේ එයින් භාගයකට අදාළ පිළිතුරු විතරයි. මම අහන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවේ ඉඳලා 150 ව්‍යවස්ථාව දක්වා වන කාරණා තුළ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මගේ අවධානය යොමු කරන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක වැරැදියි නේ. දැන් බලන්න, මට මේ උත්තරයෙන් සෑහීමකට පත් වෙන්න බැහැ නේ. එම නිසා වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් පිළිතුර මා අධ්‍යයනය කරලා ඒ සම්බන්ධයෙන් හෙට සඳහනක් කරන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මේක කියවා බලන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක රාජ්‍ය ණය වාරිකයක් තෙවන පාර්ශ්වයකට ගෙවීම
### 2.5 மில்லியன் அமெ ரிக்க டொலர் அரச கடன் தவணையை மூன்றாம் தரப்பினருக்குச் செலுத்துதல்
### PAYMENT OF US DOLLARS 2.5 MILLION STATE DEBT SETTLEMENT TO A THIRD PARTY

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, නිදහසින් පසු ඉතිහාසයේ පළමුවරට ලක් රජය විසින් සිදු කරනු ලැබූ ණය පියවීමක් අදාළ ණයකරු වෙත නොව වෙනත් පාර්ශ්වයකට ගෙවා ඇති බව අනාවරණ වුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන හෙයින් නිශ්චිත පිළිතුරු අපේක්ෂාවෙන් මා පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

01. දේශීය හා විදේශීය රාජ්‍ය ණය කළමනාකරණයට අදාළව දැනට පවත්නා නීති කවරේද? එම නීති බලාත්මක කිරීමට වගකීම් පැවරී ඇති ආයතන කවරේද? 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්මත වූ දින සිට අද දක්වා ණය ගෙවීම් කළමනාකරණ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් අමාත්‍යාංශයේ ආයතන අතර වෙනස් වූ ආකාරය දින වකවානු සහිතව පැහැදිලි කරන්නේද?

02. රාජ්‍ය මූල්‍ය කාරක සභාවට වාර්තා කළ පරිදි ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදලක් ගෙවීම් 10ක් තුළ අහිමි වී ඇත. දැනට සනාථ කරගත් තොරතුරු අනුව එම එක් එක් ගෙවීම් සිදු කළ දිනයන් කවරේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

03. මෙවන් ණය ගෙවීම් සිදු කිරීමේ සම්මත ක්‍රියා පටිපාටියේ පියවරයන් කවරේද? එම පියවරයන්හි වගකිව යුතු ආයතන සහ වගකිව යුතු නිලධාරින්, එක් එක් පියවර වශයෙන් කවරේද? මෙම වැරදි ගෙවීම් සඳහා වගකිව යුතු යැයි දැනට හඳුනාගෙන ඇත්තේ කුමන පියවරවල කුමන නිලධාරින්ද?

විශේෂයෙන්ම අපි දැනගන්න කැමැතියි, එම ඩොලර් මිලියන 2.5 අහිමි වීමත් සමඟම රජයේ මාධ්‍ය ප්‍රකාශකවරයාත් කියලා තිබෙනවා, US Postal Service එකේ ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 6ක ප්‍රශ්නයකුත් තිබෙනවා කියලා. ඒ වාගේම "අස්වැසුම" දීමනාවලට අදාළවත් double payments වගයක් සිදු වෙලා තිබෙනවා කියලා අපට ආරංචියි. ඒවා ගැනත් හොයලා බලන්න. ඒවායේ සත්‍යය මොකක්ද? අප මේ තොරතුරු ඉදිරිපත් කරන්න කලින් රජයම ඒවා ඉදිරිපත් කරනවා නම් තමයි වඩා වැදගත්. ඒ වාගේම ප්‍රංශ රජයෙන් ලබාගත් ණය මුදලකට අදාළ ණය පත්‍රිකා මුදල් අමාත්‍යාංශයේ පරිගණකවලින් අතුරුදහන් වෙලා තිබෙන බවකුත් කියනවා. මොකක්ද ඒවායේ සත්‍යය? මේ ණය ගෙවීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව පාර්ලිමේන්තුව විධිමත්, පැහැදිලි දැනුවත් කිරීමකට ලක් කරන්නට ඕනෑ. කරුණාකරලා එම පියවර මොනවාද කියන එක, ඒ වග කිව යුතු නිලධාරින් කවුද කියන එක මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න.

04. මෙම සිද්ධිය අනාවරණය වූ දිනය කවරේද? එදින සිට මුදල් රෙගුලාසි 103 සිට 109 දක්වා වන රෙගුලාසි අනුව සහ 156ට අනුව වෙන් වෙන් වශයෙන් ගත් ක්‍රියාමාර්ග දින වකවානු සහිතව කවරේද? ඒවායින් ලැබී ඇති වාර්තා සභාගත කරන්නේද? අද දක්වා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම රජය විසින් මඟ හරිනු ලැබුවේ කිනම් සුවිශේෂී හේතු මතද?

අපට දැන ගන්නට ලැබී තිබෙන ආකාරයට මේ සිද්ධිය වෙලා තිබෙන්නේ ජනවාරි මාසයේදී. නමුත් ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවට ඒ ගැන කිසිම වාර්තාකරණයක් කළේ නැහැ. විශේෂයෙන්ම විවිධ සිවිල් ක්‍රියාකාරීන් සහ අපි තමයි මේ ප්‍රශ්නය ගැන රජයෙන් ප්‍රශ්න කළේ. එතකොට තමයි තොරතුරු අනාවරණ වුණේ. මේ කරුණු රජය විසින් සඟවා තබන්නට හේතු වූ පදනම මොකක්ද?

05. මෙම සිද්ධිය දැනගත් පසු 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත අනුව මුදල් අමාත්‍යාංශය ගත් පියවර දින වකවානු සහිතව අනුපිළිවෙළින් මොනවාද?

ඕස්ට්‍රේලියානු ආයතනයේ නිල ඊමේල් ලිපිනයට සමාන ව්‍යාජ ඊමේල් ලිපිනයකට ලැබුණු උපදෙස් මත ගෙවීම් විස්තර වෙනස් කළේ කොහොමද? අපි ඒක දැනගන්න කැමැතියි. බැංකු ගිණුම්, SWIFT අංක, SWIFT කේත වෙනස් කරනකොට මොකක් හෝ සත්‍යාපනයක් - verification එකක් - තිබෙන්න ඕනෑ. මොකක්ද අනුගමනය කරපු සත්‍යාපන ක්‍රමය? ඒ වාගේම රාජ්‍ය මුදල් රෙගුලාසි අනුව විශාල මුදල් ප්‍රමාණයක ගෙවුම් විස්තර වෙනස් කිරීමක් සිදු වෙනවා නම්, යම් කිසි ස්වාධීන ක්‍රමයක් හරහා ඒක තහවුරු කර ගන්නට ඕනෑ. අපට අහන්නට ලැබෙනවා අදියර 14කින් යුත් සමාලෝචන ක්‍රියාවලියක් පවතිනවා කියලා. එසේ තියෙද්දීත් කොහොමද මේ අඩුපාඩුව සිද්ධ වුණේ කියන කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේම මේ තොරතුරු මේ විධියට හෙළිදරව් වෙන තෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරලා තිබුණේ නැහැ. ඒකට හේතුව කුමක්ද? මේ කරුණු සියල්ල පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

06. මෙම සිදුවීම දැනගත් පසු මේ සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පැමිණිලි කළ දිනය හා පැමිණිලි අංකය කුමක්ද? ඒ වාගේම පැමිණිල්ල ඉදිරිපත් කළේ කවුද?

අපට ආරංචි හැටියට ලැබෙන තොරතුර තමයි හදිසියේ අභාවයට පත් වුණු රංග නිශාන්ත රාජපක්ෂ මහත්තයා තමයි මේ පැමිණිල්ල ඉදිරිපත් කළේ කියන එක. ඒක ඇත්තද?

දැනට මේ සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කෙබඳුද? මෙම ගෙවීම මුදල් විශුද්ධිකරණයක් ලෙස හෝ අල්ලස් පනත යටතේ ගැනෙන වරදක් ලෙස මේ වන විට හඳුනා ගෙන තිබේද?

07. මෙම මුදල් අස්ථානගතවීමත් සමඟ IMF ගිවිසුමට ප්‍රකාරව තාක්ෂණික ණය පැහැර හැරීමක් සිදු කර ඇති බව රජය පිළිගන්නේද? එම තත්ත්වයෙන් මිදීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය කුමක්ද?

08. ඉතිහාසයේ බරපතළම වගකීම් විරහිත මෙම ගනුදෙනුවට අදාළ කාර්යයන් අධීක්ෂණය හා කළමනාකරණය කරනු ලැබූ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරින් රාජකාරි පැහැර හැර ඇති බව රජය පිළිගන්නේද? එසේ නම්, මුදල් අමාත්‍යාංශ ලේකම් හා වගකිව යුතු නිලධාරින් තවදුරටත් තනතුරේ රඳවා ගනිමින් මේ පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් සිදු කළ යුතු යැයි රජය සිතන්නේද?

ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ප්‍රශ්න 8ක් යොමු කර තිබෙනවා. පළමු ප්‍රශ්නයේ කොටස් කිහිපයක් තිබෙනවා.

01. (i) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පවතින 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ දේශීය හා විදේශීය ණය කළමනාකරණය සඳහා පවතින 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත මෙහි ප්‍රධාන නීතිමය රාමුව වෙනවා.

(ii) එම නීති බලාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ රාජ්‍ය ණය කළමනාකරණය කාර්යාලය වෙත වගකීම් පැවරී තිබෙනවා.

(iii) මෙම නීති රාමුව යටතේ 2025 දෙසැම්බර් 31 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණ වගකීම් දරන ලද අතර, එම ක්‍රමයේ කිසිදු වෙනසක් නොමැතිව 2026 ජනවාරි සිට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය - Public Debt Management Office - විසින් රජයේ ණය කළමනාකරණය සඳහා අදාළ වගකීම් ඉටු කිරීම ආරම්භ කර තිබෙනවා.

02. අදාළ ගෙවීම් සිදු කළ දිනයන් - 2025 නොවැම්බර් මාසයේ 14වැනි දා ඩොලර් 713,757ක් වන වවුචර් තුනයි. 2025 නොවැම්බර් 28වැනි දා 377,660යි. 2026 ජනවාරි 5වැනි දා invoices පහකින් 420,210යි. ජනවාරි 20වැනි දා 997,799යි.

03. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පසුගිය කාලය තුළ අනුගමනය කරනු ලැබූ සම්මත ක්‍රියාපටිපාටිය - standard procedure එක - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 දෙසැම්බර් 31වැනි දින දක්වා ක්‍රියාත්මක කළ අතර, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් 2026 ජනවාරි 01වැනි දා සිට එලෙසම පවත්වාගෙන එනවා. ඒ අනුව ණය හිමියන්ගෙන් ලැබෙන ඉන්වොයිස්පත් විද්‍යුත් තැපැල මඟින් ලබා ගැනීම මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව - Department of External Resources - විසින් සිදු කිරීම.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන ඉන්වොයිස්පත්හි මුදල් ප්‍රමාණය Commonwealth Secretariat Debt Recording and Management System - CS-DRMS - දත්ත පද්ධතියේ සහ ණය සේවා පුරෝකථනය සමඟ සසඳා සත්‍යාපනය කිරීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් සිදු කිරීම.

අදාළ ගිණුම් විස්තර ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - Department of Treasury Operations - සමඟ සහ විදේශීය මුදල් වෙන් කර දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය සිදු කරනවා, Public Debt Management Office එක මඟින්.

මේ සියලු තොරතුරු සත්‍යාපනය කිරීමෙන් අනතුරුව සංචිත නොවන කළමනාකරණ පද්ධතිය - Non-Reserve Management System - වෙත අදාළ දත්ත ඇතුළත් කිරීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මඟින් සිදු කරනවා.

අරමුදල් නිදහස් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනවා.

මෙම ගෙවීම් සඳහා වගකීම් දරන්නේ කවුරුන්ද යන්න නිවැරදිව හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ මේ වෙනකොට සිදු වෙමින් පවතිනවා.

04. (i) අනාවරණය දිනය, 2026 මාර්තු 23වන දින.

(ii) මේ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන් අතර, එම විමර්ශනයෙන් ලැබුණු තොරතුරු "බී" වාර්තාවක් මඟින් අධිකරණයට දැනටමත් වාර්තා කර ඇත. පාර්ලිමේන්තුව අප්‍රේල් මස අවසන් සතියේ රැස් නොවූ නිසා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අවස්ථාවක් නොමැති විය. එසේ වුවද, එම කටයුත්ත සම්බන්ධයෙන් අඛණ්ඩව පරීක්ෂණ පවත්වාගෙන යන අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම මෙන්ම, අභ්‍යන්තර කමිටුවක් මඟින් පරීක්ෂණයක් කර එම කමිටුවෙන් අනාවරණ වූ තොරතුරු මත නිලධාරින් හතර දෙනෙකුගේ වැඩ තහනම් කර ඇත. ඒ අනුව කිසිම අයුරකින් මේ කරුණු වාර්තා කිරීම මඟ හැරීමක් සිදු කර නැත.

05. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයට මේ ගැන වාර්තා කරනවා, 2026 ජනවාරි 09වැනි දා. එය ශ්‍රී ලංකා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පිටපත් කරනවා, එදිනම. ඕස්ට්‍රේලියාවේ Export Finance ආයතනය තමයි ණය හිමියා. මුදල් නොලැබූ බව වාර්තා වෙනවා, 2026 මාර්තු 23වැනි දා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලිඛිත පැමිණිල්ලක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2026 මාර්තු 24 වන දා සිදු කරනවා. මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කිරීම සිදු කරනවා, 2026 අප්‍රේල් 01වන දා.

06. (i) 2026 මාර්තු 24වන දින. අදාළ පැමිණිලි අංකය C/51/26/CR.

(ii) අධිකරණයට මේ සම්බන්ධයෙන් "බී" වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ කුමන ගණයේ වරදක්ද යන්න පිළිබඳ තීරණය කිරීමට අදාළ ආයතන විසින් මේ වනවිට පරීක්ෂණ සිදු කරමින් පවතිනවා.

07. මේ සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගතකරණයට සම්බන්ධ වූ මූල්‍ය හා නීති උපදේශකයන් දැනුවත් කර, මෙය තාක්ෂණික ණය පැහැර හැරීමක්ද - technical default එකක්ද - කියලා අදහස් ලබා ගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාව විසින් ගෙවන ලද මුදල ඕස්ට්‍රේලියානු ණය හිමියා වෙත නොලැබී ඇතත්, ණය ගෙවීමේ නොහැකියාවක් හෝ ණය ගෙවීම පිළිබඳ කිසිදු අකමැත්තක් ශ්‍රී ලංකා රජයට නොමැති බැවින් ද, ඕස්ට්‍රේලියාව ශ්‍රී ලංකා රජය සමඟ ඉතා සමීපව කටයුතු කරන බැවින් හා මෙය සයිබර් අපරාධකරුවන් විසින් කරන ලද්දක් බැවින් මෙය ණය පැහැර හැරීමක් ලෙස ඕස්ට්‍රේලියාව හා පැරිස් ක්ලබ් සාමාජිකයන් විසින් නොසලකනු ලබනු ඇති බව ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණයට සම්බන්ධ උපදේශකයන් විසින් අප දැනුවත් කරලා තිබෙනවා.

08. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරන හෝ ක්‍රියාකාරකම්වලට භාජන කරන ආයතන දෙක වන්නේ, මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයත් වේ. එම නිසා සාධාරණ පරීක්ෂණයක් සිදු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයා තනතුරේ සිටීම බාධාවක් නොවෙයි. නිලධාරින් විසින් රාජකාරි පැහැර හැරීම පිළිබඳව පරීක්ෂණවලින් ලැබෙන තොරතුරු මත අදාළ නිගමන සහ ක්‍රියාමාර්ග ගනු ඇත.

ඒ වාගේම, කලින් දැනුම් දුන් පරිදි අමාත්‍යාංශ නිවේදන යටතේ තවත් තොරතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේම කියනවා, මේ සිද්ධිය අනාවරණය වුණේ මාර්තු මාසයේ 23වැනි දා කියලා. සිද්ධිය අනාවරණය වුණේ මාර්තු 23වැනි දා නම්, අප්‍රේල් 7 සිට අප්‍රේල් 10 දක්වා පාර්ලිමේන්තුව රැස් වුණු බව ඔබතුමා දන්නවා. ඇත්ත වශයෙන්ම මේ වාගේ සිද්ධියක් වුණාය කියන එක ගැන පාර්ලිමේන්තුව දැනුවත් කිරීමේ ඉඩ ප්‍රස්තාව ඔබතුමාට තිබුණා. ඔබතුමාගේම පිළිතුරෙන් කියනවා, මේ සිද්ධිය පිළිබඳව මාර්තු 23වන දා සොයා ගත්තා කියලා. හැබැයි, මේ පිළිබඳව දැනුවත් කරන්න පාර්ලිමේන්තුව රැස් වුණේ නැහැ කියලාත් ඔබතුමා කියනවා. ඒ පිළිබඳව ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාව අවස්ථා ගණනාවකදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත කැඳෙව්වත් පැමිණියේ නැහැ. තුන් වතාවක්ම අඩුම ගණනේ එතුමා හෝ එතුමාගේ නියෝජ්‍ය ලේකම්වරයෙකුවත් පැමිණිලා තිබුණේ නැහැ. ඒ වාගේම මේ වතාවේ කැඳවීම කරනකොට, මේ පිළිබඳව ජනාධිපතිතුමා ප්‍රකාශයක් ඉදිරිපත් කරන නිසා එතුමා කාරක සභාවට එන්නේ නැහැ කියලා පළමුවෙන්ම එය ප්‍රතික්ෂේප කළා. ඊට පස්සේ එතුමා ඒ තීරණය වෙනස් කරලා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් වුණා. හැබැයි, එසේ ඉදිරිපත් වුණු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අවස්ථාවේදීත් මම දැන් අහපු ප්‍රශ්නවලින් කොටසක් අහලාත් තිබෙනවා. විශේෂයෙන්ම ණය වාරික ගෙවූ කාල වකවානු සහ ප්‍රමාණයන් පිළිබඳව උත්තරයක් දීලා නැහැ. ඒ නිසා ඒකට හේතුව මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

ඊළඟට, මගේ අවසන් පැහැදිලි කර ගැනීම මොකක්ද කියලාත් මම කියන්නම්. මේක සංවේදී කාරණාවක්. සිදු වුණු ඛේදනීය අභාවයක් මම වෙනත් වාසි තකා ප්‍රයෝජනයට ගන්නේ නැහැ. නමුත් මම ඔබතුමාට පැහැදිලිව කියන්න කැමැතියි, අපට ආරංචි විධියට අභාවයට පත් වූ රංග නිශාන්ත රාජපක්ෂ මැතිතුමාලු, ඒ අඩු පාඩු සොයාගෙන අදාළ පැමිණිල්ල ඉදිරිපත් කළේ. ඒ වාගේම එතුමාගේ අභාවය පිළිබඳවත්, සිදු කෙරුණු පරීක්ෂණ පිළිබඳවත් විවිධ කරුණු ඉදිරිපත් වෙනවා. විශේෂයෙන්ම එම පරීක්ෂණ කටයුතු පිළිබඳවත්, රංග නිශාන්ත මහතාගේ මරණය පිළිබඳවත් පැහැදිලි ප්‍රකාශයක් කරන්න කියලා මම ඔබතුමාගෙනුත්, අධිකරණ ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරන්න කැමැතියි. විවිධ සැක සංකා ඇතිවෙලා තිබෙන බැවින්, පාර්ලිමේන්තුවට විධිමත් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම වැදගත් කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා. මගේ ප්‍රශ්නවලට අදාළව පැහැදිලි කිරීමක් කරන්න කියලා ගරු අමාත්‍යතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, ඇත්තටම මාර්තු 23වැනි දා තමයි මේ සිද්ධිය පිළිබඳව අනාවරණය වුණේ. මොකක්ද සිදු වුණේ කියන මූලික ඇඟවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්න ප්‍රමාණාත්මක තොරතුරු ලබාගත යුතු වෙනවා. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ පැමිණිල්ල කරලා තොරතුරු ලැබුණාට පස්සේ තමයි, - මේ සම්බන්ධ පරීක්ෂණ තවමත් අවසන් නැහැ. අපි පුන පුනාම කියා සිටියා, මේ පිළිබඳව ප්‍රමාණාත්මක තොරතුරු අරගෙන, ඒ මත තමයි සාකච්ඡා කළ යුතු වෙන්නේ කියලා. මේ පිළිබඳ පරීක්ෂණ තවම අවසන් වෙලා නැහැ. ඇත්තටම අදාළ නිලධාරින් මේකට සම්බන්ධ වුණාද, දැනුවත්භාවයකින් සිටියාද, ඒ වාගේම internal control එකක සිටියාද වාගේ සංකීර්ණ ක්‍රියාවලියක් මේක ඇතුළේ තිබෙනවා. ඒ අනුව තමයි එදාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟුණේ නැත්තේ. නමුත්, ඉදිරියේදී අපි අනිවාර්යයෙන්ම මේ තොරතුරු ඉදිරිපත් කරනවා. ඒ වාගේම සමාජය තුළ මතු වී තිබෙන සැකයක් ගැනත් ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කළා. අවාසනාවන්ත සිද්ධියක් සිදුවෙලා තිබෙනවා, එය සියදිවි හානි කර ගැනීමක් කියලා වාර්තාවලින් ඔප්පුවෙලා තිබෙනවා. හැබැයි, "එතුමාලු, මේ වාර්තාව ගිහින් දුන්නේ" කියලා කිව්වාම මොකක්ද වෙන්නේ? පරීක්ෂණය ගෙනගිය කෙනාව මැරුවාද කියන සැකය මතු කරනවා. මම හිතන විධියට මේ "ලු" ප්‍රකාශ මත, වගකීමකින් තොර තොරතුරු මත කරුණු ඉදිරිපත් කිරීම ඉතාම ගැටලු සහගතයි. මගේ මේ පිළිතුරෙන් ඉතාම පැහැදිලිව කිව්වා, මේ පරීක්ෂණය සඳහා ලිඛිත ඉල්ලීම කරන්නේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කියලා. මොන විධියට කොහෙන් මේ තොරතුරු ගන්නවාද කියලා අපි දන්නේ නැහැ. එහෙම නම් අදාළ source එක මොකක්ද, කාටද පැමිණිල්ල කළේ කියලා කියන්නට ඕනෑ. එවැනි කිසිදු දෙයක් නැහැ. මම මේ ගැන මාධ්‍යයටත් කිව්වා. විශේෂයෙන් අවධානය යොමු කරවනවා, කිසියම් දෙයක නිශ්චිත තොරතුර ලබාගෙන කරුණු ඉදිරිපත් කිරීම වඩාත් හොඳයි කියන කාරණය පිළිබඳව. එහෙම නැති වුණාම එක පැත්තකින් සමාජය නොමඟ යවනවා වාගේම සමාජයට අහිතකර තත්ත්වයකුත් උදා වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම අනවශ්‍ය ලෙස බාධා කරනවා නොවෙයි. නමුත් ගරු ඇමතිතුමා ලබා දෙන පිළිතුර පැහැදිලි වෙන්නට ඕනෑ. මෙතුමා කියනවා, CID එකට පැමිණිල්ලක් කළාලු, මාර්තු 23වැනි දා. CID එකට පැමිණිල්ලක් කරන්නට තරම් තොරතුරු එතුමා සතුව තිබුණා නම්, 7වැනි දාත්, 10වැනි දාත් අතර කාලය තුළ පාර්ලිමේන්තුවට එම තොරතුරු වාර්තා කළේ නැත්තේ ඇයි? CID එකට පැමිණිලි කරන්න පුළුවන් තරම් තොරතුරු තිබුණා නම්, "මෙන්න මෙහෙම සිද්ධියක් සිදු වෙලා තිබෙනවා, මේක ගැන පැමිණිලි කරලා තිබෙනවා" කියලා ඔබතුමාට සරලව කියන්න තිබුණා. අඩුම වශයෙන් මේ පාර්ලිමේන්තුවට හෝ නිවේදනයක් කරන්න තිබුණා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මම මේ ගැන පිළිතුරෙනුත් පැහැදිලි කළා. මෙහි තිබෙන සංකීර්ණතාව මත අපි තොරතුරු ඉදිරිපත් කළ යුතු වන්නේ හරියට තේරුම් අරගෙනයි. මෙහි තිබෙන සංකීර්ණතාව, තාක්ෂණය යන සියලු කාරණා එක්ක මේ අපරාධ ස්වරූපය පිළිබඳව යම් නිවැරදි තොරතුරු අවශ්‍ය නිසා තමයි අපට එම පරීක්ෂණ අවසන් වෙනකම් ඉන්න සිද්ධ වෙන්නේ. එහෙම නැතිව නිකම් ප්‍රකාශ සිදු කිරීම තුළ, බොහෝදුරට පදනමකින් තොර තොරතුරු ප්‍රකාශ සිදු කිරීම තුළ සමාජය නොමඟ යැවීම තමයි සිද්ධ කරන්නේ. අපි එහෙම කටයුතු නොකළේ ඒ නිසායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මහතා.

## II

## NDB බැංකුවේ රුපියල් බිලියන 13.2ක මූල්‍ය වංචාව
NDB வங்கியில் இடம்பெற்ற 13.2 பில்லியன் ரூபாய் நிதி மோசடி
RS. 13.2 BILLION FINANCIAL FRAUD AT NDB BANK

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය මුදල් ඇමති මුදල් අමාත්‍යාංශය ගැන ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දුන්නා. මහ බැංකුව ගැන අහනකොටත් ඒ ආකාරයෙන්ම අද උත්තරයක් ලැබෙයි කියලා මම හිතනවා.

2024, 2025 මූල්‍ය වර්ෂයන් සහ 2026 වසරේ පළමු කාර්තුව පුරා විහිදී ගිය, NDB බැංකුවේ සිදු වූ බවට පිළිගත් රුපියල් බිලියන 13.2ක පමණ - මිලියන 13,200ක්, ගරු කථානායකතුමනි, 800ක් නොවෙයි - මූල්‍ය වංචාව පිළිබඳව අතිශය වැදගත් ජාතික කරුණක් සම්බන්ධයෙන් මම මුදල් අමාත්‍යවරයාගෙන් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙමි.

මෙම සිදුවීම මඟින් නියාමන අධීක්ෂණය, මූල්‍ය පද්ධතියේ අඛණ්ඩතාව සහ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම් පිළිබඳව බරපතළ ගැටලු මතු කරයි. That is when the Central Bank of Sri Lanka got its independence. මම කියන්නේ, ස්වාධීනත්වය ලබාගන්න ඉස්සෙල්ලා මහ බැංකුව රට බංකොලොත් කළා. ඒක ලබා ගත්තාට පසුව දැන් බැංකු පද්ධතිය බංකොලොත් කරගෙන යනවා. ඒකයි තිබෙන බය.

විශේෂයෙන්ම අධීක්ෂණය, මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ රාමුව, anti-money laundering laws යටතේ මූල්‍ය බුද්ධි ඒකකයේ - FIU එකේ - කාර්යභාරය පිළිබඳව මෙහිදී ප්‍රශ්න කෙරේ.

කරුණාකර පහත කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

1. මහ බැංකු අධීක්ෂණ අසාර්ථකත්වය: ව්‍යවස්ථාපිත වගකීම් පැවතියද, වසර තුනකට වැඩි කාලයක් පුරා මෙතරම් විශාල වංචාවක් හඳුනා ගැනීමට හෝ ඒ පිළිබඳව ක්‍රියා කිරීමට මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව අපොහොසත් වූයේ කෙසේද?

   ගරු කථානායකතුමනි, ඔබතුමාට හරි, අපට හරි රුපියල් ලක්ෂයක් ආවා නම් මහ බැංකුව ප්‍රශ්න 100ක් අහනවා. මේ වාගේ රුපියල් මිලියන 13,200ක්, ඒ කියන්නේ අඩු ගණනේ මේකේ transactions 3,000කට වැඩිය ගිහින් තිබෙනවා. ස්වාධීනත්වය ලබා දී තිබෙන මහ බැංකුවට මේ ප්‍රශ්නය පිළිබඳව උත්තරයක් ලබා දීමට බැරි වන්නේ ඇයි?

2. මූල්‍ය බුද්ධි ඒකකයේ - Financial Intelligence Unitහි - කාර්යභාරය: මෙම වංචාව අනාවරණය වීමට මාස 16කට පෙර අවම වශයෙන් බැංකු දෙකක්වත් සැක සහිත ගනුදෙනු - suspicious transactions - පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කර ඇති බවට තොරතුරු ලැබී ඇත. එම වාර්තා පිළිගැනීමට හෝ ඒවාට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වූයේ ඇයි? AML/CFT වගකීම යටතේ මහ බැංකුව මෙම අසාර්ථකත්වය සාධාරණීකරණය කරන්නේ කෙසේද?

   ගරු කථානායකතුමනි, independent Central Bank එකට අනිවාර්යයෙන්ම මේ කාර්යය පවරා තිබෙන අවස්ථාවේදී මා හිතන්නේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාටම අවශ්‍ය වන්නේ මහ බැංකුව ආරක්ෂා කිරීම නොවෙයි, රටේ ජනතාව සහ බැංකු පද්ධතිය ආරක්ෂා කිරීමයි. එය තමයි මා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නේ.

3. අනෙකුත් මූල්‍ය ආයතනවල සම්බන්ධතාව: මේ සම්බන්ධ පරීක්ෂණ මඟින් අනෙකුත් බැංකු හෝ බැංකු නොවන මූල්‍ය ආයතනවල සම්බන්ධයක් අනාවරණය වී තිබේද? එසේ නම්, සමස්ත මූල්‍ය පද්ධතියටම සිදුවිය හැකි බලපෑමේ ඇස්තමේන්තුව කුමක්ද?

   Hon. Speaker, two commercial banks have reported these transactions to the FIU as suspicious transactions. So, why has no action been taken on this?

4. ගෙවීම් පද්ධති (LankaPay) නියාමනය: CEFT ගනුදෙනු 2,700කට අධික ප්‍රමාණයක් සිදු වී ඇති පසුබිමක, LankaPay පෞද්ගලික සමාගම - මේ මහ බැංකුවේ සියයට 40ක කොටස්කරුවෝ - ඇතුළු ජාතික ගෙවීම් යටිතල පහසුකම් පද්ධතිය අනතුරු ඇඟවීම් නිකුත් කිරීමට අපොහොසත් වූයේ ඇයි? තත්කාලීන නිරීක්ෂණ - real-time monitoring - සහ සැසඳුම් පද්ධති බලාත්මක කර නොතිබුණේද?

5. ලාභාංශ සහ ආයතනික ආයෝජකයින්ට බලපෑම: මෙම කාල සීමාව තුළ රඳවා තබා ගත් මුළු ලාභාංශ අගය කොපමණද? සේවක අර්ථසාධක අරමුදල - EPF, සේවක භාරකාර අරමුදල - ETF - ඒ කියන්නේ වැඩ කරන ජනතාවගේ සල්ලි. ඊට පස්සේ සමස්ත රටේ ජනතාව - සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - SLIC - ඒ ආණ්ඩුවට අයිති කොම්පැනියක්- ඇතුළු ආයතනික කොටස් හිමියන්ට මෙයින් සිදු වූ බලපෑම කුමක්ද?

6. රාජ්‍ය මූල්‍ය පාඩුව: සෘජු සහ වක්‍ර බදු පාඩු මෙන්ම අය කරගත නොහැකි ණිහ මුදල් ඇතුළුව රජය ඇස්තමේන්තු කරන මුළු මූල්‍ය පාඩුව කොපමණද?

   මොකද, රුපියල් මිලියන 13,200ක අලාභයක් කියන්නේ, අඩු ගණනේ සියයට 30ක්. ඒ කියන්නේ 3,600ක් පමණ නැති වෙනවා. එතකොට සියයට 18ක VAT එක නැති වෙනවා. SSCL එක නැති වෙනකොට රුපියල් බිලියන 6ක විතර අලාභයක් වෙනවා, ආණ්ඩුවට.

7. විදේශ ප්‍රේෂණ සහ ක්‍රිප්ටෝ මුදල්: යම් අරමුදලක් විදේශගත කර හෝ ක්‍රිප්ටෝ මුදල් - cryptocurrency - හරහා හුවමාරු කර තිබේද? එසේ නම්, විනිමය පාලන අනුමැතියකින් තොරව එවැනි මාරු කිරීම් සිදු කළේ කෙසේද සහ ඒවා යළි ලබා ගැනීමට ගෙන ඇති පියවර මොනවාද?

8. වෙළෙඳ පොළ ප්‍රාග්ධනීකරණය (Market capitalization): මෙම තොරතුරු අනාවරණය වූ දින සිට මේ දක්වා කොටස් මිල සහ වෙළෙඳ පොළ ප්‍රාග්ධනීකරණයේ - market capitalizationහි - සිදු වූ පහත වැටීම කොපමණද? සමස්ත වෙළෙඳ පොළ වටිනාකමේ පාඩුව කොපමණද?

   ගරු කථානායකතුමනි, මේකේ debenture issue එකක් තිබුණා, මාර්තු මාසයේ 10වැනි දා. ඒක 19වැනි දා අවසන් වුණා. ඉතින්, මේ බැංකුවේ වංචාවක් සිදු වෙමින් යන අවස්ථාවේදී මහ බැංකුව තුළින් රටට හෙළිදරව් කරනවා, මේකේ කිසි ප්‍රශ්නයක් නැහැයි කියලා. දවස් 10කට පස්සේ කියනවා, මෙන්න ලොකු වංචාවක් වෙලා තිබෙනවා කියලා. ඒක ගැන දැනුවත් කරන්නේත් Stock Exchange එක, මහ බැංකුව නොවෙයි.

9. ස්වාධීන විගණනය: මහ බැංකුව විසින්ම අධිකරණ විගණකවරයකු - forensic auditor කෙනෙකු - පත් කිරීම තුළින් බැඳියාවන් අතර ගැටුමක් - conflict of interest - නිර්මාණය නොවේද? මුදල් අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයාගේ බලතල යටතේ රජය විසින් ස්වාධීන විගණකවරයෙකු පත් කරනු ලබන්නේද?

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා කල් ඉල්ලා සිටිනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාගේ අවසර පරිදි මම ඉල්ලීමක් කළා, මගේ fundamental rights උල්ලංඝනය වෙලා තිබෙනවා කියලා. මහ බැංකුව සම්බන්ධ මේ 9වැනි ප්‍රශ්නයට උත්තර දීලා නැහැ. මම කථා කළේ සමස්තයක් වශයෙන් මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් 225දෙනා වෙනුවෙන්. දැන් පිටින් අහන ප්‍රශ්නවලට ඒ අය උත්තර දෙනවා. අපෙන් අහනවා, පාර්ලිමේන්තුවේ ඉන්න අය මොනවාද කරන්නේ කියලා. මම දන්නවා, ඇමති වුණත් මේ අවස්ථාවේදී අසරණ වෙලා ඉන්න බව. කරුණාකර මේ ගැන ඔබතුමා විධිමත් පරීක්ෂණයක් කරලා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට, රටට, ජනතාවට සැබෑ තත්ත්වය කියන්න පුළුවන් මාර්ගයක් මහ බැංකුවට යටත් නොවෙමින් සකස් කරන්න කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අද දිනට නියමිත ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කිරීමට මත්තෙන් මේ පාර්ලිමේන්තුවටත්, රටේ ප්‍රජාතන්ත්‍රවාදයටත් ඉතාම වැදගත් වන කාරණයක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න එක මිනිත්තුවක් මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාරය සතු ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනක මුදලක් අස්ථානගත වීමේ ආන්දෝලනාත්මක සිද්ධිය ගැන මේ දවස්වල රට පුරා ලොකු සංවාදයක් ගොඩනැඟිලා තිබෙනවා. මේ විධියට අස්ථානගත වෙලා තිබෙන්නේ ජනතාවගේ බදු මුදල්. ඒ වාගේම මුදල් පිළිබඳ බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට. නමුත්, ඒ ගැන පාර්ලිමේන්තුවට වාර්තාවීමක් වුණේත් නැහැ. ඒ නිසා පසුගිය දවසක ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පක්ෂ නායක රැස්වීමේදී විපක්ෂය වෙනුවෙන් අපි ඉල්ලා සිටියා, මේ පාර්ලිමේන්තු සතියේදී දිනයක විවාදයක් මේ සම්බන්ධයෙන් අපට අවශ්‍යයි කියලා. නමුත්, රජය ඒක ප්‍රතික්ෂේප කළා. අපි ඔබතුමාගෙන් දැනටමත් මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ගේ අත්සනින් හදිසි විවාදයක් ඉල්ලා තිබෙනවා, ලිඛිතව. 20දෙනෙකුට නොඅඩු අපේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් නැඟිටලා ස්ථාවර නියෝග 19 (2)(ඇ) යටතේ හදිසි විවාදයක් ලබා දෙන්න කියලා නැවත ඉල්ලා සිටිනවා.

***[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු විසිදෙනෙකුට වැඩි පිරිසක් සිය අසුන්වලින් නැඟී සිටියහ.]***
*[இச்சந்தர்ப்பத்தில் இருபதுக்கும் மேற்பட்ட எதிர்க்கட்சி உறுப்பினர்கள் தமது ஆசனங்களில் இருந்து எழுந்து நின்றனர்.]*
*[At this stage, more than twenty Hon. Members of the Opposition rose from their seats.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 19(2) යටතේ වූ කාරණය කෙරෙහි අවධානය යොමු කිරීමට මම කැමැතියි. "හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා කල් තැබීම" යටතේ ස්ථාවර නියෝග 19(1)හි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "ප්‍රශ්න අවසාන වූ විට මන්ත්‍රීවරයකු ස්වකීය ස්ථානයේ නැඟී සිට හදිසි පොදු වැදගත්කමක් ඇති නිශ්චිත කාරණයක් සාකච්ඡා කිරීම සඳහා කාරණය කුමක්දැයි සඳහන් කරමින් පාර්ලිමේන්තුව කල් තැබීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා ඇතොත් මිස, ප්‍රධාන කටයුතු ආරම්භ කරන තෙක් (අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හැර) පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය."

ඊළඟට, ස්ථාවර නියෝග 19(2)හි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "(අ) එවැනි ඕනෑම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම් පටන් ගැනීමට පෙර ඒ යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, කථානායකවරයාගේ එකඟත්වය ලබා ඇත්නම්; සහ
>
> (ආ) මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ අවසරය ලබාගෙන ඇත්නම්; හෝ
>
> (ඇ) පාර්ලිමේන්තුවේ අවසරය ලබා නොදෙන ලදුව, විසි දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් ස්වකීය ස්ථානවල සිට ඒ මන්ත්‍රීවරයාගේ ඉල්ලීමට අනුග්‍රහ දැක්වීමට නැඟී සිටිත් නම්
>
> මිස (1) ඡේදය යටතේ එවැනි යෝජනාවක් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය:"

ඔබතුමන්ලාට නැවත වතාවක් අවධාරණය කරමින් මම කියන්න ඕනෑ, බොහොම අවධානයෙන් සහ කරුණු කාරණා හොඳටම තේරුම් ගන්න, ස්ථාවර නියෝග 19(2) (අ)හි සඳහන්ව තිබෙන්නේ මොකක්ද කියලා. [බාධා කිරීම්] ඔබතුමන්ලා මේ සභාව පටන් ගන්න කලින් මේ සම්බන්ධව මට දැනුම් දිය යුතුයි. නමුත් මම මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා මෙම විවාදයට,- [බාධා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම බොහොම පැහැදිලිව ඔබතුමාගෙන් ඉල්ලනවා, ස්ථාවර නියෝග 19(2) (ඇ) කියවන්න කියලා. ගරු කථානායකතුමනි, ඒකේ බොහොම පැහැදිලිව මේ ගැන තිබෙනවා. ඔබතුමා කරන මේ අර්ථ නිරූපණය වැරදියි. අපි දැන් ඔබතුමාට මේක ලිඛිතව ලබා දීලා තිබෙනවා. ඊට පස්සේ තිබෙන්නේ, "අවසරය ලබා නොදෙන ලදුව" කියලා. එතකොට අපි විසිදෙනෙක් නැඟිටලා මේ ඉල්ලීම ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ කියන්නේ, කිසිම ප්‍රශ්නයක් නැහැ. මම දන්නේ නැහැ, ඔබතුමා අලුත් අර්ථ නිරූපණයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න හදනවා ද කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. කරුණාකරලා මේ අවස්ථාව දෙන්න. මේක සම්පූර්ණයෙන්ම වැරදියි. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගවල බොහොම පැහැදිලිව තිබෙනවා මේ අවස්ථාව ලබා දෙන්න කියලා. ඔබතුමාට මේක ආපසු වෙනත් විධියකට අර්ථ නිරූපණය කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දැන් මෙතුමන්ලා විසිදෙනෙකු නැඟිටලා ඉල්ලීමක් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, කීය වුණත්,- *[බාධා කිරීමක්]* අපට තිබෙන්නේ මන්ත්‍රීතුමන්ලා විසිදෙනෙකු නැඟිටලා කරපු ඉල්ලීම පිළිබඳ ප්‍රශ්නය නොවෙයි. ඒ නිසා මේ යෝජනාවට අපට ඉඩ ලබා දෙන්න පුළුවන්. නමුත් අපි කියන්න කැමැතියි, මේ සම්බන්ධයෙන්,- *[බාධා කිරීම්]* ඇහුම්කන් දෙන්නත් පුළුවන් වෙන්න ඕනෑ. ඒ මොකද දන්නවාද? ගරු කථානායකතුමනි, පැහැදිලිවම අද පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කරමින් තමයි දැන් මේ යෝජනාව ඉදිරිපත් වෙන්නේ. විපක්ෂ නායකවරයාටත් පිළිතුරු ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මෙකේ වෙන අධිකරණමය පැත්තකුත් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අධිකරණමය කටයුත්තකුත් පවතිනවා. *[බාධා කිරීම්]* Facts report කරලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ ඒකයි. *[බාධා කිරීම්]* ඒ නිසා පාර්ලිමේන්තු සම්ප්‍රදායය සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙන්න පුළුවන්, විශේෂයෙන්ම විනිශ්චයේ තිබෙන කරුණක් නිසා. නමුත් කිසි ප්‍රශ්නයක් නැහැ, අද අපර භාග 3.30 ඉඳලා 5.00 දක්වා - පැය දෙකකට ආසන්නයි නේ - කාලය ලබා දෙන්න අපි ලැහැස්තියි, විවාදයට. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Thank you. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඒක නොවෙයි ප්‍රශ්නය. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හවස 5.30 වෙනකල්, ගරු සභානායකතුමනි. [බාධා කිරීම්] හවස 5.30 වෙනකල්. [බාධා කිරීම්] From 3.30 p.m. to 5.30 p.m. [බාධා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඔබතුමා ඉන්නේ අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එතැන point එකක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් පැත්තකින් තියලා,- *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කරුණාකරලා පාර්ලිමේන්තුවේ වැඩකටයුතු කරගෙන යන්න ඉඩ දෙන්න කියන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමන්ලාට විවාදය ලබා දීලා තිබෙනවා, හවස 3.30 ඉඳලා 5.00 වෙනකල්. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අවස්ථාව ලබා දුන්නාට පස්සේ ආයෙත් බාධා කරන්නේ, මොකක්ද මේ? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
3.30 ඉඳලා, 5.00 වෙනකල්. [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
3.30 ඉඳලා 5.00 වෙනකල්. *[බාධා කිරීම්]* 5.00ට. *[බාධා කිරීම්]* නැහැ, main Business සඳහා කාලය අවශ්‍යයි. මේ විවාදය, from 3.30 p.m. to 5.00 p.m.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහගන්න, විවාදය හවස 3.30 ඉඳලා 5.00 දක්වා ලබා දෙනවා. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේගොල්ලන් කෑ ගහනවා නම්, ගරු කථානායකතුමනි, අපි මේක withdraw කර ගන්නවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමා අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න. *[බාධා කිරීම්]* ඔබතුමායි දෙන්න ඕනෑ හරි නම්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමා අහගෙන හිටියාද, මම කියන එක? *[බාධා කිරීම්]* දැන් ආයෙත් කියන්නේ නැහැ. දෙවැනි වතාවට,- *[බාධා කිරීම්]* විවාදය හවස 3.30 ඉඳලා 5.00 දක්වා ලබා දෙනවා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි. [බාධා කිරීම්] ලජ්ජයි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
*අමාත්‍යාංශ නිවේදන. [බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, විපක්ෂය වෙන drama එකකට සෙට් වෙලා ආවා; ඒ drama එක කර ගන්න බැරි වුණා. *[බාධා කිරීම්]* දැන් අපි ඉඩ දුන්නාට පස්සේ ආයෙත් කෑ ගහනවා. *[බාධා කිරීම්]* මොකටද කෑ ගහන්නේ? *[බාධා කිරීම්]* අපි විවාදයට ඉඩ දීලා නේ තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කරුණාකරලා අපට,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාලය වටිනවා. කරුණාකරලා,- [බාධා කිරීම්] දැන් ඔබතුමන්ලාට අවස්ථාව ලබා දීලා තිබෙනවා. [බාධා කිරීම්] නැවත වතාවක් Standing Order 19 (2)ත් කියවන්න කියලා මම ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට main Businessවලට යන්න තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Main Businessවලට යන්න තිබෙනවා, අපිට. *[බාධා කිරීම්]*

අමාත්‍යාංශ නිවේදන, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා. *[බාධා කිරීම්]* 2026.01.07වැනි දින ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා සහ 2026.03.06වැනි දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා අසුන් ගන්න. [බාධා කිරීම්] අසුන් ගන්න. [බාධා කිරීම්] අසුන් ගන්න. [බාධා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අසුන් ගන්න බැහැ. ලජ්ජයි. *[බාධා කිරීම්]* පැලවත්තෙන් ඇවිල්ලා ඉන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]* ලජ්ජයි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
3.30 ඉඳලා 5.00 දක්වා ඔය කියවන්න තිබෙන දේවල් කියවන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. *[බාධා කිරීම්]* ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුර ලබා දෙන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ප්‍රශ්න අංක 01, 2025 යල කන්නයේදී රජය මිලදී ගත් සමස්ත වී ප්‍රමාණය සහ ඒ සඳහා,- *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් රකින එකද කරන්නේ? මොකක්ද කරන්නේ ඔබතුමා? *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට අපහාසාත්මකව මෙතැන දැන් චෝදනා කරනවා. අපි ඉතාම පැහැදිලිව ඔබතුමාට කියන්න කැමැතියි, කරුණාකරලා ඒ සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගන්න කියලා. *[බාධා කිරීම්]* මෙතැන එහෙම බැහැ. *[බාධා කිරීම්]* එහෙම ගන්න බැහැ. *[බාධා කිරීම්]* එහෙම ගන්න බැහැ. *[බාධා කිරීම්]* මේකේ සීමාවක් තිබෙන්න ඕනෑ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි ඔප්පු කරලා පෙන්වන්නම්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කවුද කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් පාර්ලිමේන්තුවේ,- *[බාධා කිරීම්]* මොකද, අපට ඉන්නේ,- *[බාධා කිරීම්]*

ඔබතුමා අපි කාගේත් කථානායක. මෙතැන ඉන්න එක එක හෙංචයියන්ට ඔබතුමාට එක එක දේවල් කියලා සභාවේ ගරුත්වය නැති කරන්න ඉඩ දෙන්න බැහැ. ඒ වෙනුවෙන් වහාම විනය ක්‍රියාමාර්ග ගන්න කියලා අපි යෝජනා කරනවා. *[බාධා කිරීම්]* වහාම විනය ක්‍රියමාර්ග ගන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* කිසිම point එකක් නැහැ, ඉඳගන්න. මම ස්ථාවර නියෝග 19(2)ට අනුව වැඩකටයුතු කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඉඳගන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේගොල්ලන් මේකට බාධා කරනවා නම් අපි මේක allow කරන්නේ නැහැ. *[බාධා කිරීම්]* Main Business කරන්න දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා. *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විවාදය පවත්වන්න රජය එකඟ වුණාට පස්සේ ඔබතුමා බොහොම පැහැදිලිව සභාවේදී ප්‍රකාශ කළා, හවස 3.30 සිට 5.30 දක්වා කියලා. ඒක record වෙලා තිබෙනවා. ඊට පස්සේ මොනයම් හෝ හේතුවකට ඔබතුමාට නියෝගයක් ආවා, පැය භාගයකින් මේ කාලය අඩු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පැය භාගයක් කප්පාදු කරන්නේ නැතිව හවස 3.30 සිට 5.30 දක්වා මේ විවාදයට අවස්ථාව ලබා දෙන්න කියලා. ඒකයි මගේ ඉල්ලීම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලේකම් මණ්ඩලයේ උපදෙස් පරිදි,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පැය දෙකක් දෙන්න; පැය දෙකක් දෙන්න, අපට. පැය එකහමාරෙන් මොකක්ද කරන්න පුළුවන්? පැය දෙකක් දෙන්න, අපට. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පැය දෙකක් ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මම එතුමන්ලාට කියන්න කැමැතියි, ආණ්ඩු පක්ෂය විධියට අපි මේ විවාදයට අවස්ථාව ලබා දෙන්න එකඟ වෙලා තිබෙන බව. *[බාධා කිරීම්]* එම නිසා ඔබතුමන්ලා කරුණාකරලා,- *[බාධා කිරීම්]* ඔබතුමන්ලා ආණ්ඩුවේ main Business කරන්න දෙන්නේ නැතිව බාධා කරනවා නම් අපි මේක ඉල්ලා අස් කර ගන්නවා. *[බාධා කිරීම්]* ඔව්, අපට පුළුවන්. *[බාධා කිරීම්]* අපට පුළුවන්. *[බාධා කිරීම්]* අපට පුළුවන්. අපි කරුණාවෙන් කියන්නේ. අපි මේ විවාදයට භය නැහැ. *[බාධා කිරීම්]* අපි මේ විවාදයට භය නැහැ. *[බාධා කිරීම්]* අපි මේ විවාදයට හොඳටම ලැහැස්තියි. අද පාර්ලිමේන්තුවේ හවස 3.30 ඉඳලා 5.00 වනකල් තමයි මේ විවාදය තිබෙන්නේ. ඊට පස්සේ තමයි adjourn කරන්න තිබෙන්නේ. එම නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ හවස 3.30 ඉඳලා,- *[බාධා කිරීම්]* Standing Orders අනුව ඔබතුමන්ලා හවස 5.00 දක්වා ඒ විවාදය පාර්ලිමේන්තුවේ පවත්වන්න. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වෙලාව පැය භාගයක් දික් කරමු.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, අද පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාගේ විවාදය තිබෙන්නේ හවස 3.30 ඉඳලා 5.00 වනකල්. *[බාධා කිරීම්]* පාර්ලිමේන්තුවේ main Business තිබෙන්නේ, උදේ 9.30 ඉඳලා හවස 5.00 වනකල්. *[බාධා කිරීම්]* ඒ වෙලාව දෙන්නම්. ඊට වඩා බැහැ. *[බාධා කිරීම්]* නැහැ, මේ තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් වාඩි වෙන්න බාධා කරන්නේ නැතිව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක පැහැදිලිව තේරුම් ගන්න. ප්‍රධාන වැඩකටයුතු තිබෙන්නේ උදෑසන 11.30 සිට හවස 5.00 දක්වා. අපර භාග 5.00 ඉඳන් 5.30 දක්වා තිබෙන්නේ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න. කරුණාකරලා බාධා කරන්නේ නැතිව වැඩකටයුතු ඉදිරියට කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, හවස 3.30 සිට 5.00 දක්වා තිබෙන ප්‍රධාන වැඩකටයුතු සඳහා වෙන් කර තිබෙන කාලයෙන් ඔබතුමන්ලා ඉදිරිපත් කළ Motion එක ගෙනෙන්න මම අවසර ලබා දී තිබෙනවා. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරු ලබා දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමන්ලා පැය ගණන් කථා කරන්නේ, හවස 5.30න් පස්සේ. එම නිසා 5.30 වනතුරු මේ විවාදය පවත්වන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි මේ වැඩකටයුතු කරගෙන යන්නේ Standing Orders අනුව නේ. Standing Orders අනුව තමයි අපි වැඩකටයුතු කරගෙන යන්නේ. අපි කියන්නේ මේකයි. අද main Business තිබෙන්නේ උදෑසන 9.30 සිට හවස 5.00 වෙනකල්. හවස 3.30 ඉඳලා 5.00 වෙනකල් ඔබතුමන්ලා විවාදය කරන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා මේ කරන්නේ කාලය කා දැමීමක්. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපට වෙලාව දෙන්න තිබුණා. ඔබතුමන්ලා දැන් තව විනාඩි 30ක් අරගෙනයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* දැන් ඔබතුමන්ලා වාඩි වෙන්න. ඔබතුමන්ලා වාඩිවෙලා main Business පටන් ගන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* නැහැ, main Business පටන් ගන්න ඉඩ දෙන්න. ඉස්සෙල්ලා ඔබතුමන්ලා වාඩි වෙන්න. ඔබතුමන්ලා වාඩි වෙලා ඉස්සෙල්ලා main Business පටන් ගන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලාල් කාන්ත අමාත්‍යතුමා. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමන්ලා වාඩි වෙලා ඉස්සරවෙලා main Business පටන් ගන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්න. *[බාධා කිරීම්]* ගරු අමාත්‍යතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පැය දෙකක් දෙනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඉස්සෙල්ලා වාඩි වෙන්නකෝ. *[බාධා කිරීම්]*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
පළමු ප්‍රශ්නයෙන් 2025 යල කන්නයේදී රජය මිලදී ගත් සමස්ත වී ප්‍රමාණය සහ ඒ සඳහා වැය කළ මුදල කොපමණද යන්න අසා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point of Order එකට -*[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අද සවස 5.00 සිට 5.30 දක්වා තිබෙන්නේ, සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න. අපි කියන්නේ, ඒ කාලයත් මේකට ලබා දීලා අපට පැය දෙක ලබා දෙන්න කියලායි. ඔබතුමා ප්‍රකාශ කරලා ඉවරයි. ඔබතුමා ප්‍රකාශ කළා, මේ සභාවේ. පැය දෙකක් කියලා ඔබතුමා ප්‍රකාශ කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගයන්ත මන්ත්‍රීතුමනි, ප්‍රධාන කටයුතු තිබෙන්නේ පෙර වරු 11.30 ඉඳලා පස් වරු 5.00 දක්වා. ඒ අනුව වැඩකටයුතු කරන්න. ඊට පස්සේ පස් වරු 5.00 ඉඳලා 5.30 වනතුරු තිබෙන්නේ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න ඉදිරිපත් කිරීම. මේවා අපි Parliamentary Business Committee එකේදී එකඟ වෙච්ච කාරණා. ඔබතුමන්ලාට මේ විධියට ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීමේ හැකියාවක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩිවෙන්න. ඔබතුමා තමයි මෙතැන ප්‍රධානවම- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම point of Order එකකට අවස්ථාව ඉල්ලුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා රෑ වෙනකම් points of Order කථා කරයි. *[බාධා කිරීමක්]*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මිලදී ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 49,552යි.*[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point of Order එකට අවස්ථාව දෙන්න ඕනෑ, කථානායකතුමා.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා විසිදෙනෙක් ඉන්නවා. විසිදෙනාම points of Order ඉල්ලා සිටිය යුතු නැහැ. ඔබතුමා නියෝජනය කරන පක්ෂය- *[බාධා කිරීමක්]* දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්තුතිවන්ත වෙනවා සභානායකතුමාට. අපි කියන්නේ මේකයි. දැන් වෙලාව පස් වරු 12.05යි. ඉතුරු විනාඩි 25ත් පසුව අපි lunch එකට තිබෙන වෙලාවත් අරගෙන මේක ඉදිරියට කරගෙන යමු. එතැනින් පස්සේ පැය දෙක ගාණට එනවා. ඔබතුමන්ලා සමහර වෙලාවට සවස 5.00 පහු වුණත් වෙලාව දීර්ඝ කරගෙන පැයක් විතර කථා කරනවා නේ. අපට මෙහෙම කරන්නේ ඇයි? මෙච්චර හොරකමක් වෙලා තිබෙනවා, රට ඇතුළේ. විශාල විනාශයක් වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]* කියන දේ අහලා වාඩිවෙන්න.

ගරු ලාල් කාන්ත අමාත්‍යතුමා. පිළිතුර ඉදිරිපත් කරන්න.

# 2025/2026 වී මිලදී ගැනීම: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය

# 2025/2026இல் நெல் கொள்முதல்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று

# PURCHASE OF PADDY IN 2025/2026: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් 2026.03.06 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. මිලදී ගත් වී ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 49,552

   වැය කළ මුදල - රුපියල් මිලියන 6,300

   මෙම මුදල අය වැය මඟින් වෙන්කර ඇත.

2. මිලදී ගත් වී තොග මේ වන විට වෙළඳ පොළට නිකුත් කිරීම සඳහා සතොස ආයතනය වෙත මෙට්‍රික් ටොන් 2,978ක වී තොග නිකුත් කර ඇත. අලාභයක් සිදු වී නොමැත.

3. 2025/26 මහ කන්නයේ වී මිලදී ගැනීමේ අපේක්ෂිත ඉලක්කය - මෙට්‍රික් ටොන් 80,000

   රජය සතුව මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක ගබඩා ධාරිතාවක් පවතින අතර, දැනට මෙට්‍රික් ටොන් 250,000ක වී ගබඩා කිරීමට භාවිත කළ හැක. මෙම ගබඩාවල 2026.03.19 වන දිනට මෙට්‍රික් ටොන් 96,354.7ක ප්‍රමාණයක් වී ගබඩා කර ඇත. කෙසේ නමුත් සමහර ප්‍රදේශවල ගොවීන් වැඩි ප්‍රමාණයක් වී අලෙවි මණ්ඩලයට වී ලබා දීමේ ප්‍රවණතාව වැඩි වීම මත ගබඩා ප්‍රමාණවත් නොවීමක් ඇති වුවහොත් කුලී පදනම මත ගබඩා කිහිපයක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

4. සියයට 62.2කි.

   2026.03.19 වන දිනට සත්‍ය ලෙස මිලදී ගෙන ඇති වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 49,780.748ක්. ඒ සඳහා රජය රුපියල් මිලියන 5,982.373ක් වැය කර ඇත.

   රජයේ සංඛ්‍යාලේඛන සහ සත්‍ය මිලදී ගැනීම් අතර පරතරයක් නොමැත.

   ගොවීන්ගේ විරෝධතාව පවතින්නේ තෙත වී මිල අඩු වීම සම්බන්ධයෙනි. නමුත් වී අලෙවි මණ්ඩලය මිලදී ගනු ලබන්නේ ප්‍රමිතිගත වී බැවින් රජයේ සහතික මිල අනුව වෙළඳපොළේ මිලද සමගාමීව පවතියි.

5. රජය මඟින් වී මිලදී ගැනීමේ මිල ලෙස ප්‍රකාශ කර ඇත්තේ සම්මත වී (තෙතමනය සියයට 14) මිලදී ගැනීමේ අවම මිල (MPP) යි. ඒ අනුව 2025/26 මහ කන්නයේ අවම මිලදී ගැනීමේ මිල තීරණය කිරීමේදී ගොවියාගේ සැබෑ නිෂ්පාදන වියදම ගණනය කිරීමට භාවිත කළ සූත්‍රය පහතින් දක්වා ඇත. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සකස් කරන ලද ඇමුණුම 01 හි සඳහන් නාඩු (සුදු) නිෂ්පාදන වියදමට (COPට) අදාළව සහතික මිල/වී මිලදී ගැනීමේ අවම මිල (MPP) ගණනය කිරීම් ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| එනම්, අස්වනු නෙළාගත් වහාම, නාඩු වී කිලෝ 1ක (තෙතමනය සියයට 22) නිෂ්පාදන වියදම (COP) | = | රුපියල් 81.00 |
| නිර්දේශිත සම්මත විචල තෙතමනය | = | සියයට 14 |
| අස්වනු නෙළාගත් පසු සම්මත වී කිලෝ 1ක් නිෂ්පාදනය කළ පසු, වී කිලෝ 1 ක් නිෂ්පාදනය කිරීමේදී හානි වන බර | = | සියයට 12 |
| ඒ අනුව සම්මත වී කිලෝ එකක් නිෂ්පාදනය කිරීමෙන් පසු වී කිලෝ 1ක් සඳහා යන වියදම | = | COP* 112/ සියයට 100 |
| | = | රුපියල් 81.00*1.12 |
| | = | රුපියල් 90.72 |

තෙත වී කිලෝ 1ක් නිෂ්පාදනය කරගන්න රුපියල් 90.72ක් යනවා.

| | | |
|---|---|---|
| වී වියළීම සඳහා වැය වන මුදල | = | රුපියල් 4.50 |
| සම්මත (තෙතමනය සියයට 14) වී කිලෝ 1 ක නිෂ්පාදන වියදම | = | රුපියල් 95.22 |

දැනට ලංකාවේ වී කිලෝ 1ක නිෂ්පාදන වියදම -ප්‍රමිතිගත වී කිලෝ 1ක් සඳහා - රුපියල් 95.22ක්.

| | | |
|---|---|---|
| සියයට 26 - සියයට 30 ක ලාභාංශයක් එකතු කිරීම | = | රුපියල් 119.97 |
| ඒ අනුව, මෙවර 2025/26 මහ කන්නයේ නාඩු වී කිලෝවක් සඳහා වී මිලදී ගැනීමේ අවම මිල (MPP) | = | රුපියල් 120.00 |

මෙහිදී, රුපියල් 119.97 නිසා 120ක් විධියට රවුම් අගයක් ප්‍රකාශයට පත් කළා.

ගොවියාට ලාභයක් ඉතිරි නොවන මිලක් "සහතික මිල" ලෙස හැඳින්වීම ජනතාව මුළා කිරීමක් නොවේද කියා මෙහි අසා තිබෙනවා. එසේ ජනතාව මුළා කිරීමක් කර නැහැ. එනම්, ඉහතින් සඳහන් කරන ලද ගණනය කිරීම් මඟින්ද පැහැදිලිව සඳහන් කර ඇති පරිදි වී ගොවියා සහ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ අරමුණින් වී මිල දී ගැනීමේ අවම මිල තීරණය කිරීමක් සෑම කන්නයක් පාසාම උපරිම සියයට 30ක ලාභාංශයක් එකතු කිරීමක්ද සහිතව සිදු කර ඇත. ඒ කියන්නේ, සියයට 30ක ලාභයක් තිබෙනවා, වී කිලෝ එකකින්.

මෙවර 2025/26 මහ කන්නයේ අවම මිල තීරණය කිරීමේදී ඉහත සියලු ගණනය කිරීම් ගොවියාගේ සැබෑ නිෂ්පාදන වියදම ගණනය කිරීමට භාවිත කරන ලද ක්‍රමවේදයට අනුව ඉදිරිපත් කර ඇත. තවද, වී මිල දී ගැනීමේ අවම මිල තීරණය කිරීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ නියෝජනය වන ආයතන සම්බන්ධ කර ගනිමින් පත් කරන ලද මිල කමිටුවේ උපදෙස් මත ලාභාංශය සහ ඒ අනුව මිල ගණනය කරනු ලබයි.

6. මෙට්‍රික්ටොන් 79,064යි.

   එම අඩුව ජාතික සහල් සැපයුමට බලපාන ආකාරය පිළිබඳ රජය ඇගයීමක් සිදු කර තිබෙනවා. එම විස්තරය ඇමුණුම 02 ලෙස පහත සඳහන් පරිදි ඉදිරිපත් කරනවා.

- 2025/26 මහ කන්නය සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් (2026.03.08 වන දින සපයන ලද තොරතුරු පදනම්ව) ලබා ගන්නා ලද තොරතුරු අනුව වගා කළ මුළු වගා වපසරිය හෙක්ටෙයාර 769,764ක් වූ අතර, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හෙක්ටෙයාර 57,274ක් පූර්ණ වශයෙන් විනාශ විය. නැවත වගා කළ වගා වපසරිය හෙක්ටෙයාර 33,576කි. (ඇමුණුම 04)
- එම තොරතුරුවලට අනුව "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හෙක්ටෙයාර 57,274ක ප්‍රමාණයක් විනාශ වීමෙන් වී මෙට්‍රික් ටොන් 194,638ක් අහිමි වී ගියද නැවත හෙක්ටෙයාර 33,576ක් වගා කිරීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 118,573ක ප්‍රමාණයක් වී අස්වැන්නට එකතු විය. ඒ අනුව අහිමි වූ වී අස්වැන්න මෙට්‍රික් ටොන් 79,064ක් ලෙස ගණන් බැලිය හැකිය.
- 2025/26 මහ කන්නයේ අපේක්ෂිත අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 2.66ක් වූ අතර වගා හානි ගැළපීමෙන් අනතුරුව එය මෙට්‍රික් ටොන් මිලියන 2.58කි.

7. 2025/26 මහ කන්නයේ සමස්ත වී නිෂ්පාදන අස්වැන්න මේ වසරේ ජූලි මස තෙක් ප්‍රමාණවත්ය.

ඒ කියන්නේ මහ කන්නයේ ඒවා පමණක් ජූලි මස දක්වා ප්‍රමාණවත් වෙනවා.

නමුත් මහ කන්නයේ අපේක්ෂිත වී අස්වැන්න පදනම් කර ගනිමින් 2025/26 මහ කන්නයේ වී නිෂ්පාදනය කළ හැකි අපේක්ෂිත සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 1.53ක් වේ. එය රටේ අවශ්‍යතාව අනුව මාස 6.5කට පමණ ප්‍රමාණවත්ය.

2026 යල කන්නයේ වී නිෂ්පාදනය කළ හැකි අපේක්ෂිත සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 1.32ක් වේ. දර්ශීය ඉලක්ක සපුරා ගතහොත් එය රටේ අවශ්‍යතාව අනුව මාස 5.6කට පමණ ප්‍රමාණවත්ය.

2025/26 මහ කන්නය සහ 2026 යල කන්නය යන දෙකම සැලකූ විට දැනට සමස්තයක් ලෙස රටේ සහල් ජාතික සහල් සැපයුමට ප්‍රමාණවත්ය. (විස්තරය ඇමුණුම 03 මඟින් යොමු කර ඇත)

එමෙන්ම, 2025/26 මහ කන්නයේ සම්බා සහ කීරි සම්බා මුළු නිෂ්පාදනය මෙරට සහල් අවශ්‍යතාව සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවන බැවින් ස්ථාවර මිලක් සහිතව සම්බා සහ කීරි සම්බාවලට වෙළෙඳ පොළෙහි පවතින ඉල්ලුම සපුරාලීම පිණිස එම සහල් වර්ගවලට සමාන සම්බා සහ කීරි සම්බා සඳහා පිළිවෙළින් ආදේශක සේ සලකනු ලබන හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS Code) 1006.30.29 යටතේ වර්ගීකරණය කර ඇති පොන්නි සම්බා සහ කීරි/පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 ලෙස හඳුන්වනු ලබන සහල් වර්ගයෙන් එක් ආනයනකරුවෙකු වෙත මෙට්‍රික්ටොන් 1,040ක උපරිමයකට යටත්ව 2026.04.02 දින සිට 2026.04.30 දින දක්වා කාල සීමාව තුළ සහල් ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එමඟින් ඉහත සඳහන් ආදේශක සහල් මෙට්‍රික් ටොන් 100,000-125,000 අතර ප්‍රමාණයක් ආනයනය කර වෙළෙඳ පොළට සැපයීමට අපේක්ෂා කෙරේ.

ඇමුණුම් 01, 03 සහ 04 **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට ස්තුතියි. හැබැයි, මම ඔබතුමාට නැවත වරක් යෝජනා කරනවා, පිරිවැය - යන වියදම - ගණනය කරන සූත්‍රය පිළිබඳව රාජ්‍ය ආයතන සහ විශේෂඥයින් සම්බන්ධ කරගෙන ආපහු සොයා බලන්න කියලා. මොකද, ඔය කියපු වියදමට වඩා වැඩි වියදමක් යනවා. විශේෂයෙන්ම උද්ගත වී තිබෙන ගෝලීය තත්ත්වය තුළ, ඉන්ධන මිල ඉහළ යෑම තුළ, යන්ත්‍ර සූත්‍රවල මිල, බීජවල මිල ඇතුළුව සමස්ත නිෂ්පාදන චක්‍රයට අදාළ හැම එකකම මිල ඉහළ ගිහින් තිබෙනවා.

ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා පොරොන්දු වුණා, ගොවියාගේ වී කිලෝවකට රුපියල් 150ක් ලබා දෙනවා කියලා. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා කිව්වා ඒක මේ පාර්ලිමේන්තුවේ නීතිගත කරනවා කියලා. ඒක ඔබතුමන්ලාගේ පොරොන්දුවක්. එය ඉටු කිරීම ඉතාම වැදගත් වනවා. ගරු ඇමතිතුමනි, බීජ මිල, නිෂ්පාදන මිල හෙවත් නිෂ්පාදන පිරිවැය ඇතුළු සමස්ත නිෂ්පාදන චක්‍රයට අදාළ වියදම, විශේෂයෙන්ම ඒ වගා කටයුතු කරන්නට යෑමේදී වනජීවී ප්‍රේර කලාපීය බල ප්‍රදේශවල සිදු වන අස්වනු හානිය යනාදී හැම දෙයක්ම ගෙන බැලුවාම, ඇත්ත වශයෙන්ම මීට වඩා ස්ථාවර මිලක් ලැබෙන්නට ඕනෑ. ඒ වාගේම, මම ඔබතුමාට තවත් යෝජනාවක් කරනවා. වීවල තෙතමනය ගත්තාම සියයට 14 ප්‍රමිතියට අනුව නේ රජය වී මිල දී ගන්නේ. මේ තිබෙන අමාරුකම් මැද්දේ එහි යම් ලිහිල්භාවයක් ඇති කිරීම වැදගත්. මන්ද යත්, විශේෂයෙන්ම මැදපෙරදිග ප්‍රශ්නයත් එක්ක යූරියා, MOP, TSP පොහොරවල බරපතළ හිඟයක් අද තිබෙනවා. ගොවියා පොහොර ටික ඉල්ලනවා; පොහොර මදි කියනවා. කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමනි, ඉල්ලන තරම් පොහොර දෙන්න බැහැ කියලාත් ඔබතුමා ප්‍රකාශයක් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ගොවියා පොහොර ටික ඉල්ලන්නේ වගා කටයුතුවලට නේ; වෙන මොනවාටවත් නොවෙයි නේ.

පිරිවැය හෙවත් යන වියදම ගණනය කිරීමේදී, ඔබතුමා සඳහන් කරන කිලෝවක් නිෂ්පාදනය කරන්න යන වියදම රුපියල් 95යි කියන එක සත්‍යයෙන් තොරයි, ඒක යථාර්ථවාදී නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගණන ගැන තවත් විශේෂඥයින් සමඟ පරිශීලනය කරලා සත්‍ය වියදම සොයා බලන්න කියා. ඒ වාගේම රජය වී මිල දී ගැනීමේ මුළු අස්වැන්න කුමන ආකාරයකට හෝ යම් ප්‍රතිශතයකින් වැඩි කරන්න පුළුවන් නම් ඒක වැදගත්. ඒ වාගේම තෙතමනයට අදාළව සහ අනෙකුත් කාරණාවලට අදාළව දාලා තිබෙන කොන්දේසි වර්තමාන ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වය මත ලිහිල් කිරීම යෝග්‍යයි කියන එක මම මේ අවස්ථාවේ යළිත් ප්‍රකාශ කරනවා. පිරිවැය වැඩි වීම නිසා - දැන් වගා කරන කන්නය යල කන්නය - ගොවීන්ට යම් සහනයක් ලබා දෙන්න ඔබතුමන්ලා ගන්නා වූ පියවර ඉදිරිපත් කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා කාරණා කිහිපයක් මතු කළා. එකක්, නිෂ්පාදන වියදම ගණනය කිරීම ගැන. ඒක කාලයෙන් කාලයට වෙනස් වෙනවා. ඒක කාටත් තේරෙනවා නේ. රුපියල් 150කට වී කිලෝවක් මිල දී ගන්න ඕනෑ කියපු කාලයේ පොහොර නැතිව තිබිලා නිෂ්පාදන පිරිවැය විශාල වශයෙන් ඉහළ යන තත්ත්වයක් මතු වෙලා තිබුණා. ඒ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමේ තත්ත්වයට අනුව තමයි වී

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

කිලෝවකට රුපියල් 150ක් අවශ්‍යයි කියලා එදා ප්‍රකාශ කළේ. ප්‍රායෝගිකව ගත්තාම ඒක හැම දාම පවතින සහතික මිලක් බවට පත් වෙන්න කොහොමටත් විධියක් නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඒක ඔබතුමාට වැටහෙනවා. ඔබතුමා දේශපාලන වශයෙන් ඒ කාරණය පාවිච්චි කළත් ඒ ඇත්ත ඔබතුමාත් දන්නවා, මාත් දන්නවා, කවුරුත් දන්නවා.

යල කන්නය ගත්තොත්, යල කන්නයට නැවත නිෂ්පාදන වියදම ගණනය කිරීමක් කොහොමත් සිදු කරනවා. මේ වතාවේ නිෂ්පාදන වියදම ගණනය කරන කොට යම් මිල ඉහළ යෑමක් අනිවාර්යයෙන්ම සිද්ධ වෙයි. ඒ අනුව තමයි, වී අලෙවි මණ්ඩලය වී මිල දී ගැනීමේ මිල තීරණය කරන්නේ. ඒක රුපියල් 120 නොවෙන්න පුළුවන්. නමුත් අපි උත්සාහ කරනවා, වැඩි වන වියදමට සරිලන විධියට සහනාධාර ප්‍රමාණය ලබා දෙන්න. ඒ සහනාධාර ප්‍රමාණය ලබා දීලා මේ ස්ථාවරත්වය පවත්වා ගන්න උත්සාහයක් ගන්නවා. ඒක තමයි ඔබතුමාට දෙන්න තිබෙන පිළිතුර.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
### பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம்
### PREVENTION OF MONEY LAUNDERING (AMENDMENT) BILL

"2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 මැයි 19වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 மே 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 19th May, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 111(17)ஐ உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன். யாழ்ப்பாணம் போதனா வைத்தியசாலையின் வைத்திய அத்தியட்சகர் Dr. Sathiyamoorthy அவர்களை சனவரி மாதம் Sectoral Oversight Committeeக்கு அழைத்து, அவரது appointment தொடர்பாக நாங்கள் கேள்வி கேட்டோம். 2019ஆம் ஆண்டு அவருக்கு enforce கொடுக்கப்பட்டது தொடர்பான கேள்விக்கு பதிலைப் பெற்றுத்தரும்படி, நான் மூன்றாவது தடவையாக கௌரவ சபாநாயகர் அவர்களிடம் கேட்டுக்கொண்டு இருக்கின்றேன். அதை இன்னும் Sectoral Oversight Committeeக்கு அவர் submit பண்ணவில்லை. இது முறையற்றதொரு appointment என்று பாராளுமன்றத்தில் சொல்லி 8 மாதங்களுக்கு மேலாகியும் Sectoral Oversight Committeeக்கு கொண்டுவரவில்லை. எனவே, இது தொடர்பாக Sectoral Oversight Committeeஇல் எங்களுக்குப் பதிலைச் சொல்லும்படி சொல்லுமாறு உங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 5 දක්වා අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත: නියමය
## கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டம்: கட்டளை
## COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT: ORDER

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියමය (අංක 2), විෂය අංක 3 - කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියමය (අංක 3), විෂය අංක 4 - කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියමය (අංක 4) සහ විෂය අංක 5 - කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙනෙන නියෝග ද මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Nishantha Jayaweera to start the Debate. You have 12 minutes.

[අ.භා. 12.28]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ වන ප්‍රධාන නියම කීපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පළමුවෙනි නියමය යටතේ ඉදිරිපත් වෙන්නේ වරාය නගරයේ සේවය කරන සේවකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව අධිකරණය විසින් ලබා දුන්නු තීන්දුවක් අනුව පනවනු ලබන නියමයක්.

දෙවන නියමය විධියට ඉදිරිපත් වෙන්නේ මේකයි. ලංකාවට සංචාරකයෙක් පැමිණෙනකොට එක් වර්ෂයක් සඳහා ඇමෙරිකානු ඩොලර් 2,000ක මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමේ අවකාශය ලබා දෙනවා. මීට කලින් ඒ ඇමෙරිකානු ඩොලර් 2,000 වියදම් කරන්න පුළුවන් වුණේ එක වතාවකදී පමණයි. ඒ කියන්නේ, ලංකාවේ තිබෙන තීරු බදු රහිත - duty-free - වෙළඳ සාප්පුවලට ගිහිල්ලා එක වතාවකදීම මේ මුදල වියදම් කිරීමටයි හැකියාව තිබුණේ. මෙන්න මේ එක වතාවකදී පමණක් වියදම් කිරීමට තිබුණු හැකියාව මේ නියමය හරහා හතර වතාවක් දක්වා දීර්ඝ කරලා තිබෙනවා. ඒ අවකාශය ලබා දෙන නියමයක් තමයි දෙවන සංශෝධනය විධියට ඉදිරිපත් වෙන්නේ. මෙහි ප්‍රධාන පරමාර්ථයක් තමයි සංචාරකයන් ලංකාව ඇතුළත වියදම් කරන ප්‍රමාණය වැඩි කරවා ගැනීම, තීරු බදු වෙළඳ කටයුතු කිරීමේ අවකාශ ලබා දීම සහ ඒ තුළින් අපේ රජයට රාජ්‍ය භාගය හැටියට ලැබෙන සියයට 7ක ආදායම වැඩි කර ගැනීම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Nishantha Jayaweera, please.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉදිරිපත් කළ අය වැයෙහි සඳහන් මධ්‍යකාලීන ප්‍රතිපත්තිය වන්නේ සියයට හතක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගෙන මේ ආර්ථිකය වඩාත් වේගයෙන් පුළුල් කිරීමයි. අන්න ඒ ගමන යනකොට විශේෂයෙන්ම අපි අවබෝධ කරගෙන තිබෙනවා, වඩා වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගැනීමට නම් අපේ රටට විදේශ ආයෝජන කැන්දා ගැනීම ඉතාම වැදගත් කාරණයක් වන බව. ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගනිමින් ඉන්නවා.

2025 අවුරුද්ද ගත්තාම, අපි ඩොලර් මිලියන 1,057ක සෘජු විදේශ ආයෝජන අපේ රටට ගෙන්වා ගන්න සමත් වුණා. පසුගිය අවුරුදු හතර ඇතුළත අපේ රටට ලැබුණු වැඩිම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය එයයි. ඊට අමතරව 2026 අවුරුද්දේ සෘජු විදේශ ආයෝජන විධියට ඩොලර් බිලියන දෙකක් රටට ගෙන්වා ගන්න අපි මේ වනවිට සැලසුම් සකස් කර තිබෙනවා. අපේ ආර්ථික වර්ධන වේගයට වඩාත්ම වැදගත් වන සාධකය වන්නේ සෘජු විදේශ ආයෝජන බව අපි අත්දැකීමෙන්ම දන්නවා. ඒ නිසා අපි ඒ පැත්තට විශේෂ අවධානයක් යොමු කරනවා. ඒ වෙනුවෙන් අපි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ මෑතකදීත් කරුණු කිහිපයක් සම්මත කළා. විශේෂයෙන්ම අපේ රටට පැමිණෙන ආයෝජකයන් අපේ රටට ගෙනෙන විදේශ විනිමය ප්‍රමාණය සහ ලබා දෙන රැකියා ප්‍රමාණය පදනම් කරගෙන ඔවුන්ට බදු සහන දීම, ඒ ව්‍යාපෘති ආරම්භ කරන කාල සීමාව ඇතුළතදී ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩ බදු සහිතව මේ රටට ආනයනය කරන්න අවස්ථාව ලබා දීම, වරාය නගරය ඇතුළත ඉදිවන ගොඩනැගිලිවල උස ප්‍රමාණය වැඩි කිරීම සහ වරාය නගරය නිර්මාණයේදී විය යුතු වෙනස්කම් ඇතුළත් යම් යම් සංශෝධන සහිත යෝජනා මෑතකදී පාර්ලිමේන්තුවේදී සම්මත කළා. මේ සියලු සංශෝධනවල ඒකායන බලාපොරොත්තුව වන්නේ වැඩි සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් අපේ රටට කැන්දා ගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව මම මෙතැනදී විශේෂයෙන්ම කිව යුතු කාරණයක් තිබෙනවා. අපි 2026 අවුරුද්දට ඉදිරිපත් කළ අය වැය තුළින් VAT සඳහා යම් සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කළා. අන්න ඒ සංශෝධන ක්‍රියාවට නැඟීමට අවශ්‍ය ගැසට් පත්‍රය මේ වනවිට ප්‍රකාශයට පත් කර තිබෙනවා. එම ගැසට් පත්‍රයේ සඳහන් කරුණු වැරදි විධියට සමාජයට ගෙන යෑමට යම් පිරිසක් විසින් සංවිධානාත්මකව ලොකු ප්‍රචාරයක් සිදු කරනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුත් කියනවා මම දැක්කා, අපි සියයට 18ට තිබෙන VAT එක සියයට 20.5කට ඉහළ නංවන්න යනවා කියලා. මම රටේ ජනතාවට කියනවා, නව රජය විධියට අපි සාමාන්‍ය VAT අනුපාතය සියයට 20.5කට ගෙනියන්නේ නැති බව. රජය විධියට අපේ බලාපොරොත්තුව තමයි පවතින බදු ක්‍රමය තුළට තාක්ෂණය බද්ධ කර, බදු පරිපාලනය කාර්යක්ෂම කර, බදු පදනම පුළුල් කිරීම තුළින් වැඩි බදු ආදායමක් රැස්කර ගැනීම. ඒක තමයි අපේ ප්‍රධානම පරමාර්ථය. ඒ ඇතුළත අපි සැලසුම් කරනවා, ඉදිරියේදී මේ බදු අනුපාත අඩු කර ජනතාවට යම් සහනයක් දෙන්නේ කොහොමද කියලා. ඒක තමයි අපේ මූලික පරමාර්ථය. නමුත් අපි එතැනට යන ගමනට අදාළව මේ ඉදිරිපත් කළ සංශෝධනය වැරදි විධියට අර්ථ කථනය කරමින් යම් පිරිසක් විසින් සමාජය තුළ

[ගරු නිශාන්ත ජයවීර මහතා]

වැරදි මතයක් ගෙන යනවා. ඒ නිසා මම මෙතැනදී පැහැදිලිවම අවධාරණය කරනවා, කිසි සේත්ම VAT එක සියයට 20.5ක් වෙන්නේ නැති බව. සාමාන්‍ය ජනතාවට බලපාන VAT එක සියයට 18ට සීමා වෙනවා. දැනට පවතින ඒ ක්‍රමයේ කිසිදු වෙනසක් වෙන්නේ නැහැ.

මේ ගෙනෙන සංශෝධනයේ අරමුණ ගැනත් සඳහන් කළ යුතුයි. සාමාන්‍යයෙන් VAT අය කරන ක්‍රමයක් තිබෙනවා. එහිදී මූල්‍ය නොවන සේවා සහ මූල්‍ය සේවා වශයෙන් අංශ දෙකක් තිබෙනවා. මූල්‍ය නොවන සේවාවලින් VAT අය කර ගැනීමේදී පදනම් කරගන්නේ එහි පිරිවැටුමයි. මූල්‍ය නොවන සේවාවල පිරිවැටුමට අදාළව සියයට 10ක් VAT එක ගෙවිය යුතු වෙනවා. ඊට අමතරව මූල්‍ය සේවා තිබෙනවා. මූල්‍ය සේවාවලට අදාළ වන්නේ බැංකු සහ මූල්‍ය ආයතනයි. බැංකු සහ මූල්‍ය ආයතන විසින් කරනු ලබන මූල්‍ය සැපයුම පදනම් කරගෙන තමයි එම මූල්‍ය සේවා මත VAT එක පනවන්නේ. මෙන්න මේකට අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා. බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් යම් මූල්‍ය සේවාවක් සිදු කරනවා නම් දැනට පවතින නීතිය අනුව එම මූල්‍ය සේවාවට අදාළව VAT එක අය කිරීමේදී ඒගොල්ලන්ගේ ගිණුම් අනුව ප්‍රකාශ කරන ලද ලාභය යම් තාක්ෂණික ගැළපීම් කිහිපයකට ලක් කර, අපි එහි ආරෝපිත ලාභයක් - attributable profit එකක් - ගන්නවා. අන්න ඒක තමයි බදු පදනම වන්නේ. අන්න ඒ බදු පදනම මත දැනට තිබෙන නීතිය අනුව සියයට 18ක VAT එකක් ගෙවන්න ඕනෑ. ඒකට, "VAT on financial services" කියනවා. එහෙම නැත්නම් "මූල්‍ය සේවා මත අය කරන එකතු කළ අගය මත බද්ද" කියනවා. ඊට අමතරව යම් මූල්‍ය ආයතනයක් හෝ බැංකුවක් සිදු කරන මූල්‍ය සේවා වෙනුවෙන් සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් ගෙවන්න ඕනෑ. ඒ සියයට 2.5 ගෙවන්න පදනම් කර ගන්නේ "attributable profit" කියන එක. ඒ කියන්නේ "ආරෝපිත ලාභය" කියන එක. ඒක පදනම් කරගෙන ඒකෙන් සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් ගෙවන්න ඕනෑ. මේ වෙනකොට පවතින නීතිය අනුව යම් මූල්‍ය ආයතනයක් හෝ බැංකුවක් සිදු කරන මූල්‍ය සේවා වෙනුවෙන් සියයට 18ක VAT එකක් සහ සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් - SSCL - ගෙවිය යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගෙන එනු ලබන සංශෝධනයේ අරමුණ වන්නේ මේකයි. ජාතික ජන බලවේගයේ රජය විධියට අපි ජනතාවට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කළා, මේ පවතින සංකීර්ණ බදු ක්‍රමය වඩාත් සරල තත්ත්වයකට ගෙනෙන්න කටයුතු කරනවා කියලා. අන්න එතැනට යන එක් පියවරක් විධියට තමයි මේ සංශෝධනය ගෙන එන්නේ. දැනට පවතින නීතිය අනුව යම් මූල්‍ය ආයතනයක් තමන්ගේ ආරෝපිත ලාභයෙන් - attributable profit එකෙන් - සියයට 20.5ක බදු මුදලක් ගෙවන්න ඕනෑ. අපි මීට කලින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට සංශෝධනයක් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කළා. ඒ ගෙනාපු සංශෝධනය අනුව ජූලි 01වැනි දා සිට යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් සපයන මූල්‍ය සේවාවලට අදාළව සමාජ ආරක්ෂක දායකත්ව බද්දක් තවදුරටත් ගෙවිය යුතු නැහැ. එතකොට යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් ජූලි මස 01වැනි දා සිට සමාජ ආරක්ෂක දායකත්ව බද්දෙන් නිදහස් වෙනවා. දැනටමත් ඒ ගොල්ලන් සියයට 20.5ක් බදු ගෙවනවා. නමුත් මේ නිදහස් කිරීම තුළ වෙන්නේ මේකයි. දැනටමත් ඒ ගොල්ලෝ මූල්‍ය සේවා මත ගෙවන VAT එකට සමාජ ආරක්ෂණ දායකත්වය බද්ද වශයෙන් ගෙවපු සියයට 2.5 එකතු කරලා, මූල්‍ය සේවා මත VAT එක සියයට 20.5ක් කරනවා. මේ ගෙනෙන සංශෝධනය නිසා ඒ ආයතනයට හෝ ජනතාවට කිසිදු අමතර වැය බරක් දරන්න වෙන්නේ නැහැ. මොකද, දැනට පවතින නීතිය ඇතුළේත් ඒ ආයතන සියයට 20.5ක් බදු ගෙවන නිසා. මේ සංශෝධනය කළත් සියයට 20.5යි ගෙවන්නේ. එතකොට කිසිදු වෙනසක් වෙන්නේ නැහැ.

අපි මෙහෙම කරන්නේ ඇයි කිව්වොත්, පැවති බදු ක්‍රමයේ සංකීර්ණ බව අඩු කරන්න තමයි මෙහෙම කරන්නේ. දැනට තිබෙන නීතිය ඇතුළේ යම් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට සමාජ ආරක්ෂණ දායකත්ව බද්දත් ගෙවන්න වෙනවා කියන්නේ, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය සෑම මාස තුනකට වරක්ම සමාජ ආරක්ෂණ දායකත්ව බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සපයන්නත් ඕනෑ. එතකොට ඒවා පිළියෙළ කිරීම වෙනුවෙන් වෙනම පිරිසක් ඒ ආයතනවලට ඕනෑ වෙනවා. ඒ ගොල්ලන්ට ඒක තවත් වැය බරක් වෙනවා. ඒ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද වෙනම ගෙවන්න ඕනෑ. ඒ වාගේ සංකීර්ණ ලෙස තිබුණු බදු ක්‍රමයක් සරල කරන්න තමයි බදු වර්ග දෙකක් වෙනුවට එක් බදු වර්ගයක් පනවලා, බදු අනුපාතයේත් කිසිදු වෙනසක් නොකර මේ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක වැරදියට අර්ථකථනය කරමින්, ආණ්ඩුව ජූලි 01වැනි දා ඉඳලා VAT අනුපාතය සියයට 20.5 දක්වා ගෙනියනවා කියලා වැරදි ප්‍රචාරයක් ගෙනියනවා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. සත්‍ය තත්ත්වය තමයි, VAT එකේ කිසිදු වෙනසක් වෙන්නේ නැහැ. මේ කරන වෙනස ඇතුළේ වෙන්නේ, බදු වර්ග දෙකක් තනි බද්දක් කරලා, අය කරපු බදු ප්‍රමාණයත් නිශ්චිතව ඒ ගණනේම තබන එක. ඒක තමයි පැහැදිලිවම සිද්ධ වෙන වෙනස.

ඊට අමතරව මේ බදු ක්‍රමය සරල කිරීමට අදාළව අපි මෙතැනදී නව සංශෝධන කිහිපයක් ගෙන එනවා. ඒ සංශෝධනවලිනුත් කෙරෙන්නේ, අපේ බදු පරිපාලනයට නවීන තාක්ෂණය බද්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම තමයි. ඒ යටතේ මේ VAT එක ගෙවන සියලුදෙනාට point of sale machine එකක් ලබා දීලා, එහෙම නැත්නම් e-invoicing පද්ධතියකට සම්බන්ධ කරලා, ඔවුන්ගේ සියලු ගනුදෙනු ස්වයංක්‍රීය - automate - කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක ඇතුළේ බදු ගෙවන්නන් ඉතා සරල බදු වාර්තාවක් තමයි දෙන්න ඕනෑ. දැනට බදු වාර්තාව දෙන්න ගොඩක් කරදර වෙන්න ඕනෑ. ඒ සඳහා වෙනම accountant කෙනෙක් තියා ගන්න ඕනෑ, වෙනම සේවක පිරිසක් තියා ගන්න ඕනෑ. අපි මේ ගෙන එන යෝජනාවලට අනුව කෙනෙකුගේ VAT එක පිළිබඳ වාර්තාව ස්වයංක්‍රීයව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දීමේ හැකියාව ලැබෙනවා. ඒ වාගේම බදු ගෙවන්නන්ට ගන්න තිබෙන ආපසු ගෙවීමක් ඉතා කඩිනමින් ලබා ගන්න පුළුවන්. ඒකට විශේෂ තහවුරු කිරීම් කිසිවක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ තුළින් බදු පරිපාලනය වඩාත් කාර්යක්ෂම වෙනවා. මෙන්න මේ වාගේ කරුණු කාරණා රාශියක් අපි ගෙන එන සංශෝධන ඇතුළේ සිද්ධ වෙනවා.

POS machines ලබා දීම මේ වනකොටත් නියමු ව්‍යාපෘතියක් විධියට ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපේ බලාපොරොත්තුව තමයි, ඉතාම කඩිනමින් මේක ක්‍රියාත්මක කිරීම. මට විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ, අපි VAT එක සියයට 20.5කට ඉහළ නංවනවා කියලා සමාජයේ පතුරුවා හරින වැරදි මතය පැහැදිලිවම අසත්‍යයක් බවයි. ඒ නිසා ඒක තවදුරටත් සමාජගත කරන්න එපා. මේ කරන සංශෝධනයෙන් කිසිම බදු වැඩිවීමක් වෙන්නේ නැහැ. මෙතෙක් බදු වර්ග දෙකකින් සියයට 20.5ක බද්දක් අය කර ගත්තා. ඉන් එක බදු වර්ගයක් අයින් කරලා අනෙක් බදු වර්ගයෙන් සියයට 20.5ක බද්දක් අය කර ගැනීම පමණයි මෙහිදී වෙන්නේ.

මම කියන්න කැමැතියි, අපි රජය විධියට මේ සංශෝධන කිරීම ඇතුළේ ඉතිහාසයේ පළමුවැනි වතාවට වැඩිම බදු ආදායමට එහා ගිය ඉලක්කයකුත් ගන්න සමත් වෙනවාය කියන එක. මීට පෙර පැවති කිසිම රජයකට මේ වාගේ හැකියාවක් ලැබුණේ නැහැ. රජයක් විධියට අපි අය වැයකින් ඉදිරිපත් කරපු ආදායමට එහා ගිය ආදායමක් ඉතිහාසයේ පළමුවැනි වතාවට ලබාගෙන, "දිට්වා" සුළි කුණාටුව වාගේ අභියෝගවලට පවා සාර්ථකව මුහුණ දී නොසැලී ඉන්න හැකියාව ලැබුණේ ඒ නිසා බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Harsha de Silva. You have nine minutes.

[අ.භා. 1.11]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කථා කළේ අද ඉදිරිපත් කරපු කාරණය ගැන නොවෙයි. අද VAT එක ගැන විවාදයක් නැහැ නේ? එහෙම එකක් තිබෙනවාද? නැත්නම් මට වැරදිලාද? VAT එක ගැන අද විවාදයට ගන්නේ නැහැ. හැබැයි එතුමාට මම පිළිතුරක් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සම්පූර්ණයෙන්ම වෙන කථාවක් කිව්වේ. අද විවාදයට ගන්න කාරණාවට අදාළව නොවෙයි ඔබතුමා කථා කළේ. ඒ නිසා මටත් සිද්ධ වනවා, ඒ ගැන යම්කිසි කරුණු ප්‍රමාණයක් කථා කරලා වෙන දෙයක් ගැන කථා කරන්න. ඒක නවත්වන්න එපා.

VAT එක ගැන කථා කරපු නිසායි මම මේක කියන්නේ. VAT එක සියයට 18 තමයි. හැබැයි සියයට 2.5ක් තිබෙනවා, SSCL එක. බැංකුවෙන් තමයි මුළු value addition එකම වෙන්නේ. සියයට 18යි, සියයට 2.5යි එකතු වුණාම සියයට 20.5යි කියලා දැන් කියනවා. හැබැයි ඔබතුමාට කියන්න අමතක වුණා, බොහෝ භාණ්ඩ හා සේවාවලට SSCL එක ගහනවා කියලා. හැබැයි ඒවායේ value addition තැන් තැන්වල වෙනවා. එතකොට turnover එකේ සියයට 2.5 අවම වශයෙන් value addition එකක් හැටියට බැලුවාම සියයට 4ක් හෝ 5ක් වෙනවා. ඔබතුමා මාත් එක්ක මේකට එකඟ වෙයි. Supply chain එකේ කොච්චර කොටස් තිබෙනවාද කියන එක මත ඒක එහාට මෙහාට වෙනවා. මම ඉතාම වගකීමෙන් මෙය කියනවා. බද්ද ගහන්නේ සියයට 18යි කියලා ඔබතුමා කිව්වාට ඇත්ත වශයෙන්ම SSCL එක add කළාම අවම වශයෙන් VAT එක සියයට 22ක්වත් වෙනවා. එහෙම නැහැයි කියලා ඔබතුමා කියනවා නම්, කොහොමද ඒක වෙන්නේ කියලා කියන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ඒ වෙලාවේ මම කිව්වේ VAT on financial services ගැන.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

VAT on financial services ගැන කථා කරනවා නම්, ඒක හරි. නමුත් ඒක ගැන අද මෙතැන විවාද වෙන්නේ නැහැ නේ. The VAT on financial services, සියයට 20.5යි. හැබැයි එතැනින් එහාට ගිහිල්ලා සාමාන්‍ය මිනිස්සුන්ට ගහන බදු ගත්තාම, VAT එක සියයට 18යි, SSCL එක සියයට 2.5යි. හැබැයි SSCL එක VAT එකක් හැටියට බැලුවොත් අවම වශයෙන් ඒක සියයට 4ක් වෙනවා. ඒක සියයට 3ක් වෙන්නත් පුළුවන්, සියයට 4ක් වෙන්නත් පුළුවන්. එතකොට VAT එක සියයට 18ට වඩා වැඩියි. මට ඕනෑ කළේ ඒක කියන්න.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නොකියපු දෙයකුත් මෙතැන තිබෙනවා. වරාය නගරයේ වැඩ කරන පුද්ගලයන්ගේ සේවාව අහෝසි කරනවා නම් දැනට ඒකට කම්කරු කොමසාරිස්ගේ permission අවශ්‍යයි. දැන් ඔබතුමන්ලා කරන්නේ ඒක ඉවත් කිරීම. මම ඒකේ හරි වැරැද්ද ගැන නොවෙයි මෙතැන කථා කරන්නේ. ඔබතුමන්ලා පාර්ලිමේන්තු මැතිවරණයේදී, ජනාධිපතිවරණයේදී ජනතාවට කිව්වේ මොකක්ද? "අපි කම්කරුවෝ බලාගන්නවා, අපි JVP එක" කිව්වා. NPP කියලා පක්ෂයක් නැහැ නේ. JVP එක හැම දාම හිටියේ කම්කරුවා පැත්තේ කියලා තමයි අපිත් හිතාගෙන හිටියේ. අද ඔබතුමා මේ කරන්න යන්නේ කම්කරුවාට මෙච්චර කල් තිබ්බ ඒ සහනය, කම්කරු කොමසාරිස් හරහා තිබ්බ ආවරණය ඉවත් කිරීම. ඒක එහෙම නොවෙයි නම් නැහැයි කියන්න. ඒ සම්බන්ධව මම ඔබතුමාට අභියෝග කරනවා. එහෙම නොවෙයි නම් ඔබතුමා නැඟිටලා කියන්න, මම කියන්නේ බොරුවක් කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නේ මේ විවාදය ආරම්භ කළේ. නමුත් ඔබතුමා මේක ගැන කිව්වේ නැහැ. හැබැයි වරාය නගරය ඇතුළේ තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ඒක මෙහෙමයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට mike එක දෙන්න, කමක් නැහැ.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ඒක කඩ කරනවා නම් ඒ ගිවිසුම අනුව පැහැදිලිවම ඒ පුද්ගලයාගේ අයිතිවාසිකම හිමි වෙනවා. අධිකරණයෙන් ලබා දීපු තීන්දුව අනුව තමයි අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ඔව්, පැහැදිලියි. ඒ කියන්නේ, ජනතාවට දීපු පොරොන්දුව අයින් වනවා. කම්කරු කොමසාරිස් හරහා කම්කරුවා රැක ගන්නවා කියන ඒ පොරොන්දුව වරාය නගරයට අදාළව අද ඉඳලා අයින් වනවා. ඒකයි මේ වෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ බෝලය කාට හරි පාස් කරන්න ඔබතුමාට පුළුවන්. හැබැයි, ඔබතුමන්ලාට ඒක කරන්න අවශ්‍යතාවක් නැත්නම් ඒක නොකර ඉන්නත් පුළුවන්. ඒ ගැන කථා කරන්න තිබෙන්නේ එච්චරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට මහ බැංකුවේ නිලධාරින් කැඳවන නිසා මට ඒකට යන්න තිබෙනවා. එම නිසා මෙම විවාදයට මට දිගටම සම්බන්ධ වෙන්න බැහැ. නමුත්, මට කියන්න තිබෙන ප්‍රධාන දේ මෙයයි. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා විවාදය ආරම්භ කරමින් කියාගෙන ගියේ, "මේකේ කිසි ප්‍රශ්නයක් නැහැ, මේක සාමාන්‍ය දෙයක්" වාගේ කථාවක්. නමුත් ඒක එහෙම නෙවෙයි. මම මගේ

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කමිටු සාමාජිකයන්ට කියලා තිබුණා, අපි closed-door session එකක් කළ නිසා ඒ ඉදිරිපත් කළ කරුණු තවම ජනතාවට, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ සංක්ෂිප්තයක් වශයෙන් විතරයි කියලා. නමුත් ඒකේ කියැවුණු දේවල්වලට අනුව අපට තේරෙනවා, එම ක්‍රියාදාමයේ දැවැන්ත අවුලක්, අවුල් රාශියක් තිබෙන බව. උදාහරණයක් හැටියට කිව්වොත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මොනවාටද ඒකට සම්බන්ධ වුණේ? විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඒ ගනුදෙනුවට කිසිම සම්බන්ධයක් නැහැ. මේ තිබෙන්නේ පනත. මේ පනතේ ඉතාම පැහැදිලිව තිබෙනවා, "විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සම්බන්ධ විය හැක්කේ ද්විපාර්ශ්වික ණය ගැනීම සඳහා සාකච්ඡා කිරීම සඳහා පමණයි" කියලා. ඊළඟට කියනවා, "පනතට අනුකූලව කාලීනව ආණ්ඩුවේ ණය සේවාකරණය සිදු කළ යුත්තේ ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව හරහා" කියලා. එතකොට මොකක්ද මේ පටලැවිල්ල? මෙතැන ලොකු ගැටලුවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තමයි ඒ අය මොනවාද කරන්නේ කියලා ඒ අය දන්නේත් නැති එක. මේ අය "L" බෝඩ් කියන කථාව අද ඔප්පු වෙලා තිබෙනවා.

අනෙක් කාරණය මේකයි. සාමාන්‍යයෙන් මේ වාගේ තනතුරුවලට පත් කරන්නේ SLAS නිලධාරින්. සාමාන්‍යයෙන් ආයතන 30ක, 40ක වැඩ කරලා තමයි මුදල් අමාත්‍යාංශයේ Director General වාගේ තනතුරකට නිලධාරියෙක් පත් වෙලා එන්නේ. දැන් මේ කරලා තිබෙන්නේ "අපෝන්සුකරණය" කියලා හැමෝම දන්නවා. අපෝන්සුකරණයේදී මොකක්ද වෙන්නේ? Sri Lanka Planning Service එකේ නිලධාරින් මෙම ආයතනවලට පත් කරලා තිබෙනවා. මම අභියෝග කරනවා, පුළුවන් නම් එහෙම නැහැයි කියන්න කියලා. සමහර විට මම වැරදි වෙන්න පුළුවන්. හැබැයි, මම දන්නා විධියට DG, PDMO සහ DG, ERD කියන දෙන්නාම Sri Lanka Planning Service එකේ හිටපු නිලධාරින්. Sri Lanka Planning Service එකේ නිලධාරින්ට මේකට අවශ්‍ය experience එක කොහොමත් නැහැ. භාණ්ඩාගාරයේ ලේකම්තුමාත් ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට මෙතැන වාඩි වෙලා හිටපු මන්ත්‍රීවරයෙක්. එතුමාටත් කළමනාකරණය පිළිබඳව experience නැහැ. අපේ ආණ්ඩුව තිබෙනකොට නියෝජ්‍ය ඇමති හැටියට මම තමයි SEC එකේ වැඩ බැලුවේ. එම නිසා මේ ගැන මම දන්නවා. මම හිතන්නේ එතකොට SEC එකේ අධ්‍යක්ෂතුමන්ලා 10ක්, 15ක් ඉන්න ඇති. ඒ අයගෙන් එක්කෙනෙක් හැටියට තමයි එතුමා වැඩ කරලා තිබෙන්නේ. මුදල් අමාත්‍යාංශයේ ලේකම් කියන්නේ ඉතා ලොකු කාර්යභාරයක් සිදු කළ යුතු පුද්ගලයෙක්. එතකොට Secretaryටත් පළපුරුද්ද නැත්නම්, DGsලාටත් පළපුරුද්ද නැත්නම් ආයතනය තුළ වෙන දේවල් ගැන අහන්න දෙයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් එක මේකයි. Delegation of authority කියලා දෙයක් තිබෙනවා. ඒ කියන්නේ, Director කෙනෙක්ට අනුමත කළ හැකි ප්‍රමාණය. ගරු අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා නේ, එක වතාවක් ඩොලර් ලක්ෂ 09ක payment එකක් කළාය කියලා. එතකොට ඒ ඩොලර් ලක්ෂ 09ක payment එක approve කළේ කවුද? Director කෙනෙක්ට පුළුවන්ද ඒ ප්‍රමාණය approve කරන්න? එහෙම නම් delegation of authority කළේ නැද්ද? ඕනෑම ආයතනයක ලේකම්තුමා කළ යුතු පළමු කාර්යය තමයි, මම delegate කරනවා ලක්ෂයක්, මේ කෙනා ලක්ෂ 05ක්, DG ලක්ෂ 10ක් වශයෙන් කියලා අනුමත කිරීම. නමුත්, ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 09ක payment එකක් කළා ලු. කොහොමද ඒක කළේ? එතැන හොරකමක් වෙලා තිබෙනවා. ඒකෙන් කාටවත් ගැලවෙන්න බැහැ. හොරකමක් වෙලා තිබෙනවා. හොරා කවුද කියලා හොයන්න තිබෙනවා. ඒක CID එක කරපුවාවේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් ඉන්නවා රජයේ මුදල් පිළිබඳ කමිටුවේ. අපි මුදල් කමිටුවේදී ඒකේ ප්‍රතිපත්ති වශයෙන් තිබෙන, පරිපාලන වශයෙන් තිබෙන ගැටලු හොයා ගනිමු. හොයාගෙන අපි නිර්දේශ කරමු මොකක්ද විය යුත්තේ කියලා.

මම අවසාන වශයෙන් එකක් කියනවා. විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නයට උත්තරයක් ලැබුණේ නැහැ. වාර තුනක් තිස්සේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් හෝ නියෝජ්‍ය ලේකම්ලා අපේ කමිටුවට ආවේ නැහැ. බැරිම තැන මම ජනාධිපතිතුමාට ඒ ගැන ලියුමකුත් ලිව්වා. මේ අවස්ථාවේදී මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

ඒ ලියුම් යැව්වාටත් පසුව තමයි ඊයේ-පෙරේදා දවසකත් ඔවුන් කිව්වේ, එන්න විධියක් නැහැ කියලා. එහෙම කරන්න බැහැ. අපි හොඳ වැඩි වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හොඳ වැඩි වුණා. ඒකයි අවුල වුණේ. මම හොඳ වැඩි වුණා. මට ඕනෑ නම් වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙනෙන්න තිබුණා. නමුත්, මම වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙනාවේ නැහැ. ඇයි ඒ? මම ඔවුන්ට අවස්ථාව දුන්නා. නමුත්, ඒ අවස්ථාවෙන් අයුතු ප්‍රයෝජන ගන්න එපා. අන්තිමට තැන් තැන්වලින් අපට කියන්නේ, අපි මේ කට්ටියට ඕනෑවට වඩා ලිහිල්කම දුන්නා කියලායි. තමන් professional කෙනෙක් නම්, ඒ professional බව දෙපැත්තටම තිබෙන්න ඕනෑ. ඒ නිසා මට කියන්න තිබෙන්නේ මෙතැන මහ ලොකු හොරකමක් වෙලා තිබෙනවා, ඩොලර් ලක්ෂ ගණනක් නැති වෙලා තිබෙනවා, අවසානයේදී ඒ මුදල් ගෙවන්න වෙන්නේ මේ රටේ බදු ගෙවන ජනතාවට මිස වෙන කාටවත් නොවෙයි කියන එකයි. පැලවත්තෙන් ඒ මුදල ගෙනෙන්නේ නැහැ. එක්කෝ මේ හොරකම කරපු මිනිස්සුන්ගෙන් මේ මුදල එකතු කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් කෙළින්ම කියන්න ඕනෑ, ඔව්, මේ මුදල අපි බදු හරහා ජනතාවට දානවා කියලා. මම දැනට ඒ ගැන එච්චරයි කියන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, please wind up now.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will wind up, Sir.

මම දැනට මෙච්චරයි කියන්නේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සම්පූර්ණ බලය තිබෙනවා. කවුරුවත් ඒ ගැන ප්‍රශ්න කරන්න එපා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සම්පූර්ණ බලය තිබෙනවා. මම මේ කාරණය කියලා මගේ කථාව නවත්වන්නම්. ස්ථාවර නියෝග 121.(2)(උ) යටතේ තිබෙනවා, "රාජ්‍ය ණය සහ ණය සේවා" - that is, repaying debt. ඒකෙන් ඍජු පරීක්ෂා කිරීම කළ යුත්තේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන්. ඒ නිසා කවුරුවත් ඒ ගැන කලබල වෙන්න එපා. කාරක සභාවේ බලය ගැන කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. අපි professional විධියට, සාධාරණ විධියට මේ වැඩේ කරගෙන යනවා.

බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sundaralingam Pradeep. You have eight minutes.

[பி.ப. 1.22]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டத்தின் கீழான கட்டளை தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு, மலையக மக்களின் முக்கிய பிரச்சினைகள் பற்றி பேச விரும்புகின்றேன். மலையக மக்கள் 200 வருடங்களுக்கு முன்பு தென்னிந்தியாவில் இருந்து இலங்கைக்கு அழைத்து வரப்பட்டவர்கள் என்பது உங்களுக்குத் தெரியும்! இந்த மக்கள் தொடர்ச்சியாக இந்நாட்டின் பொருளாதாரத்துக்கு வலுச்சேர்க்கும் வகையில் செயற்பட்டு வருவதுடன், அதற்கு அச்சாணியாகவும் இருந்து வருகின்றார்கள். எனினும், இந்த நாட்டில் இவர்களுக்கு கடந்த காலங்களில் தொடர்ச்சியாகப் பல அநீதிகள் இழைக்கப்பட்டதை நாங்கள் அறிவோம்.

1975ஆம் ஆண்டு பிரித்தானியருக்குச் சொந்தமான காணிகள் அரசுடைமையாக்கப்பட்டன. அதன்பின்பு, அந்தக் காணிகள் JEDB மற்றும் SLSPC நிறுவனங்களுக்கு குத்தகைக்கு வழங்கப்பட்டன. அதன்பின்பு, 1992ஆம் ஆண்டு அந்தக் காணிகள் பெருந்தோட்டக் கம்பனிகளுக்கு குத்தகைக்கு வழங்கப்பட்டன. அன்று கிட்டத்தட்ட 23 பெருந்தோட்டக் கம்பனிகள் 400க்கும் மேற்பட்ட பெருந்தோட்டங்களைக் குத்தகைக்கு எடுத்திருந்தன. அன்று தொடக்கம் இன்றுவரை - கிட்டத்தட்ட 34 வருடங்களாக - மலையக மக்கள் தங்களுக்கு காணி உரிமை வேண்டுமென தொடர்ச்சியாக கேட்டு வருகின்றார்கள்.

மலையக மக்களில் அதிகமானவர்கள் தோட்டப்புறங்களில் 'லயன்' அறைகளில்தான் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். அந்த மக்களுடைய அடிப்படைத் தேவைகளைப் பூர்த்திசெய்வதற்கு இந்த 'லயன்' அறைகள் போதுமானதாக இல்லை. ஒரு 'லயன்' அறையில் 2-3 குடும்பங்கள் வாழுகின்ற நிலைமை காணப்படுகின்றது. இந்த நிலைமையானது அத்தியாவசியத் தேவைகளைப் பூர்த்திசெய்வதற்கும், சுகாதார முறையில் வசிப்பதற்கும் பெருந்தடையாக இருக்கின்றது. இதனால் அவர்கள் தங்களுடைய அடிப்படைத் தேவைகளைப் பூர்த்திசெய்வதற்கு ஏற்றவகையில், தாங்கள் வசிக்கின்ற இடத்தில் சிறிய அறை ஒன்றைக் கட்டிக்கொள்வதற்கு தோட்டமுகாமைத்துவத்திடம் அனுமதி கோரியபோதிலும், அதற்கான அனுமதி தொடர்ச்சியாக மறுக்கப்பட்டு வருவதை நாங்கள் அறிகின்றோம்.

பெருந்தோட்டக் கம்பனிகள் அந்த மக்களை இப்போதும் மனிதர்களாக மதிப்பது கிடையாது; அவர்களுக்குச் சலுகைகள் கொடுப்பது கிடையாது. அந்த மக்களிடமிருந்து உழைப்பை மாத்திரம் உறிஞ்சுகின்ற போக்கே இன்றும் காணப்படுகின்றது. இவ்வாறானதொரு நிலையில்தான் அந்த மக்கள்மீது தொடர்ச்சியாக அடக்குமுறைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. அண்மையில் கஹவத்தை, நீலகாமம் தோட்டத்திலுள்ள தொழிலாளி ஒருவர் தனக்கான குடியிருப்பை அமைத்துக்கொள்வதற்கு தோட்ட நிருவாகத்திடம் அனுமதி கோரியிருந்தார். அதற்கான அனுமதியை தோட்ட நிருவாகம் அவருக்குக் கொடுக்காத நிலையில், அந்தத் தோட்டத்தொழிலாளி தனக்கான வீடொன்றைக் கட்டுவதற்கு ஏற்கெனவே ஒதுக்கப்பட்ட இடத்தில் குடிசை ஒன்றைக் கட்டினார். தோட்ட நிருவாகமானது இது தொடர்பில் முறைப்பாடு செய்திருந்தபோதும், பொலிசார் ஊடாகச் சட்ட நடவடிக்கையை மேற்கொள்ளாமல், ஒப்பந்த அடிப்படையில் வைத்திருந்த தனியார் பாதுகாப்பு அதிகாரிகள்மூலம் குறித்த தொழிலாளியால் கட்டப்பட்ட குடிசையைத் தாக்கியிருக்கிறது.

அந்த பாதுகாப்பு அதிகாரிகள் அங்கிருந்த தாயையும் இரண்டு மகன்களையும் தாக்கியிருக்கிறார்கள். இந்தச் சம்பவம் தொடர்பான தகவல்கள் சமூக வலைத்தளங்கள் மூலமாகவும் செய்திகள் மூலமாகவும் நாடெங்கும் பரப்பப்பட்டன. இந்தச் சம்பவத்தைக் கேள்விப்பட்ட உடனேயே நாங்கள் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்கு அறிவுறுத்தல்களை வழங்கி, உரிய நடவடிக்கைகளை மேற்கொண்டோம். இவ்வாறான சம்பவங்கள் இன்று நேற்று அல்ல, தொடர்ச்சியாக மலையகத்தில் இடம்பெற்று வருகின்றன. கேகாலை, நுவரெலியா, பதுளை, கண்டி, மாத்தறை எனப் பல பிரதேசங்களில் தோட்டத்தொழிலாளர்கள் தமக்கான குடிசையை அமைக்கும்பொழுது அல்லது சுகாதாரத்தைப் பேணுவதற்காக கழிப்பறை ஒன்றைக் கட்டும்பொழுது இவ்வாறான அடக்குமுறைக்கு உள்ளாகின்றார்கள்.

கடந்த காலங்களில் மலையகப் பிரதேசத்தில் இது போன்ற சம்பவங்கள் இடம்பெற்றால், குறித்த இடத்துக்கு அரசியல் தலைவர்கள் சென்று அங்கு ஒரு கண்காட்சியை நடாத்துவார்கள். ஆனால், முதன்முறையாக சம்பவம் நடைபெற்று 8 மணித்தியாலத்துக்குள் சம்பவத்துடன் தொடர்புடைய 9 பேர் கைதுசெய்யப்பட்டு, அவர்கள் கஹவத்தை பொலிஸாரால் பெல்மடுல்ல நீதவான் நீதிமன்றத்தில் ஆஜர்படுத்தப்பட்டார்கள். நான் சம்பவ இடத்துக்குச் சென்று பாதிக்கப்பட்ட மக்களைச் சந்தித்தேன். அப்பொழுது, அங்கிருந்த இளைஞர்களுடைய கோரிக்கையாக இருந்தது என்னவெனில், பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் கிடைக்க வேண்டும், அவர்களுக்கான காணி உரிமை கிடைக்க வேண்டும் என்பதுதான். கௌரவ அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்களை நாங்கள் அமைச்சுக்குச் சென்று சந்தித்து, சம்பந்தப்பட்ட கம்பனிகளின் CEOsஐயும், பெருந்தோட்ட அமைச்சின் அதிகாரிகளையும் வரவழைத்து, இது சம்பந்தமான கலந்துரையாடல் ஒன்றை மேற்கொண்டிருந்தோம். இந்தத் தாக்குதல் தொடர்பில் தற்பொழுது நாங்கள் விசாரணைகளை ஆரம்பித்திருக்கிறோம்.

எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கத்தில் மலையக மக்கள் பாதுகாக்கப்படுவார்கள். அவர்களுடைய உரிமைகள் நிச்சயமாக அவர்களுக்கு வழங்கப்படும். காணி உரிமையை வழங்குவதுதான் இவ்வாறான பிரச்சினைகளுக்குத் தீர்வாக அமையும் என்பதை நாங்கள் ஆணித்தரமாக நம்புகின்றோம். எதிர்வரும் காலங்களில் இது போன்ற சம்பவங்கள் மலையகத்தில் எங்கும் நடைபெறாதென நாங்கள் உத்தரவாதம் அளிக்கின்றோம். சட்டம் அனைவருக்கும் சமம். கடந்த காலத்தில் இருந்தவர்கள் சட்டத்தைச் சரியாக நடைமுறைப்படுத்தி இருந்தால், இவ்வாறான சம்பவங்கள் மலையகத்தில் நடைபெற்றிருக்காது. எது எப்படியோ, இனியும் மலையக மக்களுக்கு அநீதி இழைக்கப்படுவதை அனுமதிக்க

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

முடியாது. எங்களுடைய அரசாங்கம் அதற்கு எதிராகச் செயற்படும்; சட்டம் உரியமுறையில் நடைமுறைப்படுத்தப்படும். எந்தத் தரத்திலுள்ள யாராக இருந்தாலும் சட்டத்தைக் கையிலெடுப்பதற்கு அனுமதிக்க மாட்டோம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)

இறுதியாக, தமிழக சட்டசபைத் தேர்தலில் தமிழக வெற்றிக் கழகம் சார்பாகப் போட்டியிட்டு வெற்றிபெற்று இருக்கின்ற அக்கட்சியின் தலைவர் ஜோசப் விஜய் அவர்களுக்கு இந்திய வம்சாவளி மக்கள் சார்பாக வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். நன்றி, வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sivagnanam Shritharan. You have six minutes.

[பி.ப. 1.29]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டத்தின் கீழான கட்டளைகள்மீது நடைபெற்றுக்கொண்டிருக்கின்ற இன்றைய விவாதத்தில், முதலில் அதற்கப்பாலான சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். மிக முக்கியமாக, தமிழ் நாட்டிலே நடைபெற்று முடிந்திருக்கின்ற தேர்தலில் தமிழ் நாட்டில் ஒரு நடிகராக இருந்த நண்பர் விஜய் அவர்கள் ஒரு பாரிய வெற்றியைப் பெற்றிருக்கின்றார். இந்திய வரலாற்றில், குறிப்பாக தமிழ் நாட்டினுடைய தேர்தல் வரலாற்றில் பாரிய வெற்றியை ஈட்டியிருக்கின்ற சகோதரர் விஜய் அவர்களுக்கு ஈழத் தமிழர்கள் சார்பாக எங்களுடைய வாழ்த்துகளை இந்த உயர்ந்த சபையினூடாக நான் தெரிவித்துக் கொள்கின்றேன். புகுமுக அரசியல் கட்சியாகப் புரட்சிகர அரசியல் பிரவேசத்தை ஆரம்பித்த தமிழக வெற்றிக் கழகம் மென்மேலும் தெளிவும் திடமும் மிகுந்ததாய் தங்களுடைய அரசியல் பயணத்தைத் தொடர, ஈழத்து உறவுகள் சார்பில் எங்களின் உடனிருப்பும் உறுதுணையும் என்றென்றும் உங்களோடு இருக்கும் என்ற நம்பிக்கையையும் உங்களுடைய வெற்றியை ஈழத் தமிழர்கள் ஒரு சாதகமான தன்மையில் தங்களுக்குக் கிடைத்த ஒரு வெற்றியாகப் பார்க்கிறார்கள் என்பதையும் இலங்கையினுடைய இந்த உயர்ந்த சபையினூடாக நான் நண்பர் - சகோதரர் விஜய் அவர்களுக்கு இந்த இடத்திலே பரிமாறிக் கொள்கின்றேன்.

எனக்கு முன்னர் பேசிய பிரதி அமைச்சர் அவர்கள் குறிப்பிட்டதுபோல, மலையகத்திலே இரத்தினபுரி மாவட்டத்தினுடைய கஹவத்தையில் உள்ள நீலகாமம் தோட்டத்திலே பெண் ஒருவர் உட்பட இருவர் இராணுவத்திலிருந்து விலகிய, கூலிக்காக அமர்த்தப்பட்ட காடையர்களால் மிக மோசமாகத் தாக்கப்பட்டார்கள். இந்த நாட்டிலே அரசாங்கங்கள் மாறி வருகின்றபோதெல்லாம் தலைவர்கள் மாறுகின்றார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மலையகத்திலே வாழ்கின்ற மக்களுக்கெனச் சொந்த நிலமொன்று இல்லை; அங்குள்ள நிலத்திலே ஒரு சிறிய கொட்டிலை அமைப்பதற்கு கூட அவர்களுக்கு இந்த நாட்டிலே உரிமையில்லை என்பது நீலகாமம் தோட்டத்திலே நடைபெற்ற சம்பவத்தின்மூலம் சர்வதேச சமூகத்தின் பார்வைக்கு வந்திருக்கின்றது. அதுவும் குறிப்பாக, சமூக வலைத்தளங்கள் பலவும் உலவுகின்ற இந்தக் காலகட்டத்திலேதான் இவ்வாறான செய்திகள் வெளிவரக் கூடியதாக இருக்கின்றது. அவையும் இல்லையென்றால் நான் நினைக்கிறேன், இதேபோல ஆயிரம் பிரச்சினைகள் அங்குள்ள கிடங்குகளிலும் மலைகளிலும் மறைக்கப்பட்டிருக்கலாம்.

இன்று நாங்கள் உலகத்திலே மனித முன்னேற்றம் பற்றியும் மனித வளர்ச்சிகள் பற்றியும் பேசுகிறோம். ஆனால், 200 ஆண்டுகளுக்கும் மேலாக இலங்கையின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி, அதன் முதுகெலும்பாக இருக்கின்ற எங்களுடைய மலையகத் தமிழ் உறவுகளுக்கு, சிறு வீடு அமைக்கும் விடயம் தொடர்பில் 'எந்த அரசாங்கம் வந்தாலும் உங்களுக்கு இதுதான் நிலைமை' என்று சொல்லுமளவுக்கு மிக மோசமாகக் காடையர் கும்பல் அவர்கள்மீது தாக்குதல் நடத்தியிருக்கின்றது. நாங்கள் அதனை வன்மையாகக் கண்டிக்கிறோம். குறிப்பாக, அந்த மக்களுக்கு நீதி கிடைத்து, சொந்த நிலம் கிடைத்து, சொந்த வீடு உள்ளவர்களாக மலையகத்திலே அந்தத் தமிழ் உறவுகள் வாழ்வதற்கான ஒரு வழியை இந்த அரசாங்கமாவது செய்யுமா? என்ற எதிர்பார்ப்பை நாங்கள் கொண்டிருக்கிறோம். கடந்த 200 ஆண்டுகளாகப் பற்பல முயற்சிகள் எடுக்கப்பட்டாலும், முன்னர் இருந்த மலையக அரசியல் கட்சிகளின் முயற்சியினால் பலருக்கு வீடுகள் கிடைத்தன; பலருக்குச் சிறு நிலங்களும் கிடைத்தன. ஆனாலும், இன்னும் பல தேவைகள் அந்த மக்களுக்கு உண்டு. அந்தத் தேவைகளில் மிகவும் பாரியது அவர்கள் குந்தியிருப்பதற்கான நிலம்! அந்த நிலத்தை வழங்குவதற்கான முயற்சியில் இந்த அரசாங்கம் முதன்மை யான நடவடிக்கையை எடுத்து, அவர்கள் நிரந்தரமாக அந்த மண்ணிலே வாழக்கூடிய சூழலை ஏற்படுத்த வேண்டு மென்பதை நான் வலியுறுத்துகிறேன்.

அடுத்து, எங்களுடைய கிளிநொச்சி மண்ணிலே பிறந்து வளர்ந்த மூத்த எழுத்தாளர் தம்பி தீபச்செல்வன் அவர்களுடைய சில புத்தகங்கள் இலங்கை சுங்கத் திணைக்களத்தில் தடுத்து வைக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக, "பயங்கரவாதி", "சயனைட்" போன்ற அவரது நூல்கள் விடுவிக்கப் பட்டிருக்கின்ற அதேநேரம், "எழுத்தால் நான் யுத்தம் செய்கிறேன்", "இப்போதும் இங்கே இரண்டு தேசங்கள்தான்" என்ற இரண்டு நூல்களுக்காக அவருடைய இன்னும் சில நாவல்கள் Sri Lanka Customsஇல் தடுத்து வைக்கப் பட்டிருக்கின்றது. இத்தகைய ஒரு தேவை ஏன் இந்த அரசாங்கத்துக்கு ஏற்பட்டிருக்கின்றது? இந்த நாட்டிலே எழுத்துரிமை ஏன் தடுக்கப்பட்டிருக்கின்றது? தமிழ் மக்கள்மீது வலிந்து ஒரு யுத்தத்தை நடத்தி, அந்த யுத்தத்தை நியாயப் படுத்துவதற்காக கோட்டாபய அவர்களைப் புகழ்ந்து எழுதியவர்களுடைய புத்தகங்கள் எல்லாம் இந்த நாட்டில் தாராளமாக உலா வருகின்றன. அவரைப் புகழ்ந்து அல்லது அரசாங்கத்தைப் புகழ்ந்தும் கொலைகளை நியாயப்படுத்தியும் எழுதினால் - அது தமிழ் எழுத்தாளர்களுடைய புத்தகமாக இருக்கலாம், சிங்கள எழுத்தாளர்களுடைய புத்தகமாக இருக்கலாம் - அந்தப் புத்தகங்கள் உலாவ அனுமதிக்கப்

படுகின்றன. ஆனால், தமிழர்களுடைய உண்மை நிலைமைகளை வெளிக்கொண்டு வரும் தீபச்செல்வன் என்ற எழுத்தாளரின் ஐந்து வகையான 360 புத்தகப் பிரதிகள் இன்னமும் சுங்கப் பிரிவில் தடுத்து வைக்கப்பட்டுள்ளன என்றால், உங்களுடைய அரசாங்கக் காலத்திலும் எழுத்துச் சுதந்திரம், பேச்சுச் சுதந்திரம் இருக்கின்றதா? என்ற கேள்வி எழுகின்றது.

கௌரவ பிரதிச் சபநாயகர் அவர்களே, ஒருமுறை திரும்பிப் பாருங்கள்! நீங்கள் பழைய அரசாங்கங்களைப் பற்றி பேசுகிறீர்கள்; அந்த அரசாங்கங்கள்மீது குற்றம் சொல்கிறீர்கள். "பழைய அரசாங்கம் நியாயமாக நடக்க வில்லை, ஜனநாயகம் பேணப்படவில்லை, சுதந்திரம் வழங்கப் படவில்லை" என்றெல்லாம் சொல்லப்படுகிறது. ஆனால், இந்த அரசாங்கமும் அதே பாணியையே இப்போது பின்பற்றுகிறது என்பது தீபச்செல்வனுடைய புத்தகங்கள் தொடர்பான விடயத்தில் மிகத் தெளிவாகத் தெரிகிறது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sivagnanam Shritharan, your time is up.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்! எனக்கு 7 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது.

நான் நினைக்கிறேன், கலாசார அலுவல்களுக்குப் பொறுப்பான அமைச்சின் இலக்கியக் குழுவும் பாதுகாப்பு அமைச்சும் வழங்கிய பரிந்துரையின் அடிப்படையில், "விடுவிக்கப்பட மாட்டாது" என்ற தோரணையிலே சுங்கப் பிரிவினால் இந்தப் புத்தகங்கள் தடுக்கப்பட்டிருக்கின்ற தென்று. இந்த நடவடிக்கை எழுத்துச் சுதந்திரத்தை மட்டுமல்லாது, இவரின் எழுத்துக்கள் வெளியான தேசிய, சர்வதேச ஊடகங்களின் கண்ணியத்தையும் பாதித்திருக் கின்றது. இதுவும், இந்த நாட்டிலே மலையகப் பகுதியிலுள்ள கஹவத்தையின் நீலகாமம் தோட்டத்திலே இடம்பெற்ற மிக மோசமான வன்முறைச் சம்பவம் போன்றவையும் இங்கு இன்னமும் இன ரீதியான வன்முறை, இன ரீதியான பாகுபாடு மற்றும் நல்லிணக்கமற்ற தன்மை என்பன மேலாங்கித்தான் இருக்கின்றன என்பதற்கு நல்ல உதாரணங்களாகும்.

தமிழர்களுடைய தனியார் காணியிலே வலுக்கட்டாயமாக அமைத்த தையிட்டி விகாரையை அகற்ற முடியாதெனக் கூறி, அதற்குப் பெயரும் குறித்து, அவர்களுடைய நிலங்களை வழங்கவிடாது தடுத்திருக்கின்ற அரசாங்கம், நீலகாமம் தோட்டத்திலே ஒரு தொழிலாளி சொந்தமாக ஒரு கொட்டிலை அமைத்து படுப்பதற்கு - உறங்குவதற்கு - அனுமதிக்காத அரசாங்கம், தீபச்செல்வனுடைய புத்தகங்களை வெளியிடு வதற்கு அனுமதிக்காத அரசாங்கம், என்ன ஜனநாயகத்தை வெளியில் சொல்லப் போகின்றது? எவ்வகையான உணர்வுகளை வெளிப்படுத்தப் போகிறது? உங்களுடைய ஆட்சிக் காலத்திலும் கடந்த அரசாங்கங்களின் காலம்போல் வன்முறை மற்றும் துப்பாக்கிக் கலாசாரம் கொண்ட, இனங்களை மதிக்கத் தெரியாத சகிப்புத் தன்மையற்ற ஓர் அரசாங்கமாகத்தான் நீங்கள் இருக்கப் போகின்றீர்களா என்பதை தயவுசெய்து உணர்ந்து கொள்ளுங்கள்! திருந்துங்கள்! கடந்த காலங்களைப் பார்த்துத் திருந்தி, இனிமேலும் நல்லிணக்கத்தையும் இனங்களுக்கிடையிலான ஒற்றுமை யையும் கொண்டுவர ஒரு புதிய முயற்சியை எடுங்கள் என நான் இந்தச் சபையினூடாக வலியுறுத்தி, விடை பெறுகிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Nishantha Samaraweera. You have eight minutes.

[අ.භා. 1.37]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙනෙන නියම හා නියෝග සම්මත කිරීම සඳහා වන විවාදයට එක් වෙන්න ලැබීම සතුටක්. විශේෂයෙන්ම ඒ කාරණාව පිළිබඳව විශේෂ පැහැදිලි කිරීමක් ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කළා. කොළඹ වරාය නගර භූමියේ ආයෝජනවල අවශ්‍යතාව, ඒ වාගේම ඒවායේ තිබෙන නඩු කටයුතු ඇතුළු ගැටලුවල ස්වභාවය, මේ මොහොතේ කළ යුතු කාර්යභාරය - මේ සියල්ල - පිළිබඳ පැහැදිලි කිරීමක් එතුමාගේ කථාවේ තිබුණා. ඒ නිසා අපි හිතනවා, මේ නියම සහ නියෝග පිළිබඳව මේ සභාවට ප්‍රමාණවත් තොරතුරු ප්‍රමාණයක් ලැබී තිබෙනවා කියලා.

කොහොම වුණත්, මේ පිළිබඳව අදහස් දැක්වීමේදී ඒක පදනම් කරගෙන සහ මේ දවස්වල සමාජයේ සාකච්ඡාවට ඇවිල්ලා තිබෙන කාරණා විශාල ප්‍රමාණයක් පදනම් කරගෙන විපක්ෂයේ මන්ත්‍රීවරු එක්තරා උත්සාහයක් දරමින් ඉන්නවා, ආණ්ඩුව පාර්ශ්වයෙන් හොරකමක් කළාය කියන්න. මේ හැම එකක්ම එකට බද්ධ කරලා තමයි අද සාකච්ඡාව, නැත්නම් උදේ වරුවේ පාර්ලිමේන්තුව ඇතුළේ සංදර්ශනය තිබුණේ. විශේෂයෙන් ගත්තාම භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන දෙකහමාරක මුදලට සම්බන්ධ සිද්ධිය ගැන නිවැරදි ලෙස පරීක්ෂණ කර, මේ ගැටලුව මතු වුණේ කොහොමද කියන එක සහ ඒකට වගකිව යුතු කවුද කියන කාරණය හෙළිදරව් කරන්න, ඒ පිළිබඳව නීත්‍යනුකූලව, විමර්ශනාත්මකව කටයුතු කරන්න ඉඩ කඩ නොදී ඒ කාරණය ඒ අයගේ මතයක් සමාජගත කිරීම සඳහා මෙහෙයවා ගන්න විශාල උත්සාහයක් දරමින් ඉන්නවා. ඒක තමයි අද උදේ වරුවේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ වාගේම, මේ දවස්වල දකින්න තිබෙන්නේ.

මේ කරුණු නිවැරදිව අනාවරණ වන තෙක් දිය සැලියේ නටන එක ඔවුන්ගේ විනෝදාංශය බවට පත් වෙලා තිබෙනවා. ගල් අඟුරු සම්බන්ධ සාකච්ඡාවේදීත් වුණේ එහෙමයි. ඒක නිවැරදි විධියට පරීක්ෂණවලට යොමු කළාම ඒවාට ඇවිල්ලා කරුණු දක්වන්නේ නැතුව, ඊට කලින් උත්සාහ කළා, මේක ආණ්ඩුවේ මහා පරිමාණ වංචාවක් බව කියන්න. හැබැයි, තවමත් අපට තොරතුරු ලැබෙන්නේ නැහැ, ඒ විමර්ශන කොමිසම පිහිටෙව්වාට පස්සේ අර තිබුණු උනන්දුවෙන් ඒකට ඇවිල්ලා කරුණු ඉදිරිපත් කරන බව. ඇයි එවැනි පසුබෑමක් තිබෙන්නේ? අපි නැවත ඒ කණ්ඩායම්වලට ආරාධනා කරන්න ඕනෑ, දන්න තොරතුරු ඇත්ත නම් ඒවා ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, බොරු තොරතුරු ඉදිරිපත් කරන්න එපා. පරිස්සමින් වැඩ කරන්න කියලාත් මතක් කරන්න ඕනෑ.

ඇත්තටම විපක්ෂය විධියට අප ඉදිරියේ ඉන්නේ කිසිම දේශපාලන ව්‍යාපාරයක් නොකරන මට්ටමේ ළදරු ක්‍රියාමාර්ග ගන්න කණ්ඩායමක්. ඒකට හොඳම උදාහරණය තමයි මෙතැනදී මතු වෙච්ච VAT සම්බන්ධ සාකච්ඡාව. නිශාන්ත ජයවීර

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

මැතිතුමා අදාළ කාරණය පැහැදිලි කළා. ඒක විශේෂ කාරණයක් ලෙස අරගෙනත් කථා කළා. සරලව ගත්තොත්, මූල්‍ය සේවා - financial services - සඳහා සියයට 18ක බද්දක් තිබුණා. ඊට අමතරව සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් තිබුණා, සියයට 2.5ක. ඒ දෙක එකතු කරලා තනි බද්දක් ලෙස අය කරන්න තමයි කටයුතු කරන්නේ. ඒක තමයි ඒ ගැසට් නිවේදනයේ පැහැදිලි කරලා තිබෙන්නේ. මේකෙන් සමාජයට අමතර බරක් වැටෙනවාද, නැද්ද කියන කාරණය පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. ඇත්තටම ගත්තොත්, 3 වසරේ දරුවෙකුගෙන් ඇහුවත්, ඒක එහෙම නැහැ කියලා ඔහුට තේරෙනවා. ඒක නොතේරෙන එකක් නොවෙයි නේ. VAT එක සියයට 18ක් සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සියයට 2.5ක් තිබුණා. මේ දෙක එකතු කරලා තමයි මේ සියයට 20.5ක බද්ද හැදුවේ කියලා තේරෙනවා. හැබැයි, විපක්ෂයට නායකත්වය දෙන විපක්ෂ නායකතුමා පවා ජනතාව ඉස්සරහා සංවිධානාත්මක මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා, වැඩිපුර බදු අය කරනවා කියලා. සාමාන්‍යයෙන් 3 වසරේ දරුවෙකුගෙන් ඇහුවොත්, "පුතේ, සියයට 18ක බද්දක් තිබෙනවා, ඒ වාගේම සියයට 2.5ක බද්දක් තිබෙනවා, ඒ දෙක එකතු කළාම සියයට 20.5යි. ඒ මඟින් බදු ගෙවන කෙනාට අවාසියක් සිදු වෙනවාද?" කියලා, ඒ මට්ටමේ දරුවෙක් වුණත් කියයි, "නැහැ" කියලා. තේරුම් ගන්න පුළුවන් මේ වාගේ සරල කාරණයක්වත් සමාජය ඉස්සරහට නිවැරදි විධියට ගෙනෙන්නේ නැති වුණාම, මොකක්ද මේ දරන උත්සාහය කියලා සමස්ත විපක්ෂයේ කාර්යභාරය පිළිබඳව බරපතළ ගැටලුවක් මතු වෙනවා. අද විපක්ෂයේ ක්‍රියාකාරිත්වය ගත්තාම, මුළු කාලයම වැය කරමින් ඉන්නේ මොකක් වෙනුවෙන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Nishantha Samaraweera, you have only two more minutes.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මම කථාව කෙටි කරලා අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔවුන් බොහෝ අවස්ථාවල මේ සමාජය ඉස්සරහා උත්සාහ කරමින් ඉන්නවා, මේ ආණ්ඩුව වංචා කරනවා, හොරකම් කරනවා වාගේ කථාවක් ප්‍රහාරාත්මක විධියට මතු කර ගන්න. ඒකට හේතුව තමයි, තමන්ගේ බලය ගිලිහෙන්න ප්‍රධානම හේතුව වුණේ මොකක්ද කියලා ඔවුන් දැනගෙන සිටීම. ඒවා ගැන අද විවිධ පරීක්ෂණ ක්‍රියාත්මක වෙනවා, විවිධ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඔවුන්ගේ යුගයේ සිදු වුණු මේ රටේ මහජන ධනය අවභාවිත වුණු ආකාරය පරීක්ෂා කරමින් ඉන්නවා. නමුත් අපට කිසි කලබලයක් නැහැ. අපි කලබල වෙලා අපේ දේශපාලන බලය පාවිච්චි කරලා උසාවි ක්‍රියාමාර්ග ගන්නවා නොවෙයි, අනීතික ක්‍රියාමාර්ග ගන්නවා නොවෙයි. නියමිත ආකාරයට පරීක්ෂණ කරමින් නීත්‍යනුකූල ක්‍රියාවලියක අපි ඉන්නවා. ඒ සඳහා කාලය ගනිමින් ඉන්නවා. හැබැයි, ඒ කාලය ඇතුළත විපක්ෂයේ ඇතැම් අය උත්සාහ ගනිමින් ඉන්නවා මේ ආණ්ඩුව හොරකම් කරනවා කියලා කියන්න.

ඇත්තටම දැවැන්ත ගල් අඟුරු වංචාවක් කියලා මුසාවක් එළියට දැම්මා. හැබැයි, දැන් ඒක ඔප්පු කර ගන්න බැරුව ඉන්නවා. අපි අභියෝග කරනවා, තව කාලය අරගෙන හෝ පුළුවන් නම් ඒක ඔප්පු කරලා පෙන්වන්න කියලා. මොකද, ඔප්පු කරන්න පුළුවන් හැම අවස්ථාවක්ම අපි ගොඩනඟලා දීලා තිබෙනවා. ඒ නිසා පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න කියලා අපි කියනවා. මේ සිද්ධි සම්බන්ධයෙනුත් අපට නිශ්චිතව කියන්න තිබෙන්නේ එයමයි. මේ සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණ නිසි පරිදි අවසන් කරලා, ඒ පරීක්ෂණවල ප්‍රතිඵල සමාජයට එන දවසට මුළු ලාංකීය සමාජයම තේරුම් ගන්නවා, මේ ආණ්ඩුව මේ පිළිබඳව දක්වන ලද කැපවීමේ සහ උනන්දුවේ තරම. ඒක වළක්වන්න බැහැ. එතෙක්, "දිය සැලියේ නටන කකුළුවන් වාගේ" විපක්ෂයේ මේ සියලුදෙනා තමන්ගේ කාලයේ සිදු වුණු වංචා, දූෂණ, හොරකම, නාස්තිය ආදී සියල්ල වහගන්න, දැනුත් එහෙම දේවල් වෙනවා කියලා සමාජයට කියන්න උත්සාහ දරනවා. අපි එය ඇත්තටම අවඥාවෙන් බැහැර කරන්න ඕනෑ.

මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මම නතර වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Namal Rajapaksa. You have eight minutes.

[අ.භා. 1.44]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමා විශේෂයෙන්ම ළඳරුවන් ගැන කථා කළා. අද තිබෙන්නේ Port City එකට අදාළ නියම සහ නියෝග ගැන විවාදයක්. එදා Port City එක හදන කොට අද ආණ්ඩුවේ ඉන්න මෙතුමන්ලා මොකක්ද කිව්වේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මේ අය කියපු විධියට Port City එක හැදුවා නම් අද සීගිරිය නැහැ. ඒ ඇයි? Port City එක හදන්න සීගිරිය කඩලා ගල් ගේන්න ඕනෑ. ඒ වාගේම එදා Port City එකේ ප්‍රතිපත්ති හැදුණේ මෙතුමන්ලා කියපු විධියට නම්, අද passport එකක් ඕනෑ Port City එකට යන්න. මේවා තමයි, අද ආණ්ඩු පක්ෂයේ ඉන්න මහත්වරුන් එදා කියපු කථා; ළඳරු කථා. මේ රට චීන කොලනියක් බවට පත් කරන්න හදනවා කියලා එදා ඔබතුමන්ලා කිව්වා. ඔබතුමන්ලා අද අඩු ගණනේ උත්සාහයක් හෝ දරනවා, Port City එකට අදාළව මොකක්හරි කරන්න. අපි ඒ ගැන සතුටු වෙනවා. හැබැයි, ඔබතුමන්ලාට කර ගන්න තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමු කාරණය මේකයි. කොළඹ වරාය නගරය හැදුවේ ගනුදෙනු කිරීම සඳහා. එහෙම නැතුව real estateවලටම නොවෙයි. Real estate අවශ්‍යයි; ගොඩනැඟිලි හැදෙන්නත් ඕනෑ. හැබැයි, එතැන ගනුදෙනු කරන්න පුළුවන් ප්‍රතිපත්ති ටික හදන්න ඕනෑ. ආණ්ඩුවලට හිතෙන හිතෙන වෙලාවට, ආණ්ඩුවලට වාසියි කියලා හිතෙන විධියට ප්‍රතිපත්ති වෙනස් කළාම අද අභියෝගයට ලක් වෙලා තිබෙන රටවල ආයෝජකයන්ට මේ රටට ව්‍යාපාර ගෙන ඒමේ අපහසුතාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. Port City එකට ආයෝජකයෙක් ආවාම අපි කැබිනට් මණ්ඩලයට දැනුම් දෙන්න ඕනෑ, පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ. කවුද අනේ එහෙම ආයෝජනය කරන්නේ?

අපිත් එක්ක competitive රටවල් තිබෙනවා. ඉන්දියාව, සිංගප්පූරුව, හොංකොං ඒවායෙන් කීපයක්. ඉන්දියාවේ GIFT City තිබෙනවා. ගල්ෆ් කලාපයේ වර්තමානයේ පවතින අර්බුදයත් එක්ක මැදපෙරදිග යම් අර්බුදයකට මුහුණ දෙනවා. ඒ නිසා ඔවුන් නව වෙළෙඳ පොළවල් සොයනවා; ගනුදෙනු කරන්න නව

කේන්ද්‍රස්ථාන සොයනවා. ඒවාට යන්න ඔබතුමන්ලා සූදානම්ද? ඒවාට යන්න අවශ්‍ය විනිවිදභාවයෙන් යුතු, පහසුවෙන් ව්‍යාපාර කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් කොළඹ වරාය නගරය කේන්ද්‍ර කරගෙන ඔබතුමන්ලා හදලා තිබෙනවාද? අඩුම ගණනේ ඒ අවශ්‍යතාව පිළිබඳව ආණ්ඩුව වටහා ගෙන ඉන්නවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ හින්දා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මෙයයි. අද මැදපෙරදිග ඇති වෙලා තිබෙන අර්බුදය හමුවේ ඒ ආයෝජකයන් ගනුදෙනු කිරීම සඳහා විකල්ප මධ්‍යස්ථාන, විකල්ප රටවල් හොයනවා. හැබැයි, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික, ප්‍රතිපත්තිමය කාරණා ටික, ඔවුන්ට අවශ්‍ය ගනුදෙනු කිරීමේ නිදහස, විනිවිදභාවය, මෙහේට ඇවිල්ලා තමන්ගේ ව්‍යාපාර ස්ථාපනය කරලා ඒවා ඉතාම නිදහසේ කරගෙන යන්න පුළුවන් පරිසරය හදලා දෙන්න ඕනෑ. එවැනි අවංක උත්සාහයක් අපි ඔබෙන් දකින්නේ නැහැ.

දැන් ඔබතුමන්ලා කථා කරනවා ආයෝජකයන්ට එන්න කියලා. නමුත්, පසුගිය කාල සීමාව තුළ මොකද වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික බැංකුවකින් බිලියන 13කට වඩා අතුරුදහන් වුණා. සාමාන්‍යයෙන් මේ රටේ පුරවැසියෙක් බැංකුවකට ගිහිල්ලා රුපියල් ලක්ෂ 10ක් ගිණුමකට දැම්මත් ප්‍රශ්න කීයක් අහනවාද? හැබැයි, රුපියල් බිලියන 13ක් අන්තර්ධාන වනකල් ආණ්ඩුව, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව බුදි. හොඳයි! ගමේ මනුස්සයෙකුගෙන්, ලංකාවේ ව්‍යවසායකයෙකුගෙන්, අහිංසක ව්‍යාපාරිකයෙකුගෙන් නම් ප්‍රශ්න හැටක් විතර අහනවා, ප්‍රශ්න ගණනාවක් අහනවා, මුදල් ටිකක් ගිණුමකට දැම්මාම. හැබැයි, ලංකාවේ ප්‍රධාන පෙළේ බැංකුවකින් රුපියල් බිලියන දහතුනහමාරක්, දාහතරක් අන්තර්ධාන වනකල් ආණ්ඩුවේ අය බුදි; ඒ ගැන දන්නේ නැහැ. අපි එතැනින් එහාට යමුකෝ. ඔබතුමන්ලා දැන් කියන හැකර්ලාගේ ක්‍රියාදාමය ගනිමු. දැන් හැකර්ලා කළා කියලා නේ කියන්නේ. එහෙම තමයි කියන්නේ. මේ ආණ්ඩුවෙන් වංචාවක් වුණොත් ඒක කරලා තිබෙන්නේ ආණ්ඩුව නොවෙයිලු, හැකර්කෙනෙක්ලු. 10 වතාවක් installments ගෙවලා තිබෙනවා, කෝටි 80කට වැඩි ප්‍රමාණයක්. හෙට ඩොලරයේ අගය වැඩි වුණොත් ඒ ගණන තවත් වැඩි වෙනවා. අදට කෝටි 80කට වැඩි ප්‍රමාණයක් ඔබතුමන්ලා වැරැදි ගිණුමකට ගෙවලා තිබෙනවා. එක මන්ත්‍රීවරයෙක් කියලා තිබෙනවා මම දැක්කා, "වැරදීම් වෙනවා" කියලා. ඔහොම වැරැදීම් වුණොත් හොඳයි ආණ්ඩුව කරන අයට. මරු! Experiences ගන්න, ඉගෙන ගන්න දීලා තිබෙන විධිය මරු! ඇහුවාම කිව්වේ, අපි මුළු රාජ්‍ය යන්ත්‍රණයම digitalize කරලා වැඩේ කරනවා කියලායි. නමුත් email එකක් හරියට කියවලා account number එක ගහගන්න තේරෙන්නේ නැහැ. අනෙක් පැත්තෙන් දහ වතාවක් වැරදි ගිණුමකට ගෙවනවා. මහ බැංකුවෙන් දැනුම් දෙනවා. ඒත් ආයේත් ගෙවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කවුද මේකට වග කියන්නේ? පුළුවන් නම් කියයි රාජපක්ෂලාගේ හැකර් කෙනෙක් කියලා. ඒක ලේසියි නේ. ඒක නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලේසිම කථාව. හැබැයි, මේවා ජනතාවගේ බදු සල්ලි. ඔබතුමන්ලා මහ ලොකුවට විනිවිදභාවය ගැන කථා කරනවා. තැපැල් දෙපාර්තමේන්තුවේත් ඩොලර් ලක්ෂ 6ක් වැරදි ගිණුමකට ගෙවනවා. මේවා එක දිගට එන්නේ. කොහොමද මේක සංවිධානාත්මක නොවෙයි කියන්නේ? හරි, අපි ඔබතුමන්ලා කියන බොරුවලට ඇහුම්කන් දුන්නා කියන්නකෝ. දෙවැනි එකත් වෙනවා, තුන්වැනි එකත් වෙනවා. RDA එකේ කොන්ත්‍රාත්කරුවන්ට double payment එකක් යනවා. ඒක තේරුම් ගන්න බැරිද? ඒකේත් මිලියන 51ක් තවම ගෙන්වා ගන්න විධියක් නැතිව ඉන්නවා. වැරදි ගිණුම්වලට ගෙව්වාම ඒ සඳහා ඔබතුමන්ලා ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද?

ජනාධිපතිවරයා තමයි මුදල් ඇමති. මේ ආණ්ඩුව හැම එකටම CID දුවනවා නේ. ජනාධිපතිතුමාගේ හිත රිදෙන post එකක් දැම්මත් CID යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිවරයාගේ හිත රිදුණාමත් CID යන ආණ්ඩුව, කෝටි 80ක් වැරදි ගිණුමකට සල්ලි ගෙව්වාම ඇයි CID ගියේ නැත්තේ? මොකක්ද ඒකට ගත්ත ක්‍රියාමාර්ගය? මොකක්ද ගත්ත පියවර ගරු නියෝජ්‍ය කථානායකතුමනි? පියවරක් ගත්තේ නැහැ. ඒක වහගන්න උත්සාහ කළා. ජනවාරි මාසයේ ජනාධිපතිවරයා දන්නවා මේ ගැන. නමුත් තීන්දුවක් ගත්තේ නැහැ, ක්‍රියාත්මක වුණේ නැහැ. ගල් අඟුරු වංචාව එක පැත්තකින්. බාල ගල් අඟුරු ගෙන්වීම වංචාවක් නොවෙයිලු. බාල ගල් අඟුරු ගෙනාවාම ඒක වංචාවක් නොවෙයි. කාලා බලලා නොවෙයි නේ ගෙනාවේ. ගෙනාවාම තමයි කෑවේ. ගල් අඟුරු වංචාවක් නොවෙයිලු. ලජ්ජා නැතිව ඒක කියන විධිය. COPE එකේ සභාපතිවරයා තමයි කියන්නේ. ලජ්ජයි. ලජ්ජයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ලෝකයේ වැඩිම මුදලක් ගෙවලා තෙල් ගත්ත රට බවට අපි පත් වෙලා තිබෙනවා. ඩොලර් 286 - 302 අතර මිලකට තෙල් අරගෙන තිබෙන්නේ. ලෝකයේ වැඩියෙන්ම ගෙවලා තෙල් ගන්න රට බවට අපේ රට පත් වෙලා තිබෙනවා. මේ හැම රුපියලක්ම, හැම ඩොලර් එකක්ම අවසානයේ කාටද යන්නේ? යන්නේ රටේ ජනතාවට.

දැන් ඉතින්, අලුත්ම න්‍යාය පටන් ගන්නවා. ඒ මොකක්ද? ඔබතුමන්ලා හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම නියෝජිතයෙක් දමනවා. හැකර් කෙනෙක්. හැකර් කෙනෙක් දමනවා. ඇයි ඒ? ඒ සමාජ ප්‍රාග්ධනය රැස් කරන්නද කියලා අපට සැකයක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම දේශපාලන පත්වීමක් දීලා හැකර් කෙනෙක් දාලා ඔබතුමන්ලා කරන්න බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ප්‍රදේශීය ලේකම්වරු, දිසාපතිවරු මේකට විරුද්ධව ඔබතුමාට ලියලා තිබෙනවා. හැබැයි, ඒවාට ඇහුම්කන් දෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ දේශපාලන වුවමනාව ඉටු කරගන්න ඔබතුමන්ලාගේ හැකර්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පත් කරගෙන යනවා. දැන් මුදල් අමාත්‍යාංශයත් හැක් කළා කියනවා නේ. ඊළඟට හැක් කරන්න ලෑස්ති වෙන්නේ මොකක්ද? ප්‍රාදේශීය ලේකම් කාර්යාල. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැනත් අවධානය යොමු කරන්න.

තව විනාඩියක් මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යාපනේ අජන්තන් කියන ධීවරයා ලංකා මුහුදු තීරය ඇතුළතදී ඉන්දියානු ධීවරයන්ගේ පහර කෑමකට ලක් වුණා. ඔහු ඉන්දියාවට අරගෙන ගියා. දැනුත් මැහුම් ගහලා ඉන්දියාවේ චෙන්නායිවල ඉස්පිරිතාලයක ඉන්නවා. අපි විදේශ ඇමතිවරයාගෙන් ඉල්ලනවා මේකට රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වෙන්න කියලා. මොකද, ඔබතුමන්ලා උතුරේ ජනතාව ගැන ලොකුවට කථා කළාට මේ සිද්ධියට නම් තවම මැදිහත් වෙලා නැහැ. අදටත්, මේ වෙනකොටත් ඒ ධීවරයාගේ පවුලේ අය පොලිසියට ගිහින් පැමිණිලි කරනවා. නමුත් ඒ ගැන රජයේ කිසිම මැදිහත්වීමක් අපි දකින්නේ නැහැ.

අවසාන වශයෙන් මේ කාරණය කියනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම දැක්කා, මැයි දින වේදිකාවේ අපේ ජනාධිපතිවරයා, ඇමතිවරු මහ උජාරුවට නඩු වාර්තා කියෙව්වා. කම්කරුවන් ගැන කථා කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නඩු වාර්තා ගැන කියෙව්වා. මම දැක්කා ජනාධිපතිවරයා කියනවා, අම්මා, තාත්තා, පුතා කියලා. ඔව්. අම්මා, තාත්තා, පුතා අර පවුම් 90ක මාලේ කරේ දාගෙන ඉන්න බල්ලා. හැබැයි, මේක මතක තියාගන්න. මම මේ 159 දෙනාටම කියන්නේ. මම කිව්වා කියලා ජනාධිපතිතුමාට කියන්න, අම්මා, තාත්තා, පුතා, පවුම් 90 මාලේ කරේ දාපු බල්ලා නොවෙයි, ඒ මොකාට මොනවා කරන්න ගියත් තමුන්නාන්සේලාගේ වංචා නම් යට ගහගන්න ලැබෙන්නේ නැහැ කියලා. ඒක ජනාධිපතිවරයාට මතක් කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chathuranga Abeysinghe. You have 10 minutes.

[අ.භා. 1.54]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම විහිළු සහගත කාරණා කිහිපයක් මතු වුණා. මේ රට බංකොලොත් කරලා, ආර්ථිකය කළමනාකරණය කරගන්න බැරිව, ඉතාම අකාර්යක්ෂම රාජ්‍ය සේවයක් බිහි කරලා, ඒ රාජ්‍ය සේවයට තාක්ෂණය ගෙන්වාගන්න බැරිව, අවශ්‍ය internal controls ටික දාගන්න බැරිව අපේ කරේ තියපු රට අපි දැන් කෙමෙන් කෙමෙන් ශක්තිමත්ව ඉස්සරහට අරගෙන යනවා. එසේ ශක්තිමත්ව ඉස්සරහට අරගෙන යද්දී ජනතාව අපට වරමක් දුන්නා, මීට කලින් මේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න කියලා. ඒක සම්පූර්ණයෙන් වෙනස් කරලා තිබෙන නිසා, ප්‍රාදේශීය රාජ්‍ය යන්ත්‍රණයට බලපෑම් කරගෙන දේශපාලනය කරපු අය දැන් පොඩ්ඩක් අමාරුවේ වැටිලා තිබෙනවා. මොකද, ඒගොල්ලන්ට ගම්වල, දිස්ත්‍රික්කවල බලය අහිමි වෙලා තිබෙනවා. ඒ බලය පාවිච්චි කරලා තමයි රුපියල් 2,500, රුපියල් 1,500 දිදී එක එක දේශපාලන කටයුතුවලට ජනතාව ගෙනාවේ. අවසානයේ ඒ කිසිදෙයක් කරගන්න බැහැ කියලා මැයි දිනයේ ඔප්පු වුණා. සදා විපක්ෂයේ තමයි ඉතින්. ඒ කියන්නේ දැන් ජනතාව සංවිධානය කරගන්නත් බැහැ, අලුත් දේශපාලන සංස්කෘතියක් බිහි කරගන්නත් බැහැ, අලුත් ව්‍යාපාරයක් හදාගන්නත් බැහැ. ඒක ඇස් පනාපිට පෙනුණා. ඒගොල්ලන් වට්ටපු රට දැන් අපි කෙමෙන් කෙමෙන් ඉස්සරහට අරගෙන යනකොට, ඒකේ තැන් තැන්වල වන අඩුපාඩු හුවා දක්වනවා දේශපාලන වැරදි විදියට. නමුත් අපි මේ ඔක්කොම හදාගෙන යනවා මහත්තයෝ. එතකොට මෙතැනින් එහාට කොහොමටත් ඔයගොල්ලන්ට අප හොලවන්න හම්බ වෙන්නේ නැහැ. ආර්ථිකයේ ස්ථාවරත්වය තමයි අපට වැදගත් වුණේ. ඒක ශක්තිමත් කරමින් අපි ආර්ථික වර්ධනයකට යමින් ඉන්නවා. ඒ යන ගමනේදී තමයි මේ වරාය නගරයේ වෙනස්කම් කිහිපයක් අපි කරන්නේ.

මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, වරාය නගරය වෙනම රටක් කරන්න යනවා කියලා අපි කිව්වාලු. ඇත්ත නේ ඉතින්. එහෙම කරන්න තමයි ගියේ. ඒ නිදහස ගැන තමයි කිව්වේ. ඒ නිසා මේ ආණ්ඩුව ආවාට පස්සේ අපි පනත වෙනස් කළා. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත කියන්නේ ලංකාවේ කිසිදු නීතියකට, පාර්ලිමේන්තුවට, කිසිදු දෙයකට වග කියන්නේ නැති තත්ත්වයකට හදලා තිබුණු පනතක්. අපි විරුද්ධ වුණේ බැසිල්ගේ ඒ පනතට. ඒ පනත තමයි අපි ආවාට පස්සේ වෙනස් කළේ. ජාත්‍යන්තර නීතිවලට අනුව, අපේ රටේ ස්වෛරීත්වය ආරක්ෂා වන විදියට, අපේ රටේ පාර්ලිමේන්තුවට වග කියන ආකාරයට කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අපි වෙනස් කළා. ඒ වෙනස්කම් තමයි මේ එක එක කරගෙන එන්නේ. ඒ අතරේ තමයි මේ විශේෂ වෙනස්කම් දෙකත් කරන්නේ. වරාය නගරය දියුණු කරද්දී ඒක බදු රහිත - duty-free - කලාපයක් බවට පත් කරලා දියුණු කරන්න ඕනෑ. ලංකාවට එන මිලියන 2.3කට එහා වන සංචාරකයන් ඒ තුළ ගනුදෙනු කරලා එළියට යවාගන්න තමයි අපට ඕනෑ කරන්නේ. ඒ නිසා ඒකට අවශ්‍ය ඒ දීලා තිබුණු සහනය වැඩි කළා. දැනට වරාය නගරයෙන් ඩොලර් 2,000ක මිලදී ගැනීමේ හැකියාව තිබෙන්නේ එක් වරක් පමණයි. අපි දැන් ඒක දින 4ක් දක්වා දීර්ඝ කරලා ඒකේ flexibility එක වැඩි කරලා තිබෙනවා. මොකද, අපට ඕනෑ වෙළෙඳාම වැඩි කරගන්නයි. එතකොට තමයි අලුත් ව්‍යාපාර කටයුතු එතැන ආරම්භ කරන්න පුළුවන්.

ඊළඟට, අපේ ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ වරාය නගරයට අදාළව කම්කරු නීතියේ බලපෑම පිළිබඳ නඩුවක් තිබුණා. ඒකට අවශ්‍ය ලෙස, සුදුසු වන පරිදි පනත වෙනස් කර තිබෙනවා. මෙතැන කෑ ගැහුවාට වැඩක් නැහැ. මේ සියලුදෙනාගෙන්ම ඇහුවොත් දන්නවා, විශේෂයෙන්ම වරාය නගරයට විදේශ ආයෝජන ගෙනෙනකොට නිදහස් වෙළෙඳ කලාපයක් තුළ වාගේ factories හැදෙන්නේ නැහැ කියලා ඒක ඇතුළේ. ඒක ඇතුළේ කර්මාන්ත හැදෙන්නේ නැහැ. ඒක ඇතුළේ හැදෙන්නේ ආයතන. ඒ හැදෙන ආයතනවලට සේවකයන් බැඳෙන්නේ ඒ ආයතනයත් සේවකයාත් අතර ඇති වන agreement එකක් ඇතුළේ. වෘත්තීමය තත්ත්වයක් යටතේ ඒ ආයතනයත්, ඒ සේවකයාත් අතර තිබෙන agreement එකෙන් තමයි ඒ බැඳීම තිබෙන්නේ. අපි ඒ වෙනස්කම කරලා තිබෙනවා අපට ආයෝජන කැඳවාගන්න. ජාත්‍යන්තරව තිබෙන නිදහස් වෙළෙඳ කලාපවලට සාපේක්ෂව තමයි මේ වෙනස්කම් ඔක්කොම කරලා තිබෙන්නේ. දැන් කිව්වා, මේකට ආයෝජකයන් කැඳවාගන්න බැහැලු. මේක මෙච්චර කාලයක් තිබුණා. අවුරුදු 10ක් තිස්සේ මේක ගැන කථා කරනවා. නමුත් කිසිදු ආයෝජකයෙක් ඇවිල්ලා නැහැ. ඒක හරි. ඒ නිසා තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණු වෙලාවේ ඉඳලා මේ අණ පනත් වෙනස් කරලා, ඉතාම සංවිධිත ආකාරයේ බදු සහන දීලා කටයුතු කරන්නේ. දැන් අපට සක්‍රියව leads 233ක් ඇවිල්ලා තිබෙනවා. ඒවා අපිත් එක්ක සාකච්ඡා කරනවා. මේකේ සමස්ත වටිනාකම ඩොලර් බිලියන 4.6ක්. මේ වෙනකොට වරාය නගරයට අදාළව ඩොලර් බිලියන 4.6ක ආයෝජන සම්බන්ධයෙන් සාකච්ඡා කරමින්, එයින් ඩොලර් බිලියන 1.4ක ආයෝජනවලට අපි අනුමැතිය දීලා තිබෙනවා. ඒ වාගේම මේ වෙනකොට ආයෝජන 134ක් සක්‍රිය මට්ටමේ කටයුතු කරමින් තිබෙනවා. ඒවාට අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන වරාය නගරය නිර්මාණය කරපු එකේ උපරිම ඵල ලබා ගන්න මේ රජය කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම මේ මොහොතේත්, මීට කලිනුත් සාකච්ඡා වුණු දෙයක් තිබෙනවා. අපේ රටේ ආර්ථිකය ගැන යම්කිසි න්‍යායාත්මක අවබෝධයක් තිබෙන විපක්ෂයේ අය මේ ආර්ථිකය ගැන කථා කරන්නේ නැහැ. මොකද ඒ අය දන්නවා, ආර්ථිකය හොඳට දුවනවා කියලා. නමුත් ආර්ථිකය ගැන මෙලෝ දෙයක් දන්නේ නැති අය, විශේෂයෙන්ම මේ ආණ්ඩුවට ප්‍රහාර එල්ල කරන අය ආර්ථිකය ගැන බොරු කථා කියනවා. කාලයක් තිස්සේ කිය කියා ආවා, ආර්ථිකය ආපස්සට යනවා කියලා. ඉතාම ශක්තිමත්ව ආර්ථිකය ඉස්සරහට ගිහිල්ලා, 2025දී සියයට 5ක ආර්ථික වර්ධනයක් අරගෙන සියලු නිර්ණායක අභිභවා තිබෙනවා. කර්මාන්ත වැටෙනවා කිව්වා. නමුත්, ගිය අවුරුද්දේ කර්මාන්ත ක්ෂේත්‍රයේ සියයට 8ක වර්ධනයක් ලබාගෙන තිබෙනවා. බඩු මිල වැඩි වෙලා කියනවා. බඩු මිල වැඩි වෙනවා, වැඩි වෙනවා කියලා කෑ ගහනවා. නමුත් ඉතාම පැහැදිලිව තිබෙනවා, ගිය අවුරුද්දේ උද්ධමනය සියයට 2.2යි කියලා. අරමුණු කරපු සියයට 5ට ගිහිල්ලාත් නැහැ.

ඒ වාගේම ආයෝජන එන්නේ නැහැ කිය කියා කෑ ගහනවා. වරාය නගරය තුළ ඩොලර් බිලියන 4.6ක ආයෝජන පිළිබඳ සාකච්ඡා සිදු වෙමින් යනවා. ගිය අවුරුද්දේ විතරක් BOI හරහා ඩොලර් බිලියන 1.1ක ආයෝජන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, දේශීය ආයෝජකයන්ගේ පැත්තෙන් ගත්තොත්, පෞද්ගලික අංශය ගිය අවුරුද්දේ විතරක් රුපියල් ට්‍රිලියන දෙකක් ණය අරගෙන තිබෙනවා. ඒ ට්‍රිලියන දෙක ඇතුළේ කෘෂිකාර්මික

ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් බිලියන 163ක් ණය අරගෙන තිබෙනවා. කර්මාන්ත ක්ෂේත්‍රය රුපියල් බිලියන 538ක් බැංකුවලින් ණය අරගෙන තිබෙනවා. සේවා අංශය - service sector - රුපියල් බිලියන 449ක් ණය අරගෙන තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික පරිභෝජනයට, පුද්ගලයන් විධියට personal loans විධියට, housing loans විධියට රුපියල් බිලියන 400ක් ණය අරගෙන තිබෙනවා. ඒ කියන්නේ ආර්ථිකය ඉතාම කාර්යක්ෂමව වර්ධනය වෙමින් තිබෙනවා. පෞද්ගලික ණය ගැනීම්, ආයෝජන සඳහා ණය ගැනීම් සියයට 126කින් වැඩිවෙලා තිබෙනවා. මේකෙන් තමයි කියන්නේ මේ ආර්ථිකය පිම් පනිමින් ඉදිරියට එනවා කියලා. 2024දී මෙවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. 2025 වර්ෂයේදී ගත්ත මේ ණය ආයෝජනය වෙලා, නිෂ්පාදනය වැඩිවෙලා ප්‍රතිඵල එන්නේ 2026දී. ඒක මේ අය දන්නවා. ඒ නිසා තමයි ආර්ථිකය ගැන දන්නා අය මේක ගැන කථා කරන්නේ නැත්තේ. ඒ නිසා තමයි "ඔන්න VAT එක වැඩි කළා" කියලා බොරු මවලා ජනතාවට කියන්න හදන්නේ. ඒක අමූලික බොරුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ බදු එකතු කර ගන්නේ නැතිව මේ රට බංකොලොත් කරලා ගෝඨාභය රාජපක්ෂ යනකොට අපේ රටේ බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.2යි. එතැන තමයි මේ අය බෝම්බය තියලා ගියේ. දැන් අපි ඒක 16.6කට ගෙනැල්ලා තිබෙනවා. IMF එක අපට 15.3ක target එකක් දීලා තිබුණා. අපි මේක 18.5කට ගෙනියනවා. හරි ද? මේ අය තියලා ගිය බදු පද්ධතිය ඇතුළේ තමයි අපි මේ දේවල් කළේ. රට බංකොලොත් කරලා තිබුණු නිසා තමයි VAT එක සියයට 18කට වැඩි කරනවා කියලා අවසාන වශයෙන් IMF එකත් එක්ක එකඟ වුණේ. බදු වැඩි කරලා, බදු බර ජනතාවට දාලා, මේ රට බංකොලොත් කරලා තමයි මේගොල්ලන් පැනලා ගියේ. දැන් අපි ඒක හදනවා. බදු පදනම වැඩි කරලා, බදු ගෙවන්නේ නැති අය බදු ක්‍රමයට අරගෙන, කාලානුරූපීව මේ සියයට 18ක VAT එක සියයට 15ට, සියයට 12ට, සියයට 10ට ගෙනෙන්න අපට පුළුවන්. අපේ target එක තමයි VAT එක සියයට 10ට ගෙනෙන එක. ඒක තමයි ලෝක සම්මතය. ඒක පරිභෝජන බදු.

දැන් අනෙක් පැත්තෙන් කියාගෙන යනවා, VAT එක සියයට 20ක් කරලා කියලා. දැන් ඉතාම හොඳින් පැහැදිලි කළා, මේ VAT එකට මූල්‍ය ක්ෂේත්‍රයට තිබෙන සමාජ ආරක්ෂණ බද්දත් එකතු කරලා බදු ක්‍රමය සරල කරන්න කරපු දෙයක් කියලා. ජනතාව මීට වඩා දැනුවත්. ජනතාව මීට වඩා දැනුවත් නිසා තමයි මැයි දිනයේදී පැහැදිලිවම එළියට ඇවිල්ලා පෙන්නුවේ, ඔයගොල්ලන් බොරු කියලා කෑ ගැහුවාට වැඩක් වෙන්නේ නැහැ කියලා.

ඒ වාගේම මෙතැනදී වංචා, දූෂණ, අක්‍රමිකතා ගැන කිව්වා. ඉස්සරත් වංචා, දූෂණ, අක්‍රමිකතා සිද්ධ වුණා. නමුත්, ඒ රාජ්‍ය නිලධාරින් සම්බන්ධයෙන් ඔයගොල්ලන් පරීක්ෂණ කළේ නැහැ; අඩුපාඩු හදාගත්තේ නැහැ. අඩුපාඩු තිබෙනවා නම් ඒවා මොනවාද කියලා රටට කිව්වේ නැහැ. මේ වාගේ තොරතුරු දැන ගැනීමේ පනතක් තිබුණෙත් නැහැ. දැන් මේ සියලු දෙයක්ම විනිවිදභාවයෙන් ජනතාවට පේනවා වාගේම, අපි වග කියනවා. අපි මැති ඇමතිවරු විධියට, නියෝජ්‍ය ඇමතිවරු විධියට ගිහිල්ලා බලන්නේ නැහැ, මොන contract එකද දුන්නේ කියලා. ඒක කොහොමද දුන්නේ, කාටද දුන්නේ කියලා සමහර වෙලාවට අපි දන්නේත් නැහැ. මොකද, ඒකට අවශ්‍ය රාජ්‍ය යන්ත්‍රණය ශක්තිමත් කරලා තිබෙන නිසා. අදාළ නිලධාරින් ඒවා ක්‍රියාත්මක කරගෙන යනවා, අපි අත පෙවීමක් කරන්නේ නැහැ.

මීට කලින් දේශපාලනයේ එහෙම අතපෙවීම් කරලා තිබෙනවා. ඒ නිසා තමයි මේ අය දැන් මේ නඩුවල පැටලිලා තිබෙන්නේ. තමන්ගේ හදවත දන්නවා, මොකක්ද වෙන්න යන්නේ කියලා. මීට කලින් රටේ වෙච්ච වංචා, දූෂණ පිළිබඳව ගත්තාම, නිලධාරින් වාගේම දේශපාලන යන්ත්‍රණයත් සම්බන්ධයි. ඒකට තමයි දැන් කටයුතු ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඒ නඩු තීන්දු එනවා කියලා දින වකවානු දුන්නාම මෙතැන දඟලන්න හදනවා. මොකද, ඒගොල්ලන් දන්නවා, මොකක්ද එන නඩු තීන්දුව කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chathuranga Abeysinghe, your time is up. Please, wind up now.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ඒ නිසා ඔයගොල්ලන්ට මේක ආපසු හරවන්න විධියක් නැහැ. මොකද දන්නවාද? එකක් තමයි ආර්ථිකය පිම් පනිමින් ඉස්සරහට යනවා. මහ බැංකු වාර්තාව පදනම් කරගෙන මේ පිළිබඳව විවාදයක් හෙට අනිද්දාට තිබෙනවා. ආර්ථිකය පිම් පනිමින් ඉදිරියට යනවා. ඒ නිසා ඒක ආපස්සට හරවන්න බැහැ. ප්‍රවාහනය දියුණු වෙනවා. අධ්‍යාපනය, සෞඛ්‍ය යටිතල පහසුකම් දියුණු වෙනවා. ඒවා මිනිස්සු දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මහජනතාව හදපු ආණ්ඩුවක්. එහෙම නැතුව අපි කාලයක් තිස්සේ දේශපාලනය කරපු අයවත්, දේශපාලකයෝ වෙන්න හිටපු අයවත් නොවෙයි. අපි මහ පොළොවේ හිටපු, මහජනතාවත් එක්ක හිටපු අය. මේක මහජනතාව පත් කරපු ආණ්ඩුවක්. ඒකට තිබෙන support එක මැයි මාසයේ ජනතාව පෙන්නුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේගොල්ලන්ට දේශපාලන චින්තනයකුත් නැහැ; දේශපාලන පැවැත්මකුත් නැහැ; දේශපාලන සංවිධානයකුත් නැහැ. ඒ නිසා තමයි මෙතැන ගෝරනාඩු කරන්නේ, විශේෂයෙන්ම උදේ වරුවේ අපේ වැඩ කටයුතු අඩාළ කරන්න. ඉතින් අපි හිතනවා, මීට වඩා සංවිධිත, සංවර පාර්ලිමේන්තුවක් අපට බිහි කර ගන්න පුළුවන් කියලා. මගේ කථාව මම අවසන් කරනවා. මේ ආයෝජන සියල්ල 2026, 2027 කාලයේ ලෝක තත්ත්වයන් යටතේ ලංකාවට ආකර්ෂණය වෙලා ඉවරයි කියන පණිවුඩය තමයි මට දෙන්න අවශ්‍ය.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rohitha Abeygunawardhana. You have nine minutes.

[අ.භා. 2.06]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසට නියමිත වැඩ කටයුතු තිබෙන වෙලාවේ, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අද උදේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසිදෙනෙකුට වැඩි කණ්ඩායමක් නැඟිටලා කථානායකතුමාගෙන් ඉල්ලීමක් කළා, මේ රටේ මහා භාණ්ඩාගාරයේ සිදු වෙලා තිබෙන අක්‍රමිකතාවක් ගැන කථා කරන්න විවාදයක් දෙන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් කථානායකතුමාගෙන් මොනවා හරි ගන්නවා කියන්නේ ඉබ්බාගෙන් කෙස් ගන්නවා වාගේ වැඩක්. හරි අමාරුයි, ගන්න. නමුත් දැන් අපට පැය දෙකක් ඒ වෙනුවෙන් දීලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පැය එකහමාරක්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
පැය එකහමාරක්. පැය එකහමාරක් තමයි දීලා තිබෙන්නේ.

ඉතින්, අපට මතක් වෙනවා, මෙන්න මේ කාරණා. අපි පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ හිටපු කාලයේ තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් විපක්ෂයේ හිටියා. මොකක්ද, විපක්ෂයේ කාර්යභාරය? රටේ යම් අක්‍රමිකතාවක් සිදු වෙනවා නම්, ඒ ගැන විපක්ෂය කථා කරන්න ඕනෑ. ගොළුවෝ නොවෙයි නේ, විපක්ෂයේ ඉන්නේ. හොඳට ඇස් පෙනෙනවා; කන් ඇහෙනවා. එන තොරතුරුත් එක්ක කථා කරන්න ඕනෑ. එහෙම කථා කරන්න තමයි විවාදය ඉල්ලුවේ. නැතුව වෙන වෙන වල් පල් කථා කරන්න නොවෙයි.

ඊළඟට, අද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙනෙන නියමයන් සම්බන්ධයෙන් කථා කරන්නත් තිබෙනවා. ඒ ගැන සතුටුයි. මොකද, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ මේ වරාය නගරය ව්‍යාපෘතිය ආරම්භ කරනකොට එම විෂය භාර ඇමතිවරයා හැටියට හිටියේ මමයි. එදා චීනයේ ජනාධිපතිවරයා ඇවිල්ලා මුල් ගල් තියලා තමයි එහි වැඩ ආරම්භ කළේ. එදා ඒක කළේ සද්භාවයෙන්. එදා විපක්ෂය හැටියට ඒ සම්බන්ධයෙන් නොයෙකුත් චෝදනා එල්ල කළා. නොයෙකුත් චෝදනා එල්ල කළා. විෂය භාර ඇමතිවරයා හැටියට මමත් බයෙන් හිටියා, අර කියන විධියට සීගිරි ගලත් කඩන්න වෙයිද කියලා. ඒ කියපු විධියට, තිබෙන ගල් ටික ඔක්කෝම කඩලා, කපලා, කපලා, අර ගලත් කඩන්න වෙයිද කියලා මටත් සැකයක් ඇති වුණා. නමුත් එහෙම වුණේ නැහැ. ඒක හෙල්ලිලාවත් නැහැ. නමුත් මේ වරාය නගරය අද මේ රටේ අනාගතය හඳන ආර්ථික මර්මස්ථානයක්.

දැන්, මහා භාණ්ඩාගාරයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් අස්ථානගත වෙලා තිබෙන බව අපි දන්නවා. ඒකට දැන් නොයෙක් දේවල් කියනවා. මොකක්ද අපි මේ ගැන දකින්නේ? මේ රටේ රාජ්‍ය පාලනය වෙන්නේ කොහොමද? මේ රටේ ජනතාව තමයි ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව පිහිටුවන්නේ. හැබැයි ජනතාව ඒ ආණ්ඩුව පිහිටුවලා මහජන නියෝජිතයන් පත් කරන්නේ, අවුරුදු පහකට. අවුරුදු පහකට පත් කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවුරුදු 40කට නොවෙයි පත් කරන්නේ. හැබැයි, රාජ්‍ය නිලධාරියෙක් වයස අවුරුදු 20න් පත්වීමක් ගත්තොත්, ඔහු වයස අවුරුදු 60 වෙනකල් අවුරුදු 40ක් රාජ්‍ය සේවයේ ඉන්නවා. ඔහුට රාජ්‍ය සේවය ගැන අවබෝධයක් තිබෙනවා; ඒ ගැන දැනීමක් තිබෙනවා. අවුරුදු පහෙන් පහට මැතිවරණ තියලා රාජ්‍ය සේවකයාව එහාට මෙහාට කරන්නේ නැහැ. මහජන නියෝජිතයින්, දේශපාලනඥයින්, බලධාරින් පත් කරගන්නේ ජනතාවගේ ඡන්දයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? මුදල් අමාත්‍යාංශයේ වත්මන් ලේකම්තුමා රාජ්‍ය නිලධාරියෙක්ද? නැහැ, ඔහු රාජ්‍ය නිලධාරියෙක් නොවෙයි. මුදල් අමාත්‍යාංශය වාගේම අනෙක් අමාත්‍යාංශවල ලේකම්වරුන්, ජනාධිපති ලේකම් කියන අය ගොඩක් වෙලාවට රාජ්‍ය සේවයත් එක්ක බද්ධ වෙච්ච අය. තමුන්නාන්සේලා මොකක්ද කළේ? මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයාව අරගෙන ගිහිල්ලා මුදල් අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වාඩි කෙරෙව්වා. ඊට පස්සේ මොකක්ද වුණේ? ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් හොරාකාපු එකාව දැන් හොයනවා. දැන් ඔක්කෝම හොයනවා. පික්පොකට් ගහපු එකාත්, හොරා කවුද කියලා හොයනවා. දැන් ඔක්කෝම හොයනවා, "කෝ, කවුද මේක හොරා කෑවේ?" කියලා. දැන් හොරෙක් නැහැ. ඔක්කෝම කියනවා, හොරාව අල්ලන්න කියලා. ඒකයි වෙලා තිබෙන්නේ. මේකේ වැරැද්ද වෙලා තිබෙන්නේ කොහේද?

රාජ්‍ය සේවය ගැන මනා අවබෝධයක් තිබෙන නිලධාරින්ව ඉවත් කර දේශපාලන චරිත පුටුවල වාඩි කරවීමේ විපාක තමයි අද මේ විඳින්නේ. අපේ ආණ්ඩුවලත් යම් යම් කාලවලදී මේ වාගේ දේවල් එක දෙක සිද්ධ වෙලා තිබෙනවා. මම බොහොම නිර්ලෝභීවයි ඒක කියන්නේ. එහෙම වෙලා තිබෙනවා. ඒ වැරදි නිවැරදි විය යුතුයි. අත්දැකීම් නැතිකම, අවබෝධය නැතිකම නිසා තමයි අද මෙහෙම සිද්ධ වෙලා තිබෙන්නේ. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ගැන ෆේස්බුක් එකේ සඳහන් වනවා, "ද්විත්ව පුරවැසිභාවය [C 19090060828] [2010.02.03] මැතිවරණ කොමිසමෙන් සැඟවූ අයෙකුට, රජයේ අරමුදල්වල භාරකාරත්වය දීම සුදුසුද?" යනුවෙන්. එම කොටස මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට අපි කියනවා, ඒ පුරවැසිභාවය මුලින් තිබිලා මැතිවරණයට ඉස්සෙල්ලා ඔබතුමා ඒකෙන් ඉවත් වුණා නම් ඒකට කමක් නැහැ, කරුණාකරලා ඒක ඉදිරිපත් කරන්න කියලා. එහෙම නොවෙයි නම් කියන්න, ඔබතුමා ද්විත්ව පුරවැසිභාවයක් තිබෙන කෙනෙක්ද කියලා. එහෙම නම් අපේ රටේ නීතිය අනුව ඔබතුමාට එහෙම තනතුරක් දරන්න පුළුවන්ද? පාර්ලිමේන්තුවේ ඉන්න පුළුවන්ද? එහෙම නැත්නම් රාජ්‍ය සේවයට යන්න පුළුවන්ද? මේ ගැන බලන්න කියලා තමයි අපට කියන්න සිද්ධ වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොනවා කළත් මේ, රටේ ජනතාවගේ මුදල්. එක ප්‍රශ්නයක් නොවෙයි, අපි මෙවැනි ප්‍රශ්න දිගින් දිගටම දැක්කා. බැංකුවක මුදල් ටිකක් නැති වෙනවා. අනෙක් පැත්තෙන් තවත් ස්ථානවල වැඩිපුර මුදල් ගෙවීම් කරනවා. මේ මොකක්ද? මේ, අත්දැකීම් නොමැතිකම තුළ දකින්න සිදු වන දේවල්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැයි මාසයේ පළමුවැනි දා කියන්නේ, ජාත්‍යන්තර කම්කරු දිනය. මුළු ලෝකයම එදින කම්කරු දිනය සැමරුවා. ලංකාවේත් කම්කරුවෝ වෙනුවෙන් මැයි දිනය සමරනවා. ජනතා විමුක්ති පෙරමුණ කියන පක්ෂය, විපක්ෂයේ ඉන්නකොට තමන්ගේ කාර්යභාරය අනුව මීට අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලා වෙනකම් - අවුරුදු හැට, හැත්තෑ ගාණක් වෙනකම් - කම්කරු දිනය ඉතා හොඳින් සැමරුවා. ඒ මොකද? ඔවුන් කම්කරුවෝ වෙනුවෙන් පෙනී ඉන්න පක්ෂයක්; කම්කරුවෝ වෙනුවෙන් කථා කරන පක්ෂයක් නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කාලයක් යනකොට මේ රටේ කම්කරුවෝ කියාවි, කරුණාකරලා ඔවුන්ට මේ කම්කරු දිනය එපා කියලා. ඇයි, ඒ? මේ එක වේදිකාවකවත් කම්කරුවෙක් ගැන කථා කළාද? මේ රටේ වැඩ කරන, මේ රටේ දුක් විඳින, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන එක කම්කරුවෙක් ගැන හෝ මේ වේදිකාවලදී යෝජනා කළේ මොනවාද? ඔවුන් වෙනුවෙන් කරන්න තිබෙන වැඩ පිළිවෙළක් ගැන කථා කළේ කොතැනකද? නැහැ, කථා කළේ නැහැ. තනිකරම කථා කළේ මොනවාද? තමුන්නාන්සේලා ආණ්ඩුවක් විධියට රැලි 21ක් පැවැත්වුවා. හොඳයි. රැලි 21ක් නොවෙයි, ආසන මට්ටමින් ඒවා තිබ්බත් කමක් නැහැ, කරන්න පුළුවන් නම්. හැබැයි, තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒවායේදී මොනවාද කථා කරන්නේ? තමුන්නාන්සේලාගේ එක ලේකම්වරයෙක් කිව්වේ මොකක්ද? "තව වසර ගණනාවක් යනතුරු මේ රජය වෙනස් කරන්න බැහැ, මේ ආණ්ඩුව ජීවිතේට වෙනස් කරන්න බැහැ" කිව්වා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදීත් කියනවා මට ඇහුණා, මේක කවදාවත් වෙනස් කරන්න බැහැ කියලා. මේක පෙරළන්න බැරි පර්වතයක්ද? මේක සීගිරි ගලද? මේක විශ්වය තිබෙන තුරුම පවතිනවාද? ඔහොම තමයි කිව්වේ, අපේ ආණ්ඩු කාලයේත් අපේ උන්නැහේලා. ජීවිතේට පෙරළන්න බැහැ කිව්වා. නමුත්, නැතිවෙලා යනකන්ම දන්නේ නැහැ. උදේ ඉන්න ජනාධිපති හවස් වනකොට නැහැ. එම නිසා මේ ආණ්ඩු ස්ථාවර නැහැ, අස්ථාවරයි. ආණ්ඩු තිබෙනවාද, නැද්ද කියලා තීන්දු කරන්නේ මිනිස්සුන්ගේ හෘදය ස්පන්දනයයි. ජනතාව වෙනුවෙන් කරනවා කියපු දේවල්, ඔවුන්ට දීපු බලාපොරොත්තු ඉටු නොකරනකොට පුද්ගල නාමයන් ජනතාවට වැඩක් නැහැ. ජනතාව ඒක කියනවා. මැයි දිනයේදී රිළහට කථා කළේ මොනවාද? වෛරය, ක්‍රෝධය සහ ඊර්ෂ්‍යාව ගැන. වැරදි කරලා තිබෙනවා නම් වැරදි කරපු අයට දඬුවම් දෙන්න. හැබැයි, මැයි දිනය කියන්නේ ඒකද? ඒක නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක වෙනස් විය යුතුයි. ඒකයි අපි කියන්නේ, කම්කරු දිනයේදී කම්කරුවන් ගැන යෝජනා ඉදිරිපත් කරන්න කියලා. කම්කරු දිනය කියන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැමදාම තෙල් මිල ඉහළ යන්නේ මාසයේ පළමුවැනිදාට. හැබැයි, මේ මාසයේ විතරක් ඒ දවස පැන්නුවා නේ. එහෙම ඒ දවස පැන්නුවේ මොකද? ඒක, මැයි දිනයේ වේදිකාවට මාතෘකාවක් වන නිසාද? ඒවා හංගන්න පුළුවන් දේවල් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rohitha Abeygunawardhana, your time is up.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අවසාන වශයෙන් මම මතක් කරන්න ඕනෑ, මේ සිදුවන සිද්ධිමාලාවලදී ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලාගෙන් සිදුවන අක්‍රමිකතා ඇතුළු නොයෙකුත් දේ සම්බන්ධයෙන් විපක්ෂයේ කාර්යභාරය අපි ඉටු කරනවා කියන එක. තමුන්නාන්සේලා ආණ්ඩුව හොඳට කරනවා නම්, ඒවාට අපි හොඳයි කියලා කියනවා. එදා විපක්ෂයේ හිටපු තමුන්නාන්සේලාගේ අය නම් අද මෙතැන ඉන්නේ, මේ වාගේ ඩොලර් මිලියන 2.5ක් නැති වනකොට විපක්ෂය පැත්තේ පුටුවල නොවෙයි, අර මැද තිබෙන රතු පලස උඩයි ඉන්නේ. එහෙනම් සෙංකෝලය අරගෙන දුවනවා. එහෙමයි එදා විපක්ෂය හැසිරුණේ. හැබැයි, අපි එහෙම විපක්ෂයක් නොවෙයි. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, කරුණාකරලා මේකට වගකිවයුතු නිලධාරින් පිළිබඳව සහ අනික් අය පිළිබඳව නිවැරදි තොරතුරු මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Wijesiri Basnayake. You have nine minutes.

[අ.භා. 2.16]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ උත්තරීතර සභාවේ විවාද කරන්නේ 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ වූ නියම සහ නියෝග පිළිබඳවයි. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අහනවා, මේ සංශෝධන ගෙන එන්නේ ඇයි කියලා. අපි දැක්කා, එදා වරාය නගරය නිර්මාණය කළේ මේ රටේ වෙනම ප්‍රාන්තයක් විධියට, ඒ වාගේම අපේ රටේ නීතියට අඩංගු නැති කලාපයක් හැටියට බව. ඒ නිසා තමයි අපි වරින්වර අවශ්‍ය සංශෝධන ගෙන එමින් කොළඹ වරාය නගරයට - Port City එකට - සම්බන්ධ ආර්ථික කටයුතු වඩාත් සාර්ථක කර ගැනීමට උත්සාහ කරන්නේ. පරණ පාලන සමයන්හිදී ඒ ආර්ථිකයේ වැඩිම පංගුව ගියේ, විපක්ෂයේ දැන් මේ කථා කරන සමහර මන්ත්‍රීවරුන්ගේ සාක්කුවලට. අපි ඒක දැක්කා. ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ල කන වෙලාවේ හිටපු කිසිම ඇමතිවරයෙකුට, මන්ත්‍රීවරයෙකුට ඒ පිළිබඳව සහකම්පනයක් තිබුණේ නැහැ, වගවීමක් තිබුණේ නැහැ. එහෙම අය දැන් කියනවා, අපේ ආණ්ඩුවට ගෙදර යන්න කියලා. ඒක පුදුම කථාවක් නේ.

හිටපු ජනාධිපතිවරයෙකු වූ මහින්ද රාජපක්ෂ මැතිතුමා පසුගිය දවසක කියා තිබුණා, ඔවුන්ට මේ රටේ බලය ගන්න සැලැස්මක් තිබෙනවා කියලා. ඒ සැලැස්ම මොකක්ද දන්නේ නැහැ. ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් බිඳ වට්ටපු වෙලාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ඓතිහාසික නඩු තීන්දුවක් ලබා දුන්නා. ඒ ඓතිහාසික නඩු තීන්දුවේ වැදගත් කරුණු කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම හිටපු ජනාධිපතිවරයෙකු වූ ගෝඨාභය රාජපක්ෂ, මුදල් අමාත්‍යවරුන් හැටියට කටයුතු කරපු මහින්ද රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ සහ භාණ්ඩාගාරයේ හිටපු ලේකම්වරුන් වන පී.බී. ජයසුන්දර සහ එස්.ආර්. ආටිගල වාගේම හිටපු මහ බැංකු අධිපතිවරුන් වන අජිත් නිවාඩ් කබ්රාල් සහ ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් ඇතුළු ඒ මුදල් මණ්ඩලය රට බංකොලොත් කළේ කොහොමද, ඒකට ඒගොල්ලන් වගකිව යුතුයි කියලා එහි තිබෙනවා. එහෙම දේවල් කරපු මිනිස්සු තමයි අද දවසේ අපට විවිධ චෝදනා එල්ල කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක සංවර්ධනයට වැදගත් වන ප්‍රධාන විචල්‍ය කිහිපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, රටට ලැබෙන සෘජු විදේශ ආයෝජන - foreign direct investment. 2025 වර්ෂයේදී රුපියල් කෝටි 31,700ක ආයෝජන මෙරටට ලැබිලා තිබෙනවා. ඒක 2024 වර්ෂයට සාපේක්ෂව ගත්තොත්, සියයට 72ක වර්ධනයක්. රටක කර්මාන්ත නිර්මාණය කිරීමේදී, අපනයන වර්ධනය කිරීමේදී වාගේම රටට ආයෝජන ලබා ගැනීමේදී විශේෂයෙන්ම අද දවසේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන මේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙන එන නියම සහ නියෝග බොහොම වැදගත්. ඒ තුළින් විශාල කාර්යභාරයක් ඉටු කරනවා. අපි මේ හරහා අද දවසේ ඒ මූලික නියමයන් කිහිපයක් සහ නියෝග අනුමත කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොත වනවිට අපි විතරක් නොවෙයි, ගෝලීය ආර්ථිකයම දැවැන්ත අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ඒකට මූලික හේතුව වන්නේ මැද පෙරදිග කලාපයේ තිබෙන දැවැන්ත යුද්ධය. ඒ හරහා මුළු ලෝකයේම උද්ධමන වේගය වැඩි වෙලා තිබෙනවා; ඉන්ධන වාගේම ගෑස් මිලත් වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගෝලීය වශයෙන් සමාජ, ආර්ථික සහ දේශපාලනික අස්ථාවරත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ හරහා ආයෝජන සහ නිෂ්පාදන කටයුතුවලට, අපනයනවලට අහිතකර ලෙස බලපෑම් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර වෙළෙඳාම, සංචාරක කටයුතු, ගමනාගමන කටයුතු අඩපණ වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් අපේ රටට සෘජුවම බලපානවා. එවැනි වටපිටාවක ඉඳගෙන තමයි අපි මේ කටයුතු කරන්නේ.

ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය මාසයේ 20වැනි දා ඔවුන්ගේ වාර්ෂික ආර්ථික විවරණය ඉදිරිපත් කළා. අද දවසේ මේ සභාවේ සිටින සෑම සාමාජිකයෙකුටම ඒ වාර්ෂික ආර්ථික විවරණය

[ගරු විජේසිරි බස්නායක මහතා]

ලැබෙනවා. ඔබ සියලුදෙනාටම මම ආරාධනා කරනවා, ඒ වාර්ෂික ආර්ථික විවරණයේ මොනවාද තිබෙන්නේ කියලා පිටුවෙන් පිටුවට කියවා බලන්න කියලා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුව විසින් 2025දී රට කරවපු ආකාරය පිළිබඳ ශේෂ පත්‍රය එහි තිබෙනවා. ඒක බොහොම වැදගත්. අපට චෝදනා එල්ල කරන්න ඉස්සෙල්ලා ඔබ ඒ ආර්ථික විවරණය ගැන සාකච්ඡා කරන්න. ඒකේ තිබෙනවා, 2025 වසර ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයක් වුණාය කියලා. විශේෂයෙන්ම මෑත ඉතිහාසය තුළ රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි - real GDP එකේ - සියයට 5ක වර්ධනයක් වෙලා තිබෙනවා. ඒ සලකුණ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි සනිටුහන් කරනවා. ඒක ආර්ථිකය අඛණ්ඩව ප්‍රසාරණය වුණු කාරණාවක් විධියට පැහැදිලි කරන්න පුළුවන්. මෙන්න මේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශය ප්‍රබල පිටුවහලක් වුණා. ඒ, සියයට 7.8ක වර්ධනයක් ලබා ගෙන. ඒ වාගේම සේවා අංශය සියයට 3.3ක වර්ධනයක් ලබා ගත්තා. කෘෂිකාර්මික අංශයත් විවිධ අභියෝග මධ්‍යයේ සියයට 1.4ක වර්ධනයක් ලබා ගත්තා. මෙන්න මෙහෙම තමයි අපි 2025දී රට කළමනාකරණය කළේ. ඒ සමස්ත නිෂ්පාදනය අපි මුළු රටේම ජනගහනයෙන් බෙදුවාම අපට තවත් විචල්‍යයක් එනවා. ඒ විචල්‍යය තමයි, දළ දේශීය නිෂ්පාදිතය - GDP එක. මෙන්න මේක අපි ඇමෙරිකානු ඩොලර් 5,000 සීමාව පසු කර තිබෙනවා. එය මෑත ඉතිහාසයේ අපේ රට ලැබූ විශාල අගයක්. ඒකත් එක්ක ලෝකයේ ඉහළ මැදි ආදායම් රටවල් කරා පිවිසීමේ මාර්ගයට අපි ඇවිල්ලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, පසුගිය වසරේදී උද්ධමන වේගය අපි සියයට 2.3ක ප්‍රමාණයකින් පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. අපේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය ගත්තොත්, අපි ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයෙන් සහ විදේශ ප්‍රේෂණවලින් ලැබුණු ආදායම විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. අපි එය ප්‍රමාණාත්මකව ගත්තොත්, විදේශීය ප්‍රේෂණවලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1ක් ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, සංචාරක පැමිණීම් මිලියන 2.36ක් දක්වා වර්ධනය වී තිබෙනවා. ඒ අංශ දෙක වර්ධනය වීමත් එක්ක අපේ නිල සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.8ක් බවට පරිවර්තනය වුණා. මෙන්න මේ විධියට තමයි 2025දී අපි මේ රට පවත්වාගෙන ගියේ. ඒ විතරක් නොවෙයි, අපි විසින් කරපු ඒ රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසරභාවයේ වෙනස්කම් තුළින් ඇති වුණු ප්‍රතිඵලයේ අස්වැන්න අපි මේ මොහොත වනවිට නෙළමින් ඉන්නවා. ඒකට උදාහරණයක් කිව්වොත්, ප්‍රාථමික ගිණුමේ අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 5.4ක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක 2024දී සියයට 2.2ක්. එහෙම නම් ඔබට පෙනෙනවා, අපි මේ රටේ ආර්ථික කළමනාකරණය කළේ කොහොමද කියලා. මෙන්න මේ විධියට තමයි අපි මේ කටයුත්තට අත දුන්නේ. එහෙම වටපිටාවකයි අපි ඉන්නේ. පොරොන්දු වුණු විධියටම අපි 2026 වසරේදීත් මේ රටේ ආර්ථික කළමනාකරණය ඉදිරියට රැගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දා අපි දැක්කා, වියට්නාමයේ පූජ්‍ය පඤ්ඤාකර හිමිගේ නායකත්වයෙන් දැවැන්ත සාම පා ගමනක් මේ රට තුළ දින 7ක් තිස්සේ සිදු වනවා. ඒ සාම පා ගමනේදී කිලෝමීටර 350ක් ගමන් කළා. එම පා ගමනේ සමාප්ති උළෙලේදී ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ප්‍රකාශ කළා, "ලංකාවට මුළු ලෝකයේ ධනවත්කමෙන් අංක එකේ රටට එන්න බැරි වෙයි. ඒ වාගේම ලංකාවට තාක්ෂණයෙන් ලෝකයේ ප්‍රබල රටක් වෙන්න බැරි වෙයි. හැබැයි, අපට පුළුවන් මනුස්සකම - humanity - පෙරදැරි කරගෙන ලෝකයේ ප්‍රබල රට බවට පත් වෙන්න" යනුවෙන්. ඒ ප්‍රකාශය පූජ්‍ය පඤ්ඤාකර හිමි එදා වෙක්සාස්හි ධම්මචේතිය විහාරයේදීත් දේශනා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්. අපි මේ ඉන්නේ වෙසක් මාසයේ. විශේෂයෙන්ම පූජ්‍ය පඤ්ඤාකර හිමියන් ප්‍රකාශ කළ විධියටම, අපේ ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ විධියටම අපි මනුස්සකම - humanity - කියන එක මුල් කර ගත්, අධ්‍යාත්මයෙන් ඉහළ මිනිසුන්ගෙන් පොහොසත් රටක් බවට මේ රට පරිවර්තනය කරමු. ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Leader of the Opposition. You have six minutes.

[අ.භා. 2.25]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් - ලක්ෂ 25ක් - වංචනික ලෙස වෙනත් ගිණුමකට යොමු වුණේ 2025 දෙසැම්බර් මාසයත්, 2026 ජනවාරි මාසයත් අතර කාලයේදීයි. ඇත්තවශයෙන්ම අපේ රටේ සිවිල් ප්‍රජාව සහ අපි මාධ්‍ය හරහා මේ කාරණාව රටට හෙළිදරව් කරනකම් රජය මේ කාරණාව ගැන පාර්ලිමේන්තුව දැනුවත් කරන්නටවත්, රට දැනුවත් කරන්නටවත් කටයුතු කළේ නැහැ.

රජය මේ වරද පිළිගත්තත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා රජයේ මුදල් පිළිබඳ කමිටුවට ඇවිල්ලා එම කමිටුව ඉදිරිපත් කරන ප්‍රශ්නවලට උත්තර සැපයීම ප්‍රතික්ෂේප කළා. ඒ අතරතුර වැඩ තහනම් වූ නිලධාරිවරයා මිය ගියා. ඔහුගේ අභාවයත් සමඟ ලේකම්වරයා හදිසියේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා රජයේ මුදල් පිළිබඳ කමිටුවට මුහුණ දෙන්නට ඉදිරිපත් වුණා. ඇත්තවශයෙන්ම මේ සිද්ධි සමුදාය දිහා බැලුවාම රටේ ජනතාව අතර යම්කිසි සැකයක් ඇති වීම සාධාරණයි. ඒක පිළිබඳව අමුතුවෙන් පුදුම වෙන්නට අවශ්‍ය නැහැ. රජයේ මුදල් පිළිබඳ කමිටුවේදී බොහොම පැහැදිලිව අපට දැනගන්නට ලැබුණා, ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක්, අවස්ථා 10කදී වෙනත් වැරදි ගිණුමකට ගියා කියන කාරණාව. ඒ කියන්නේ, මේ අඩුපාඩුව, මේ වරද අවස්ථා 10කදීම ක්‍රියාත්මක වුණා. අපි අහන්න කැමැතියි, කොහොමද එහෙම වෙන්නේ කියා.

විදේශීය ණය ගෙවන එක සාමාන්‍ය බැංකු හුවමාරුවක් නොවෙයි. ඒකට ක්‍රමවේදයක් තිබෙනවා; නීතිරීති, රෙගුලාසි තිබෙනවා; රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, මුදල් රෙගුලාසි, ආයතන රෙගුලාසි, ආයතන සංග්‍රහ, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත තිබෙනවා. අපි රජයෙන් අහන්න කැමැතියි, මේ සියලු අණපනත්, රෙගුලාසි, නීතිරීති කිසිවක් පිළිපැදලා නොවෙයිද මේ ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25 ණය වාරිකය ගෙවන්නට කටයුතු කළේ කියන එක. ඒකයි අපි අහන ප්‍රශ්නය. පාර්ලිමේන්තුවට හංගලා, නිලධාරින් මිය ගිහිල්ලා, රටට මුදල් අහිමි වෙලා තිබෙනවා. මේ රජයේ කාර්යක්ෂමතාව ඔය සිද්ධීන්වලින්ම ඔප්පු වෙනවා. වැරදි ගොඩක් සිදු වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, ඒ නිලධාරියාගේ මරණය පිළිබඳ කාරණා කිහිපයක්. ඇත්තවශයෙන්ම ඒ සම්බන්ධයෙන් නිසි පරීක්ෂණ සිදු වෙලා තිබෙනවාද? නිසි බරක් එක්ක, නිසි වැදගත්කමක් එක්ක ඒ මරණ පරීක්ෂණ සිදු වෙලා තිබෙනවාද? ඒ පිළිබඳවත් බරපතළ සැකයක් ඉස්මතු වෙලා තිබෙනවා. ඒ වාගේම අපට අහන්නට ලැබෙනවා, මුදල් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල වෙනසකුත් පසුගිය කාලයේ සිදු වුණා කියලා. අපි දැනගන්න කැමැතියි, කොයි ආකාරයටද මේ කාර්ය මණ්ඩල වෙනස් කිරීම් සිදු වුණේ කියලා.

අවසානම ගැටලුව තමයි, ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක මුදල අහිමි වීමට වග කියන්නේ කවුද, වග වෙන්නේ කවුද කියන එක. ලේකම්ද, ඇමතිවරයාද, ජනාධිපතිවරයාද? දැන් කවුරුවත් නැහැ, මේ වගකීම භාර ගන්න. දැන් රජය කරන්නේ මේ සිදු වුණු මුදල් අහිමි වීම, රටේ ජනතාවගේ බදු මුදල් ඔවුන්ගෙන් හොරා කෑම, රටට වංචා කිරීම හැකර්ගේ කර පිටට දමන එකයි. ඒකට වග කියන්නේ හැකර්. අපි පැහැදිලිවම කියනවා, හැකර්ලා හෝ වෙනත් පාර්ශ්ව මත වගකීම් පටවලා මේ රජය මේ වගකීමෙන් නිදහස් වෙන්නට දරන උත්සාහයට අපි විපක්ෂයක් - සමගි ජන බලවේගය - හැටියට තරයේ විරුද්ධයි කියන එක. අපි ඉල්ලීමක් කරනවා, ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක මුදල රටට අහිමි වුණේ කෙසේද කියන එක පිළිබඳව අද දවසේදීවත් පාර්ලිමේන්තුවට සත්‍යවාදීව කරුණු ඉදිරිපත් කරන්න කියලා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. M.K.M. Aslam. You have eight minutes.

[பி.ப. 2.31]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
நன்றி! கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நாங்கள் கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு இருக்கின்றோம். வெளிநாட்டு முதலீடுகளையும் எமது நாட்டுக்குத் தேவையான டொலர்களையும் பெற்றுக்கொள்வதற்கு இந்தத் திருத்தங்கள் மிகவும் முக்கியமானவை. எமது நாட்டுக்கு வருகைதருகின்ற வெளிநாட்டவர்கள், நாட்டுக்கு வருகைதந்து 4 நாட்களுக்குள் Port Cityஇலுள்ள duty-free shopsஇல் பொருட்களைக் கொள்வனவு செய்யலாம். அவ்வாறு கொள்வனவு செய்யக்கூடிய பொருட்களுக்கு வருடத்துக்கு 2,000 டொலர் வரை வரிச் சலுகை இதன்மூலம் கிடைக்கும்.

கொழும்புத் துறைமுக நகரப் பொருளாதார மையத்தில் தொழிற்சாலைகள் இல்லை. வெறுமனே பொருட்களைக் கொள்வனவு செய்யக்கூடிய கடைகள்தான் காணப்படுகின்றன. இதனால் கொழும்புத் துறைமுக நகரப் பொருளாதார மையம் விஷேடமான ஓர் இடமாகக் காணப்படுகின்றது. எனவே, அந்தப் பொருளாதார மையத்துக்குரிய விசேட தீர்மானங்களும் சட்ட ஏற்பாடுகளும் காணப்படுகின்றன. அந்த அடிப்படையில்தான் வேலைசெய்யும் நபரொருவரின் வேலைநிறுத்தம் சம்பந்தமாக சில விதிவிலக்கான சட்டங்கள் பின்பற்றப்படும். சர்வதேச சட்டதிட்டங்களுக்கு உட்பட்டதாகவும், பொருளாதார மையத்துக்கான சிறப்புச் சட்டமாகவும் இது காணப்படுகின்றது. தொழில் வழங்குநருக்கும் தொழில் புரிபவருக்கும் இடையில் ஏற்படும் உடன்பாட்டின் அடிப்படையில்தான் இந்தச் சட்டம் அமுலாக்கப்படும். இவ்வாறான புதிய வழிமுறைகளையும் நாட்டுக்குத் தேவையான முதலீட்டுத் திட்டங்களையும் அறிமுகப்படுத்தி, கடந்த கால அரசாங்கங்கள் விட்ட தவறுகளைத் திருத்திக்கொண்டு, நாங்கள் நாட்டின் பொருளாதாரத்தை ஸ்திரப்படுத்தி வருகின்றோம்.

கடந்த மே தின மேடைகளில் பேசப்பட்ட பேச்சுகள் பற்றி இங்கு பேசிய களுத்துறை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் சொன்னார். உண்மையிலே அவர் என்ன சொல்கிறார்?

කළුතර දිස්ත්‍රික්කයේ අපේ ගරු මන්ත්‍රීතුමා පැවසුවා කම්කරුවන් ගැන කථා කළේ නැහැ කියලා. අනේ මන්ත්‍රීතුමනි, මේ රටේ කම්කරුවන් ඇති තරම් දුක් වින්දා තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ. කම්කරුවෝ අද බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ඒ කම්කරුවෝ බලාපොරොත්තු වෙන පළමුවෙනි එක තමයි සේවයට සරිලන පඩිය. ඉතින් අද ආණ්ඩුවක් හැටියට අපි රාජ්‍ය සේවයේ සහ පෞද්ගලික අංශයේ සේවය කරන අයගේ, වතුකරයේ ආදරණීය ජනතාවගේ පඩි වැඩි කිරීමට සැලසුමක් හදලා තිබෙනවා. ඒකට අවුරුද්දකට බිලියන 110ක්, කෝටි 11,000ක් මුදල් වෙන් කරලා තිබෙනවා, 2025, 2026, 2027 අවුරුදු සඳහා. අන්න, කම්කරුවන් වෙනුවෙන් මේ ආණ්ඩුව කරපු පළමුවෙනි ක්‍රියාකාරකම!

ඒ වාගේම ඔවුන්ගේ සේවා සුරක්ෂිතභාවය ඇති කර තිබෙනවා. ඊළඟට, ඔවුන් මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? ඒ කම්කරුවන් බලාපොරොත්තු වෙනවා ළමයින්ට සුදුසු අධ්‍යාපනයක්. අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024දී රනිල් මහත්තයා අධ්‍යාපනයට වෙන් කරනවා, කෝටි 23,700ක්. දැන් අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වෙන් කරනවා, කෝටි 70,000ක්. කවුද කම්කරු ජනතාවගේ දරුවන් වෙනුවෙන් අධ්‍යාපනයට මේ විධියට මුදල් වෙන් කළේ?

ඊළඟට, සෞඛ්‍ය බලන්න. ඒ කම්කරුවන් බලාපොරොත්තු වෙනවා, තමන්ට හා පවුලට නිසි සෞඛ්‍ය ආරක්ෂාවක් තියෙන්න ඕනෑ කියලා. 2024දී රනිල් මහත්තයා වෙන් කරනවා, සෞඛ්‍ය සඳහා කෝටි 35,000ක්. 2026දී ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වෙන් කරනවා, කෝටි 55,000ක්. එතකොට කම්කරුවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන්නේ නැති ආණ්ඩුවක්ද අද මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව කියන්නේ? කටු මැටි ගෙවල් තිබෙනවා නම්, ආර්ථික අර්බුද තිබෙනවා නම් ඒ සියලු තැන් අපි address කරලා තිබෙනවා. ඒ ජනතාව වෙනුවෙන්, කම්කරු ජනතාව වෙනුවෙන් තමයි මේ සියලු දේ අපි කරලා තිබෙන්නේ. මොකද, ආණ්ඩුවක් හදන්නත් පුළුවන්, ආණ්ඩුවක් වට්ටන්නත් පුළුවන් කම්කරු ජනතාවට බව අපි නිවැරදිව දන්නවා. ලංකාවේත් ලක්ෂ 82ක් කම්කරු ජනතාව ජීවත් වෙනවා. ඒ නිසා ඒ කථා කරපු මන්ත්‍රීතුමා මේවා හරියට තේරුම් ගන්න ඕනෑ.

ඒ වාගේම වංචාව ගැන කථා කරනවා. වංචාව ගැන කථා කරන්න කිසිම අයිතියක් නැහැ, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට. අපි මේක හරියට තේරුම් ගන්න ඕනෑ. අපේ ආණ්ඩුව, අපේ ජාතික ජන බලවේගය අපි මෙහෙයවන්නේ ජනතාවගේ ජයග්‍රහණය සඳහා. අපි මේ ආර්ථිකය ගෙනියන්නේ රටේ ජයග්‍රහණයට සුදුසු වෙන පරිදි. විපක්ෂයේ ඒ කෑ ගැසීම්වලට ප්‍රායෝගිකව අපි උත්තර දෙනවා. ආර්ථික වර්ධන වේගය සියයට 5යි. හැබැයි, පසුගිය අවුරුදු එකහමාර තුළ අපි දැක්කා, අර්බුද තුනක් තිබුණු බව. අපට අභියෝග තුනක් තිබුණා. ඒ තමයි, ඇමෙරිකානු බදු, "දිට්වා" සුළි කුණාටුව සහ මේ ඇති වෙලා තිබෙන ලෝක යුද්ධය. ඒත් ආර්ථික වර්ධන වේගය සියයට 5ට පල්ලෙහාට වැටෙන්න දුන්නේ නැහැ. එවැනි අවස්ථාවක තමයි ජනතාවට අපි අර දීපු සහනත් දුන්නේ.

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது பொருளாதாரத் திட்டமிடல் மற்றும் சிறந்த முகாமைத்துவம் காரணமாகத்தான் 30.1 ரில்லியனாக இருந்த மொத்த உள்நாட்டு உற்பத்தி 32.8 ரில்லியனாக வளர்ச்சியடைந்துள்ளது. இந்தப் பொருளாதார வளர்ச்சி எவ்வாறு ஏற்பட்டது? கடந்த காலங்களில் நாட்டிலுள்ள வளங்களைச் சூறையாடி, நாட்டை வங்குரோத்து நிலைக்கு இட்டுச் சென்றவர்கள் இன்று எமது பொருளாதாரத் திட்டம் பற்றி பேசுகின்றார்கள். இந்த அரசாங்கத்தின் தெளிவான திட்டத்தின் வளர்ச்சியால், அபிவிருத்தியானது நாட்டு மக்களைச் சென்றடைகின்றது. 4,546 டொலராகக் காணப்பட்ட தனிநபர் மொத்த உள்நாட்டு உற்பத்தியானது இன்று 5,003 டொலராக வளர்ச்சியடைந்துள்ளது. இதன்மூலம் இந்த நாட்டின் பொருளாதாரம் ஸ்திரமாக உள்ளது என்பது மிகத் தெளிவாகத் தெரிகின்றது.

இன்று இந்த நாட்டில் இனவாதப் பிரச்சினைகள் இல்லை. இந்த நாட்டுக்கென தேசிய வேலைத்திட்டம் ஒன்றுள்ளது. அது 5 வருடகாலத் திட்டமாகும். அதைச் செயற்படுத்த 'பிரஜா சக்தி' என்ற பெயரில் ஒரு நிருவாகக் குழு உள்ளது. மேலும், மக்களைப் பாதுகாப்பதற்கென ஒரு திட்டம், போதைப்பொருளை ஒழிப்பதற்கென ஒரு திட்டம் எனப் பல திட்டங்கள் வகுக்கப்பட்டு, இந்த அரசாங்கத்தின் பயணம் தெளிவாகச் செல்கின்றது. இந்த அரசாங்கம் ஊழலுடன் தொடர்புடையது என்று எதிர்க்கட்சியிலுள்ள யாரும் விரல்நீட்ட முடியாது. இவர்கள் நாட்டு மக்களுக்காக உயிர்நீத்த சகோதரர்கள் வழிவந்தவர்கள்! கையில் கறையுடன் அல்லது ஊழல் குற்றச்சாட்டோடு இந்த நாட்டை நிருவகிக்க வேண்டிய தனிப்பட்ட தேவை இவர்களுக்கு இல்லை. இலங்கையில் வாழுகின்ற முக்கிய மூன்று இனங்களான சிங்கள, தமிழ், முஸ்லிம் மக்களுடைய கலாசாரங்களைப் பாதுகாக்கும் வகையிலே இந்த அரசாங்கம் செயற்படுகின்றது. இலங்கையில் வாழுகின்ற முஸ்லிம்களினதும் சரி, தமிழ் மக்களினதும் சரி, மத, கலாசாரங்கள் பாதுகாக்கப்படும். கடந்த ஒன்றரை வருட காலத்தில் எவ்வாறு பாதுகாக்கப்பட்டதோ, அதேபோன்று இனிவரும் காலங்களிலும் மக்களின் கலாசாரங்கள் பாதுகாக்கப்படும் வகையிலே இந்தச் சட்ட திட்டங்கள் நடைமுறைப்படுத்தப்படுமெனக் கூறிக் கொள்கின்றேன். இறுதியாக, தமிழக சட்ட சபைத் தேர்தலில் வெற்றிபெற்றுள்ள ஜோசப் விஜய் அவர்களுக்கு வாழ்த்துத் தெரிவித்து, இந்தச் சந்தர்ப்பத்தை வழங்கிய கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களுக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Dilith Jayaweera. You have eight minutes.

[2.40 p.m.]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Hon. Deputy Speaker, it is nice to see you in the Chair. I do not, usually, get the opportunity to address you.

Sir, in the presence of the Hon. Minister of Justice and National Integration, I would like to state, among other matters, that there had been several statements made during May Day rallies by none other than the members of the Cabinet of Ministers and even by the Hon. President himself, referring to some judgments.

මම හිතනවා, අපේ හිතවත් අධිකරණ ඇමතිතුමාට ඉතාම අපහසු තත්ත්වයක් මතු වෙලා ඇති, එතුමා ඉතාම අපහසු තත්ත්වයකට පත් වෙලා ඇති කියලා. මොකද, ඉතිහාසයේ කවදාවත් නැතුව අපේ අධිකරණයේ විනිසුරුවරුන්ට කලින් රටේ ඇමතිවරු අධිකරණ තීන්දු ප්‍රකාශයට පත් කරන නිසා. එවැනි ඉතිහාසයක් අපි දැකලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙයින් සඳහන් කරන්න උත්සාහ කරන්නේ කුමක්ද? අපේ රට එන්න එන්නම අගාධයට ගෙන යන ආකාරය තහවුරු වුණු අවස්ථාවක් තමයි මෙවර මැයි දිනය. මෙවර මැයි දිනය ලංකාව පුරා රාජ්‍ය බලය භාවිත කරලා පැවැත්වූවා. කොහොම හරි, රැළි පවත්වපු එක හොඳයි කියමුකෝ. If we take the contents of those speeches made, we could see that it is a coordinated effort. විපක්ෂය සම්පූර්ණයෙන්ම බය කිරීම සඳහා ගෝරනාඩු නගමින් ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ පද්ධතියේ ස්වාධීනත්වයට අභියෝග කරමින් කියනවා, "අපි නඩු තීන්දු අහවල් දවසේ දෙනවා, බලාගෙන ඉන්න" කියලා.

අපේ අධිකරණ ඇමතිතුමා අපේ ගෞරවයට පාත්‍ර වන මහත්මයෙක්. He is a gentleman and we admire him. I can understand how uncomfortable he must be, but we have to say this. මොකක්ද මේ කරන්න හදන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? එක අතකින් අපේ ප්‍රජාතන්ත්‍රවාදය, ඒ සංකල්පය සම්පූර්ණයෙන්ම, එක එල්ලේ ඉරා දමනවා. භීතිය වපුරමින්, රාජ්‍ය බලය භාවිත කරමින්, විධායක බලය භාවිත කරමින් ඒක කරනවා. අනෙක් අතින්, අභිරහස් ලෙස රාජ්‍ය නිලධාරින් මිය යනවා. මේ සංවාදය බරපතළ සංවාදයක්ව විය යුතුව තිබියදී එය ඉතාම සැහැල්ලුවෙන් මඟ හරින්නට උත්සාහ කරනවා. අපේ රටේ ආදරණීය පුරවැසියන් බලාපොරොත්තු වුණේ මෙවැනි තත්ත්වයක්ද? අද ලොව ඇති වී තිබෙන මේ යුද්මය තත්ත්වය හේතුවෙන් අපේ ආර්ථිකය බරපතළ අභියෝගයකට ලක් වෙලා තිබෙන අවස්ථාවක, අපේ රටේ ශ්‍රමිකයන්, එහෙම නැත්නම් අපේ රටේ මානව ප්‍රාග්ධනය අමතමින් මේ කිසිදු ඇමතිවරයෙක් වැදගත් කථාවක් කළාද? මේ රට මුහුණ දෙමින් තිබෙන යථාර්ථය පිළිබඳ දැනුවත් කරන්නට එක වාක්‍යයක් හෝ භාවිත කළාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පුළුවන් දේශපාලනය කරන්න. අපට පුළුවන් පක්ෂ දේශපාලනය කරන්න. නමුත්, Sir, I must mention that we are in dire straits due to this very challenging situation. We do understand that. But, I am sad that the Government does not understand that. බදු වැඩි කරලා, මිනිසුන්ගෙන් බදු අය කරලා, ප්‍රාථමික ගිණුමේ ශේෂය ගැන කථා කරමින් නිකම් පාරම් බාමින් සිටියාට මේ රට ඉස්සරහට යන්න විධියක් නැහැ.

අද ඔබ දන්නවා, රුපියලේ අගය වේගයෙන් පහත වැටෙන බව. ඊට සාපේක්ෂව අපට බදු වැඩි කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඒ තුළින් අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම සංකෝචනය වෙනවා. ඒ තුළින් අපේ ආර්ථික අවස්ථා සම්පූර්ණයෙන්ම අහිමි වෙලා තිබෙනවා. අද සියලු කර්මාන්තශාලා හිමිකරුවන්, කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණයේ ව්‍යවසායකයන් දන්නේ නැහැ, විදුලි බිල වැඩි වීමට මුහුණ දෙන්නේ කොහොමද කියලා. ඒ අස්සේ බදුත් ගැහුවාම ඒකට මුහුණ දෙන්නේ කොහොමද කියලා. නිකම් කිසි දෙයක් සිද්ධ නොවුණා වාගේ කථා කළාට වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ආර්ථික විද්‍යාඥයෙක් නොවෙයි. නමුත්, බැලූ බැල්මට පෙනෙන කරුණු අනුව එකක් කියන්නට පුළුවන්. අපේ රටේ gross capital formation එකට වැඩිම ප්‍රතිශතයකින් - percentage එකකින් - දායක වෙන්නේ පෞද්ගලික අංශය; private sector එක. එය සියයට 23ත්, 26ත් අතර තිබෙන ප්‍රතිශතයක්. කොහොමද මේ ප්‍රාග්ධනය වැඩි වෙන්නේ? ඔබ නිකමට ඒ ගැන හිතන්න. බදු ගහලා, බදු ගහලා ඔක්කොම සල්ලි ටික අරගෙන, ඒක ආණ්ඩුවේ ගිණුමට දමා ගත්තාම, ආර්ථිකය වර්ධනය වෙන්නේ කොහොමද? ආර්ථිකය වර්ධනය නොවී ධනයක් වර්ධනය වෙන්නේ කොහොමද? මිනිසුන්ගේ අතට සල්ලි එන්නේ කොහොමද? දුප්පත් මිනිහා තවදුරටත් දුප්පත් නොවී දියුණු වන විධිය මට කියලා දෙන්න. හැබැයි, ඔබතුමන්ලා ඒක ගැන කථා කරන්නේ නැහැ. ඒක ගැන කථා කරනවා වෙනුවට, ඉතාම ප්‍රාථමික මට්ටමට ගිහිල්ලා, වණ්ඩි දේශපාලනය කරන්න, අප බිය ගන්වන්න හදනවා. නඩු තිබෙනවා නම් නඩු අහන්න. හොරකම් කරලා තිබෙනවා නම්, අල්ලලා ඇතුළට දමන්න. හැබැයි, ඒක මේ රටේ පළමුවැනි ආඛ්‍යානය, the first narrative. But, it cannot be the narrative of the country. We must talk about how we are going to take our nation forward. මේක මම හැමදාම මතු කරන ප්‍රශ්නයක්. හැබැයි, මේ ගැන සංවාද කරනවා වෙනුවට මේගොල්ලන් දන්නා දේ තමයි, බය කරමින් දේශපාලනය කරන එක, බිරාන්ත කරමින් දේශපාලනය කරන එක, මරණ තර්ජනය කරමින් දේශපාලනය කරන එක, මරණ පෙන්වමින් දේශපාලනය කරන එක. ඒක තමයි කරන්නේ. එහෙම කරලා මේ රට ඉස්සරහට යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මම මේ ආණ්ඩුවට ආරාධනා කර සිටිනවා, කරුණාකර මේ අවර ගණයේ දේශපාලනයෙන් දැන්වත් මිදෙන්න කියලා. දැන් ඒකට කාලය හරි. දැන් ඔබට හොඳම කාලය එළඹ තිබෙනවා ඒකෙන් මිදෙන්න. දැන් ඒකේ ගොඩක් කල් හිටියා. ඕවා කථා කර කර ඉඳලා හරියන්නේ නැහැ කියලා තේරුම් අරගෙන, ජාතියක් හැටියට අප මුහුණ දීලා තිබෙන ප්‍රශ්න ගැන, ඒ සඳහා ගත යුතු, ගත හැකි විසඳුම් ගැන කථා කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dilith Jayaweera, your time is up.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Okay.

Lastly, Sir, I want to mention that we have a shock-amplifying economy. මේ ආර්ථිකයට, මේ සිදු වෙමින් තිබෙන ක්‍රියාදාමයට අප අතිශයින් සංවේදියි. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, ඒ සඳහා ඔබතුමන්ලාට ඇති සූදානම ගැන කරුණාකර කියන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

I thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Thilina Samarakoon. You have eight minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.48]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙනෙන නියම සහ නියෝග කිහිපයක් පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ මට අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. අප මෙවැනි ගැඹුරු කාරණයක් පිළිබඳව මේ ගරු සභාව තුළ අවධානය යොමු කරමින් සිටින මොහොතක, මීට කලින් අදහස් දැක්වූ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා අපේ රටේ ආර්ථිකය පිළිබඳව යම් යම් ප්‍රකාශ කළා. එතුමා අපේ රටේ ආර්ථිකයට අදාළ තත්ත්ව විශ්ලේෂණය කර ගන්නේ කොයි ආකාරයෙන්ද දන්නේ නැහැ. අර නයා මූලික කරගෙනද දන්නේ නැහැ එතුමා ඒ ආර්ථික විශ්ලේෂණ ඉදිරිපත් කරන්නේ. මම එතුමාට කාරුණිකව මතක් කරනවා, ශ්‍රී ලංකා මහ බැංකුව 2025.12.31 දිනට නිකුත් කරපු ආර්ථික විශ්ලේෂණය පිළිබඳව අධ්‍යයනය කරන්න කියලා. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව රටේ ආර්ථිකය පිළිබඳව මාස තුනෙන් තුනට ප්‍රකාශන නිකුත් කරනවා. ඒවා පරිශීලනය කරලා මේ ආර්ථිකයට අදාළ තත්ත්ව පිළිබඳව යම් අවබෝධයක් ගන්න කියලා මා එතුමන්ලාගෙන් ඉල්ලනවා.

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ අපි අවස්ථා කිහිපයකදීම, අවස්ථා දෙක-තුනකදීම, මෙවැනි සංශෝධන ඉදිරිපත් කළා. අපි මෙවැනි සංශෝධන ඉදිරිපත් කරන්නට පදනම් වුණු කාරණා කිහිපයක් තිබෙනවා.

කොළඹ වරාය නගරය ඇතුළේ සිද්ධ කරන ව්‍යාපාරික කටයුතු ටික පහසු කරන්න ඕනෑ. ඒ, එක කාරණයක්. ඊට අමතරව ක්‍රමෝපායික ව්‍යාපාර ප්‍රවර්ධනය කරන්න ඕනෑ. ඒ කියන්නේ අපි තෝරා ගත්ත ව්‍යාපාර මේ තුළ ප්‍රවර්ධනය කරන්නට ඕනෑ. ඊට අමතරව කලාපය තුළ ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කළ යුතුයි. ඒ අනුව මේ කලාපය පදනම් කරගෙන ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි, නාවික ප්‍රවර්ධන මෙහෙයුම් සිදු කිරීම සහ ජාත්‍යන්තර ආරාවුල් නිරාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම. ඒ කියන්නේ මේ තුළ ජාත්‍යන්තර ආරාවුල් නිරවුල් කරන්න අපට යම් මැදිහත්වීමක් කරන්න පුළුවන්ද කියා බලන එක. ඒ වාගේම, කලාපය තුළ නාගරික පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීමට යම් මැදිහත්වීමක් කිරීම කියන කාරණාත් දැක්විය හැකියි. මේක නාගරික පරිසරයක්

[ගරු තිළිණ සමරකෝන් මහතා]

සහිතව ගොඩනහලා නේවාසික ප්‍රජාවක් මේ තුළ පදිංචි කරන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳව යම් කිසි විමසීමක් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මෙන්න මේ කාරණා කිහිපය මත පදනම් වෙලා තමයි අද අපි මේ සාකච්ඡාව කරන්නේ.

විදෙස් රටක සිට පැමිණෙන්නෙකුට දින හතරක් යන්නට පෙර එක් දිනයකදී කොළඹ වරාය නගරයට පැමිණීමට පුළුවන්. අද අපි ඒ කාරණයත් සංශෝධනය කරනවා. පැවැති නීතියට අනුව නම් විදෙස් රටක සිට ලංකාවට පැමිණෙන්නෙකුට එසේ පැමිණ දින හතරක් ඇතුළත එක් අවස්ථාවකදී වරාය නගරය පරිශ්‍රය තුළින් ඩොලර් 2,000කට තීරු බදු රහිතව මොකක් හෝ අවශ්‍ය දෙයක් මිලදී ගන්න පුළුවන්කම තිබුණා. වරාය නගරය පරිශ්‍රයට එක් අවස්ථාවකදී යනවා වෙනුවට, මේ දින හතර ඇතුළතදී ගිහින් ඩොලර් 2,000ක් වියදම් කර යම් දෙයක් මිලදී ගන්නට හෝ සුදුසු කටයුත්තක් ඒක ඇතුළේ කරන්න පුළුවන් කියන අවසරය ලබා දීම තමයි අපි මේ කරන්නේ, මේ පනතට අදාළ නියම ගෙන ඒම තුළින්. 2024 වර්ෂය තුළ එසේ සිද්ධ වෙච්ච සමස්ත ගනුදෙනුවල වටිනාකම ඩොලර් 22,021ක්. එම ප්‍රමාණය 2025 08වැනි මාසයේදී ඩොලර් 77,898 දක්වා වර්ධනය කරගන්න අපට හැකි වෙලා තිබෙනවා. මේ පනත යටතේ ගෙනෙන මෙම නියම සම්මත කිරීමත් එක්ක තීරු බදු රහිත වෙළෙඳාම සඳහා අදාළ වන සියයට 7 රාජ්‍ය භාගයත් වැඩි කරගෙන ඒ තුළින් රාජ්‍ය ආදායම ඉහළ නංවන්නට අප බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව ගත්තාම වරාය නගරයට පමණක් අදාළව කම්කරු නීතිවල පුංචි කාරණා කිහිපයක් සංශෝධනය වෙනවා. ඒ තමයි සේවකයා සහ සේවා යෝජකයා අතර යම් සාකච්ඡාවක් මඟින් සේවය අවසන් කිරීමට අදාළ කටයුතුවලදී යම් යම් තීරණ ගන්න පුළුවන් කියන කාරණය. අවුරුදු දෙකක කාල සීමාවක් ඇතුළත මේ කරුණු පිළිබඳ යම් විමසීමක් කරලා, ඊට පසුව ඒවායේ ඵලදායිතාව, ආර්ථිකයට තිබෙන ප්‍රයෝජනවත් බව සලකා තවදුරටත් සංශෝධන අවශ්‍ය නම් ඒ සංශෝධන කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

අපි මේ රටේ ආර්ථික පරිවර්තනයට අවශ්‍ය නීති, අණ පනත් වෙනස් කරමින් අපේ ආර්ථිකය කළමනාකරණය කළේ පසුගිය වසර තුළ යම් යම් ආපදාවලට හා යම් යම් අභියෝගවලටත් මුහුණ දෙමින්. මෙවැනි නියම හරහාත් අපි ඉදිරියේදී අපේ රටේ ආර්ථිකය කළමනාකරණය කරමින් රටේ ආර්ථික වර්ධන වේගය වැඩි කර ගනිමින්, රටේ සමස්ත ආදායම වැඩි කර ගනිමින්, අපේ රටට ලැබෙන ඩොලර් ප්‍රමාණය වෙනදාට වඩා අපේ රටට ගෙන එමින් අපේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය ප්‍රවේශය ලබා ගන්න උත්සාහ කරනවා.

අපි ආර්ථිකය පිළිබඳව අවධානය යොමු කළොත්, අපට පෙනී යනවා පසුගිය වසර තුළ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 30,096 සිට 32,751 දක්වා වර්ධනය කරගන්න අපට හැකියාව ලැබී තිබෙන බව. ඒ වාගේම දළ ජාතික ආදායම රුපියල් බිලියන 29,311 සිට 32,142 දක්වා වර්ධනය කර ගන්න හැකි වී තිබෙනවා. ඩොලර් මිලියන 12,772ක්ව පැවැති අපනයන ආදායම අපි 2025 වසරේදී ඩොලර් මිලියන 13,581 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා. මේ විධියට ගත්තාම, සමස්ත ආර්ථික ක්‍රියාවලිය වර්ධනය කරන්න අපි සමත් වෙලා තිබෙනවා. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය අඛණ්ඩව සියයට 5ක අගයක රඳවාගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මෙන්න මේ විධියට රටක් ආර්ථිකමය වශයෙන් ඉස්සරහට යද්දී රට ඇතුළේ සිද්ධ වෙච්ච යම් යම් කාරණා, යම් යම් සිද්ධි අදාළ කරගෙන මේ ආණ්ඩුව යම් යම් වංචා කරනවාද, එහෙම නැත්නම් දූෂණ කරනවාද, ඒ දූෂණවලට රටේ ඉන්න අමාත්‍යවරු, එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු යම් විධියක සම්බන්ධයක් තිබෙනවාද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු නිතර නඟන මැසිවිල්ලක් තිබෙනවා. ඒකට අදාළ කාරණා කිහිපයක් තිබෙනවා. නමුත්, එයින් කාරණා දෙකක් පිළිබඳව විතරක් මම මේ අවස්ථාවේ අදහස් දක්වන්නම්.

විශේෂයෙන්ම අපේ එක මන්ත්‍රීවරයෙක් මීට විනාඩි කිහිපයකට පෙර අදහස් දක්වද්දී පෞද්ගලික බැංකුවක් ඇතුළේ සිද්ධ වෙච්ච මුදල් වංචාවක් පිළිබඳව කථා කළා. ඒ රුපියල් බිලියන 13කට, 14කට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධව. ඒ බැංකුවේ ඉහළ නිලධාරියෙක් යම් මුදල් ප්‍රමාණයක් transfer කරද්දී, එහෙම නැත්නම් fund transferring system එක ඇතුළේ සිද්ධ වෙච්ච වැරැද්දක් හරහා තමයි ඒ දේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකට අදාළ පරීක්ෂණය මේ වන විට ක්‍රියාත්මක වෙනවා. එතකොට ඒක ආණ්ඩුවේ දේශපාලන අඩුවක් නොවෙයි. ඒ බැංකුව ඇතුළේ තිබුණු ක්‍රියාවලියේ යම්කිසි අඩුවක් නිසා ඒ දේ සිද්ධ වෙලා තිබෙනවා. එවැනි දේවල් ඉදිරියට ඇති නොවෙන්න අදාළ මැදිහත් වීම තමයි අපේ පැත්තෙන් කරන්න ඕනෑ. අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීත් මේවා සාකච්ඡා කළා. එවැනි තත්ත්ව ඉදිරියේදී ඇති නොවෙන්න අදාළ මැදිහත් වීම කරන්න ඕනෑ.

ඊට අමතරව, RDA එකට අදාළ මුදල් ගෙවීම රජයේ ප්‍රධාන බැංකුවක් හරහා සිද්ධ කරපු ආකාරය ගැන අපි බලමු. බැංකුව ඇතුළේ ඉන්න නිලධාරියෙක් අවස්ථා දෙකකදී ගනුදෙනු සිද්ධ කරලා තිබෙනවා, ඒ ගිණුම්වලට මුදල් බැර කරලා තිබෙනවා. නිලධාරින්ගේ ඒ වාගේ යම් යම් අඩුපාඩු නිසා මෙවැනි දේවල් සිද්ධ වෙලා තිබෙනවා. රාජ්‍යයක් විධියට, මුදල් අමාත්‍යාංශය විධියට අපි උත්සාහ කරනවා, මෙන්න මේ දේවල් වළක්වාගෙන ඉදිරියේදී කටයුතු කරන්න. ඒ නිසා පසුගිය කාලයේ රට ඇතුළේ සිද්ධ වෙච්ච දේවල් අපේ දේශපාලන අඩුවක් හෝ එහෙම නැත්නම් අපේ ඇමතිවරුන්ගේ, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශය භාර ඇමතිවරුන්ගේ දූෂණ හෝ වංචා නිසා සිදු වූ දේවල් නොවෙයි, රට ඇතුළේ සිද්ධ වෙච්ච යම් යම් ක්‍රියාවල යම් අඩුපාඩුවක් නිසා සිදු වූ දේවල් බව කියන්න ඕනෑ. අපි ඉදිරියේදී මේ රට යහපත් විධියට කළමනාකරණය කරමින් අවශ්‍ය ආර්ථික වර්ධනය රටට අත්පත් කරලා දෙන්න අවශ්‍ය මැදිහත්වීම කරනවාය කියන එක මතක් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අමිර්තනාදන් අඩෙයික්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.57]

**ගරු අමිර්තනාදන් අඩෙයික්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

நேற்றைய தினம் அறிவிக்கப்பட்ட தமிழ்நாடு சட்டசபைத் தேர்தல் முடிவுகளின்படி, அத்தேர்தலைச் சந்தித்து முதலமைச்சராகப் பதவியேற்கவுள்ள தமிழக வெற்றிக் கழகத்தின் தலைவர் விஜய் அவர்களுக்கும் அக்கட்சி சார்பில் போட்டியிட்டு வெற்றி பெற்றுள்ள வேட்பாளர்களுக்கும் எங்களுடைய தமிழ் மக்கள் சார்பான பாராட்டுகளைத்

தெரிவித்துக் கொள்கின்றோம். அதேநேரத்திலே, கடந்த 5 வருடங்கள் ஆட்சி செய்த திராவிட முன்னேற்றக் கழகத்தின் தலைவர் தோல்வியைத் தழுவியிருக்கின்றார். அந்த வகையில் எங்களுடைய மனவருத்தத்தையும் தெரிவித்துக் கொள்கின்றோம். நேற்றைய தினம் இந்தியாவின் துணை சனாதிபதி மாண்புமிகு ராதாகிருஷ்ணன் அவர்களுடைய பிறந்த தினம் ஆகும். அந்த வகையில், அவருக்கும் எனது வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாளைய தினம் எனது தானைத் தலைவன் சிறீ சபாரத்தினம் மற்றும் சக போராளிகளுடைய 40 ஆவது நினைவு தினத்தை நாங்கள் ஒற்றுமை வாரமாக நினைவுகூருகின்றோம். அந்த வகையிலே, இன்றைய விவாதத்திலிருந்து சற்று மாறுபட்டு சில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன். எமது தமிழீழ விடுதலை இயக்கம் மிகவும் தாங்க முடியாத இரண்டு இழப்புகளைச் சந்தித்தது. முதலாவதாக 1983ஆம் ஆண்டு தங்கத்துரை, குட்டிமணி, ஜெகன் ஆகியோர் சிறையில் வைக்கப்பட்டிருந்தபோது படுகொலை செய்யப்பட்டார்கள். தமிழீழ விடுதலை இயக்கத்தை ஆரம்பித்த ஸ்தாபகர்களான அவர்கள் மரித்தபோது, என்ன செய்வது என்று தெரியாது தத்தளித்த நிலையில், அதன் தலைமைப் பொறுப்பை எனது தானைத் தலைவன் சிறீ அண்ணா அவர்கள் ஏற்றுக் கொண்டார். அதன் பின்பு எங்களுடைய இனத்தின் விடுதலைக்கான இளைஞர்களுடைய ஆயுதப் போராட்டமானது பல வெற்றிகளை ஈட்டிய வரலாற்றை என்னால் தொடர்ந்து சொல்ல முடியும். நேரம் போதாமையால் நான் அதனை விடுத்துப் பேச்சைத் தொடர்கின்றேன். அப்படியான மிகத் திறமையான ஒரு தலைவனான எங்களுடைய சிறீ சபாரத்தினம் அவர்கள் மற்றும் எங்களுடைய போராளிகள் சகோதரப் படுகொலை செய்யப்பட்டு மரித்த நிலையிலே, ஆரம்ப காலத்தில் முதற் தடவையாகப் பிரிவினை என்ற நிலை ஏற்பட்டு, எங்களுடைய இனத்திற்கு அது ஒரு சாபக்கேடாக மாறியது. அதைத்தான் நாங்கள் ஒற்றுமை வாரமாக இப்பொழுது நினைவுகூருகின்றோம்.

இருந்தாலும் நாங்கள் சோர்ந்துவிடவில்லை; அந்த நேரத்திலே விடுதலைப் புலிகள் முப்படைகளையும் கொண்ட பாரிய பலமானதொரு சக்தியாகப் போராட்டத்தை மேற்கொண்டிருந்தபோது, தமிழீழ விடுதலை இயக்கம் பல பிரச்சினைகளைச் சந்தித்துக்கொண்டாலும்கூட, பாரிய இழப்புக்களைச் சந்தித்துக் கொண்டாலும்கூட, நாங்கள் பலவீனமான சூழலிலே இருந்தாலுங்கூட, எங்களுடைய தமிழீழ விடுதலை இயக்கமோ, தமிழர்களோ அந்தப் போராட்டத்தை மலினப்படுத்துகின்ற, மழுங்கடிக்கின்ற செயற்பாட்டிலே ஒருகாலமும் முனையக்கூடாது என்றதொரு செய்தியை நாங்கள் இந்த நாடாளுமன்றத்திலே வெளியிட்டோம். அந்த வகையிலே, நாங்கள் விடுதலைப் புலிகளோடு இணைந்து செயற்படக்கூடிய ஒரு காலகட்டத்தை உருவாக்கினோம். அந்தக் காலகட்டத்திலேதான் ஒற்றுமை என்பது தேவை என்பதை உணர்ந்த எனது நண்பர் 'மாமனிதர்' சிவராம் அவர்கள் மற்றும் கிழக்கு மாகாணத்திலே இப்பொழுதும் இருக்கின்ற பத்திரிகையாளர்கள் இணைந்து மேற்கொண்ட தமிழ்த் தேசியக் கூட்டமைப்பை உருவாக்குவதற்கான முயற்சியிலே தமிழீழ விடுதலை இயக்கமும் அவர்களோடு கரங்கோர்த்தது. அந்த வகையில், நாங்கள் கிளிநொச்சிக்குச் சென்று அப்போது தமிழீழ விடுதலைப் புலிகளின் முப்படைகளின் தலைவராக இருந்த பிரபாகரன் அவர்களைச் சந்தித்து, அதற்கான அங்கீகாரத்தைப் பெற்று, விடுதலைப் புலிகள்கூட தேர்தல் களத்திலே ஈடுபட்டுப் பிரச்சாரம் செய்திருந்ததன் அடிப்படையில், தமிழ்த் தேசியக் கூட்டமைப்பு அப்போது 22 நாடாளுமன்ற உறுப்பினர்களைப் பெற்றிருந்தது.

நான் என்ன சொல்கின்றேன் என்றால், எங்களுடைய தலைவன் சிறீ சபாரத்தினம் அவர்கள் இந்த ஒற்றுமையை மிக வலுவாக எங்களுக்குச் சொல்லித் தந்தவர், வழிநடத்தியவர் என்ற அடிப்படையிலே, தமிழீழ விடுதலை இயக்கம் அவர் காட்டிய வழியில் தனது கடமையைச் செய்தது. அதன் பின்பு, எங்களுடைய தமிழ்த் தேசியக் கூட்டமைப்பு தொடர்ச்சியாக மக்கள் மத்தியிலே செல்வாக்கைப் பெற்றிருந்த நிலையிலே, மீண்டும் ஒரு சாபக்கேடாக, தமிழ்த் தேசியக் கூட்டமைப்பாக உள்ளூராட்சி சபைத் தேர்தலில் போட்டியிடுவதற்கான நிலைமை சிதைக்கப்பட்டது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நான் ஒரு நிமிடத்திலே முடிக்கிறேன்.

அதுவும் எங்களுடைய மக்களுக்கான ஒரு சாபக்கேடாக இருக்கிறது. என்றாலும், தமிழீழ விடுதலை இயக்கம் சோர்ந்து போகவில்லை. ஐந்து கட்சிகளை - அதுவும் போராட்ட இயக்கங்களாக இருந்தவர்களை - ஒன்றிணைத்து, நாங்கள் உருவாக்கிய 'ஜனநாயகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு' இன்றைக்கும் செயற்பட்டுக்கொண்டு இருக்கின்றது. அந்த நிலையிலே, எங்களுடைய 'குத்துவிளக்கு' சின்னம் 'சங்கு' சின்னமாக மாற்றப்பட்டபோது, இங்கே இருக்கின்றவர்களும் வெளியிலே இருக்கின்றவர்களும், நாம் 'சங்கு' சின்னத்தைக் களவாடிவிட்டதாக எதிராகப் பிரசாரம் செய்ததால், எங்களுடைய 'சங்கு' சின்னத்திலே போட்டியிட்டவர்கள் தோல்வி கண்டார்கள். இது எங்களுக்கு இடையேயான ஒற்றுமை இன்மையைக் காண்பிக்கின்றது.

நான் ஒரு விடயத்தைச் சொல்லி முடிக்கின்றேன், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! என்னைப் பொறுத்தமட்டிலே, இறந்த எங்களுடைய போராளிகள் மீது, விடுதலைப் புலிகள் இயக்கத்தின் போராளிகள் மீது, இறந்த எங்களுடைய தமிழ் மக்கள்மீது ஆணையாகச் சொல்கிறேன், மீண்டும் தமிழ்த் தேசியக் கூட்டமைப்பு உருவாக்கப்படவில்லை என்றால், எப்படி தமிழகத்திலே இளைஞர்கள் தாங்கள் விரும்பியபடி மாற்றத்தைக் கொண்டுவந்தார்களோ, அதேபோல எங்களுடைய பிரிவின் காரணமாக இங்கேயும் NPP கட்சி வடக்கு, கிழக்கிலே கால் ஊன்றியது போன்றதான ஓர் அபாயகரமான சூழ்நிலையை நாங்கள் சந்திக்க நேரிடும் என்பதைச் சொல்லிக்கொள்வதோடு, எமது ஒற்றுமையை நாங்கள் பலப்படுத்த வேண்டும், தமிழீழ விடுதலை இயக்கம் அதற்குத் தயாராக இருக்கின்றது என்பதைக் கூறி, முடிக்கின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.05]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගැනෙන්නේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ඉදිරිපත් කළ නියම සහ නියෝග පිළිබඳවයි. මෙහිදී අපි පළමුවෙන්ම පැහැදිලි කර ගන්න ඕනෑ, කොළඹ වරාය නගරය ඉදි කළේ ඇයි කියන කාරණය. අද මේ විවාදය පටන් ගත් අවස්ථාවේ විපක්ෂයෙන් චෝදනාවක් එල්ල වුණා, එදා විපක්ෂයේ ඉඳගෙන වරාය නගරය ඉදිකිරීම ගැන විවේචන ඉදිරිපත් කළ අපි, අද මේ තරම් සංශෝධන ගෙනැල්ලා මේවා ගැන කථා කරන්නේ ඇයි කියලා. අපි භාර ගත්තේ කොයි වාගේ රටක්ද කියන එක කාටවත් අමතක නැතුව ඇති. අපි භාර ගත්තේ බිඳ වැටුණු රටක්. නමුත්, අවුරුදු එකහමාරකට ආසන්න කාලයක් තුළ, - 2025 වර්ෂයේ මහ බැංකු වාර්තාව කියන විධියට, සියයට 5ක ආර්ථික ප්‍රගතියක් තිබෙන, ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000 ඉක්මවා ගිය වර්ෂයක් - අපි කොයි තරම් ශක්තිමත්ව මේ ආර්ථිකය ගොඩනැඟුවාද කියන කාරණය මේ දර්ශක අපට කියා පානවා.

සමාජය හමුවේ තිබෙන මේ අභියෝග ජයග්‍රහණය කරන්න නම්, අපි මේ රට සාර්ථකව කළමනාකරණය කළ යුතුව තිබෙනවා. එසේ නොකළොත් අපේ ආණ්ඩුකරණය තුළ අපි අර්බුදයකට ලක් වෙන්න පුළුවන්. එම නිසා කොයි විධියට ඉදි වුණත් වරාය නගරයට ආයෝජන කැඳවා ගැනීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. විදේශිකයන්, විදේශ ආයෝජකයන් මේ රටට ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තමයි මේ රජයේ යුතුකම සහ වගකීම වෙන්නේ. අන්න ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීම තමයි මේ සංශෝධන තුළින් සිදු වන්නේ.

මා දකින එක තත්ත්වයක් තිබෙනවා. පසුගිය අවුරුද්ද පුරාවට තිබෙන කාර්ය දර්ශක අපි සලකා බැලුවාම, සාමාන්‍යයෙන් අපේ රටින් බැහැරට යන, එහෙම නැත්නම් විදේශගත වන අයෙක් duty -free shopsවලින් මිලදී ගන්නේ ආසන්න වශයෙන් ඩොලර් 300ක භාණ්ඩ පමණයි. ඒ වාගේම රටට ඇතුළු වෙන සංචාරකයෙක් වියදම් කරන්නේ ඩොලර් 150ත්, ඩොලර් 153ත් අතර ප්‍රමාණයක්. අපි මෙන්න මේ තත්ත්වය සලකා බැලුවාම, 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ දී යම් ආකාරයක ඉහළ ප්‍රගතියක් දකිනවා. අළෙවිය මත, නැත්නම් විකුණුම් මත රජය අය කරනු ලබන රාජ්‍ය භාගය සියයට 7ක ප්‍රතිශතයක් වෙනවා. එය වැඩි කර ගැනීම ඇත්තටම රජයේ ආදායම් උත්පාදන මාර්ගයක් විධියට සලකන්න පුළුවන්. ඒ අනුව මේ භූමි භාගය තුළ අළෙවිය තව තවත් වර්ධනය කර ගැනීම සඳහා අවස්ථාව සලසනවා නම්, අන්න ඒ අවස්ථාව තුළ මේ රටට විදේශ විනිමය රඳවා ගැනීමේ හැකියාව තිබෙනවා. අපේ රට තුළම ඒ විදේශ විනිමය - ඩොලර් - වැය කිරීමට අපි අවස්ථාව සකස් කරනවා නම් අපේ රට තුළ ඩොලර් රැඳීමෙන් අපේ රටේ අනාගත අවශ්‍යතාව සඳහා, එහෙම නැත්නම් අනෙකුත් වුවමනාවන් සඳහා අපට ඒවා භාවිත කිරීමේ හැකියාව ලැබෙනවා.

මේ අලුත් සංශෝධන ඇතුළේ අවුරුද්දක කාල සීමාවක් තුළ වරක් පමණක් ඩොලර් 2,000කට සීමා වෙච්ච, දින 4ක් ඇතුළත සිදු වෙන ගනුදෙනු උපරිමය මේ සංශෝධනය තුළ දෙවතාවක දී කරන්න අවකාශය ලැබිලා තිබෙනවා. එතකොට ඒ දින හතර කියන කාරණාව එහෙමම තිබිය දී සංචාරකයෙක් සඳහා අවස්ථා දෙකකදී මේ ප්‍රමාණයට යටත්ව මිලදී ගැනීමේ හැකියාව ලබා දීම නිසා අපට අපේ රට තුළ ඩොලර් රඳවා ගැනීමේ හැකියාව ලැබෙනවා. ඇත්තටම මේක කර්මාන්තයක් විධියට සංවර්ධනය වෙනකොට තවත් ආකාරයකින් අපට ආයෝජන ගෙන්වා ගැනීමේ හැකියාවක් තිබෙනවා.

ඊළඟ කාරණය ගත්තොත්, ඇත්ත වශයෙන්ම සේවා සැපයීමේදී, එහෙම නැත්නම් සේවකයන් බඳවා ගැනීමේ දී සාමාන්‍යයෙන් රටේ පවතින නීතියට අනුකූලව වරාය නගර සීමාව ඇතුළත ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැහැ. මොකද, අපි ආයෝජකයන් ආකර්ෂණය කර ගන්නත් ඕනෑ. ඒ වාගේම එම භූමිය තුළ අපේ සේවකයන්ට රැකියා සපයා දීමේ අවස්ථාවත් තිබෙන්න ඕනෑ. නමුත්, අධිකරණය ඉදිරියේ විමසන ලද නඩුවක තීන්දුවකට අනුව මේ කියන ගිවිසුම්වල, විශේෂයෙන්ම රැකියාවෙන් ඉවත් කිරීමේදී, නැත්නම් රැකියාව අවසන් කිරීමේදී ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ සංශෝධන අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඇත්තටම ඒ සංශෝධන ශ්‍රී ලංකාව තුළ පවතින සාමාන්‍ය නෛතික තත්ත්වයට වඩා වෙනස්. නමුත් ඒ සංශෝධනයට යටත්ව තමයි අපට මේ ක්‍රියා කරගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අනුව, සේවා යෝජකයා හා සේවකයා අතර ඇති වෙන ගිවිසුමක් යටතේ තමයි සේවය අවසන් කිරීමේ තත්ත්වය තීරණය වන්නේ. ඒ නිසා ඒ සේවකයා හොඳටම දන්නවා තිබෙන කොන්දේසි මොනවාද කියලා. ඒවාට යටත්ව තමයි ඔවුන් සේවයට බඳවා ගැනීම, පවත්වා ගෙන යෑම සහ ඉවත් කිරීම සිද්ධ වෙන්නේ. අධිකරණය විසින් රැකියාවෙන් ඉවත් කිරීම සම්බන්ධ පනතේ දෙවැනි වගන්තිය, එකොළොස්වන වගන්තිය, දොළොස්වන වගන්තිය විශේෂයෙන්ම සංශෝධනය සඳහා අවශ්‍ය කරන නිගමනයන් සඳහා තීන්දු දීලා තිබෙනවා. ඇත්තටම සේවකයෙක් ඉවත් කිරීම කියන කාරණාව ගැන තමයි දෙවැනි වගන්තියේදී කථා කරන්නේ. එය කෙසේ සිදු විය යුතුද? එකොළොස්වන වගන්තියේ දී ඒ ඉවත් වන සේවකයා සම්බන්ධයෙන් යම් ආකාරයකට නියමානුකූලව කටයුතු නොකරන්නේ නම් දඩ මුදල් අය කිරීම සහ වෙනත් ආකාරයකට දඬුවම් ලබා දීමත්, දොළොස්වන වගන්තියේ දී මේ කරුණු ප්‍රකාරව ඇත්තටම යහ පාලනය, එහෙම නැත්නම් ඒ පාලන කටයුත්තේ දී නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දු කරවීම කියන කරුණු තමයි තිබෙන්නේ.

මේ කියන තත්ත්වය එක්ක ඇත්තටම පසුගිය වර්ෂයේ ලබා දුන් නිරීක්ෂණ දර්ශක සහිතව අපි සලකා බලනකොට, යම් ආකාරයකට අපි අපේක්ෂා කරනවාට වඩා ඉහළ ප්‍රගතියක් මේ හරහා වාර්තා කර ගන්න අද අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඉතින් අපි උත්සාහ කරන්නේ ඉදිරියටත් මේ තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගනිමින් විදේශ ආයෝජන මේ රට තුළට ආකර්ෂණය කරගෙන, තීරු බදු රහිත වෙළඳසැල්වලින් - duty-free shops - මිලදී ගැනීම් තව තවත් ඉහළ දමමින් අපේ රටට ආදායමක් වශයෙන් සියයට 7ක රාජ්‍ය භාගය අය කිරීම තුළ ඉහළ ආදායම් ඉලක්කයට යාමටයි. ඒ වාගේම අපි ඉලක්ක කරන ආර්ථික ප්‍රගතිය අත්කර ගැනීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද මේ භූමි භාගය නිකම් හිස් ඉඩකට සීමා නොකර, පූර්ණ වශයෙන් ඵලදායීව යොදවා ගැනීම අපි මේ සියල්ල තුළින් අපේක්ෂා කරනවා. මා විශ්වාස කරනවා, අලුතින් අපි ගෙනෙන තීරු බදු සම්බන්ධයෙන් සහ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් වන මේ කරුණු දෙක ඉතා සාර්ථක ආකාරයෙන් ස්ථාපනය කරලා ඒ තුළින් අපි අපේක්ෂා කරන ඉලක්ක ළඟා කර ගැනීමට හැකියාව ලැබේවි කියලා.

ඒ එක්කම, රජය අපේක්ෂා කළ ඩොලර් ප්‍රමාණය රටට අහිමි වීම, එහෙම නැත්නම් අපේ විදේශ සංචිත යම් ආකාරයකට අඩු වීම ඇත්තටම අපට ඉතා විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණා, අර්බුදයක් වෙලා තිබුණා. අපට විදේශ විනිමය ලැබෙන මාර්ග කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම පිට රට ගිහිල්ලා ඉන්න අපේ සේවකයන් අපට එවන ප්‍රේෂණ, ඒ වාගේම ආයෝජන හරහා අපට ලැබෙන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒවාත්, ඒ එක්කම වරාය නගරය ආශ්‍රිතව සිද්ධ වන මේ ව්‍යාපාරික කටයුතු හරහා අපි උපයා ගන්නා සහ විශේෂයෙන්ම විදේශිකයන් මේ රටට

පැමිණීමේදී සහ සංචාරකයන් යන එන අතරවාරය තුළ මේ පරිශ්‍රයෙන් මිලදී ගැනීමේදී අපට රඳවා ගත හැකි ඩොලර් ප්‍රමාණය ඉහළ දමා ගැනීම කියන කරුණු ඔස්සේ අපට අවශ්‍ය ඉලක්ක සහගත තැන්වලට ඩොලර් සංචිත ගොඩනගා ගැනීම සඳහා ප්‍රවේශ වෙන්න පුළුවන්. ඒ සාර්ථක උත්සාහය අපි මේ සංශෝධන තුළ දකිනවා. මේ නියම, නියෝග පැනවීමෙන් සහ පවත්වාගෙන යැමෙන් අපි අපේක්ෂා කරන ඉලක්ක ඉතා ඉක්මනින් ළඟා කර ගත හැකියි කියන විශ්වාසය අප තුළ පවතින බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.14]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ වූ නියම සහ නියෝග පිළිබඳව වාගේම, වෙනත් විවිධ කරුණු පිළිබඳව අද මේ විවාදයට එකතු වෙච්ච මන්ත්‍රීවරු ගණනාවක් අදහස් දක්වනු ලැබුවා. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ වූ නියම හා නියෝග පිළිබඳව සාකච්ඡා කරද්දී සමහරු මතු කරනවා, එදා අපි විපක්ෂයේ ඉන්නකොට කොළඹ වරාය නගරය පිළිබඳව කථා කරපු කරුණු පිළිබඳව. මම ඒ ගැන වෙනම සඳහන් කරන්නම්.

අද මැයි මාසයේ 5වැනි දා. මැයි දිනයෙන් පස්සේ පවත්වන පළමුවැනි පාර්ලිමේන්තු සභාවාරය තමයි අද පවත්වන්නේ. පසුගිය මැයි 1වැනි දා ජාත්‍යන්තර කම්කරු දිනයේදී මේ රටේ දිස්ත්‍රික්ක විසිඑකක දසදහස් ගණනින්, ලක්ෂ ගණනින් වැඩ කරන ජනතාව ප්‍රමුඛ මේ රටේ ප්‍රගතිශීලී ජනතාව "ජන රජයට ජන බලයක්" කියන තේමාව යටතේ මැයි දින ඉතිහාසයටම ඓතිහාසික වටිනාකමක් එකතු කරමින් මේ රටේ මැයි දිනයක් ගැන ඉතිහාස පොතේ ලියන්නට සමත් වුණා. එම නිසා මුලින්ම ඒ සඳහා එකතු වූ, අත්වැල් බැඳගත් අපේ රටේ වැඩ කරන ජනතාව ප්‍රමුඛ ප්‍රගතිශීලී ජනතාවට අපේ ගෞරවය, ප්‍රණාමය, ආචාරය පුද කරන්නට ඕනෑ.

මම දැක්කා, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගෙන එන නියම හා නියෝග පිළිබඳ විවාදයට එක් වෙමින් එහා පැත්තේ සිටින නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියනවා, එදා අපි කරපු විවේචන ගැන. ඔව්, එදා අපි විවේචන කළා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? නාමල් රාජපක්ෂ ඇතුළු විපක්ෂයේ නඩය පසුගිය ඉතිහාසය පුරා නීති වළ දමමින්, අනීතික විධියට, අනවසරයෙන් මේ රටේ කරපු බොහෝ දේවල් තිබෙනවා. දැන් අපට නාමල් මොකක්ද කියන්නේ? ඒගොල්ලන් හදපු Colombo Port City එක ආපසු අත්හරින්න කියලාද දැන් කියන්නේ? අපේ වගකීම තමයි, ඒ අනවසර දේවල්වලට උපරිම ලෙස නීතියෙන් ක්‍රියාත්මක වීම සහ එසේ කරන ගමන්, ඉදිරියේදී එවැනි අනවසර කටයුතුවලට ඉඩ නොතබා, අපේ පැත්තෙන් ඒ කටයුතු නීත්‍යනුකූලව ඉදිරියට අරගෙන යන එක. මේ රටේ මහජනතාවගේ මුදල් වියදම් කරමින් කරපු කටයුතු අතරමඟ නතර කරන්න නොවෙයි, ඒවා ඉදිරියට ගෙන යැමේ වගකීමත් අපට තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි අද මේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියම 4ක් සහ නියෝග විවාදයට ගනිමින් සම්මත කරන්න සූදානම් වෙලා ඉන්නේ. ඒ නිසා තමයි, ගුවන් තොටුපොළෙන් එක් වරක් පමණක් ලැබෙන ඩොලර් 2,000ක තීරු බදු සහනය හතර වතාවක් ගන්න පුළුවන් වන විධියට සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ. ඒ නිසා තමයි, අද Port City එකට ගැළපෙන විධියට සමහර කම්කරු නීති සහ අණ පනත් සංශෝධනය කරමින් ඉන්නේ. ඒ නිසා අද මේ විවේචන ඉදිරිපත් කරන මහත්වරුන්ට අපි කියන්න ඕනෑ, අපේ වගකීම තමයි, ඔබතුමන්ලා පසුගිය කාලය තිස්සේ කරන ලද, පසුගිය කාලය තිස්සේ ගෙන යන ලද විනාශකාරී ගමන් මඟ වෙනුවට මේ රටේ ජනතාවට ආර්ථික ප්‍රගතියක්, ආර්ථික සංවර්ධනයක් අත් පත් වන විධියට කටයුතු කරන එක. ඒ වෙනුවෙන් තමයි අද අපි මේ කටයුතු කරමින් ඉන්නේ.

මේ වෙලාවේ මම තවත් කාරණයක් කියන්න ඕනෑ. දසවන විධායක ජනාධිපති හෙවත්, "තෙරපුම් ජනාධිපති - 2" අපි දැක්කා. මට සතුටුයි, "තෙරපුම් ජනාධිපතිලා" දෙදෙනෙකුට පසුව කථා කරන්න ලැබීම පිළිබඳව. අපේ රටේ ඉන්නවා, "තෙරපුම් ජනාධිපතිලා" දෙදෙනෙක්. මීට කලින් ඒ දෙදෙනාම කථා කළා. අපි දැක්කා, ඒ අය මැයි දිනය දවසේ මේ රටේ ජනතාවට ඇති තරම් විහිළු සපයපු විධිය. අපට සතුටුයි, ඒ අය ජාතික ජන බලවේගයේ මැයි දින රැලි 21ටම සහභාගි වුණු නායකයන්ගේ කථා ටික පසුගිය දවස් හතර පහ තිස්සේ හොරාට, හොරාට අහලා තිබෙන එක ගැන. Hall එක පිරෙන්න සෙනඟ නැහැ. හැබැයි සමහරු තෙරපි තෙරපි දුවගෙන ඇවිල්ලා, වේදිකාවට නැඟලා දැවැන්ත shoot එකක් කරනවා නම් අපි දැක්කා.

ඒ වාගේම අපි දැක්කා, මේ රටේ රාජ්‍ය බලය හොබවපු ඓතිහාසික දේශපාලන පක්ෂයක් වන ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමන්ලාගේ කලින් පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය මැයි දිනය කර ගන්න බැරිව වෙන මොනවාද විකාර කරනවා. *[බාධා කිරීමක්]* නැහැ, මම කිව්වේ එතුමාගේ කලින් පක්ෂය ගැන. එතුමාගේ කලින් පක්ෂය කටයුතු කරපු විධිය අපි දැක්කා. ඒ වාගේම නාමල් රාජපක්ෂලා පව්. නාමල් රාජපක්ෂලා එදින ශීල ව්‍යාපාරවල නියැළෙන බවක් කිව්වා. ඒක හොඳයි. මම නැවත අවධාරණය කරනවා, දේශපාලනමය වශයෙන් කනත්තට යන දේශපාලන ව්‍යාපාර, බෞද්ධ දර්ශනයේ සඳහන් වන ආකාරයටම යන තැනකට මොනවා හෝ කරගෙන ඉන්න එක ගැන අපි සතුටු වන බව. දිගටම එහෙම කරගෙන ඉන්න, මේ රටේ ජනතාවට වධයක් වෙන්නේ නැතුව.

ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමා ගැන මට එක පැත්තකින් පොඩි දුකකුත් ඇති වුණා, කනගාටුවකුත් හිතුණා. එතුමා කථා කරද්දී සෙනඟ නැඟිටලා ගියා. එහා පැත්තේ ඉඳලා අද උදේ මහා ලොකුවට බෙරිහන් දුන් මහත්වරු එක එක කථා කිව්වා, හිතෙන හිතෙන දේවල් කිව්වා. හිතෙන හිතෙන දේවල් කියමින් ඒ සිදු වුණු අලකලංචිය වහගන්න කටයුතු කළා. අඩුම ගණනේ 1,000ක, 2,000ක සෙනඟක් එකතු කරගෙන මැයි දිනයක් පවත්වාගන්න බැරිව, අද ජාතික ජන බලවේග ආණ්ඩුවට විවිධ උපදෙස් දෙන්න, විවිධ අනුශාසනා කරන්න, විවිධ විධියට මඟ පෙන්වන්න ඒ අය එනවා.

ඒ වාගේම සමහරු මහා ලොකුවට බෙරිහන් දෙමින් කිව්වා, අපි නඩු තීන්දු ගැන, නඩු තීන්දු ලබා දෙන දින වකවානු ගැන සඳහන් කළ බව. හැබැයි, අපේ කථා අහපු ඒ අය ඒ කථා ටික

[ගරු මහින්ද ජයසිංහ මහතා]

හරියට අහලා නැහැ. අපි - ජනාධිපතිතුමාවත්, අපේ අනෙක් කථිකයන්වත් - කොතැනකවත් එහෙම කියලා නැහැ. අපි නඩු ගැන කිව්වා. මැයි මාසය ඇතුළත විතරක් නඩු 10ක් ඉදිරියට එන්න නියමිතයි කිව්වා. අපේ අධිකරණ ඇමතිතුමා ඒ නඩු මොනවාද කියලාත් කිව්වා. එහෙම නැතිව අපි නඩු තීන්දු ගැන කියන්න ගියේ නැහැ. හැබැයි අපි සහතික ලෙසම දන්නවා, එහා පැත්තේ ඉදිරි පෙළේ ඉන්න දූෂිතයෝ, වංචනිකයෝ ටික දන්නවා,- පසු පෙළේත් අපේ මන්ත්‍රීවරු ටික නේ ඉන්නේ. *[බාධා කිරීමක්]* ආ, ඔබතුමා ඉන්නවා නේ. තව පොඩ්ඩෙන් එදා අර ගැහැනු ළමයින්ගෙන් ගුටි කනවා. සද්ද නැතිව ඉන්න. තව පොඩ්ඩෙන් ගැහැනු ළමයින්ගෙන් ගුටි කනවා, බෝට්ටුවක නැහලා. *[බාධා කිරීමක්]* பொய் சொல்ல வேணாமப்பா! இரிங்க!

ඒ නිසා අපි ඉතාම පැහැදිලිව මේ රටේ ජනතාවට මේ කාරණය අවධාරණය කරනවා. මැයි දිනයෙන් පසු මේ රටේ මහජනතාව කොහේදී හරි හය වෙලා, කෑ ගහලා, වෙවුලලා, දැඟලුවාද, ඉදිරියේදී නඩු තීන්දු එනවා, ඒ නඩු තීන්දුවලින් අපට යම් හානියක් වෙනවා කියලා? එහෙම මොකක්වත් සිදු වුණේ නැහැ. හැබැයි, විපක්ෂයේ ඉන්න කිහිප දෙනෙක් ඉදිරියේ ලබා දෙන නඩු තීන්දු ගැන මහා ඝෝෂා නඟන්න පටන් අරගෙන තිබෙනවා. වැරදි කරපු දූෂිතයෝ, වංචනිකයෝ, අපරාධකරුවෝ හඬ නඟන්න ඕනෑ; හය වෙන්න ඕනෑ. ඒක නිසා තමයි අද විපක්ෂයේ සමහර අයගේ පැත්තෙන් මර ළතෝනි හඬ නැඟෙමින් තිබෙන්නේ. ඒ නිසා තමයි ඔවුන්ගේ පැත්තෙන් අපේ කථා විකෘති කරමින්, අපි දක්වපු අදහස් විකෘති කරමින් ඔවුන්ට ඕනෑ ඕනෑ විධියට ඒ අදහස් පළ කරමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔව්, නිශ්චිතයි. අපි මැයි දිනයේදී සඳහන් කළා වාගේම මේ වසර තුළ නඩු විශාල ප්‍රමාණයක් අධිකරණ තුළ විභාග වෙන්න නියමිතව තිබෙනවා. මොකද, ඒ නඩු විභාග වෙන්නේ නිකම්ම නොවෙයි කියලා අපි දන්නවා. මේ රටේ සිද්ධ වුණු අපරාධවලට, වංචාවලට, දූෂණවලට වාගේම මිනිස් ඝාතනවලට අදාළ නඩු තමයි විභාග වෙමින් තිබෙන්නේ. ඒ නඩුවල තමයි තීන්දු දෙන්න නියමිතව තිබෙන්නේ. ඒ තීන්දුවලට හයේ අද සමහරුන්ගේ කකුල් වෙවුලනවා. අද නාමල්ලා මේ සභාවට ඇවිත් මොනවා හරි බොරු ගොඩක් කියනවා. අපි පිළිතුරු දෙනකම් ඉන්නේත් නැහැ, පැනලා දුවනවා. ඒක තමයි ඔවුන්ගේ භාවිතය බවට පත් වෙලා තිබෙන්නේ. අද අපි නාමල් රාජපක්ෂට කියනවා, එතරම් නීති ගරුක පුරවැසියෙක් නම් කරුණාකරලා රට පැනලා ඉන්න, උසාවිය මඟ හැරලා කට්ටි පැනලා ඉන්න ඔයාගේ බාප්පොච්චි ගෙන්වලා දෙන්න කියලා. ඔබතුමා මේ රට භාර ගන්න ඉන්න පළමුවැනි තෙරපුම් ජනාධිපති නේ. ඒ පළමුවැනි තෙරපුම් ජනාධිපති මේ රටේ නීති හදන්න කථා කරනවා. පසුගිය දවස්වල මහ ලොකුවට උජාරුවට කියනවා අපි දැක්කා, නීති හදන විධිය, හොරුන්ට, වංචනිකයන්ට දඬුවම් දෙන විධිය. ඉතින්, ඒවා ආදර්ශයෙන් පෙන්වන්න කෝ. තමන්ගේ තාත්තාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එන්න කියලා කැඳවීම් එනකොට එළියේ ඉඳගෙන ඒවාට එක එක බයිලා කියන්නේ නැතිව නීතිගරුක පුරවැසියන් විධියට ඒ කොමිෂන් සභාවට ඇවිත් අදාළ ප්‍රකාශ ලබා දෙන්න කෝ. ඒක නේ රට භාර ගන්න ඉන්න පළමුවැනි තෙරපුම් ජනාධිපති කෙනකුගේ වගකීම වෙන්න ඕනෑකම තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අපි ඉතාම පැහැදිලිව සහ නිරවුල්ව මේ රටේ ජනතාව වෙනුවෙන් වගකීමක් භාර අරගෙන තිබෙනවාය කියන එක කියන්න ඕනෑ. ජාතික ජන බලවේගය ලෙස අපි ගෙවුණු වසර එකහමාර තුළ වාගේම ඉදිරි වසර තුනහමාර තුළත් භාර ගත්ත වගකීම අනුව මේ රටේ ආර්ථිකය ගොඩනඟමින්, විශේෂයෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව ඇතුළු මේ සියලු දේවල් නිවැරදි දිශාවට ගෙන එමින් නිවැරදිව කටයුතු කරමින් සිටිනවා.

පසුගිය කාලය තිස්සේම හැමෝම ඔවුන්ගේ හිතෛෂීන්ට, ඥාති මිත්‍රයන්ට, ගජ මිතුරන්ට තමයි හැම දෙයක්ම ලබා දුන්නේ. ඒ වෙනුවට අපි විවෘතව කටයුතු කරමින් මේ රට නිවැරදි දිශාවට ගෙන යමින් තිබෙනවා. ඒ නිසා තමයි මේ අය කලබල වෙලා තිබෙන්නේ. මේ මහත්වරු වංචනිකයෝ, දූෂිතයෝ, අපරාධකාරයෝ. ඒ නිසා ඒගොල්ලන් කල්පනා කරනවා වාගේම උත්සාහ කරනවා, ජාතික ජන බලවේගයේ අපිත් ඒ ගොඩට ඇදලා දමන්න. සොරි, ඔයගොල්ලන් මඩ ගොඩේ ලැග්ගාට, ඔයගොල්ලන් මඩ වගුරේ ලැග්ගාට අපිත් එතැනට ඇදගන්න ඔයගොල්ලන්ට හම්බ වෙන්නේ නැහැ, මහත්වරුනි.

අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඇතුළු මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනාගෙන් කිසිවෙකුට විරුද්ධව නිකම් ඔහේ වේදිකාවල, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා විවිධ වංචා, දූෂණ චෝදනා එල්ල කළාට ඔයගොල්ලන්ට ඒවා ඔප්පු කර ගැනීම හරියට ගලකින් පට්ටයක් ගන්නවා වාගේ වැඩක්. ඒක කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, ඉතිහාසය පුරා අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට පෙන්වා තිබෙනවා, අපේ කඳවුරේ, අපේ දේශපාලන ව්‍යාපාරයේ කෙනෙක් කිසිදු හෝ වරදක් කළොත් ඔවුන්ට එරෙහිව ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා. අපට බලය නැතිව තිබියදී, අපි විපක්ෂයේ සිටියදී ඒ දේශපාලන ආදර්ශය දීපු දේශපාලන පක්ෂයක්; දේශපාලන ව්‍යාපාරයක්.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගල් අඟුරු වෙන්න පුළුවන්, මහ බැංකුවේ සිද්ධ වෙච්ච ඩොලර් මිලියන 2.5ක වංචාව වෙන්න පුළුවන්, අර කන්ටේනර්වලට අදාළව වෙන්න පුළුවන්, අර පෞද්ගලික බැංකුවක සිද්ධ වෙච්ච රුපියල් බිලියන 13ක වංචාව වෙන්න පුළුවන්, ඒ කිසිවක් ජාතික ජන බලවේගයේ ඇමතිවරුන්ගේ හෝ මන්ත්‍රීවරුන්ගේ ඇඟේ ගහන්න ඔබ උත්සාහ කළාට, "සොරි ඩොට් කොම්." ඒවාට ඉඩක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මම ඉතාම පැහැදිලිව කියනවා, මේ කාරණයත්. අද විවාදයට ගැනෙන 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ වන මේ නියම 4ට අදාළව ගත්තත්, අපි උත්සාහ කරමින් තිබෙන්නේ මේ රට නිවැරදි දිශාවකට ගෙනයන්නයි, මේ රටේ ආර්ථිකය පණගන්වමින් ඉදිරියට ගෙනයන්නයි, මේ රටේ ජනතාවට ඉහළම ප්‍රතිලාභ ලැබෙන විධියට කටයුතු කරන්නයි කියන කාරණය අවධාරණය කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත: නියෝග
## கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு சட்டம் : ஒழுங்குவிதிகள்
## COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT: REGULATIONS

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 පෙබරවාරි 13 දිනැති අංක 2475/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා..

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
Question proposed.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 19(2)(ඇ) අනුව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

[අ.භා. 3.31]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම මේ කාරණය දැනගන්න කැමැතියි. අපි ස්ථාවර නියෝග 19(2) (ඇ) යටතේ කරන ලද හදිසි විවාදයක් ඉල්ලීමේ යෝජනාව හදිසියේ විවාද කෙරුණත්, අද දින න්‍යාය පත්‍රයේ සවස 5.00 සිට 5.30 දක්වා කාලය වෙන් කර තිබෙන්නේ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න සඳහායි. නමුත්, සභාව කල් තබන අවස්ථාවේ විවාදයක්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පවත්වනකොට කල් තැබීමේ ප්‍රශ්න අහන සිරිතක් නැහැ. ඒ නිසා සභාවේ කටයුතු නියමිත පරිදි සවස 5.30ට අවසන් කරමින් පැය 2ක කාලයක් මේ විවාදය සඳහා ලබා දෙන්න පුළුවන් නේද කියන කාරණය දැනගන්න කැමැතියි. ලේකම් මණ්ඩලයෙන් අපි ඉල්ලා සිටිනවා, ඒ ගැන අපට අදහසක් ලබා දෙන්න කියලා. සවස 5.30ට නේ කොහොමත් සභාවේ කටයුතු අවසන් වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, උදේ සාකච්ඡා කර එකඟ වූ පරිදි තමයි සභාවේ කටයුතු පවත්වාගෙන යන්න වෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
නමුත්, අද සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න අහන්නේ නැහැ නේ. එතකොට ආණ්ඩුවටත් වැඩිපුර කාලය ලැබෙනවා නේ, මේ ගැන කරුණු පැහැදිලි කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ ගැන උදේ වරුවේ සාකච්ඡා කරලා යම් එකඟතාවකට ආවා. අපි ඒ අනුව කටයුතු කරමු කියන යෝජනාව තමයි තිබෙන්නේ. සවස 5.00 වෙනකල් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදය පවත්වාගෙන යන්න පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න අහන්නේ නැති නිසා මේ පිළිබඳව අපට උපදේශයක් ලබා දෙන්න ලේකම් මණ්ඩලයට පුළුවන්ද? සවස 5.30ට නේ සභාවේ කටයුතු අවසන් වෙන්නේ.

පැය භාගයයි නේ වැඩි වෙන්නේ. අනික, අවසන් කරන්න නියමිතව තිබෙන කාලයට වඩා වැඩි වෙන්නේත් නැහැ නේ. අද අපි කොහොමත් සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න හිටපු වෙලාවට අවසන් කරමු කියලායි අපි ඉල්ලන්නේ. අද සභාවේ වැඩ කටයුතු පැය භාගයක් කලින් අවසන් කරන්නේ නැතිව, අද අවසන් කරන්න හිටපු වෙලාවටම සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න පුළුවන් නේද කියලායි මම අහන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අද උදේ මේ සභාවේදී සාකච්ඡා වුණා. ඒ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් කථාවෙලා එකඟතාවට ආවා. ගරු කථානායකතුමා මූලාසනයේ සිටින අවස්ථාවේදී පැහැදිලිව කිව්වා, සවස 5.00ට විවාදය අවසන් වන බව. අපි ඒ එකඟතාව අනුව කටයුතු කරමු.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සවස 5.00 සිට 5.30 දක්වා තිබෙන්නේ සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න ඉදිරිපත් කිරීම. එතකොට, අද සභාවේ වැඩ කටයුතු අවසන් වෙන්නේ සවස 5.30ට. නමුත් අද දවසේ සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න නැති නිසා නියමිත වෙලාවටම සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න කියලායි අපි ඉල්ලන්නේ, පැය භාගයක් කලින් සභාවේ වැඩ කටයුතු අවසන් කරන්නේ නැතිව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් උදේ වරුවේ සාකච්ඡා කරලා යම් එකඟතාවකට ආවා නේ. ඒ අනුව අපි මේ සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යමු කියන යෝජනාව තමයි තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, ඒ පැය භාගයක කාලය දෙන්නකෝ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සම්බන්ධයෙන් උදේ සාකච්ඡා කරලා එකඟතාවකට පැමිණියා. ඒ එකඟතාව අනුව තමයි දැන් කටයුතු කරන්නේ. තවදුරටත් මේ ගැන කථා කරමින් විවාදයේ කාලය තමයි දැන් අපි මේ නාස්ති කරන්නේ. ඒ නිසා කාලය නාස්ති කරන්නේ නැතිව අපි විවාදය ආරම්භ කරන එක තමයි සුදුසු.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි අද උදේ මේ පිළිබඳව සාකච්ඡා කරලා යම් එකඟතාවකට ආවා. ඒ අනුව අපි සභාවේ වැඩ කටයුතු ඉදිරියට පවත්වාගෙන යන්න තමයි එකඟතාව පළ කළේ. ඒ අනුව අපි සභාව පවත්වාගෙන යමු කියන එකයි මම කියන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න තිබෙන හින්දා තමයි සවස 5.00ට සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න කියලා එකඟතාවට ආවේ. මේ වෙනකොට, සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න නැහැ කියලා දැනගන්න ලැබී තිබෙනවා. සභාවේ වැඩ කටයුතු සවස 5.30 වෙනකම් පවත්වාගෙන යන්න නියමිත වෙලා තිබුණා. අපි කියන්නේ සවස 5.30 වෙනකම් මේ සභාව පවත්වාගෙන යමු කියලායි. එච්චරයි. උදේ එකඟතාව හරි. උදේ ඒ එකඟතාව ආවේ සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කරන්න ප්‍රශ්න තිබුණු නිසා. නමුත්, අද ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ නිසා ඒ පැය භාගයත් අරගෙන අපි මේ විවාදය කරගෙන යමු. පැය භාගයයි නේ, ලාල් කාන්ත ඇමතිතුමනි. ලාල් කාන්ත ඇමතිතුමනි, කියන්නකෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි, අපි මේ විවාදය කරගෙන ගෙන යමු. අදාළ තැනදී අපි ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අද සභාවේ වැඩ කටයුතු අවසන්වීමට නියමිතව තිබෙන්නේ කොහොමත් සවස 5.30ට නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි විවාදය ආරම්භ කරගෙන යමුකෝ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එහෙම නම් මේ සම්බන්ධයෙන් ඔබතුමා නියෝගයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, අපි කථා කරලා බලන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමා ඒක ලබාදෙයි කියලා අපි විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කථා කරන්න.

## විදේශ ණය වාරික මුදල අස්ථානගත වීම පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා නොකිරීම
## வெளிநாட்டுக் கடன் தவணைக் கொடுப்பனவு மாயமானது பற்றி பாராளுமன்றத்துக்கு அறிக்கையிடாமை
## FAILURE TO REPORT TO PARLIAMENT THE DIVERSION OF FOREIGN DEBT REPAYMENT

[අ.භා. 3.31]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ද්විපාර්ශ්වික ණය ආපසු ගෙවීමට අදාළව ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනක් අස්ථානගත වී ඇති බව වාර්තා වෙනවා. එහෙත් මෙම සිදුවීම සම්බන්ධව 2026 අප්‍රේල් මාසය වන විට ද පාර්ලිමේන්තුවට තොරතුරු වාර්තා කරලා නැහැ. මෙම වගකීම් පැහැර හැරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා පාර්ලිමේන්තුව සතුව ඇති රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලන බලය හෑල්ලුවට ලක් කර තිබෙනවා. තවද, මෙම කරුණ අනාවරණය වූ පසුව පවත්වනු ලබන පළමු පාර්ලිමේන්තු සතිය තුළ මේ සම්බන්ධව විවාදයක් හෝ ලබාදීම ආණ්ඩුව විසින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. එම නිසා මෙම සිද්ධිය තුළින් මහජන අරමුදල් කෙරෙහි පාර්ලිමේන්තුවේ වගවීම තහවුරු කිරීම සඳහා පූර්ණ විවාදයක් පැවැත්විය යුතු වෙනවා. එබැවින්, හදිසි විවාදයක් ලබාදීමට යෝජනා කරන්නෙමු" කියන කල් තැබීමේ යෝජනාව මම මේ අවස්ථාවේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මේ පිළිබඳව යෝජනාව ස්ථිර කරමින් වැඩිදුර අදහස් ප්‍රකාශ කිරීම සඳහා ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාට පළමුව අවස්ථාව දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවම වශයෙන් මිනිත්තු 15ක් වත් ලබා දෙන්න. මොකද, භාෂා 3කින් කාරණා කිහිපයක්ම කියන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 10ක කාලයක් තමයි ඔබතුමාට ලැබී තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
නැහැ, නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පැය භාගයක කාලයත් ගත්තාම වැඩිපුර කාලය තිබෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 9යි තිබෙන්නේ.

[අ.භා. 3.36]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට කාලය මදි වුණොත් මම ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා ගන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කල්තැබීමේ විවාදය සම්බන්ධයෙන් උදේ පාන්දර සිදු වුණු සාකච්ඡාවේදී ස්ථාවර නියෝගයට සම්පූර්ණයෙන් පටහැනි අර්ථ නිරූපණයක් දීම සම්බන්ධයෙන් විපක්ෂය වෙනුවෙන් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මගේ දැඩි කනස්සල්ලත්, විරෝධයත් මම මුළින්ම පළ කරන්න කැමැතියි. මම මේ ලේකම් මණ්ඩලයෙනුත් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා. ස්ථාවර නියෝග 19 යටතේ මන්ත්‍රීවරු විසිදෙනෙක් නැඟිටලා යෝජනාවක් සම්මත වන අවස්ථාවක, ස්ථාවර නියෝග 19(2)(අ) සහ (ආ) අදාළ නැත. මේක මම නැවතත් කියන්න කැමැතියි. ලිඛිතව දැනුම් දීම සහ පාර්ලිමේන්තුවේ අවසර ලබා ගැනීම අදාළ වෙන්නේ, විසිදෙනෙකු ඉල්ලා සිටින අවස්ථාවක නොවෙයි. ඒ සම්බන්ධයෙන් මුල් අවස්ථාවේදී කථානායකතුමා වැරදි අර්ථ කථනයක් දීම සම්බන්ධයෙන් අපගේ කනස්සල්ල සහ විරෝධය ඉස්සර වෙලාම ප්‍රකාශ කරන්න කැමැතියි. මේක අපි දකින්නේ, මේ පාර්ලිමේන්තුවේ සිටින රජයේ ඇමතිවරු සහ මන්ත්‍රීවරු මේ ඉතා බරපතළ සිදුවීම සම්බන්ධයෙන් ජනතාව තුළ තිබෙන උනන්දුව කොහොම හරි කාලය යැවීමෙන් අනතුරුව නැති වුණාට පස්සේ, ඒක එහෙම පිටින්ම කූල් වුණාට පස්සේ ඒ පිළිබඳ මතකය නැති කරන්න කරන උත්සාහයක් හැටියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් වෙලා තිබෙන චෝදනාව නිකම්ම නිකම් චෝදනාවක් නොවෙයි, ඒක බරපතළ අධි චෝදනාවක්. It is a damning indictment on the officers in the Ministry of Finance. I am happy to see that the two important Deputy Ministers in charge of finance are there in the front rows. Do not take me wrong, everybody has stated that this is a damning indictment on the officers who had handled this transaction; මෙය handle කරපු නිලධාරීන්ට එල්ල වී ඇති බරපතළ අධි චෝදනාවක් මේක. මම මේ පිළිබඳව කරුණු ටිකක් කියන්නම්. මම වැරදි නම් ඊට ඔබතුමන්ලාගේ ප්‍රතිචාරය මට කියන්න. පළමුවැනි එක තමයි මේ සම්පූර්ණ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් නැති වීමේ ආරම්භය, අත්තිවාරම පටන් ගන්නේ, ඒ පිළිබඳව කරන ඊමේල් පණිවුඩ හුවමාරුවේදීයි. There was a bloody, silly mistake made. ".gov.au" සහ ".com" අතර වෙනස නොදැන තමයි ඒක පටන් අරගෙන තිබෙන්නේ. Do you all not feel ashamed that the officers attached to the Ministry of Finance, who are dealing in millions of dollars, are unable to distinguish between ".com" and ".gov.au"?

අපි කී දෙනෙකුට - මම දන්නවා මෙතැන ඉන්න ඔය ගොඩක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුන්ට - කොතරම් ඊමේල් එනවාද? සමහර අපේ හිතවතුන්ගේ පාස්පෝට් ටික නැති වුණාට පස්සේ ඒ පාස්පෝට්වල තිබෙන විස්තර ටික අපට එවනවා. නැත්නම් ඒ තිබෙන ඊමේල් හරහා ඔවුන් ඇතුළු වෙලා අපට පණිවුඩයක් එවනවා; they interfere with the emails. ඒ ඊමේල් ලිපිනයම hack කරලා "මම මේ රටේ අනාථ වෙලා, මගේ පාස්පෝට් නැති වෙලා ඉන්නේ, මට මෙච්චර ඩොලර් ගණනක් එවන්න" කියලා කියනවා. එහෙම scams වෙනවා. ඔබතුමන්ලා පොඩි දරුවෙකුගෙන් ඇහුවත් දන්නවා, මේක scam එකක්, සත පහක්වත් ඒ account එකට දමන්න හොඳ නැහැ කියලා. එහෙම තිබෙද්දී මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක ප්‍රධාන නිලධාරියෙක් ".com" හරහා ලැබුණු ඊමේල් පණිවුඩයට ප්‍රතිචාරය දැක්වූවා කියන්නේ කොතරම් ඛේදනීය, කොතරම් ලජ්ජාවට පත් විය යුතු කරුණක්ද? This is not hacking; මේක hack කිරීමක් නොවෙයි. මෙතැන සම්පූර්ණයෙන්ම තිබෙන්නේ නොදැනුවත්කම; අවිද්‍යාව. මූලාමය කටයුතු, ගනුදෙනු කිරීම් පිළිබඳ හැකියාව පැත්තක තියමු. අවම වශයෙන් ඊමේල් පණිවුඩ හුවමාරු කිරීම සම්බන්ධයෙන්වත් අදක්ෂ නිලධාරීන් හිටියාද? හිටියා නම් ඒ කවුද? එහෙම නිලධාරීන් හිටියා නම්, ඔවුන් ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අනෙක් ඉහළ නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් නොවුණේ ඇයි? මේක තමයි ප්‍රශ්නය. අපි හැමෝම දන්නවා, there is something called "authentic domain". එහි තිබුණේ, "exportfinance.gov.au" කියන ඊමේල් එක. අවම වශයෙන් මේ "exportfinance.gov.au" කියන ඊමේල් ලිපිනය hack කරලා ඒ හරහා ආපු පණිවුඩයට අනුව මුදල් ලබා දී තිබුණා නම්, we could have called it hacking. නමුත්, වුණේ මොකක්ද? "exportfinance.av.com" කියන එකෙන් තමයි ඒ ඊමේල් පණිවුඩය ආවේ. ".av.com" කියන එකවත් හඳුනා ගන්න බැරි වුණා. අපේ මුදල් අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් එච්චර අදක්ෂද? ඒක තමයි ප්‍රශ්නය.

ආණ්ඩුව අද ඉන්නේ ඩිජිටල් ආර්ථිකයක් සම්බන්ධයෙන් පුරසාරම් දොඩමින්, "ඔන්න අපි ඩිජිටල් ආර්ථිකයට ප්‍රවේශ වෙන්න ලැහැස්තියි" කිය කියා මුළු ලෝකයාටම පෙන්වමින්. Authentic domain සහ fraudulent domain අතර වෙනසවත් හඳුනා ගන්න බැරි නිලධාරීන් යෙදුවේ කවුද? මුදල් ඇමතිතුමා ඒ වගකීම භාර ගන්න ඕනෑ. මම නම් කියන්නේ, මුදල් ඇමති හැටියට ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාට සම්පූර්ණ වගකීමක් තිබෙනවා කියලායි, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ සිදු වුණු වරද සම්බන්ධයෙන් කනස්සල්ල ප්‍රකාශ කරලා ජනතාවගෙන් සමාව ඉල්ලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තව වැඩිපුර මිනිත්තු 5ක් ලබා දෙන්න. එතකොට මිනිත්තු 7ක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හොඳයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක එසේ මෙසේ ප්‍රශ්නයක් නොවෙයි. I want to explain this in Tamil also. බලන්න, එක ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් දැන් මරුමුවට පත් වෙලා තිබෙනවා. ඒක හරි සංවේදී කරුණක්. අපි කැමැති නැහැ, "මේක සිය දිවි හානි කර ගැනීමක්, එහෙම නැත්නම් මිනී මැරුමක්" කිය කියා ඒ පිළිබඳව විග්‍රහ කර කර, ඒ ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ පවුලේ සාමාජිකයන්ට තව තවත් සංවේදී වෙන්න, දුක් වෙන්න කරුණු ඉදිරිපත් කරන්න. නමුත්, එක ප්‍රශ්නයක් මම අහන්න කැමැතියි. හේතු දෙකක් නිසා තමයි එම මරණය සිදු විය හැක්කේ. එකක් තමයි, ජනප්‍රිය සමාජ මාධ්‍ය ඔස්සේ දැන් වැඩිපුර පළ වෙනවා වාගේ, මරණයට ලක් වුණු ඒ මහත්මයා ළඟ යම්කිසි අබිරහස් සාක්ෂි තිබෙන නිසා ඒවා හෙළිවීම වැළැක්වීම සඳහා ඒ මරණය සිදු කළා කියන එක. එසේත් නැතිනම් තමා සිදු කරපු වරද පිළිබඳව ලජ්ජාවට පත් වෙලා සිය දිවි හානි කර ගත්තා කියන එක.

දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? මෙහිදී අපි බලන්න ඕනෑ වැදගත් කාරණයක් තිබෙනවා. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ කොහේවත් සඳහන් කරලා නැහැ, "He died due to suicide" කියලා. What was said was this. "ධමනිය කැපීම හරහා සිදු වුණු රුධිරය ගැලීම හේතු කොට ගෙන මරණය සිදු වුණා" කියලා කියා තිබෙනවා මිසක්, ඒක සිය දිවි හානි කර ගැනීමක් හෝ මිනී මැරුමක් හැටියට තීරණය කරලා නැහැ. මම කියන්නේ මේකයි. එය සිය දිවි හානි කර ගැනීමක් නම්, එතුමා තමාගේ ලජ්ජාව තමාගේ ජීවිතයට වැඩිය වටිනවා කියලා හිතලා ජීවිතය නැති කරගෙන තිබෙනවා. නමුත්, තමාගේ ඇමතිකම ලජ්ජා නැතිකමට වැඩිය විශාලයි කියලා හිතලා ඇමතිකම් තියාගෙන ඉන්න කට්ටිය මේ ආණ්ඩුවේ ඉන්නවා. අදත් තම ධුරයේ ඉන්නවා අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට විරුද්ධව හිටපු පොලිස් පරීක්ෂක හේරත් මහත්මයා සමාජ මාධ්‍යයේ විශාල statement එකක් දුන්නා. සාරාගේ මරණය සිදු වුණාය කියපු සයින්දමරුදූ සිද්ධියේදී වත්මන් ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා එදා නැගෙනහිර භාර අණ දෙන නිලධාරි හැටියට එතැනට ගියා. ඒ ගැන "නෝ කථා, නෝ සිනා". මම කියන්නේ මේ රජය එක්කෝ දැන දැන වැරැදි කරලා ලජ්ජා නැතිකමට ඔහේ ඉන්නවා. එහෙමත් නැත්නම් ඒ ඉන්න නිලධාරින් ලජ්ජාව තමාගේ ජීවිතයට වඩා විශාලයි කියලා ඉබේ මැරෙන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் முக்கியமான ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். இந்த 2.5 மில்லியன் அமெரிக்க டொலர் பணம் மக்களுக்குச் சொந்தமானது. இந்தப் பணம் ஒருசில நபர்களுடைய கவன யீனத்தால் பறிபோனதா அல்லது இவர்கள்தான் இதைக் களவு செய்தார்களா? என்ற கேள்வி மக்கள் மத்தியில் இருக்கின்றது. ‘
”I would say that that negligence, if at all, is of criminal nature; if it is negligence, at all.

நான் தமிழ் பேசும் மக்களுக்கு ஒன்றைச் சொல்ல வேண்டும். இன்று முக்கியமான ஒரு நாள்! தமிழ் நாட்டில்கூட பாரிய மாற்றங்கள் ஏற்பட்ட ஒரு நாள்! எனக்கு இவ்வேளையிலே பிரபலமான ஒரு பாடல் ஞாபகத்திற்கு வருகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I will take two more minutes.

> “ எல்லா புகழும் ஒருவன் ஒருவனுக்கே
> நீ நதி போல ஓடிக்கொண்டிரு
> எந்த வேர்வைக்கும் வெற்றிகள் வேர் வைக்குமே
> உன்னை உள்ளத்தில் ஊர் வைக்குமே”

தமிழ் நாட்டு மக்கள் இளைய தளபதி விஜய் அவர்களை உள்ளத்தில் வைத்து, ஒரு Chief Ministerஆக, தமது தளபதியாக நியமித்திருக்கிறார்கள். இந்தக் காலகட்டத்தில் எனது சகோதர பாராளுமன்ற உறுப்பினர் சாணக்கியன் ராசமாணிக்கத்தைப் பார்த்து நான் இதை அடிக்கடி சொல்வேன். ஆனால், எங்களுக்கும் இப்படியோர் இளைய தளபதி தமிழ் பேசும் மகன் ஒருவன் கிறிஸ்தவர்கள், முஸ்லிம்கள், தமிழர்கள் என்ற இன, மத பேதங்களுக்கு அப்பால் கிழக்கு மாகாணத்தில் முதலமைச்சராவதற்கு ஒரு சந்தர்ப்பத்தை இந்த அரசாங்கம் வழங்கவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I will wind up in one minute, Sir.

ஆகவே, எங்களுடைய ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் பாராளுமன்ற உறுப்பினர்கள் ஒவ்வொருவரினதும் வாழ்த்துகளை இளைய தளபதி விஜய் அவர்களுக்குத் தெரிவித்துக்கொண்டு, என்னுடைய பேச்சை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනිල් ජයන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Export Finance Australia එකට ගෙවීමට නියමිතව තිබුණු මුදලින් කොටසක් - ඩොලර් මිලියන 2.5ක් - තුන්වැනි පාර්ශ්වයකට ගියේ කොහොමද කියන කාරණය පිළිබඳව අපි දැනුවත් වූ වහාම ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග හා මැදිහත්වීම් පැහැදිලි කරමින් අපි කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා මේ සම්බන්ධ පරීක්ෂණ ගණනාවක් තවමත් සිද්ධ වෙනවා. හැබැයි, මේ තොරතුරු හරියට ඉදිරිපත් කරන්නේ නැතිව, වැරැදි තොරතුරු ඉදිරිපත් කරමින්, නොමඟ යවන තොරතුරු ඉදිරිපත් කරමින් සමාජය තුළ විශාල ප්‍රශ්නයක් නිර්මාණය කරලා තිබෙනවා. අද

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

විවාදයට බඳුන් කරන්නේත් මේ කාරණයයි. ඒ නිසා අපට වඩාත් වැදගත් වන්නේ, මොකක්ද මේ සිද්ධ වුණේ කියන කාරණයයි. අපට දැනට ඉදිරිපත් කරන්න තිබෙන්නේ, මේ වනවිට හෙළිදරව් වෙලා තිබෙන තොරතුරු විතරයි. ඒ තොරතුරු අතර සංකීර්ණතා තිබෙනවා. එකට එක ගැළපීම් තිබෙනවා. ආයතන ගණනාවක් මේකට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මම සැකෙවින් ඉදිරිපත් කරන්නම්, මොකක්ද මේ සිද්ධිය, මෙවැනි මුදලක් එළියට ගියා කියලා දැනුවත් වුණේ කොහොමද කියන කාරණා.

ඇත්ත වශයෙන්ම මෙය මතුකර ගැනීමට අදාළ ප්‍රධාන ණය ගෙවීම් දෙකක් සම්බන්ධ වෙනවා. Export Finance Australia එකට ගෙවපු ඩොලර් මිලියන 2.5ක මුදල එකක්. ඒ වාගේම ඒ ගෙවීම සම්බන්ධයෙන් ඊමේල් පණිවුඩවලට මැදිහත්වීම සිද්ධ කිරීමට පාදක වෙන්නේ ඉන්දියානු EXIM Bank එක. ඒ, අනෙක් එක. මම දින වකවානු සහිතව කියන්නම්. අපි ඇත්තටම කථා වෙන්නේ ඩොලර් මිලියන 2.5 ගැන නේ. මේක වෙන්නේ මෙහෙමයි. අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීමකට යනවා. විශේෂයෙන්ම ද්වි පාර්ශ්විය ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී රටවල් විශාල ප්‍රමාණයක් එක්ක සම්බන්ධ වෙනවා. Export Finance Australia එකට තිබෙන ණය ප්‍රතිව්‍යුහගතකරණය කරලා අපි ඒවා ගෙවන්නේ කොහොමද, දින වකවානු ඇතුළත්ව ගෙවන ප්‍රමාණය, ඒවාට තිබෙන කොන්දේසි, debt covenants and obligations, මොන මොන ගිණුම්වලටද ගෙවන්න ඕනෑ කියන සියලු කාරණා ඇතුළත් කරන ලද ණය ගිවිසුමක් අත්සන් කරනවා. ඒ ණය ගිවිසුම 2025 ඔක්තෝබර් මස 27වැනි දා, මුදල් අමාත්‍යාංශයේ External Resources Department - ERD - එකේ සම්බන්ධීකරණ කටයුතු කරපු රංග රාජපක්ෂ නිලධාරියා විසින් අදාළ අංශයට යවනවා. දැන් ඒ නිලධාරියා අවාසනාවන්ත විධියට මිය ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම එක එක රටවල් එක්ක කරන ගනුදෙනු භාරව එක් නිලධාරියෙක් ඉන්නවා. Export Finance Australia එකේ කටයුතු සම්බන්ධව භාරව ඉන්නේ මේ රංග. ඔහු අදාළ ගිවිසුම යවලා තිබෙනවා. ඊට පස්සේ නොවැම්බර් 10වැනි දා පිළිතුරක් ලැබෙනවා, ඒ අදාළ ඉයන් ගේට්ස්, - කලින් සඳහන් කළා වාගේ ඊමේල් එකේ තිබෙන්නේ dots ද, වෙනත් මොනවාද කියන ඒවා පිළිබඳව පරීක්ෂණ කරමින් පවතිනවා. නිලධාරියා ගිවිසුම ලබා දෙනවා. ඒකට පිළිතුරු ලැබෙනවා. ණය ගෙවන්න ඕනෑ කියලා දැනුවත් කළාම ඔහුට පිළිතුරු විධියට invoices ප්‍රමාණයක් එවනවා. මේ අය දවසක් දෙකක් වැඩ කරපු අය නොවෙයි, මේ සම්බන්ධව දීර්ඝ කාලීනව වැඩ කරපු අය. සාමාන්‍යයෙන් අතීතයේදී අදාළ ඉන්වොයිසිය External Resources Department එකෙන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට - Public Debt Management Office එකට - යවනවා. ඊට පස්සේ ඒක මහ බැංකුවට යනවා. ඊට පසු තුන්වැනි පාර්ශ්වය ලබා දී තිබෙන ගිණුම් හරහා මහ බැංකුවෙන් ගෙවීම් සිද්ධ කරමින් යනවා. ඒ අනුව තමයි නොවැම්බර් මාසයේදී සහ ජනවාරි මාසයේදී මේ ගෙවීම් සිද්ධ වෙන්නේ, ඩොලර් මිලියන 2.5ක. ඒවා සිදුවුණු ආකාරයේ ගැටලු තිබෙනවාද කියලා තමයි දැන් පරීක්ෂණ කරගෙන යන්නේ. කියනවා නේ, දහ වතාවක් ගෙව්වා කියලා. දහ වතාවක් ගෙව්වාට වඩා, වවුචර් 10ක් ගෙවීම තමයි සිද්ධ වෙන්නේ මේ ක්‍රියාවලිය ඇතුළේ. ඒක තමයි සිද්ධ වෙලා තිබුණු ඩොලර් මිලියන 2.5ක ගනුදෙනුව.

ඊට පස්සේ ඉන්දියානු EXIM Bank එක,- *[බාධා කිරීමක්]* ඔව්, මම පැහැදිලි කළේ නැහැ. මේ තිබෙන්නේ invoices. ඒ කියන්නේ ණය ගිවිසුමේ ආකාරයට, debt amortization schedule එකට අනුව, අපි ගෙවන්න තිබෙන invoices. පළමුවන sets දෙක තමයි මේ යන්නේ. ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙනවා. දැන් ඒක ගිහිල්ලා ගෙවිලා ඉවරයි. ඒක වාර්තා වෙලා නැහැ, වැඩ කරපු අයත් දන්නේ නැහැ කියන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

අපි සැලකිල්ලට භාජන කරන්න ඕනෑ දෙවැනි කාරණය මේකයි. ඉන්දියානු EXIM Bank එකටත් මේ හා සමානව ද්විපාර්ශ්වික ණය ගෙවීමක් තිබෙනවා. එය සම්බන්ධීකරණය කරන්නේ වෙනත් නිලධාරිනියක්. රංග නොවෙයි, වෙනත් නිලධාරිනියක්. එයාට මේ විධියටම මේ invoices එනවා. එතකොට ඒ තාක්ෂණය දන්නා අය සැක මත පරීක්ෂණ කරලා ඒ ගැන හොයාගෙන, බලාගෙන යාවි, කොහොමද ඒවා සිද්ධ වුණේ කියන එක. ඒ නිලධාරිනියත් ඒගොල්ලන් කලින් භාවිත කරපු ක්‍රමය භාවිත කරගෙන ඒ වවුචර් ඊළඟ අංශයට - ණය කළමනාකරණ අංශයටත්, මහ බැංකුවටත්, ගෙවීම් අංශයටත් - මාරු කරගෙන යනවා. හැබැයි එතැනදී විශේෂත්වයක් පැන නැඟෙනවා. එතැනදී කිහිප දෙනෙක් මෙතැනට සම්බන්ධ වෙනවා; ඊමේල් කීපයක් එනවා. ඒ වාගේම දුරකථන ඇමතුමක් ලැබී තිබෙනවා කියලාත් වාර්තා වෙලා තිබෙනවා. ඒ අතරතුරේදී මේ නිලධාරිනියට දකින්න ලැබෙනවා සුවිශේෂී තත්ත්වයක්. ඒ තමයි එක ඊමේල් එකක එක අකුරක් වෙනස් වෙලා තිබෙනවා. "Bank" කියලා ලියනවා වෙනුවට "Benk" කියලා ලියවෙනවා. එතැනදී එයා සැක මතු කරගන්නවා මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. ඒත් මොකක්ද කියලා දන්නේ නැහැ. එකම මාතෘකාව යටතේ තමයි ඊමේල් හුවමාරු වෙන්නේ. ඒ අනුව මේ දැනුවත් කිරීම් කරනවා. ඒ දැනුවත් කිරීම් කරලා අදාළ ඉන්දියානු EXIM Bank එකේ කණ්ඩායම් - නිවැරදි පාර්ශ්ව - දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කරගෙන අදාළ ණය නියමිත දිනයට ගෙවනවා. ඒ විතරක් නොවෙයි. ඉන්දියාවට ගෙවන්නට ගිය ගෙවීම නවත්වනවා, stop කර ගන්නවා. එතැනදී තමයි මේක trigger වෙන්නේ. එතැනදී වෙන්නේ ගෙවීමක් එළියට ගිය එකක් නොවෙයි. කවුරු හෝ මෙතැනට ගන්න උත්සාහයක් දරනවා. ඒ වෙනත් නිලධාරිනියක් නේ. ඇය දන්නේ නැහැ රංග ඕස්ට්‍රේලියාවත් එක්ක කරපු ගනුදෙනුව පිළිබඳව. ඒ පිළිබඳව immediately වාර්තා කරනවා SLCERT - Sri Lanka Computer Emergency Readiness Team - එකට. ඒ අනුව රැස්වීම් ගණනාවක් පවත්වා තිබෙනවා. දිගින් දිගටම රැස්වීම් පවත්වා තිබෙනවා, ERD එක, ඒ වාගේම Department of Information Technology Management. ඒ වාගේම පොලිසියේ තිබෙන සයිබර් අපරාධ අංශයත් එක්ක සාකච්ඡා කරගෙන මේ පරීක්ෂණ කරගෙන යමින් තිබෙනවා.

e-mail සම්බන්ධ කරගෙන මෙහෙම දෙයක් වෙලා තිබෙනවා කියලා අපට දැනගන්න ලැබුණාම, අතීතයේදී කරපු ගනුදෙනුත් එහෙම වෙලාද කියන පරීක්ෂණයට යනවා. ඒ පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂණ යනවා. ඒ පිළිබඳ සාකච්ඡා යනවා. අන්න එවැනි පරීක්ෂණයකදී තමයි හෙළිදරව් වෙන්නේ ඕස්ට්‍රේලියාවට ගෙවපු එක ගැන. ඕස්ට්‍රේලියාවට ගෙවපු මුදලට එහෙම වෙලා කියලා හෙළිදරව් වෙනවා. ඕස්ට්‍රේලියාවේ තානාපති කාර්යාලය හරහා දැනගන්න ලැබෙනවා ඒ ඩොලර් මිලියන 2.5ක මුදල ගෙවිලා නැහැ කියලා. එතැන සිද්ධ වෙන්නේ, ඔක්තෝබර් 27වැනි දා ලබා දුන්නු ගිවිසුමට අනුව නොවැම්බර් 10වැනි දා, 12වැනි දා හුවමාරු කරන ලද ඊමේල් හරහා ඒ වවුචර් process වෙලා ගිහින් තිබෙන එක. ඒ එක payment එකක් නොවැම්බර් මාසයේ සිද්ධ වෙලා තිබෙනවා. තව payment එකක් ජනවාරි මාසයේ මුල සිද්ධ වෙලා තිබෙනවා. ඒක තමයි දන්නේ නැතිව හිටියේ. ඒක හොයා ගන්නේ ඇත්තටම මාර්තු 22වැනි දා. මාර්තු මාසයේ තමයි හොයා ගන්නේ. එය හොයා ගත්තු වහාම SLCERT එක දැනුවත් කරනවා, පරීක්ෂණ පවත්වන්න. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව - CID එක - දැනුවත් කරනවා. ඒ කටයුතු එහෙම කරගෙන යනවා. ඒත් එක්කම, එදිනම - 24වැනි දාම - නියෝජ්‍ය භාණ්ඩාගාර

ලේකම්වරු දෙදෙනෙකුත්, තවත් නිලධාරින් තුන්දෙනෙකුත් සහිතව නිලධාරින් පස්දෙනෙකුගෙන් යුතු තාක්ෂණික කමිටුවක් මුදල් අමාත්‍යාංශයෙන් පත් කරනවා, මොකක්ද සිද්ධ වුණේ කියලා සොයන්න. ඒ සාකච්ඡා කරපු නිලධාරින්ගේ සටහන් වාර්තා කර ගෙන තිබෙනවා. ඔවුන් නිගමනයක් කරනවා ගත යුතු ක්‍රියාමාර්ග ගන්න කියලා. *[බාධා කිරීමක්]* පසුව මතු කරන්නකෝ ඔබතුමාගේ ප්‍රශ්නය. මම මේ කථාව පැහැදිලි කරලා ඉන්නම්.

අදාළ පරීක්ෂණයේ ප්‍රතිඵල මත, එයින් අනාවරණ වූ කරුණු මත රංග කියන නිලධාරියාත් තවත් නිලධාරින් හතර පස් දෙනෙකුත් ගනුදෙනු කර තිබෙන බව තහවුරු වුණා. ඉන් එක්කෙනෙක් ප්‍රසූත නිවාඩු ගිහිල්ලා තිබෙනවා. ඇයගේ ඊමේල් එක පවා පාවිච්චි කර තිබෙනවා, මේ ගනුදෙනුව හරහා. දැනට හෙළිදරව් වෙලා තිබෙන තොරතුරු මත ඒ නිලධාරිනිය ඒ ඊමේල් එක පාවිච්චි කරලා නැහැ. නමුත්, මේ ගනුදෙනුවට සම්බන්ධ වෙච්ච පාර්ශ්වයක ඒ ඊමේල් එකත් ඇතුළත් වෙලා තිබෙනවා. ඒ අනුව, අර අභ්‍යන්තර පරීක්ෂණයෙන් හෙළිදරව් වෙච්ච තොරතුරු මත තීන්දුවක් ගන්නවා අප්‍රේල් 10වැනි දා. ඒ තමයි, ඒ පරීක්ෂණ කටයුතු සිදු කර ගැනීමට පහසු වීම සඳහා ඒ නිලධාරින් හතරදෙනා වෙනත් ස්ථානයකට මාරු කරන එක. මුදල් අමාත්‍යාංශය සාකච්ඡා කරලා, මේ පරීක්ෂණවල ස්වභාවය සහ අලුතින් වාර්තා වෙච්ච තොරතුරු මත තමයි ඒ අය වැඩ තහනමකට ලක් කරන්නේ, 17වැනි දා. ඒ ආකාරයට තමයි මේ කටයුතුවල මූලික සිදුවීම සිද්ධ වෙන්නේ. මෙහි අවසානයක් තවම නැහැ. තොරතුරු, පරීක්ෂණ දිගින් දිගටම යනවා. අපට වගකීමක් තිබෙනවා. අපි වාර්තා කළ යුතු වන්නේ මේ අදාළ පරීක්ෂණ හරහා හරියටම මේ ගැන දැන ගත්තාට පස්සේ. එහෙම නැතුව නිරන්තරයෙන් අර්ධ තොරතුරු, වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමත් මේ පරීක්ෂණවලට ගැටලුවක් වෙනවා වාගේම මහ ජනතාවත් නොමඟ යවනවා.

විශේෂයෙන්ම මේ තිබෙන චෝදනා ඇතුළත සමාජයේ මතයක් හැදුවා, අවාසනාවන්ත විධියට මියගිය නිලධාරියා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළාය කියලා. ඔහු පැමිණිලි කරලා නැහැ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තමයි පැමිණිලි කරලා තිබෙන්නේ. ඒ නිසා මෙවැනි තත්ත්වයකදී වඩාත් වැදගත් වෙන්නේ ඒ පරීක්ෂණ, අදාළ කටයුතු විශේෂයෙන් නීති අංශය කරගෙන යන කටයුතු ඔවුන්ට කරගෙන යන්න **ඉඩ දෙන එකයි.** ඒ තොරතුරු මත තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ වාගේම මතක තබාගත යුතු කාරණය තමයි, අපගේ ආණ්ඩුව යටතේ මේක දැනගත් වහාම දින දෙකෙන් අපි පරීක්ෂණ පටන් ගත්තා කියන එක. හැබැයි, ඔබතුමන්ලාගේ අතීතයට ගිහිල්ලා බලපුවාම, සිදු වූ සමහර ඩොලර් ගනුදෙනු ගැන ඔබතුමන්ලා ප්‍රශ්න කරගත යුතු වෙනවා. පොහොර නැව්වලට ගෙවපුවා, කිරි හරක් ආනයනය වාගේ දේවල් අරගෙන බලපුවාම මේ විධියට ඩොලර් විශාල ප්‍රමාණයක් හානි වෙලා තිබෙනවා. වසර ගණනාවකින් පරීක්ෂණ සිද්ධ කරලා නැහැ. හැබැයි, ඒ පරීක්ෂණත් දැන් සිදු වෙමින් යනවා. එතකොට මේකේ යම් කෙනෙක් අපරාධ කරලා තිබෙනවා නම්, වංචා කරලා තිබෙනවා නම්, දූෂණ කරලා තිබෙනවා නම්, අපේ ආණ්ඩුව යටතේ අනිවාර්යයෙන් මේ පරීක්ෂණ සිද්ධ වෙනවා. ඒ ගැන කිසිදු සැකයක් තියා ගන්න එපා. ඒ අනුව තමයි දැන ගත් වහාම CID එක හරහා මේ පරීක්ෂණයත් දින දෙකක් ඇතුළත සිද්ධ කරන්න අපි මැදිහත් වෙලා තිබෙන්නේ. ඉතින්, දැනට තිබෙන පරීක්ෂණවල තොරතුරු සම්බන්ධයෙන් මෙවැනි තත්ත්වයක් තමයි අපට ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්නේ. මම අර කලින් සඳහන් කරපු අභ්‍යන්තර පරීක්ෂණයට අමතරව තවදුරටත් මේ තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් සොයා බලන්න අවශ්‍යයි. මොකද, මේක තාක්ෂණය සම්බන්ධව ගැට ගැහිලා තිබෙන එකක් නිසා.

දැන් මම ඉදිරිපත් කළේ මේ තිබෙන තොරතුරුවල සාරාංශයක් පමණයි. එතකොට අපට එකවර නිගමනයකට එන්න බැහැ, ඇත්තටම මේ නිලධාරිනුත් මේ ගනුදෙනුවට සම්බන්ධ වුණාද, ඔවුන් දැනුවත්භාවයෙන් මෙතැන වංචාවක් කළාද, එහෙමත් නැත්නම් තාක්ෂණිකමය ගැටලුවක් නිසා එතැනට හැකර්වරුන් විසින් මැදිහත් වෙලා කරපු එකක්ද, එහෙමත් නැත්නම් වෙනත් කවුරු හෝ තුන්වෙනි පාර්ශ්වයක් මේකට උදවු කළාද කියලා. මේක විවිධ විධියට වෙන්න පුළුවන්. ඒ නිසා අපේ වගකීම තමයි අන්න ඒ තාක්ෂණික පැත්ත ගැනත් තව හොයන එක. ඒ නිසා කොළඹ විශ්වවිද්‍යාලයත්, අදාළ ක්ෂේත්‍රයේ සිටින විද්වතුනුත් සම්බන්ධ වෙලා තවත් පරීක්ෂණයක් ඉදිරියට ඇදෙමින් යනවා. ඒ පරීක්ෂණවල ප්‍රතිඵලත් මෙතැනට ඉදිරිපත් කර ගන්න පුළුවන්. ඉතින්, විපක්ෂය හෝ කවුරු හෝ මෙවැනි අවස්ථාවකදී, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ කාරණයකදී කරුණු ඉදිරිපත් කළ යුතු වන්නේ; මත දැක්විය යුතු වන්නේ ඉතාම වගකීම් සහගතව ඇත්ත තොරතුරු මත පදනම් කරගෙන මිසක් උපකල්පන මත හෝ වෙනත් වෙනත් නිගමනයන් මත නොවෙයි. එම මරණය සම්බන්ධයෙන් පවා ඉතාම හාස්‍ය විධියටත්, නරක විධියටත් නිගමනවලට එමින් තිබෙනවා, මම දකිනවා.

අපි කවුරුත් දන්නවා, මෙවැනි වංචා, දූෂණ පිළිබඳව ප්‍රශ්න පැන නඟිනකොට වඩාත් ලෙහෙසි උපක්‍රමයක් විධියට ආණ්ඩුවට මේ වාගේ චෝදනා; බොරු චෝදනා ඉදිරිපත් කරන්න පුළුවන් බව. එවැනි චෝදනා ගණනාවක් ඉදිරිපත් කරනවා. මේ වෙනකොට ශ්‍රී ලංකා රක්ෂණ සමාගම බැඳුම්කර වංචාවක් කරලා කියලාත් චෝදනාවක් එනවා. එය සම්පූර්ණ අසත්‍යයක්. වැරදි කරුණු. අපේ ආණ්ඩුවේ එකදු මන්ත්‍රීවරයකු හෝ මේ ආකාරයට තොරතුරු දීලා, කාටහරි බලපෑම් කරලා මේ විධියට කරන්න කිව්වා කියලා කාට හෝ පුළුවන්කමක් තිබෙනවා නම් පැහැදිලිව කියන්න. අන්න ඒක තමයි නිවැරදි තොරතුර. මොකද, මහ බැංකු බැඳුම්කර වංචාව සිද්ධ වුණේ කොහොමද කියලා අපි දන්නවා. ඒ අදාළ ලංසු තැබීම සිද්ධ කළේ කොහොමද කියලා අපි දන්නවා. ඒක වැඩි කර ගත්ත හැටි, තොරතුරු හුවමාරු වෙච්ච හැටි අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ ගිහිල්ලා, විගණන වාර්තා, forensic audits තිබෙනවා. මෙන්න මෙතැනත් බැඳුම්කර වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා කියලා ඉතාම වැරදි බොරු ප්‍රවෘත්තියක් මවන්න උත්සාහයක් දරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හරියට අධ්‍යයනය කරලා බලන්න. මෙහි කිසිදු වංචාවක් සිද්ධ වෙලා නැහැ. අදාළ වෙන්දේසිය නිසි ආකාරයට සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම VAT එක සම්බන්ධයෙනුත්; එය වැඩි කරලා කියලා ප්‍රකාශ කළා. ඒවා බොරු දේවල්.

ඒ වාගේම මේ හා ගැට ගැහිච්ච තව එක කාරණයක් තිබෙනවා. අපි මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී විවිධ ණය ගෙවීම් කරගෙන යනවා.

සමහර වෙලාවට මේ කණ්ඩායම් එකකට එකක් සම්බන්ධ ද කියලාත් සැකයත් මතු වෙනවා. මොකද, මේ අපරාධකරුවන් බේරා ගැනීම සඳහා **පුවත්පත්වලටත් විවිධ ප්‍රකාශයන් කරනවා.** මේ ණය ගෙවීම සම්බන්ධව ප්‍රංශයේ ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ගිවිසුම් ටික අස්ථානගත වෙලා කියලා කිව්වා. අමූලික බොරුවක්. ඒවායේ කිසිදු ගැටලුවක් සිද්ධ වෙලා නැහැ. හැබැයි, ප්‍රශ්නය වෙන්නේ එවැනි ප්‍රවෘත්තියක් ගිය ගමන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ ප්‍රවෘත්තිය අරගෙන, 'මෙන්න අස්ථානගත වෙලා' යනුවෙන් කියනවා. වඩාත් වැදගත් වෙන්නේ තොරතුර හොයන්න, ඇත්ත තොරතුර ඉදිරිපත් කරලා කරුණු සාකච්ඡා කරන්න. ඔබට පුළුවන්, ඒ තොරතුරු අදාළ පරීක්ෂණ අංශවලට ලබා දෙන්න.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ නිසා අපි හැම කෙනෙකුගේම වගකීම වෙන්නේ වංචාව, දූෂණය වැනි දේවල් නවත්වමින්, යහපත් පාලනයක්, යහපත් ආණ්ඩුකරණයක් පවත්වා ගෙන යෑම කියලා මේ මොහොතේදී මා වඩාත් වගකීමෙන් යෝජනා කරනවා. ඒ සඳහා අපේ ආණ්ඩුව අනිවාර්යයෙන්ම කැප වී සිටිනවා. මේ ඕනෑම තත්ත්වයක් යටතේ සිදු වන පරීක්ෂණ අපි පවත්වනවා. අදාළ වැරැදිකරුවන් කවුරු වුණත්, ඒ අයට දඬුවම් ලබා දීමට නීතිය ක්‍රියාත්මක කිරීමට අපි සහයෝගය ලබා දෙනවා. මේ ආණ්ඩුවේ ඒවාට විතරක් නොවෙයි, කලින් ඔබතුමන්ලා කරපු කටයුතුවලටත් අපි මැදිහත් වෙනවා. ඒ නිසා සමාජය නොමඟ යැවීම, බොරු කීම නතර කරන්න, වඩාත් විද්වත් සාකච්ඡාවකට මහපාදන්න කියලා යෝජනා කරනවා. ඒ නිසා මෙතැනදී ආණ්ඩුව වංචාවක් කළාය කියන එක සම්පූර්ණයෙන්ම බැහැර කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 4.04]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු හැටියට ඉතා වගකීමෙන් කියනවා මෙතැන දැවැන්ත හොරකමක් සිදු වෙලා තිබෙනවා කියලා. දැවැන්ත වංචාවක්, දැවැන්ත හොරකමක් සිදු වෙලා තිබෙනවා. රටේ ජනතාවගේ මුදල් ඩොලර් ලක්ෂ 25කට දැන් වෙච්ච දෙයක් නැහැ. ඉතා පැහැදිලිවම මේ රටේ ජනතාවට බදු ගහලා තමයි මේ ඩොලර් ලක්ෂ 25ක මුදල අන්තිමට අය කර ගන්න වෙන්නේ. එහෙම නැත්නම් පැලවත්තෙන්වත්, මෙතැන ඉන්න 159දෙනාවත් මේ මුදල් ගෙවන්නේ නැහැ. මේක වහගන්න උපරිම උත්සාහයක යෙදුණා. මේක වහගන්න උපරිම උත්සාහයක යෙදුණා කියන්න හොඳම උදාහරණය තමයි, අදත් මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ අපට මේ විවාදය බලෙන් ගන්න වුණ එක. අපි පක්ෂ නායක රැස්වීමේදී ඔබතුමන්ලාගෙන් ඒ පිළිබඳව ඉල්ලීමක් කළා. හැබැයි, අවස්ථාව ලබා දුන්නේ නැහැ. අපි විපක්ෂය හැටියට ස්ථාවර නියෝග උපයෝගී කරගෙන මේ අවස්ථාව ගන්න කොට, කථානායකතුමා ඒකටත් ඉඩදෙන්නේ නැතුව ඉන්න තමයි හැදුවේ. අපි දන්නේ නැහැ, කථානායකතුමා පුටුව මාරු කරගෙනද කියලා. මොකද, කථානායකතුමා හැම වෙලාවේම බිමල් රත්නායක සභානායකතුමාගේ මුහුණ බලලා තමයි තීන්දු තීරණ ගන්නේ. සභානායක, බිමල් රත්නායක මැතිතුමා නැඟිටලා කිව්වාම අවස්ථාවක් දෙනවා කියලා, අර හෝ හෝ කියපු කථානායකතුමා මේ විවාදය ලබා දෙන්න කටයුතු කළා. එතැනදීත් විවාදයට පැය දෙකක් දෙනවා කියලා ඉස්සෙල්ලා කිව්වා. ඊට පස්සේ බිමල් රත්නායක ඇමතිතුමා පැය එකහමාරක් කිව්වාම, පැය දෙක පැය එකහමාර කළා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, කරුණාකරලා මේ පුටු දෙක මාරු කරන්න. කරුණාකරලා, බිමල් රත්නායක මැතිතුමා කථානායක කරලා, අපේ doctorව වෙන තැනක තියන්න. මොකද, ඇත්තටම බිමල් රත්නායක මැතිතුමා තමයි කථානායක කාර්යභාරය කරන්නේ. එතුමා තමයි විවාදය පැය භාගයක් කලින් ඉවර කරන එක ගැනත් කථානායකතුමාට නියෝගය දුන්නේ. මෙහෙම පාර්ලිමේන්තුවක මම මේ හිටියාමයි. ඒ කියන්නේ කථානායකතුමාට නියෝග දෙන්නේ සභානායකතුමා. ලජ්ජයි!

කෙසේ වෙතත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කණ්ඩායම අපි කැඳෙව්වා. බොහොම අමාරුවෙන් තමයි ඒකටත් එතුමා කැඳවා ගත්තේ. ඒකටත් එන්නේ නැතුව ඉන්න උපරිම උත්සාහයක යෙදුණා. අපි මීට කලින් කැඳවපු රැස්වීම් තුනකට පැමිණීමට ඒ අය ක්‍රියා කළේ නැහැ. හැබැයි මේ අවස්ථාවට ආවා, සමාජයේ වෙච්ච ලොකු බලපෑමක් එක්ක. මෙතැනදී ඉතා පැහැදිලිවම අපි දකින අඩුපාඩු, කාරණා ගණනාවක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට මේ සිදුවීම ගැන දැනුවත් කරන්න තිබුණා. ඒ වාගේ අවස්ථා ගණනාවක් තිබුණා. 2025 අවසාන කාර්තුවේ ඉඳලා ජනවාරි මාසය දක්වා වෙච්ච මේ අක්‍රමිකතාව පිළිබඳව පාර්ලිමේන්තුව හෝ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව දැනුවත් කළේ නැහැ. එතකොට ඒ සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමාටත්, මුදල් ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමාටත් වගකීමක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව තමයි මූල්‍ය කටයුතු පිළිබඳව වගකියන ප්‍රධාන ආයතනය. අපි එතකොට ඒ අවස්ථාව සලසනවා. පිට කවුරුත් නැතුව, ඒ කාරක සභාවේ කටයුතු මාධ්‍යයට හෙළි කරන්නේ නැතුව, යම් යම් සංවේදී කාරණා පිළිබඳව අපි සාකච්ඡා කරනවා. ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. නමුත් මේක හංගන්න මේ පිළිබඳව දැනුවත් නොකිරීම දැවැන්ත වැරැද්දක්. එම නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, මේකට මේ සියලු අය වග කියන්න ඕනෑ බව. මුදල් ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් කියන මේ සියලුදෙනා මේකට වග කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මෙහි තිබෙන බරපතළකම තමයි, මේ transactions යනකොට, මේ පිළිබඳව red flags emerge වෙලා තිබීම. ඒ කියන්නේ යම් සැක කටයුතු දෙයක් සිදු වනවා කියා ප්‍රකාශ කර තිබියදීත් මේක වළක්වා ගන්න නොහැකි වෙලා තිබෙනවා. එතකොට එවැනි red flags emerge වෙලා තිබෙනකොට, සැක කටයුතු තත්ත්වයක් තිබෙනවා කියා දැනුවත් වෙලා තිබියදීත් එම කටයුතු එහෙමම සිදු වනවා නම් ඒක බරපතළ කාරණාවක්.

ඒ විතරක් නොවෙයි. මූල්‍යමය කටයුතුවලදී මුදල් රෙගුලාසි කියා දෙයක් තිබෙනවා. නමුත් මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් සහ ලේකම්තුමා කථා කරන්නේ එම මුදල් රෙගුලාසි මුදල් අමාත්‍යාංශයට අදාළ නැහැ වාගේයි. මුදල් රෙගුලාසිවලට - Financial Regulationsවලට- අනුකූලව නොවෙයි, මේ හැම කටයුත්තක්ම වෙලා තිබෙන්නේ. කොටින්ම කිව්වොත්, ආණ්ඩු පක්ෂය උත්සාහ කළා, මේ පිළිබඳව සාකච්ඡාවක් කිරීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වගකීමක් නොවෙයි කියන්න. එහෙමත් උත්සාහ කළා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා තර්ක විතර්ක කරන්න පටන් ගත්තා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කැඳවීම පිළිබඳවත්. මෙතුමන්ලා උත්සාහ කරනවා, මෙතැන කිසිම දෙයක් සිදු වෙලා නැහැ, කිසිම වැරැද්දක් සිදු වෙලා නැහැ, අකටයුත්තක් නොවෙයි සිදු වුණේ, මේ වුණේ පොඩි අත්වැරදීමක්ය කියලා පුළුවන් තරම් මේක whitewash කරන්න. හැබැයි, මේ අත්වැරදීම එසේ මෙසේ පොඩි ගණනක එකකුත් නොවෙයි, ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක්. ඒ ඩොලර් ලක්ෂ 25 කවුද ගෙවන්නේ? කාගෙන්ද අය කරන්නේ? මම කැට තියලා කියනවා, මේ ඩොලර් ලක්ෂ 25 හොරකම් කරපු කාගෙන්වත් නම් ගන්න හම්බ වෙන්නේ නැහැ කියන එක. ඒවා ගන්න වෙන්නේ මේ රටේ අහිංසක ජනතාවගෙන් අය කරන බදු තවත් ටිකක් වැඩි කරලා තමයි. තව බදු වැඩි කරලා තමයි අන්තිමට මේ දැවැන්ත හොරකමේ පාඩුව ගෙවන්න වෙන්නේ. එම නිසා අපි ඉතාම ඕනෑකමින් කියනවා, මේ කාරණය වසා ගැනීම සඳහා මේ ආණ්ඩු පක්ෂයට පුදුම වුවමනාවක් තිබෙන බව. එතකොට අපට සාධාරණ සැකයක් මතු වනවා නේද, මේ මරණය පිළිබඳව? සාධාරණ සැකයක් මතු වනවා.

මේ මරණය සිය දිවි නසා ගැනීමක් කියනවා. අපි ඉතාම කනගාටු වනවා ඒ සිදුවීම ගැන. ඔහුගේ පවුලේ අයට අපේ ශෝකය ප්‍රකාශ කරනවා. හැබැයි මේ පිළිබඳව සැකයක්, ගැටලුවක් තිබෙනවා. අපි නොවෙයි, එතුමාගේ බිරිඳ කියන්නේ සැක කටයුත්තක් තිබෙනවා කියන එක. මේ මරණය පිළිබඳව සැකයක් තිබෙනවා කියන එකයි ඇය කියන්නේ. මෙම මරණය පිළිබඳව අපි හැමෝටම සාධාරණ සැකයක් තිබෙනවා. මොකද, සිය දිවි නසා ගැනීම් නම් අපි දැක තිබෙනවා, අසා තිබෙනවා. අපි ඒ මරණ ගෙවල්වලට ගිහිල්ලාත් තිබෙනවා. හැබැයි, මේ විධියේ සිය දිවි නසා ගැනීමක් පිළිබඳව හරිම කලාතුරකින් තමයි අහන්න ලැබෙන්නේ.

ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය දිහා බලනකොට, මරණයක්, දෙකක් කියන එක සාමාන්‍ය දෙයක්. එහෙම නේද? 1988-89 කාලයේ මෙහෙමද මැරුවේ? 1988-89 කාලයේ මරපු විධියට මේක මොකක්ද? ඒක නිසා ඒ ගමනමද මේ යන්නේ කියන සාධාරණ සැකය මේ රටේ ජනතාවට තිබෙනවා. අපි හැමෝටම එවැනි සැකයක් තිබෙනවා. ඒ ගැන විවාදයක් නැහැ. මොකද අපටත් මතකයි, එක රැයින් නඩු විසඳපු ආකාරය. එහෙම නේද ලාල් කාන්ත ඇමතිතුමා? තමුන්නාන්සේලා ඒ දවස්වල ගමට බලය ගෙනාවා වාගේ මේ දවස්වලත් අධිකරණ බලය ගමට, කුලියාපිටියට ගෙනාවාද කියලා අපි දන්නේ නැහැ. එම නිසා අපට සාධාරණ සැකයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු මන්ත්‍රීතුමනි, 60,000ක් මැරුවා මතකද, ප්‍රේමදාස කියලා ජනාධිපති කෙනෙක් ඉන්න කාලයේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, එහි point එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්න තව විනාඩියක් මට ලබා දෙන්න.

සමාවෙන්න, මේ මරණය පිළිබඳව විවාද කරනකොට 60,000ක් කොහෙන්ද මැරුවේ, කවුද මැරුවේ කියන එක ගැන අපි වෙනම විවාදයක් ගනිමු. ඒ සිද්ධියේදී රාජ්‍ය සම්පත් විනාශ වුණේ කොහොමද, බස් ගිනි තැබුවේ කොහොමද කියලා කථා කරන්න පුළුවන් නම් අපි වෙනම විවාදයක් ගනිමු. අපි යෝජනා කරනවා, ඒ පිළිබඳව කථා කරන්න තව විවාදයක් ගනිමු කියලා. මොකද, ලාල් කාන්ත ඇමතිතුමාත් කියලා තිබෙනවා නේ, ප්‍රසිද්ධියේ කරපු කෙරුවාවල් පිළිබඳව. තමුන්නාන්සේත් කියලා තිබෙනවා නේ, "ට්‍රාන්ස්ෆෝමර් ගිනි තිබ්බා, ඔව් අපි කළා, මිනී මැරුවා, බස් ගිනි තිබ්බා" කියලා. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන විවාදයකට යන්න එපා, කථාව අවසන් කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
අපි ඉල්ලීමක් කරනවා, ඉතුරු පැය භාගයේ අපට ඒ පිළිබඳ විවාදයක් ලබා දෙන්න කියලා. ඒ පිළිබඳවත් අපි සාකච්ඡා කරමු. එතකොට මටත් මගේ වෙලාව තව විනාඩි 10ක් විතර වැඩි කරගන්න පුළුවන්. කෙසේ වෙතත් අපි ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මෙච්චර දැවැන්ත හොරකමක් මේ රටේ අහිංසක ජනතාවගේ පිටින් යවන්නේ නැතුව මේ හොරකම පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලා.

මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂය මෙලෙස කරුණු දැක්වීම පිළිබඳව ඇත්තටම අපි කනගාටු වෙනවා. දේශපාලන වාසි සඳහා කොච්චර නම් කරුණු විකෘති කරන්න පුළුවන්ද? විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු බලය වෙනුවෙන් මළ මිනියක් හෝ විකුණන්න පුළුවන් තත්ත්වයකට වැටීම ගැන මට බරපතළ කනගාටුවක් තිබෙනවා. නමුත්, ඒක තමයි තිබෙන ඇත්ත තත්ත්වය.

අපි ඉස්සෙල්ලාම මේ ගැන කථා කරමු. මේ රජය විසින් කොයිම අවස්ථාවකවත් ඩොලර් මිලියන 2.5ක් නැති වුණාය කියන එක වහන්න යන්නේත් නැහැ, එහෙම කරන්න වුවමනාවකුත් නැහැ. ඒක වුණේ නොසැලකිල්ලෙන්ද, ඒක වුණේ වංචනික ක්‍රියාවක් හරහාද, එහෙම නම් ඒක කළේ කවුද කියන එක ගැන හොයන එකට තමයි මේ විමර්ශන පවත්වමින් තිබෙන්නේ.

ඉස්සෙල්ලාම අපි දිනවලින්ම ගනිමු. දිනවලින්ම ගත්තාම ජනතාවට මේ කරුණු තේරෙනවා. අපට හොඳට මතකයි, ජනතාව අපට දීපු ජන වරම ගැන. ඒ, හොරු අල්ලන්න සහ හොරු අධිකරණයට ඉදිරිපත් කරන්න. අපට ජන වරම දුන්නේ ඒකට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අලුත් කලාව මෙයයි. හොරාට කියන්න බැහැ නේ, "අපි හොරු නොවෙයි" කියලා. එහෙනම් ඒ කෙනා අපට ඇඟිල්ල දිගු කරලා පෙන්වන්න ඕනෑ, "නැහැ, නැහැ, අපි හොරු, හැබැයි නුඹලාත් හොරකම් කරනවා තමයි" කියලා. ඒ නිසා රටේ සිදු වන සිදුවීම් විකෘති කරලා රජයේ වංචාවක් නිසා සිදු වුණු දෙයක් කියලා මේ සිද්ධියට කියනවා. ගල් අඟුරු සිද්ධිය ගත්තත් එහෙමයි, කන්ටේනර් සිද්ධිය ගත්තත් එහෙමයි, මේ සිද්ධිය ගත්තත් එහෙමයි.

ඩොලර් මිලියන 2.5ක් අහිමි වෙලා තිබෙනවාය කියන කාරණාව ගැන හොයන එක අපි කොයිම අවස්ථාවකවත් නවත්වලා නැහැ. ඒක ගැන අපි හොයනවා. කරපු කෙනාත් හොයාගන්නවා. මොකද, කවුරු වැරදි කළත් ඒ හොරු හොයා ගන්නේත් අපි, දඬුවම් කරන්න ඒ අය උසාවියට ඉදිරිපත් කරන්නේත් අපේ ආණ්ඩු කාලය තුළමයි කියලා ඉස්සෙල්ලාම කියන්න ඕනෑ. අපි ඉතාම කඩිනමින් මේ සම්බන්ධයෙන් පියවර ගත්තා. මෙගොල්ලන් කියපු red flags, අනන්මනන් මොකුත් නැහැ.

මේ සිද්ධිය අනාවරණ වෙන්නේ කවදාද? පසුගිය මාර්තු 22වැනි දා. මාර්තු 22වැනි දා මේ ගැන සොයා ගත්තාට පස්සේ ලිඛිතව පැමිණිල්ලක් යනවා, මාර්තු 24වැනි දා. දවස් 2ක් ඇතුළත ඒ පැමිණිල්ල කරනවා. එදාම අභ්‍යන්තර විගණනය ආරම්භ කරනවා. ඊට පස්සේ මේ ගැන මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශය දැනුවත් කරනවා, SLCERT එක දැනුවත් කරනවා. අපි මේ සියල්ල කරනකොට මේ සුන්බුන් කැලි අපි ඒවා කරනවා කියලා දන්නේත් නැහැ. හැබැයි අපි ඒවා ආරම්භ කරලා තිබෙන්නේ. ඒ, ඒගොල්ලන් කියපු හින්දා හෝ අපට මෙය වහන්න ඕනෑ හින්දා නොවෙයි, වෙච්ච වැඩේ හොයාගන්න අපි මැදිහත් වන නිසා. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව අපේ ආනන්ද විජේපාල ඇමතිතුමාගේ යටතේ මේ සම්බන්ධයෙන් විශේෂඥ කමිටුවක් - panel එකක් - පත් කළා. ඒකට කොළඹ විශ්වවිද්‍යාලයෙන් සම්බන්ධ වනවා. ඒ වාගේම SLCERT එකෙන් සම්බන්ධ වනවා. ඒ අනුව එය ඒකාබද්ධ යන්ත්‍රණයක්. ඒ කුමක් සඳහාද? මේක ඉතාම complex, ව්‍යාකූල crime එකක් නිසා මේක ඒ ආකාරයට විමර්ශනය කරන්න ඕනෑ නිසා. අපි නිලධාරීන් විසිදෙනෙකුගෙන් කටඋත්තර ගත්තා. පසුගිය අප්‍රේල් 28වැනි දා "B" Report එකකින් අධිකරණයට කරුණු වාර්තා කළා. මේ වන විට ඕස්ට්‍රේලියාවේ ෆෙඩරල් පොලීසිය සමඟ අපට අවබෝධතා ගිවිසුමක් තිබෙනවා. ඒ අවබෝධතා ගිවිසුම අනුව ඔවුන්ගේ සහායත් මේ විමර්ශනයට ලැබෙනවා. ඒ වාගේම මේ විමර්ශනයේ සමහර කොටස් ඇමෙරිකාවේ FBI එකේත් උදවු ඇතුවයි අපි කරගෙන යන්නේ. ඒ වාගේම අභ්‍යන්තර විනය පරීක්ෂණය අනුව කටයුතු කරලා අප්‍රේල් 17වැනි දා වනකොට හතරදෙනෙක් රැකියාවෙන් ඉවත් කරනවා; වැඩ තහනම් කරනවා. Interdict කරනවා. හැබැයි, විපක්ෂය ඒ කාරණය අල්ලාගෙන දඟලන්නේ කවදා ඉඳලාද? අප්‍රේල් 18වැනි දා ඉඳන්. හැබැයි, අපි මාර්තු 22වැනි දා සිට අප්‍රේල් 17වැනි දා වනකොට විමර්ශනය කරලා වැඩ ටික ඉවර කරලා අවශ්‍ය track එකට දාලා ඉවර වුණාට පස්සේ තමයි මේ විපක්ෂයේ සුන්බුන් කල්ලි විසින්, අලුතින් මෙගොල්ලන් හොයා ගත්තා, ආණ්ඩුව මේක හංගන්න හැදුවා කියමින් කෙඳිරි ගාමින් දුවන්නේ. ඒ කෙඳිරි ගාන්නේ අපි කළ දෙයක් නිසා නොවෙයි, ඉදිරියේදී එන නඩු ටික නිසායි. ඒකත් නොකියාම බැහැ. ඒ කෙඳිරි ගෑමට අපට කරන්න දෙයක් නැහැ. ඕනෑ තරම් කෙඳිරි ගාන්න. නමුත්, අපි එහෙම කාර්යක්ෂමව වැඩ කරන ගමන් මේ කාරණා ගැන අහන්න කැමැතියි, සුන්බුන් කැලිවලින්.

2016-17 කාලයේ පී. හැරිසන් හිටපු ඇමතිතුමා සහ හිටපු ජනාධිපතිවරයෙකුගේ බිරිඳක් කිරි හරක් ගෙන්වූවා. ඒ තුළින් සිදු වුණු පාඩුව ඩොලර් බිලියන 10.6යි. මේ ඩොලර් මිලියන 2.5 ගැන නේ දැන් කෙකර ගාන්නේ. ඒ පාඩුව වුණාම මේ සුන්බුන් කල්ලිය මොකක්ද කිව්වේ? මොනවාද කළේ? දැන් තමයි අපි ඒ පරීක්ෂණයත් පටන් ගත්තේ. 2025දී තමයි ඒ සම්බන්ධ පරීක්ෂණ කරන්නේ. අපි පරීක්ෂණ කරනවා; සාර්ථක වනවා; නඩු පවරනවා. ඒ, 2016දී වුණු සිදුවීමට.

ඊළඟට, අජිත් නිවාඩ් කබ්රාල්ට එරෙහිව ගොනු කර ඇති Greek Bond නඩුව. ඒකෙන් රටට ඩොලර් මිලියන 12.6ක පාඩුවක් වුණා. දැන් මේ කථා කරන්නේ, ඩොලර් මිලියන 2.5ක් ගැන. ඩොලර් මිලියන 12.6ක පාඩුවක් කරනකොට මේ සුන්බුන් කැලි කොහේද හිටියේ? ඒ ගැන කථා කළාද? නැහැ. ගෝඨාභයලාට, මහින්දලාට හයේ ඇඳන් යට හැංගිලා හිටියේ. හැබැයි, ඒ ග්‍රීක් බැඳුම්කර සම්බන්ධ නඩුව දැම්මේත් අපි. *[බාධා කිරීම්]* ඒ නඩුව පැවරුවේත් අපි. දැන් නඩුව පවරලා කටයුතු කරමින් යනවා. එදා හැංගිලා හිටපු කට්ටිය තමයි දැන් මේ කෑ ගහන්නේ.

ඊළඟට, අජිත් නිවාඩ් කබ්රාල් හරහා ඉමාම් සුබෙරු පාවිච්චි කරලා CIA එකට ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් ගෙව්වා. ඒ සම්බන්ධයෙන් විමර්ශන කරන්නේ කවුද? අපි. කලින් හිටපු කට්ටිය ඒ සම්බන්ධයෙන් විමර්ශන කළේ නැහැ. මම මේ පෙන්වන්න උත්සාහ කරන්නේ මේකයි. මෙතුමන්ලා කයිවාරු ගැහුවා නේ මේ ආණ්ඩුව මොකුත් කළේ නැහැ කියලා. මේ ආණ්ඩුව මේ සිද්ධියේදී ක්‍රියාත්මක වෙච්ච වේගයෙන් කලින් සිද්ධි සඳහා ඒ ආණ්ඩු ක්‍රියාත්මක වුණාද කියලා මම අහනවා.

හම්බන්තොට රෝහලට භාණ්ඩ ගෙන්වීමේ වංචාව ඩොලර් මිලියන 1.4යි. ඒ වංචාව සිදු වුණේ 2012 අවුරුද්දේ. ඒ ගැන විමර්ශනය කරන්නේත් අපි. ඒ සාක්ෂි හොයා ගන්නේත් අපි. නඩු පවරන්නේත් අපි.

ඊළඟට, ගිං-නිල්වලා ව්‍යාපෘතිය. ඒක 2015දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වෙන්න දවසකට කලින් වුණේ. ඒකේ පාඩුව රුපියල් මිලියන 4,000යි. ඒ රුපියල් මිලියන 4,000ක පාඩුවට සම්බන්ධ ගොනුව නැවත විවෘත කරලා විමර්ශන ගෙන යන්නේ කවුද? අපේ ආණ්ඩුව.

ඊළඟට, බඩල්ගම කිරි කර්මාන්තශාලා ව්‍යාපෘතිය. එය යුරෝ මිලියන 63.8ක් වටිනා ව්‍යාපෘතියක්. ඊළඟට, DESMI ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ වංචාව ගැන දැන් විමර්ශනය කරන්නේත් අපි.

ඊළඟට, නිවාස සංවර්ධන අධිකාරිය සම්බන්ධ කාරණා තිබෙනවා. එයාර් බස් ගනුදෙනුව සම්බන්ධ කාරණා තිබෙනවා. පාර්ලිමේන්තුවටත් කියන්න අවශ්‍ය නැති විමර්ශන රාශියක් තව කෙරෙනවා. ඒ නඩු ටික පැවරෙනවා. මේ අවුරුද්ද අන්තිම වනවිට කෙඳිරි ගාන්න එපා. *[බාධා කිරීම්]* කෙඳිරි ගාන්න එපා. මේ රටේ ජනතාව මේ ආණ්ඩුවට භය නැහැ. මේ ආණ්ඩුවට භය වෙලා ඉන්නේ හොරු. හොරු භයයි. හැබැයි, රටේ මිනිස්සු අපට භය නැහැ. අපි නීතියේ විධානයේ ආධිපත්‍යය රකිනවා. අපි පව කියන්නේ නැහැ.

ඒ වාගේම කියන්න කනගාටුයි, මේ බංකොලොත් විපක්ෂයට තමන්ගේ නායකයාගේ කථාව ඉවර වන කල් මිනිස්සු තියා ගන්න බැරි වුණා. එවැනි විපක්ෂ නායකයෙක් ඉන්න රටක් මේක. අපට කරන්න තිබෙන්නේ මෙච්චරයි. අපි මේ ආණ්ඩුව කරගෙන යන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුද්ගලයෙක් මිය ගොස් තිබෙනවා. මම මේ කාරණයෙන් එහාට ඒ ගැන කථා කරන්න සූදානම් නැහැ. ඒක සිය දිවි නසා ගැනීමක්ද, මිනී මැරුමක්ද, වෙනත් දෙයක්ද කියන එක ගැන පරීක්ෂා කරන්න තමයි අපි JMOsලා හතර දෙනෙක් දැම්මේ. ඇයි, අමතකද තාජුඩීන්ගේ සිද්ධිය? ඒ ගැන JMO කෙනෙක් තනිවම පරීක්ෂණයක් කළා. ඊට පසුව එතැන ප්‍රශ්නයක් මතු වුණා. අන්තිමට අස්ථි කොටසුත් අස්ථානගත කරලා දැම්මා. අන්තිමට හිටපු අධිකරණ විශේෂඥ වෛද්‍යවරයෙකුට නඩු පවා පැවරුණා, අස්ථි කොටස් අස්ථානගත කළාය කියලා. අන්න ඒ වාගේ කථා අහගන්න අවශ්‍ය නැහැ. මේ කාරණය සංකීර්ණයි. අධ්‍යක්ෂ ජනරාල් හරහා අධිකරණ විශේෂඥ වෛද්‍යවරු හතර දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් තමයි ඒ ගැන ප්‍රශ්න කරන්නේ. මම එතැනින් එහාට ඒ ගැන වචනයක්වත් කියන්නේ නැහැ. හැබැයි, ඉතාම නින්දිතයි, ඉතා කැතයි, මිනියක් තමන්ගේ දේශපාලනයට පාවිච්චි කරන එක. ඒ මරණය නිසා ශෝක වන පවුලක් ඉන්නවා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ නැතත් ඇත්ත වශයෙන්ම එතුමාට මම ස්තුතිවන්ත වනවා. ඇයි ඒ? එතුමාගේ දේශපාලනයත් එක්ක අපි එකඟ නැහැ. නමුත්, එතුමා මනුස්සයෙක්. Mike එකක් දික් කරලා මාධ්‍යවේදියෙක් අහනවා, එය මිනී මැරුමක් බවට පරිවර්තනය කරන්න තුඩු දෙන ජුගුප්සාජනක ප්‍රශ්න කිහිපයක්. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? "ඒ පවුල ශෝක වන වෙලාව. ඒ ගැන මේ වෙලාවේ කථා කරන්න ඕනෑ නැහැ" කිව්වා. එතුමාගේ දේශපාලනයට අපි එකඟ නැහැ. හැබැයි, ඒ වාගේ මහත්මයෙකුට ඔය පැත්තේ ඉන්න හිරිකිත නැද්ද දන්නේ නැහැ. නමුත්, එතුමාගේ ඒ ප්‍රකාශය වෙනුවෙන් මගේ ගරුත්වය දක්වනවා.

ගල් අඟුරු වේවා, කන්ටේනර් වේවා, වෙන මොකක් හෝ සම්බන්ධයෙන් වේවා මෙවැනි ව්‍යාජ කරුණු හදමින් ඔයගොල්ලන්ට කියන්න පුළුවන්ද, මේ මන්ත්‍රීවරයා මේ වරද කළා, මේ මන්ත්‍රීවරයා මෙහෙම බලපෑම් කළා, මේ ඇමතිවරයා මෙහෙම බලපෑම් කළා කියලා? එහෙම එකක් කියන්න පුළුවන්ද? මේ සභාවේදී නොවෙයි. වරප්‍රසාදවලට හැංගිලා බොරු කියන එක ගැන නොවෙයි මම මේ කියන්නේ. එහෙම දේවල් තිබෙනවා නම් එළියට ගිහිල්ලා කියන්න පුළුවන්ද?

අපේ අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා වාගේ රනිල් වික්‍රමසිංහයන්ගේ කාලයේ සිදු වුණු බැඳුම්කර සිද්ධියේදී private placements කරන්නේ නැතිව auction system එකට යන්න කියලා රනිල් වික්‍රමසිංහ දීපු උපදෙස නිසා තමයි අර්ජුන මහේන්ද්‍රන් ඒ වැඩේ කළේ. ඒකෙන් තමයි බැඳුම්කර පාඩුව වුණේ. අන්න ඒ ආකාරයට වංචනිකව යම් ක්‍රියාවකට අපේ ඇමතිවරයෙක්, අපේ මන්ත්‍රීවරයෙක් සම්බන්ධයි කියලා කියන්න පුළුවන් නම් කට ඇරලා කියන්න. හැබැයි, මේ සභාවේදී නොවෙයි, මෙතැනින් එළියේ. වරප්‍රසාදවලට හැංගිලා ඕනෑ කෙනෙකුට ඕනෑ දෙයක් මෙතැන කියන්න පුළුවන්. මම කියන්නේ තොරතුරු සහිතව එළියේදී කියන්න කියායි.

මීට කලින් කථා කළ මන්ත්‍රීවරයා ඉතා අසත්‍ය කරුණු කිව්වා. මේ වචන පාවිච්චි කරන්න හොඳ නැහැ. මේවා ඉතා පහත් කියමුකෝ. එතුමා මේ සභාවේදී කථා කරනකොට කිව්වා, ඒ මිය ගිය අයගේ භාර්යාව මරණය සැකයි කියලා පොලීසියට පැමිණිලි කර තිබෙනවාය කියලා. කාලකණ්ණි දේශපාලනයට එන්න එපා. ඔබතුමා එහෙම කියනවා නම් කාටද පැමිණිලි කළේ, කොයි පොලීසියටද, කවදාද පැමිණිලි කළේ? එහෙම දෙයක් වෙලා නැහැ. සම්පූර්ණ අසත්‍ය කියනවා. ඔළුවට ඔටුන්න දමා ගන්න ඔය තරම් පහත් මට්ටමට වැටෙන්න එපා කියලා මම මේ සුන්බුන් කල්ලියට කියා සිටිනවා. *[බාධා කිරීමක්]* නැන්දම්මාගේ account එක වාගේ තමයි. ඒකට නම් තවම මරික්කාර් මන්ත්‍රීතුමා කටයුතු කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ මේකයි. මේ ආණ්ඩුව ආවේ හොරු අල්ලන්නයි, හොරුන්ට දඬුවම් දෙන්නයි. ඒක අපි කරනවා. අපට ඒක අමතක වෙලා නැහැ. අපට අමතක වෙන්න ගියොත් මිනිස්සු ඒක මතක් කරලාත් දෙනවා. හැබැයි, එක දෙයක් මම කියන්න ඕනෑ. මේ රටේ කිසි මිනිහෙක් අපට ඇඟිල්ල දික් කරලා, අපි හොරු කියන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාගේ ව්‍යාපෘතිය ෆේල්. "පව මදිවට හොරු" කියන එක නේ ඔබතුමන්ලාගේ මාතෘකාව වුණේ. එහෙම නම් ඔබතුමන්ලාගේ පැත්තට සෙනඟ ඉන්න ඕනෑ. අපට සෙනඟ නැති වෙන්න ඕනෑ, මිනිස්සු අප අවිශ්වාස කරලා. එහෙම වුණේ නැහැ නේ. එහෙම වුණේ නැහැ. හිටපු අයත් නැඟිටලා ගියා, නායකතුමාගේ කථාව අතරතුර. නායකතුමාගේ කථාව අතරතුර නැඟිටලා ගියාට කමක් නැහැ කියමුකෝ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නැඟිටලා ගිය එක බේරා ගන්න සට්ටම්බි රාළලා දීපු උත්තර ටික බලන්නකෝ. "පරක්කු වෙච්ච නිසා යන්න වුණා, ආවේ රූපය දකින්න විතරයි, රූපේ ඇහෙන් දැකලා කනේ ස්පීකර් ගහගෙන ගෙදර ගියා, සංවිධායකයෝ එන්නේ නැති නිසා ගියා." ඒවා තමයි කිව්වේ මම කියන්නේ මෙච්චරයි. ඔබතුමන්ලාට වෙලා තිබෙන්නේ මේකයි. සාධාරණ විපක්ෂයක කාර්යභාරය කරනවා වෙනුවට පහත් දේශපාලනයක යෙදීමේ ප්‍රතිඵල තමයි ඔබතුමන්ලා අද මේ බුක්ති විඳිමින් සිටින්නේ. ඒ නිසා මම පැහැදිලිව කියන්න ඕනෑ, මේ විමර්ශන කෙරෙනවා, විමර්ශනවල අඩුපාඩුවක් නැහැ කියන එක. වරද කළේ කවුද, කොහොමද වරද වුණේ කියලා සොයා බලා ඔවුන්ට දඬුවම් කරන්න, නඩු පනවන්න අවශ්‍ය සියලු කටයුතු අපි කරනවා. කිසිම අවස්ථාවක අපට හැංගෙන්න ඕනෑත් නැහැ, හැංගෙන්නේත් නැහැ.

හැබැයි, මම තව දෙයක් කියන්නම්. ජනතාවටයි මම මේ කාරණය කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙහෙම මගේ කථාව අවසන් කරන්නම්. අපි පොරොන්දු වූ පරිදි පළමු අවුරුද්දේ නඩු දැමීමේ වේගය පොඩ්ඩක් අඩුයි. කඩා වැටුණු ක්‍රමයක් නේ තිබුණේ. දැන් නඩු ටික පැවරී ගෙන, පැවරී ගෙන එනවා. උසාවි 7ක් දැන් නඩු අහනවා. සමහර උසාවි දෛනිකව නඩු අහනවා. ඒ, ප්‍රගීත් එක්නැලිගොඩ, පාස්කු ප්‍රහාරය යනාදී සියලු නඩු. හැබැයි, ඒකට කලබල වෙලා ආණ්ඩුව පෙරළන්න හදන බංකොලොත් සුන්බුන් ටිකක් ඉන්නවා. නමුත්, වැඩක් වෙන්නේ නැහැ. මොකද, ඔයගොල්ලන් කොච්චර දැඟලුවත් මිනිස්සු ඉන්නේ අපිත් එක්ක.

මම එක දෙයක් කියන්නම්. ඒ නඩු ටික අහනවා; තීන්දු එනවා. තව මම මෙතැන නොකියපු නඩුවල විමර්ශන රාශියකුත් සිදු වෙනවා. ඒ සියල්ල වෙලා නඩු පැවරිලා එනකොට කරුණාකරලා කෙඳිරි ගාන්නේ නැතිව ඒවාට ගිහිල්ලා උත්තර දෙන්න. මේ වාගේ බොරු කියලා, අධම වැඩ කරලා, අපේ ගමන නවත්වන්න කිසිම ආකාරයකින් මේ විපක්ෂයට අවස්ථාවක් නැහැ. ඒ වාගේම ලැබෙන සෑම අවස්ථාවකදීම මේ විපක්ෂය ඔසවලා පොළොවේ ගහන්න දේශපාලනිකව අපි කටයුතු කරන බවත් කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට සිංහල කියවන්න බැරි නිසා මම Englishවලින් තිබෙන Standing Order 91 (f) කියවන්නම්. කරුණාකරලා මට මේක කියවන්න දෙන්න. අපේ අධිකරණ ඇමතිතුමාට ඉංග්‍රීසි තේරෙන නිසා මම එය ඉංග්‍රීසියෙන් කියවන්නම්.

Standing Order No. 91 (f) states, I quote:

> "(f) No Member shall refer in any motion or debate, to any matter which is under adjudication by a court of law or to any matter on which a judicial decision is pending."

අපේ අධිකරණ ඇමතිවරයාට කවුරුන් හෝ සිංහලෙන් මේ ගැන කියන්නකෝ. මම දන්නා සිංහලෙන් කියන්නම්. මේ ගැන තවමත් නඩුව යනවා නේ. නඩුව යනකොට JMO ගැන කථා කරන්නේ කොහොමද? මාමා ගැන, නැන්දා ගැන කථා කරන්නේ කොහොමද? තවම මේ නඩුව යනවා. ඒ නිසා අධිකරණ ඇමතිට කවුරුන් හෝ Standing Orders ගැන කියලා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය පැහැදිලියි.

මීළඟට, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි පහක් කියන්නේ ඉතා කෙටි කාලයක්.

මම විශේෂයෙන්ම හර්ෂණ ඇමතිතුමාගෙනුයි, අනිල් ඇමතිතුමාගෙනුයි මේ කාරණය අහන්නේ. ඔබතුමන්ලා පරස්පර අදහස් දෙකක් කිව්වා. හර්ෂණ ඇමතිතුමා කිව්වා වැඩ තහනම් කළා කියලා. අනිල් ඇමතිතුමා කිව්වා හතර දෙනා ස්ථාන මාරු කළා කියලා. ඔබතුමන්ලාට ඒ සම්බන්ධව පරීක්ෂණ කර ගන්න බැරි වුණා. *[බාධා කිරීමක්]* I have little time.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ස්ථාන මාරුවක් කළා. ඊට පස්සේයි වැඩ තහනම් කළේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කාලය ගන්න එපා. ඉඳගන්නකෝ. *[බාධා කිරීමක්]* හරි, ඉඳගන්නකෝ. ඔබතුමා- *[බාධා කිරීමක්]* හරි, හරි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. ඒ කාරණාවලට ඔබතුමා අවධානය යොමු කරන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
වැඩ කරපු හතරදෙනා අස් කළා. එතකොට නියෝජ්‍ය ඇමති තියාගෙන පරීක්ෂණයක් කරන්නේ කොහොමද? වැඩ කරපු හතර දෙනෙක් පරීක්ෂණයට බාධාවක් නම් නියෝජ්‍ය ඇමති, ඇමති, ලේකම්තුමා මොකටද තනතුරුවල බකන්නිලාගෙන ඉන්නේ? එතකොට කොහොමද පරීක්ෂණ කරන්නේ? මේ හොරකමට අරයා සැකයි, මෙයා සැකයි කියලා අනිල් මැතිතුමා කියනවා. අපි ඔක්කෝටම ඔයා සැකයි නේ. සැක තිබෙන නියෝජ්‍ය ඇමතිවරයා පුටුවේ ඉඳගෙන ඉන්නවා. නියෝජ්‍ය ඇමතිවරයා තනතුරේ ඉන්නකොට පොලීසියට, රහස් පොලීසියට පරීක්ෂණ කටයුතු කරන්න පුළුවන්ද? මේ සම්බන්ධයෙන් එතුමා මොකක්ද කිව්වේ? දැනුවත් කළා කිව්වා. දැනුවත් කළේ කොහේද? නලින්ද ජයතිස්ස ඇමතිතුමාට මම මේ කියන කාරණය මතක ඇති. මාධ්‍යවේදියෙක් එතුමාගෙන් අහන කොට එතුමා කියනවා, "ඔබතුමා ඔය කියන්නේ මෛත්‍රී ගුණරත්න මැතිතුමා සඳහන් කරපු හොරකම ගැන නේද?" කියලා. කොහේද දැනුවත් කළේ? පාර්ලිමේන්තුව දැනුවත් කළාද? ඔබතුමන්ලා දිගටම හංගාගෙන හිටියේ. කාටවත් කිව්වේ නැහැ. හොරකම හින්දා හංගාගෙන

හිටියේ. නැත්නම් දැනුවත් කරන්න තිබුණා. ඔය කථා ටික ලස්සනට කියන්න තිබුණා නේ පාර්ලිමේන්තුවට. ඔය කථා ටික කියන්න තිබුණා නේ, නලින්ද ජයතිස්ස ඇමතිතුමාට. එතුමා අපි ගරු කරන ඇමතිවරයෙක්. එතුමා කියනවා, "ඔය කියන්නේ මෛත්‍රී ගුණරත්න කියපු කාරණාව සම්බන්ධයෙන් නේද?" කියලා. මෛත්‍රී ගුණරත්න කියන කල් ඔබතුමන්ලා මේක දැනගෙන හිටියේ නැද්ද? ඩොලර් මිලියන දෙකහමාරක් කියන්නේ කිරිකජු නොවෙයි.

ඒ වාගේම NDB බැංකුවේ බිලියන දහතුනහමාරක් මාරු කරලා. ඒවා කොහේද? ඔබතුමන්ලා කියනවා රාජපක්ෂලාගේ කාලයේ හොරකම් ගැන. ජේවීපී එකේ ඔක්කෝම කට්ටිය ඒ කාලයේ හිටියේ රාජපක්ෂලාත් එක්ක. රාජපක්ෂලා හොරකම් කරපු මුදල් එවපු චෙක්වල අංක දන්නවා කිව්වා. අධිකරණ ඇමතිගේ බාප්පාට ගෙවල් හම්බ වුණේ ඒ පැත්තෙන්. ඔබතුමන්ලා ශුද්ධ කර කර ඉන්න එපා. බයිලා ගහන්නේ නැතුව හොරකම් ටික පරීක්ෂා කරන්න. දැන් අහිංසක මනුස්සයෙක් ගැන කථා කරනවා. දවස් ගණනක් මේ ගැන සඳහන් කළේ නැහැ. ඔබතුමන්ලාට මම කියන්නම්. NDB බැංකුවේ සිද්ධියෙන් බිලියන දහතුනහමාරයි, මේ වංචාවෙන් බිලියනයකට ආසන්න ප්‍රමාණයකුයි රටට අහිමි වෙලා තිබෙනවා.

දේශපාලන වශයෙන් මොනවා කිව්වත් ඔබතුමන්ලා දෙන්නාට යම්කිසි හැදියාවක් තිබෙනවා. ඔබතුමන්ලාම දන්නවා, ලංකාවේ බැංකු සම්බන්ධයෙන් audit එකක් කරන්න කියලා තිබෙනවා කියලා. ඒක Audit කරන්නේ නැතුව ඔබතුමන්ලා ඇද ඇද ඉන්නවා. Audit කළොත් අසාදු ලේඛනයට ලංකාව වැටෙනවා. හැබැයි, මේ වනකොට ලංකාවේ බැංකු ක්ෂේත්‍රය ඉතා ඉක්මනින් audit කරන්න කියලා ඉල්ලා තිබෙනවා. ඒ, මේ තිබෙන හොරකම නිසා. අවුරුදු එකහමාරක් ඇතුළත සිදු වුණු දේවල් මේ. ඔබතුමන්ලා බිලියන ගණන් අලාභ ගැන කියනවා. බිලියන සියයට අධිකයි, ගල් අඟුරු වංචාව නිසා ඇති වූ පාඩුව. ඒ වංචාව නිසා අද තෙල් ලීටරයක සැබෑ මිල කීයද? රුපියල් 700යි. "ඒ අමතර පිරිවැය අපි දරනවා" කියනවා. "අපි දරනවා" කියන්නේ කවුද? ආණ්ඩුව දරනවා කියන්නේත් ජනතාවගේ බදු සල්ලි. බෙල්ල මිරිකලා රනිල් වික්‍රමසිංහ ගහපු බදු සල්ලිවලින් තමයි ඔබතුමන්ලා ඔය කියන දේ කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කථා කරන්න නැඟිට්ටා විතර නේ.

ඔබතුමන්ලා විශේෂයෙන්ම මේ කියන කාරණයට අවධානය යොමු කරන්න. හර්ෂණ නානායක්කාර මැතිතුමා දන්නවා නේ. ගල් අඟුරු වංචාව ගැන විපක්ෂය දිගින් දිගටම කිව්වා. නමුත් ඒක නැහැ කිව්වා. අන්තිමට ඒක අහු වුණා. දැන් නැව් 15ක් විතර එන්නේ නැහැ. මේකට උත්තර දෙන්න. ඔබතුමන්ලා සුළං බලය, සූර්ය බලය සහ ජලවිදුලි බලය සම්බන්ධ සමාගම් 390කට මාස පහක් බිලියන 12කට වැඩිය ගෙවලා නැහැ. පුළුවන් නම් කවුරු හරි උත්තර දෙන්න. සමාගම් 390කට මාස පහක මුදල් ගෙවලා නැහැ. ඔබතුමන්ලාගේ කෙරුවාව මොකක්ද? ආර්ථික වර්ධන වේගය දෙකයි දශම ගණනක්. සංචිත ගණන ඉතා අඩු ප්‍රමාණයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විවාදයට අදාළව කථා කරන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මේක තමයි විවාදය. විවාදය හොරකම ගැන නේ. හොරකම ගැන කිව්වා නේ. ඩොලර් බිලියනයක් ගිලලා ඊට පස්සේ ඒ ගැන පරීක්ෂා කරනවා, හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ. රාජපක්ෂලාගේ කාලයේ රාජපක්ෂලාගේ හමුදාවෙන්, පොලිසියෙන් පුළුවන් ද සාධාරණයක් බලාපොරොත්තු වෙන්න? ඔබතුමන්ලාගෙන් පුළුවන්ද? *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බාධා කරන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඊට අන්තයි ඔබතුමන්ලා. CID officersලා ජේවීපී එකේ දේශපාලනය කරපු කට්ටිය. අනික් නිලධාරින් ඔක්කෝම දේශපාලනය කරපු අය. අධිකරණවල තීන්දු දුන්නාම මාරු කරනවා. Mount Lavinia අධිකරණයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අත්අඩංගුවට ගන්න කියලා තීන්දුවක් දුන්නා විතරයි, judge මාරු කළා. දැන් ඔන්න කොටුවේ judge මාරු කරන්න කියනවා. එතැන ඉන්න judge ගෙනෙන්න කියනවා, මෙතැනට. ඔබතුමන්ලා අධිකරණයට-

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔබතුමාට ඔය කාරණය මෙතැනින් එළියට ගිහින් කියන්න පුළුවන්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මම කියන්නම්, ඔබතුමාත් කියන්නකෝ. මම කියන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමා ඉඳගන්නකෝ, මම කියන්නම්. *[බාධා කිරීමක්]* මාරු කළ විධිය කවුරුත් දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඒකයි ඔබතුමාට අමාරු. නඩුකාරතුමා කිව්වා අත්අඩංගුවට ගන්න කියලා. මොකක්ද කළේ? මාරු වුණා. *[බාධා කිරීමක්]* ඔබතුමා ඉඳගන්නකෝ, මම කියන්නම්. *[බාධා කිරීමක්]* නඩුකාරයෝ මාරු කරනවා. දිගින් දිගටම තමන්ට ඕනෑ විධියට

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

සියලු දේ කරනවා. CID එක හදන්නේත් තමන්ට ඕනෑ විධියට, පොලිසිය හදන්නේත් තමන්ට ඕනෑ විධියට, අධිකරණය හදන්නේත් තමන්ට ඕනෑ විධියට. ඒ නිසා හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ කටයුතු කරලා මීට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. අවුරුදු එකහමාරක් වාගේ කාලයක් තුළ කොච්චර නම් හොරකම් කළාද? කන්ටේනර් හොරකම, ගල් අඟුරු හොරකම, බිලියන 13ක හොරකම, ඊළඟට බිලියනයක හොරකම. මේ ටික කාලය තුළ තමයි ඒ ටික කළේ. තව කොච්චර තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව හොරු අල්ලන්න කියලා ආවත්, ලොකුම හොරු ටික ඇවිල්ලා ඉන්නේ දැන්. ආණ්ඩු මාරු වුණාට පස්සේ ඕවාට නඩු වැටෙයි. අවුරුද්දක් ඇතුළත- *[බාධා කිරීමක්]* ඒ වාගේම, පාස්පෝට් හොරකම. ඒ එකින් එකට නඩු වැටෙයි. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මගේ නමත් කිව්වා. ඒක නොවෙයි ප්‍රශ්නය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම කියන්නේ, මේ කාරණය අධිකරණයේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීමක්]* එතැන point එකක් නැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
එතුමා මගේ නම කියලා කථා කළේ. *[බාධා කිරීමක්]* Point එක තමයි, අධිකරණයට අපහාස කිරීම. අධිකරණයට අපහාස කරන්න හොඳ නැහැ. එතුමා අධිකරණයට අපහාස කළා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය පුළුවන් නම් එළියට ගිහිල්ලා කියන්න. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය කථා කරන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේක දිගින් දිගටම ඇදගෙන යන්න එපා. බාධා කරන්න එපා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමායි මමයි දෙදෙනාම එළියට ගිහිල්ලා සම්මුඛ සාකච්ඡාවක් කරමු. ඔබතුමා එන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මේ කාරණය වාදයකට අරගෙන යන්න එපා. ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි. මේ විවාදයේදී- *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Footnote එකක් දාලා තියන්න, footnote එකක්. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමිය කථා කරන්න. ඔබතුමිය ඒකට අවධානය යොමු කරන්න එපා, කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

අද මේ විවාදයේදී විපක්ෂයෙන් මතු කළ ප්‍රධාන කාරණයක් තමයි,- *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව පාලනය කරලා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමා සහ ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

[අ.භා. 4.35]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද විවාදයේදී ගොඩක් කාලය ගන්න අවශ්‍යතාවක් නැහැ. නමුත්, විපක්ෂය විසින් ප්‍රධාන කාරණයක් හැටියට මතු කළා, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5 සම්බන්ධයෙන් වාර්තා කිරීමක් සිද්ධ කරන්න අවශ්‍යයි,- *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා සභාව පාලනය කර දෙන්න කියලා.*[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි, දැන් ඔබතුමිය කථා කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මේ නැති වෙලා තිබෙන, එහෙම නැත්නම් වෙනත් - තුන්වන - පාර්ශ්වයක account එකකට ගිහිල්ලා තිබෙන ඩොලර් මිලියන 2.5ක මුදල පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට වාර්තා නොකළේ ඇයි කියන කාරණය ගැන මම හිතන විධියට පසුගිය සති කිහිපය තුළම විපක්ෂය කථා කළා. මට මතක විධියට අප්‍රේල් 22වැනි දා තමයි යම්කිසි සංවිධානයක් විසින් මේ සිද්ධිය මතු කරලා ගත්තේ. එසේ මතු කර ගැනීමත් එක්කම විපක්ෂයෙන් සාකච්ඡාවක් හැදුවා, මේ කාරණය පාර්ලිමේන්තුවට වාර්තා කළේ නැත්තේ ඇයි කියලා.

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක් බවත් ප්‍රකාශ කරලා, එම කාරක සභාව තුළ සාකච්ඡා වුණු කාරණා පිළිබඳව ඉතාම වැරැදි සහගත තොරතුරු ප්‍රමාණයකුත් අද පාර්ලිමේන්තුවේ කිව්වා. සාමාන්‍යයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යම් කිසි රැස්වීමක් පැවැත්වූවාට පස්සේ එහි වාර්තාව කාරක සභාවේ සභාපතිතුමා විසින් තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. අපිත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෝ තමයි. නමුත්, අපට විනයක් තිබෙනවා, සභාපතිතුමා විසින් ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක් අපි එකඟ වූ පරිදි කටයුතු කරන්න. විශේෂයෙන්ම මේ සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හමු වුණේ, එම කාරක සභාවේ යම් එකඟතාවට අනුවයි. කාරක සභාවේ සභාපතිතුමාත්, විපක්ෂයේ මන්ත්‍රීතුමෙක්. ඒ තමයි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. එතුමා ඒ සම්බන්ධ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක්, ඒ පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට හෝ වෙනත් කිසිම කෙනෙකුට සදාචාරාත්මක අයිතියක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. මම දන්නේ නැහැ, විපක්ෂ නායකතුමා ඒවා දැන ගත්තේ කොහොමද, කවුද එතුමාට ඒවා කිව්වේ, කොහොමද ඒවා මෙතැනට වාර්තා වෙන්නේ කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සිද්ධ වුණු දේවල් ගැන මෙතැන කථා කිරීම ඉතා අනවශ්‍ය වැඩක්. ඒකේ වගකීම තිබෙනවා, සභාපතිතුමාට. එතුමා ඒ අනුව කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ කාරණය සම්බන්ධව තව එක නිවැරැදි කිරීමක් පමණක් කරන්න ඕනෑ. හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා කිව්වා, මේ කාරණය සම්බන්ධයෙන් අපි මුදල් ලේකම්තුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට තුන් වතාවක් ගෙන්වන්න උත්සාහ කළා කියලා. මට මතක විධියට විපක්ෂ නායකතුමාත් මේ කාරණය අද කිව්වා. එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. මුදල් ලේකම්තුමාට නිශ්චිත වශයෙන් එන්න කියලා අපි කැඳවීමක් කළ දිනය මා කියන්නම්. මම කැමැතියි, කාරක සභාවේ සභාපතිතුමා මේ නිවැරැදි කිරීම කළා නම්. ඒක තමයි වඩාත් හොඳ. නමුත් මේක දිගින් දිගටම සමාජගත වන නිසායි මම මෙය කියන්නේ. අපි මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට එන්න කියලා කැඳවීමක් කළේ අප්‍රේල් මාසයේ 28වන දා පැවැති රජයේ මුදල් පිළිබඳ කාරක සභා රැස්වීමට පමණයි. ඊට පෙර මුදල් ලේකම්තුමාට නිශ්චිත වශයෙන් එන්න කියලා අපි කැඳවීම් කරලා තිබුණේ නැහැ. මුදල් අමාත්‍යාංශයේ නියෝජනය වෙනුවෙන් එන්න කියලා තමයි හැම තිස්සේම කැඳවන්නේ. ඒ නිසා අර කියපු අවස්ථා තුනම මේ සිද්ධියට අදාළව නොවෙයි. මුදල් අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට යම් යම් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා, ඔවුන්ට ඒ දිනවල එන්න බැරි වන හේතු දක්වමින්. නමුත් ඒ ඩොලර් මිලියන 2.5ට අදාළ කාරණය ගැන කථා කරන දවසේ නොවෙයි. ඒවා පසුගිය අවුරුදු එකහමාර ඇතුළත ඇති වෙච්ච අවස්ථා තුනක්. ඒක ගැන කියමින් ඉතාම වැරැදිසහගත ලෙස තොරතුරු සමාජගත කරනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා පාර්ලිමේන්තුවට ඒම ප්‍රතික්ෂේප කළා කියලා. නමුත් එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කරපු එකම දේ තමයි එදිනට එන්න බැරි නිසා "අපට වෙන දවසක් දෙන්න පුළුවන්ද?" කියලා ඉල්ලීම. ඒ මිස පැමිණීම ප්‍රතික්ෂේප කිරීමක් කිසිම අවස්ථාවක සිදු කළේ නැහැ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් දැනුම් දුන්නාම "එදාට එන්න ඕනෑ" කියලා, එතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඉදිරියට ඇවිල්ලා ඒ සාකච්ඡාවට සහභාගි වුණා. මුදල් ලේකම්තුමා කියන්නේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න පුද්ගලයෙක් නොවෙයි. ඒක නිසා එතුමා සම්බන්ධයෙන්, එතුමාගේ කීර්තිනාමය සම්බන්ධයෙන්, එතුමාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් මේ ආකාරයෙන් බොරු තොරතුරු සමාජගත කිරීම ඉතාම නරක ක්‍රියාවක්.

අනෙක් කාරණය මේකයි. පාර්ලිමේන්තුවට මුදල් බලය තිබෙන නිසා මේ වන විට මේ අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර පරීක්ෂණයක් සිද්ධ වන, අපරාධ පරීක්ෂණයක් සිද්ධ වන කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට කරුණු වාර්තා කරන්න ඕනෑ වාගේ අදහසක් මේ අවස්ථාවේ විපක්ෂය විසින් ඉදිරිපත් කරනු ලැබුවා. ඇත්තටම මොකක්ද පාර්ලිමේන්තුවට

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මහතා]

තිබෙන මුදල් බලය? පාර්ලිමේන්තුවට මුදල් බලය ලබා දී තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව යටතේයි. එම ව්‍යවස්ථාවේ මොකක්ද සඳහන්ව තිබෙන්නේ? I quote:

> "Parliament shall have full control over public finance. No tax, rate or any other levy shall be imposed by any local authority or any other public authority, except by or under the authority of a law passed by Parliament ..."

පාර්ලිමේන්තුවේ නීතියක් සම්මත කිරීමකින් තොරව හෝ පවතින නීතියක් යටතේ නොවන ආකාරයකට මුදල් රැස් කිරීම හෝ වියදම් කරන්න බැහැ කියන එක තමයි පාර්ලිමේන්තුවට තිබෙන මුදල් බලයේ සාරාංශගත අදහස. ඒක හින්දා තමයි අපි හැම අවුරුද්දේම පාර්ලිමේන්තුවේදී Budget එකක් pass කරන්නේ. කිසිම ආකාරයකින් බදු එකතු කරන්නට හෝ වියදම් කරන්නට බැහැ, ඒ ක්‍රියාව පාර්ලිමේන්තුව අනුමත කරන්නේ නැතිනම්. පාර්ලිමේන්තුවට මුදල් බලය තිබෙනවා කියන එකෙන් අදහස් වෙන්නේ නැහැ මුදල් අමාත්‍යාංශයේ විධායක බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි කියන එක. ඒ නිසා මෙතැන ලොකු වැරැදි වැටහීමක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශය සතුව තිබෙන විධායක බලය, එහෙම නැත්නම් ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලය සතුව තිබෙන විධායක බලය පාර්ලිමේන්තුවට හෝ පාර්ලිමේන්තු කාරක සභාවලට නැහැ. අපේ ව්‍යවස්ථාවේ Article 4.(b) යටතේ බොහොම පැහැදිලිව තිබෙනවා, විධායක බලය පවතින්නේ ජනාධිපතිතුමා යටතේ කියලා. ජනාධිපතිතුමා යටතේ පවතින කැබිනට් මණ්ඩලය යටතේ තමයි විධායක බලය පවතින්නේ.

අනෙක් කාරණය මේකයි. දැන් මෙතැන දිගටම අහනවා ඒ කාරණය වාර්තා කළේ නැත්තේ ඇයි කියලා. අමාත්‍යාංශ මට්ටමින් යම්කිසි ප්‍රශ්නයක් සිද්ධ වුණාම ඒක ගැන බලන්න අමාත්‍යාංශයේ ලේකම්තුමෙක් ඉන්නවා; ඇමතිවරයෙක් ඉන්නවා; නියෝජ්‍ය අමාත්‍යවරු ඉන්නවා. මුලින්ම ඒ පිළිබඳ විධායක කටයුතු, පරිපාලන කටයුතු, විමර්ශන කටයුතු සිද්ධ කරන්නේ අභ්‍යන්තරව අමාත්‍යාංශය තුළ. අපරාධමය ප්‍රශ්නයක් තිබෙනවා නම්, එය යොමු කරන්නේ අපරාධ පරීක්ෂණ ආයතනවලට. ඒ නිසා ඒක එක පාරටම, අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ, මෙතැන විමර්ශන කටයුතු කරන්න ඕනෑ කියන අදහස ඇති කරන එක ඉතාම වැරැදියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ලබා දී ඇති කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, මට ඉතාම බරපතළ ලෙස බාධා කරපු නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියක කාලයක් ලබා දෙන්න අපහසුයි. ඔබතුමිය කථාව ඉක්මනින් අවසන් කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

අනෙක් කාරණය මේකයි. වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගත්තොත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත - Public Financial Management Act එක - යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු නිශ්චිත වාර්තා තිබෙනවා, Budget, Economic and Fiscal Position Report එක, Mid-Year Fiscal Position Report එක යනාදි වශයෙන්. ජාතික ආරක්ෂාවට හෝ රජයේ යම්කිසි වාණිජ කටයුත්තකට හෝ බාධා වන දෙයක් නම්, ඒ වාර්තා පවා ඉදිරිපත් නොකිරීමේ හැකියාව මුදල් අමාත්‍යාංශයට තිබෙනවා. ඒ බව බොහොම පැහැදිලිව කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Minister of Financeට පුළුවන්, national securityවලට - ඒ කියන්නේ, ජාතික ආරක්ෂාවට - අහිතකර වන හෝ එහෙම නැත්නම් ශ්‍රී ලංකා රජයේ negotiation එකකට, litigation එකකට හෝ වාණිජ කටයුත්තකට බාධා කරන ඕනෑම කරුණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර ඉන්න. ඒ හැකියාව මුදල් අමාත්‍යාංශයට තිබෙනවා. ඒ නිසා මේවා පටලවන්න එපා. පාර්ලිමේන්තුවේ මුදල් බලය කියන එක බොහොම නිශ්චිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, නීති තුළ තිබෙනවා. එහෙම නැති බලයක් පවරාගෙන මේ අද වෙච්ච දේවල් හෙට පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ වාගේ අදහස් සමාජගත කරන්න එපා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් 20දෙනෙකු නැඟිටලා අත ඔසවලා ඉල්ලපු විවාදයේදී තේ අපි මේ කථා කරන්නේ. ආණ්ඩු පක්ෂයෙන් අදහස් දක්වපු ඇමතිතුමන්ලා ඇතුළු පිරිස පැහැදිලි කිරීමක් කළා, මොකක්ද මේ භාණ්ඩාගාරයේ වෙලා තිබෙන සිදුවීම, මොකක්ද මේ කියන මුදල් තෙවන පාර්ශ්වයකට යැමේ ගැටලුව, කොහොමද ඒ ප්‍රශ්නය ඇති වෙන්නේ කියන කරුණු.

වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ වැරැද්දට අදාළව ගත්තු ක්‍රියාමාර්ග ගැන, ඒ වැරැද්ද වෙලා තිබෙන්නේ කොහෙන්ද කියලා හොයන එක ගැන පැහැදිලි කිරීමක් මට කලින් අදහස් දක්වපු පිරිස විසින් සිදු කළා. නමුත්, නැවතත් මේ කාරණා ටික මතක් කරගෙන යන්න ඕනෑ කියලා මම හිතනවා. මේ අවුරුදු එකහමාර තිස්සේම විපක්ෂය දිගින් දිගටම මේ ආණ්ඩුව හොරකම් කරනවා, අර වංචාව, මේ වංචාව කරනවා කියලා සති දෙකේ, මාසයේ මාතෘකා ඇදගෙන යනවා. ඒ හැම දාකම වාගේ නැවතත් එවැනි මාතෘකාවක් ගැන කථා කරන්න පටන් ගෙන තිබෙන මේ වෙලාවේ ඒ පිළිබඳ කරුණු කාරණා හරියට කථා කර ගන්න ඕනෑ කියලා අපි හිතනවා.

විශේෂයෙන්ම ඩොලර් මිලියන 2.5ක් ලංකාවට අහිමි වීම ගැන අපි හැමෝම දන්නවා. අපි හැමෝම පිළිගන්නවා ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියලා. ඒ ගැන කථා කරන්න කලින් විපක්ෂයේ මේ මහත්වරුන් ගැන කථා කරන්න ඕනෑ. මේ විවාදය ඉල්ලපු අය අතරේ මම දැක්කා සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුත් හිටියා, පොහොට්ටුවේ මන්ත්‍රීවරුත් හිටියා. ඒ ඔක්කොම හිටියා. මේ කියන ඩොලර් මිලියන 2.5 භාණ්ඩාගාරයෙන් වෙනත් පාර්ශ්වයකට යෑම ප්‍රශ්නයක් නේ, ගැටලුවක් නේ. අපි හැමෝම ඒක පිළිගන්නවා. ඒකට අදාළ පරීක්ෂණ කරගෙන යනවා. හැබැයි, පසුගිය අවුරුදු 10, 15 ඇතුළත භාණ්ඩාගාරයේ මුදල්වලට අදාළව සිද්ධ වෙච්ච දූෂණ, වංචා වෙනුවෙන් මේ ගොල්ලන් කරපු මැදිහත්වීම මොකක්ද? ඒ ගැන මේගොල්ලන් කරපු පරීක්ෂණ මොනවාද? පසුගිය කාලයක් තිස්සේ දිගින් දිගටම ලංකාවෙන් ඩොලර් කුට්ටි පිටින් යද්දී මේ මහත්වරු මොකක්ද කළේ? කලිනුත් කියපු හින්දා මම උදාහරණ කීපයක් විතරක් ඉක්මනින් කියාගෙන යන්නම්. එකක් තමයි, අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයාට අදාළව නඩු පවරා තිබෙන 2011 ග්‍රීක බැඳුම්කර වංචාව. මා හිතන්නේ, අද වනකොට නඩු පවරා තිබෙනවා- *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා, මේ අජිත් නිවාඩ් කබ්රාල් ගැනයි කියන්නේ, සභාවේ අය ගැන නොවෙයි. එතැන ඩොලර් බිලියන 12.6ක්. ඔබතුමන්ලා ආණ්ඩුවක් කළත් ඒ සම්බන්ධයෙන් කිසිවක් කළේ නැහැ. ඒ සිදුවීම වෙලා දැනට අවුරුදු 15ක් ගත වෙලා තිබෙනවා. දැන් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කරගෙන යනවා. ඒ වාගේම ඔහුම ඉමාම් සුබේරි කියන, ඇමෙරිකාවේ CIA නියෝජිතයෙකුට ලංකාවේ ප්‍රතිරූපය හදන්න කියලා මහ බැංකුවෙන් බිලියන 6.5ක් දීලා තිබෙනවා. ඒ ගැන තොරතුරු හෙළිදරව් වුණේ ඇමෙරිකාවේ නඩුවකට ඒ අදාළ පුද්ගලයා හසු වුණාට පසුවයි. අද විපක්ෂයේ ඉන්න මේගොල්ලන් අවුරුදු 12ක් ආණ්ඩු කළත් ඒවා ගැන නොසොයා නිකම් හිටියා. නමුත්, දැන් ඒ පරීක්ෂණ කරනවා, අපි ඒ ගැන හොයනවා.

ඊළඟට, බඩල්ගම කිරි ෆැක්ටරියක් හදනවා කියලා, 2013 යුරෝ මිලියන 63ක ව්‍යාපෘතියකට අදාළ වංචාවක් තිබෙනවා. කිරි ෆැක්ටරියක් තියා මොකවත් හදලා නැහැ. මේගොල්ලෝ අවුරුදු 12ක් ආණ්ඩු කළත් ඒවා ගැන හෙව්වේ නැහැ. නමුත්, දැන් ඒ පරීක්ෂණ පටන් අරගෙන තිබෙනවා, දැන් ඒවා ගැන හොයනවා. ඒ වාගේමයි, හම්බන්තොට රෝහලට උපකරණ ගන්න ගිහින් 2012දී වෙච්ච ඩොලර් මිලියන 1.4ක වංචාව. එය සිදු වෙලා දැනට අවුරුදු 14ක් ගත වෙලා තිබෙන නමුත් මේගොල්ලන් ඒ ගැන හෙව්වේ නැහැ. නමුත්, දැන් ඒ ගැන හොයන්න, පරීක්ෂණ කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම ගිං නිල්වලා ව්‍යාපෘතිය කියලා එකක් ආවා. ඔබතුමන්ලාත් සමහර විට ඒ ගැන අහලා ඇති. මොකද, ඒ ගැන අහලා විතරයි තිබෙන්නේ. ඒක වචනයක් විතරයි. මා හිතන විධියට, ඒක වචනයක් සහ board එකක් විතරයි. ඒකට අදාළව බැම්මක්වත් බැඳලා නැහැ. ඩොලර් මිලියන 30ක් කොටස් 3කට ගෙවපු එකේ අවසාන කොටස 2015 ජනාධිපතිවරණයට කලින් දවසේ වැටෙන්නේ, ලංකාවට. එදා ඒ ගැන සද්ද නැතුව හිටියා; files වහලා තිබුණා. දැන් ඒ ගැන පරීක්ෂණ පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම, 2020-2021 කාලයේ අසූචි පොහොර නැවක් සඳහා ඩොලර් මිලියන 6.5ක් ගෙවා තිබෙනවා. ඒ සම්බන්ධව එදා මොකවත් කෙරුණේ නැහැ. දැන් පරීක්ෂණ පටන් අරගෙන තිබෙනවා.

අවසාන වශයෙන්, කලිනුත් කියපු කාරණයක් කියන්නම්. මේගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ මේ ගොල්ලන්ගේ ඇමතිවරයෙක් හිටියා නේ, පී. හැරිසන් කියලා. කිරි හරක් ගෙන්වනවා කියලා ඩොලර් මිලියන 1.6ක් ගෙවා තිබෙනවා. කිරි හරකනුත් නැහැ, හැරිසනුත් නැහැ. හරක් නම් ඉන්නවා. නමුත් ඒ පිළිබඳ පරීක්ෂණත් සිදු වුණේ නැහැ. මෙහෙම තමයි රටේ සල්ලි විනාශ වෙලා ගියේ. ඒ සම්බන්ධව මොකවත් කළේ නැහැ. පසු ගිය කාලයේ මේගොල්ලන් ආණ්ඩුවකුත් කළා. ආණ්ඩුවේ නම "යහ පාලනය". නමුත් ඒ කවුරුවත් මේවා ගැන මොකවත් හෙව්වේ නැහැ. රටේ සල්ලි කුට්ටි ගණන් යද්දී files වැහුවා; ඩීල් දැම්මා. එවැනි දේවල් තමයි කරමින් හිටියේ. මේ සියලු දේවල් සම්බන්ධ පරීක්ෂණ දැන් සිදු වෙනවා. අපි මේවා හොයනවා, දඬුවම් දෙනවා. ඒකට තමයි මේ ආණ්ඩුව හදලා තිබෙන්නේ. ඒ නිසා කලබල වෙන්න එපා. මෙතැනදීත් වැරැද්දක් වෙලා තිබෙනවා නම් - වැරැද්දක් වෙලා තිබෙනවා - ඒ වැරැද්ද සම්බන්ධවත් පරීක්ෂණ කරලා දඬුවම් දීම සිදු වන්නේ මේ ආණ්ඩුව යටතේම තමයි. හොරුන්ට හොරු අල්ලන්න බැහැ. මේ ආණ්ඩුවට ඒක කරන්න පුළුවන් වෙන්නේ ඒ නිසායි. මේ සිදුවීම ගත්තත් එහෙමයි.

නැවත කියන්නම්. මේ විවාදය අරගෙන කියනවා නේ, ලොකු ප්‍රශ්නයක් කිව්වේ නැහැ කියලා. අමාත්‍යාංශයක හෝ ආයතනයක යම් ප්‍රශ්නයක් වුණාම කරන්න තිබෙන වැඩේ ඒක කාට හරි කියන එක නොවෙයි. ඒ පිළිබඳ පරීක්ෂණ වෙන්න ඕනෑ. ඒ පිළිබඳ නිසි පරිදි ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා, මේ සිදුවීම මාර්තු 23වැනි දා තමයි දැනගන්නේ කියලා. එතකොට මාර්තු 24වැනි දාම ක්‍රියාමාර්ග දෙකක් ගන්නවා. එක දවසක් ඇතුළත. මොකක්ද ඒ? එකක් තමයි, CID එකට පැමිණිල්ලක් දානවා. ඒ වාගේම, අදාළ නිලධාරින් සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පටන් ගත්තා. පැය 24ක් ඇතුළත ඒ දේවල් වුණා. කලින් සිදුවීම් ගැන මම කිව්වේ ඒකයි. අවුරුදු 15ක්, 14ක්, 12ක් ඩොලර් කුට්ටි ගණන් පිළිබඳව හොයපු නැති අවස්ථා තිබුණා. හැබැයි, දවසක් ඇතුළත මේ ආණ්ඩුව මේකට අදාළව ගන්න ඕනෑ මූලික ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ අනුව CID එකේ පැමිණිල්ලක් දාලා තිබෙනවා; අදාළ නිලධාරින් සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පටන් අරගෙන තිබෙනවා. ඒ CID පැමිණිල්ල ගැන පොලිසිය භාර ඇමතිතුමාගෙන් ඇහුවාට පස්සේ කියනවා, මේ වෙනකොට 20කට වැඩි පිරිසකගෙන් කටඋත්තර අරගෙන තිබෙනවා කියලා. ඒ වාගේම, අප්‍රේල් 28වැනි දා වෙද්දී පොලිසිය facts report කරලා තිබෙනවා. ඊට අමතරව මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට පැමිණිලි කරලා තිබෙනවා, SLCERT එකට පැමිණිලි කරලා තිබෙනවා. මෙය පරිගණක ආශ්‍රිත සිදුවීමක් නිසා කොළඹ විශ්වවිද්‍යාලයේ සහ SLCERT එකේ විශේෂඥයන් සහිතව expert panel එකක් පත් කරලා තිබෙනවා. ඒ වාගේම, මේ සම්බන්ධව ඕස්ට්‍රේලියාවේ ෆෙඩරල් පොලිසිය සම්බන්ධ වෙලා අවබෝධතා ගිවිසුමක් තිබෙනවා. එතකොට ඒගොල්ලන් ඒ පැත්තෙන් මේ ගැන හොයනවා.

දැන් මේ සල්ලි ඇමෙරිකාවට ගියා කියලා කථාවක් තිබෙනවා. ඒ නිසා FBI එකට මේ ගැන කියලා තිබෙනවා. ඒ පරීක්ෂණ සිදු වෙමින් යනවා. ඒ වාගේම, අභ්‍යන්තර පරීක්ෂණයේ ප්‍රතිඵලයක් විධියට මේ අතුරු වාර්තාව අප්‍රේල් 10වැනි දා එළියට දැම්මා. ඒ අනුව අප්‍රේල් 12වැනි දා නිලධාරින් කිහිප දෙනෙකුට ස්ථාන මාරු ලබා දීලා තිබෙනවා. අප්‍රේල් 17 වෙද්දී වැඩ තහනම්

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

කර තිබෙනවා. ඊට පස්සේ මේගොල්ලන්ගේ කාලයේ පඩි ලබපු සෙට් එකක් දැන් නන්නත්තාර වෙලා ඉන්නවා. අන්න ඒ අය මේ කරුණු එහෙන් මෙහෙන් mediaවලට උස්සාගෙන ගිහිල්ලා මේක ප්‍රශ්නයක් කරන්න හැදුවේ අන්න එතැනින් පස්සේ. ඒ වෙද්දී කරන්න තිබෙන සියලු දේ කරලා තිබෙන්නේ. මොකක්ද තව කියන්නේ? මම හිතනවා, විපක්ෂයේ ඊළඟ කථාවේදීවත් මේ ගැන කියයි කියලා. මොකක්ද කියන්නේ? මෙතැනදී මේ ආණ්ඩුව කරලා නැත්තේ මොකක්ද? ඒ නිසා මොකක් හරි වෙච්ච ගමන්, "ආණ්ඩුව හොරකම් කරලා, ආණ්ඩුව වංචා කරලා" කියලා දන්න එකම සූත්‍රය අරගෙන යනවා. ඒගොල්ලන් හිතනවා, ඒගොල්ලන් වාගේ තමයි මේ අපිත් ආණ්ඩු කරන්නේ කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම නරක පන්නයේ හැසිරීමක්. මේ අයගේ මේ හැසිරීම මට තේරෙන්නේ නැහැ. අඩුම තරමින් තමන්ට කරන්න බැරි වෙච්ච එක, තමන් කරන්නේ නැති එක, අපි කරනකොට බාධා කරන්න එපා. රාජපක්ෂලා ගැන ඒවා මේවා කිව්වා. අන්තිමට රාජපක්ෂලාත් එක්ක ලියුම් අත්සන් කර කර මේවා තමයි කරන්නේ. ඒ නිසා මේ කාරණය ගැන කිසිම සැකයක් තියා ගන්න ඕනෑ නැහැ. මේ රටේ වංචා, දූෂණ තිබුණා නම්, වෙනවා නම්, වුණා නම් ඒවා අල්ලන එක කරන්නේ අපි, මේ ආණ්ඩුව. ඒක මේගොල්ලන්ට කරන්න බැහැ. කරන්න පුළුවන් නම් කරලා තිබෙන්න ඕනෑ. හොරු අල්ලනවා කියලා ඇවිල්ලා අන්තිමට මාස 3ක් තුළ මහ බැංකුවට විදලා නේ ගියේ. මහ බැංකු බැඳුම්කර වංචාව ගැන පොත් ලියලා, සාක්ෂි දීලා දැන් එනවා හොරු අල්ලන්න. ෆුට්නෝට් ගහලා, පොත් ලියලා දැන් හොරු අල්ලන්න කථා කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා බාධා කරන්න එපා. ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මේ දේවල් කියනකොට කලබල වෙනවා. ඇයි පොත් ලිව්වේ නැද්ද? මහ බැංකු බැඳුම්කර වංචාව ගැන ෆුට්නෝට් දාලා, පොත් ලියපු අය කලබල වෙන එක ඉතාම සාධාරණයි. *[බාධා කිරීමක්]* ඒ නිසා කරුණාකරලා මට බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මේ දේවල් කියනකොට මේ අයට අමාරු ඇති. ඒ වුණාට කරන්න දෙයක් නැහැ, අහගෙන ඉන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම මෙතැන තිබෙන අනෙක් කාරණය මේකයි. මේ සියල්ල එසේ වෙලා තිබියදී හැම තිස්සේම මේ ගැන බොරු කියමින්, ව්‍යාජ ප්‍රවෘත්ති මවමින් මේක උස්සාගෙන යනවා. මේ ගැන කොච්චර දේවල් කිව්වා ද කියන්නකෝ? කොච්චර දේවල් කිව්වා ද? මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ගැන ඊයේ පෙරේදාත් කියනවා මම දැක්කා, එතුමා ද්විත්ව පුරවැසියෙක් කියන කථාවක්. ඒක ඇත්ත නම්, මේ අය ඒක පැහැදිලිව කියයි කියලා මම හිතනවා. මේ අය කටට එන එක කිය කියා යනවා. කිසිම පදනමක් නැතිව කටට එන එක කිය කියා තැන් තැන්වල ඇවිදිනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න කාරණයක් කියන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට බාධා කරන්න එපා. ඔබතුමාගේ අවස්ථාවේදී උත්තර දෙන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ද්විත්ව පුරවැසියෙක් බව, ඔහු, බිරිඳ සහ දරුවන් දෙදෙනා ද්විත්ව පුරවැසියන් බව කියනවා. එතකොට ඔහු පාර්ලිමේන්තුවට,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඔබතුමා ඒක දිගටම කියන්න. ඊට පස්සේ අපි නඩුවක් එහෙම දාලා බේරා ගනිමු. එතුමා ඡන්දය ඉල්ලුවා. එතකොට ඒක කොහොමද කළේ කියලාත් දන්නවා. ඒ නිසා නිකම් බොරු කියන්න ලෑස්ති වෙන්න එපා. බොරු කියන්න ලෑස්ති වෙන්න එපා. ඒක ඇත්තක් නම් එළියේ කථා කරලා, නඩුවක් දාලා එතුමා වැරදිකරුවෙක් කරන්නත් පුළුවන්. ඔබතුමාත් නීතිඥවරයෙක් නේ. ඔබතුමන්ලා මේ ගැන දිගටම බොරු ප්‍රවෘත්ති මවනවා.

අනෙක් පැත්තෙන්, මේ අය රාජ්‍ය නිලධාරින් ගැන, නිලධාරියෙකුගේ මරණය ගැන ලජ්ජා නැති කථා කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මනුස්සයෙක් මැරිලා සිටියදී, ඒක ගැන පරීක්ෂණ කරලා තිබියදී - ඒ සියල්ල කරලා තිබියදී - කිසිම ලජ්ජාවක් නැතිව ඒ මරණය විකුණාගෙන කන්න පටන්ගෙන තිබෙනවා. දැන් මෙතැන කරපු කථාවලදීත් ඒ ගැන නොයෙක් දේවල් කියැවුණා. JMO වාර්තාවේ "suicide" කියලා නැහැ ලු. *[බාධා කිරීමක්]* නැහැ, එහෙම ලියන්නේ නැහැ JMO වාර්තාවල. JMO වාර්තාවේ ලියන්නේ "suspected self-inflicted injury" කියලා. *[බාධා කිරීමක්]* ඒක මගේ ළඟ නැහැ. මම ඒක ඉල්ලලා නැහැ. මම ඒක දන්න නිසා කියන්නේ. ඒක එහෙම නොවෙයි නම් ඔබතුමා කියන්න. දැකලා නැති දෙයක් ගැන බොරු කියන්න බැහැ නේ. JMO වාර්තාවේ කොතැනද "suicide" කියලා තිබෙන්නේ? ඔබතුමාත් උසාවි ගිහින් තිබෙනවා නේ. කොහේද එහෙම ලියලා තිබෙන්නේ? කවදාවත් එහෙම ලියන්නේ නැහැ.

ඔබතුමා දන්නා දෙයක් කථා කරන්න. ඒ නිසා මේවා බොරු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක මතක තියා ගන්න. මේ රටේ එහෙම සිදුවීම් තිබෙනවා. තජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් අවසානයේ ඒ විශේෂඥ වෛද්‍යවරයාට -JMOට - චෝදනා එල්ල වුණා. ඒක එක වෛද්‍යවරයෙකුගේ මූලිකත්වයෙන් කළේ. අස්ථි කොටස් අස්ථානගත කිරීම සම්බන්ධයෙන් එතුමාට චෝදනා එල්ල වුණා; එතුමාට නඩුවක් පැවරුවා. අන්තිමට එතුමා අවාසනාවන්ත ලෙස මිය ගියා. ඒ නිසා ඒ පරීක්ෂණයත් යට ගියා. මේ සිද්ධියේදී පොලීසිය කරන ලද ඉල්ලීම අනුව - මතක තියා ගන්න - පොලීසිය කරන ලද ඉල්ලීම අනුව විශේෂඥ අධිකරණ වෛද්‍යවරු - consultantsලා - හතරදෙනෙකුගෙන් යුත් panel එකක් මගින් තමයි මේ පරීක්ෂණය කරලා තිබෙන්නේ. ලංකාවේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරු 50කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නේ. ඔවුන්ගෙන් හතරදෙනෙකුගෙන් සමන්විත panel එකකින් තමයි මේ සාමූහික තීන්දුව දීලා තිබෙන්නේ. ඔබතුමන්ලා ඒකට අභියෝග කරනවා නම් අභියෝග කරන්න. තැන් තැන්වල ඕපාදූප කිය කියා ඇවිදින්න එපා. මෙතැනදී ඇහැට දැකලා නැති, ඇහැට පෙනෙන්නේ නැති සියලු දේවල් බොරු කරන්නයි යන්නේ. මේ සිද්ධියේදීත් ඉතාම අශිෂ්ට ලෙස සහ කියන්න දෙයක් නැති වුණාම අර හැමදාම කියනවා වාගේ හොරකම් කරනවා, අරක කරනවා, මේක කරනවා කියලා එක මාසයකට එක කථාවක්, එක සතියකට එක කථාවක් කියලා දේශපාලනය කරන්නයි පටන් අරගෙන තිබෙන්නේ. නමුත් ඒක කළාය කියලා මොකක්වත් වෙන්නේ නැහැ. මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ, නඩු ඇතුළු ඒ සියල්ල සිද්ධ වෙනවා, පහුගිය හොරකම් එක්කම. ඒ නිසා බය වෙන්න එපා, කලබල වෙන්න එපා. මේ රටේ හොරකම් සහ හොරු අල්ලන එක කරන්නේ අපි. ඒක ඔබතුමන්ලා කළේ නැහැ. ඔබතුමන්ලාට අවස්ථාවක් දුන්නා. අවස්ථාවක් දුන්නා, ඒක කළේ නැහැ. ඒ වෙනුවට හොරුත් එක්ක පිනුම් ගැහුවා. ඒ වෙනුවට ඒ හොරුන්ට වඩා හොරකම් කළා. ඊට පස්සේ දැන් ඇවිල්ලා හොරු ගැන කථා කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Footnotes ලිව්වා; පොත් ලිව්වා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඔව්, footnotes ලිව්වා. ඒ නිසා ඒවා ගැන කථා කරන්න ලෑස්ති වෙන්න එපා.

අවසාන වශයෙන්, දැන් මේගොල්ලන්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකම් ගැන කියලා, බොරු කියලා දිගටම ඒ හරහා දේශපාලනය කරන එක වැරදියි.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. මෙතුමන්ලා මැයි දිනයේදී මොකක් හරි දෙයක් ලියලා තිබුණා නේ. "පව මදිවාට හොරු" කියලා, නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔව්.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඇත්තටම "පව මදිවාට හොරු" කියලා මේගොල්ලන් හැම එක්කෙනාගේම නළලේ ගහන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I refer to Standing Order No. 91(h). ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා, උඩු රැවුල තිබ්බාට වැඩක් නැහැ, සුජීව සේනසිංහ අයියාගේ නම කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.56]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අධිකරණ ඇමතිතුමා ප්‍රකාශ කළා, අවාසනාවන්ත විධියට මිය ගිය රංග රාජපක්ෂ කියන නිලධාරියාගේ මරණය පිළිබඳව සැක බවට ඔහුගේ බිරිඳ පැමිණිලි කරලා නැහැ කියලා. මම ඉදිරිපත් කරනවා, 2026.05.01වැනි දා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ, වෛද්‍ය මණ්ඩලයක් පත් කිරීම සඳහා වූ ලිපිය. ඒ ලිපියේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "……………it has been reported that Nishshanka Arachchilage Seelawathi, a resident of Pahala Veerambuwa Kuliyapitiya, within the Kuliyapitiya Police Division, has informed that her husband, Abeysinghe Mudiyanselage Ranga Nishshanka Rajapaksha, died under suspicious circumstances on 30.04.2026."

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

2026 අප්‍රේල් මාසයේ 30වැනි දා තමන්ගේ ස්වාමි පුරුෂයා සැක කටයුතු ලෙස මිය ගිහිල්ලා තිබෙනවා කියලා පැමිණිලි කරලා තිබෙනවා, කුලියාපිටිය උසාවියට. කුලියාපිටිය උසාවියේ ඒ නඩු අංකය, බී 88575/2026. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට කුලියාපිටිය මහෙස්ත්‍රාත්තුමා යවපු 2026.04.30 දිනැති ලිපිය මම **සභාගත*** කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොඳට අහගන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙච්චර වෙලාවක් කිව්වා, මේ මරණය සැක බව පවුලේ අය කියලා නැහැයි කියලා. ඒක කොච්චර වැරදි කථාවක්ද? ඒ අහිංසක මනුස්සයා මිය ගියා. ඒ පවුලට අපහාසයක්. *[බාධා කිරීමක්]* සත්‍යය දැන ගන්න යුතුකමක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ සත්‍යය දැන ගන්න යුතුකමක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ සඳහා ඔවුන් ඉල්ලීමක් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* එතකොට මොකක්ද මේ පාර්ලිමේන්තුවේ යුතුකම? අසත්‍ය ප්‍රකාශ කරන එකද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාවට බාධා කරන්න එපා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක දෙයක් පැහැදිලියි. මේ පාර්ලිමේන්තුවේ අපි දැන ගන්නට ඕනෑ, මොකක්ද මේ රටේ සාමාන්‍ය රජයේ සේවකයෙකුට අත්වන ඉරණම කියලා. මේ රටේ රජයේ සේවකයෙක්-

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
වැඩ නතර කරලා මැරුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කෝ, අධිකරණ ඇමතිතුමා සභාවේ ඉන්නවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ, නැහැ. ගියා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ ඇමතිතුමා සභාවේ ඉන්නවාද? නැහැ නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ, නැහැ. කයිවාරු ගහලා පැනලා ගියා. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ ඇමතිතුමා එහෙම තමයි හැමදාම. යමක් කියනවා,- *[බාධා කිරීම්]* මම සභාගත කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි- *[බාධා කිරීම්]* මේ රටේ අධිකරණ ඇමති දන්නේ නැහැ, මේ තරම් බරපතළ සිදුවීමක් වෙලා ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධ කාරණය. *[බාධා කිරීම්]* ඒවාට උත්තර දෙන්න අධිකරණ ඇමති එන්න ඕනෑ. *[බාධා කිරීම්]* අධිකරණ ඇමති එන්න ඕනෑ. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක දෙයක් පැහැදිලියි. *[බාධා කිරීම්]* මේ රටේ අනාගතය උදෙසා, මේ රටේ ජනතාවගේ මුදල් ආරක්ෂා කිරීම සඳහා මුදල් පාලනය පිළිබඳ මේ පාර්ලිමේන්තුවට තිබෙන බලය අපි මේ පාර්ලිමේන්තුව තුළ පාවිච්චි කරද්දී, මේ රටේ හැම කෙනාටම යුක්තිය, සාධාරණය ඉටු වීම සනාථ කරන්න ඕනෑ.

මේ වාගේ බරපතළ අවස්ථාවක පළපුරුදු නැති පුද්ගලයෙක්, - ඇත්ත වශයෙන්ම මේ මහත්මයා ඉතාම උගත් කෙනෙක්. ඒ වාගේම සැලසුම් සේවයේ ජ්‍යෙෂ්ඨ කෙනෙක්. හැබැයි, එතුමාට මේ රාජකාරිය සම්බන්ධව පළපුරුද්දක් නැහැ. ජනාධිපති ලේකම් කාර්යාලයේ කටයුතු කළ අර අපොන්සු කියන ලේකම්වරයා, - ගල් අඟුරු හොරකම නිසා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉල්ලා අස්වුණාට පස්සේ එම බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වුණෙත් ඔය අපොන්සු තමයි. "අපොන්සුකරණය", "අපොන්සුකරණය" කියලා දැන් සමාජයේ ලොකු කථාවක් තිබෙනවා නේ. අපොන්සු තමයි හැම තැනටම පත්කිරීම් කරන්නේ, අපොන්සු තමයි පත්කිරීම්වල බලධාරියා, අපොන්සු තමයි පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරින්ව පස්සට දාලා සැලසුම් ක්ෂේත්‍රයේ නිලධාරින්ව උඩට අරගෙන එන්නේ. ඒ වාගේම අපොන්සු තමයි පැලවත්තට අවශ්‍ය විදියට ලැයිස්තු සකස් කරලා නිලධාරින්ගේ මාරුවීම්, උසස් වීම් දෙන්නේ කියලා අපොන්සු කෙනෙක් ගැන කියනවා නේ. ඒ අපොන්සු තමයි බලශක්ති අමාත්‍යාංශයේ හොරකමෙන් පස්සේ පත් කරපු ලේකම්වරයා, වෙන කවුරුත් නොවෙයි. ඒ අපොන්සු තමයි මේ මනුස්සයාව අමාරුවේ දැම්මේ. ඔහුට පළපුරුදු නැති රස්සාවක් දුන්නා. ඔහු ගොඩක් උගත් කෙනෙක්; මම ඉගෙන ගත්ත විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත හොඳ වැදගත් මහත්මයෙක්. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ full-timer කෙනෙක් විදියට වැඩ කරපු, අවංකව දේශපාලනය කරපු කෙනෙක්. තමන්ගේ පක්ෂය ආණ්ඩුව වශයෙන් පත් වුණාට පස්සේ, මේ වගකීම භාර ගන්න කියලා තමන්ගේ පක්ෂයෙන් කිව්වාම ඒ මනුස්සයා ඒක භාර ගත්තා. ඒ මනුස්සයාව තෝරාගෙන ඔහුගේ වැඩ තහනම් කළේ අපි නොවෙයි. ඔහුට වගකීම් පවරලා, ඔහුගේ වැඩ තහනම් කරලා, මානසික පීඩනයට ලක් කළා නම්, ඒ අය තමයි කළේ.

ඊළඟ කාරණය මේකයි. ඇත්ත වශයෙන්ම මේ මරණය සිය දිවි නසා ගැනීමක්ද, එහෙම නැත්නම් මේක මිනී මැරුමක්ද කියලා හොයන්න විශේෂඥ මණ්ඩලයක් පත් කරන්න කියලා තමයි කිව්වේ. ඔබතුමන්ලාට මතක ඇති, ෂාෆ්ටර්ගේ මරණය සිද්ධ වුණු වෙලාවේ පත් කරපු විශේෂඥ මණ්ඩලයේ හිටියේ අධිකරණ වෛද්‍ය නිලධාරින් විතරක් නොවෙයි. ඒ විශේෂඥ මණ්ඩලයට විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයන්; මේ රටේ සිටින ජ්‍යෙෂ්ඨතම මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨතම අධිකරණ වෛද්‍ය නිලධාරින් තමයි පත් කළේ. තැනින් තැනින් තෝරාගත් අධිකරණ වෛද්‍ය නිලධාරින් පත් කළාම සාධාරණයක් සිද්ධ වෙන්නේ නැහැ.

---

*** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඒ වාගේම මේක සිය දිවි නසා ගැනීමක් කියලා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ තිබෙනවා කියලා මේ සභාවේ කථා වුණා. එහෙම තිබෙනවා නම් හොඳම දේ තමයි, ඒ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මේ විවාදයේදී ඉදිරිපත් කරන එක. එහෙම එකක් නැති නිසා තමයි ඉදිරිපත් කරන්න බැරි. එහෙම එකක් තිබෙනවා නම් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරනවා නේ. අපි දන්නවා, විවිධ වියහැකිභාවයන් - සම්භාවිතාවන් - තිබෙන බව.

මෙතැන ඉන්න සමහර තරුණ මන්ත්‍රීවරුන්ට ඉතිහාසය මතක නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ අලුත් කැරැල්ලේ පළමුවැනි මරණය තමයි දයා පතිරණ මරා දැමීම. දයා පතිරණ මරා දැමීම සම්බන්ධව සැකයට ලක් වෙච්ච ජනතා විමුක්ති පෙරමුණේ විත්තිකරුවන්ගෙන් දෙවැනි විත්තිකාරයා වෙනුවෙන් පානදුරේ මහාධිකරණයේ පෙනී හිටියේ මම. මම දන්නේ නැහැ, එතකොට මේ සමහර මන්ත්‍රීවරු ඉපදිලාද කියලා. එහෙම නැත්නම් ඒ අය පොඩි ළමයි, ඉස්කෝලයේ යන ළමයි වෙන්න ඇති. ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය ගැන, ජනතා විමුක්ති පෙරමුණ මිනී මරපු හැටි ගැන, ජනතා විමුක්ති පෙරමුණ මිනී මරන්න කුමන්ත්‍රණය කරපු ආකාරය ගැන, දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් තමන්ගේ සගයන් පාවා දීපු ආකාරය ගැන, ගෝනි බිල්ලෝ ගැන අපි දන්නවා. ඒ ගෝනි බිල්ලෝ වුණේ කවුද කියලාත් අපි දන්නවා. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ විශ්වවිද්‍යාලයේ එදා ඉඳලා අන්තරයේ එකට වැඩ කරපු, කැප වීමෙන් වැඩ කරපු, රස්සාවට ආවාට පස්සෙත් තමන්ගේ පක්ෂය වෙනුවෙන් වැඩ කරපු, පක්ෂය වෙනුවෙන් අනවශ්‍ය තරම් වගකීමක් භාර අරගෙන කටයුතු කරපු මේ මහත්මයාගේ අවමංගල්‍යයට මේ ජනාධිපතිවරයා ගියාද, අගමැතිනිය ගියාද, සභානායකතුමා ගියාද? ජනතා විමුක්ති පෙරමුණේ, NPP එකේ ප්‍රධාන පෙළේ නායකයෙක්, අඩු ගාණේ මහ ලේකම්තුමා, දොස්තර මහත්තයාවත් ගියාද? නැහැ. ඒ කියන්නේ තමන්ගේ සගයාව අමාරුවේ වැටුණාම අත හැරලා දානවා. ඒ වාගේම තමන්ගේ සගයාව ගණන් ගන්නේ නැහැ.

මේ රටේ කවුරු හරි රජයේ සේවකයෙක් "මේ අපේ ආණ්ඩුව; JVP ආණ්ඩුව, NPP ආණ්ඩුව. අපි කඩේ යන්න ඕනෑ, අපි වගකීම් භාර අරගෙන වැඩ කරන්න ඕනෑ" කියලා හිතලා වැඩ කරලා අමාරුවේ වැටුණාම මේ ඉස්සරහ පේළියේ ඉන්න කිසිම ඇමති කෙනෙක් ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* ඒක තමයි කනගාටුදායක දේ. අඩුම ගාණේ ඒ මිය ගිය කෙනාගේ අවමංගල්‍යට එන්නෙත් නැහැ. ශෝකය ප්‍රකාශ කරන්නේත් නැහැ. එදා කථාවක් පවත්වලා මේ මනුස්සයා හොඳ මිනිහෙක්, අවංක මිනිහෙක් කියලා කියන්න කෙනෙක් එම මළ ගෙදර හිටියේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. මේ පාර්ලිමේන්තුවේ කයිවාරු ගහන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ පාක්ෂිකයෙක් වෙච්ච, තමන් එක්ක සටන් කරපු, තමන්ගේ පාරේ සටන් කරපු, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති වෙනුවෙන් ජීවිත කාලයක් වැඩ කරපු රංග රාජපක්ෂ මහත්මයාගේ මරණය ගැන ශෝක වෙන්න මේ ඉන්න එක නායකයෙක් ගියාද? කවුරු හරි ගියා නම් අත උස්සන්න. තමන්ගේ පක්ෂයේ සගයෙක් අසරණ වෙලා මැරුණාම, - අපි කියමු, සිය දිවි නසා ගැනීමක් කියලා; අපි කියමු, මරා දැමීමක් කියලා. සිය දිවි නසා ගත්තත්, මරා දැම්මත් තමන්ගේ පක්ෂයේ මිනිහෙක් අමාරුවේ වැටිලා ජීවිතය නැති වුණාම ඒ පවුලේ අයටවත් හිතේ සතුටක් ඇති වෙන්න මේ ඉන්න එක ඇමති කෙනෙක් ඒ අවමංගල්‍යයට ගියාද? එක නායකයෙක් ගියාද? ශෝක ප්‍රකාශයක් කළාද? තමන්ගේ හිතේ තිබෙන අමාරුව, තමන්ගේ දුක ප්‍රකාශ කළාද? නැහැ. මොනවාද මේ කථා කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මිනිස්සු දැන ගන්න ඕනෑ. තමන්ගේ පක්ෂය වෙනුවෙන් කැප කිරීම් කරපු ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් - අපි කියන්නේ නැහැ, ඒ මහත්මයා වරදක් කළා කියලා. අපි කියන්නේ නැහැ, ඔහු වරදකාරයෙක් කියලා. හැබැයි, මේ සිද්ධිය නිසා පීඩාවට පත්වෙලා ඔහු සිය දිවි නසා ගත්තත්, ඔහුව මරා දැම්මත්, ඔහු නිසා වැළලෙන තොරතුරු ප්‍රමාණයක් තිබෙනවා. ඔහු අධිකරණයේ සාක්ෂි දෙන්නේ නැති නිසා එහි වාසිය ලැබෙන්නේ මේ සිද්ධියට අදාළ වන අයට; ආණ්ඩුවට. තමන් වෙනුවෙන් එහෙම කැපවීමක් කරපු මිනිහාගේ අභිංසකකම කියන්න, මේ එක්කෙනෙක් හරි මළ ගෙදර කථාවක් කරන්න ගියාද? ගිය කෙනෙක් ඉන්නවා නම් අත උස්සලා කියන්න.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
නිකමට ගිහිල්ලා බලලා ආවද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගිහිල්ලා එනවා නේ, කට්ටිය.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඉන්නවාද? ඔව්, නජිත් ඉන්දික මහත්මයා, ඔබතුමා හැමදේම කථා කරනවා නේ. *[බාධා කිරීම්]* ඔබතුමා මළ ගෙදර ගියාද? නජිත් ඉන්දික දොස්තර මහත්මයා තමන්ගේ සගයා මැරුණාම කුලියාපිටියේ මළ ගෙදර ගියාද? *[බාධා කිරීම්]* ගියාද? නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හිනාවෙලා වැඩක් නැහැ, මගේ මිත්‍රයා. හිනාවෙලා වැඩක් නැහැ. තමන්ගේ සගයා අසරණ වෙලා මැරුණාම, මළ ගෙදර ගිහිල්ලා ඔහු වෙනුවෙන් කථාවක් කරන්න තරම් ධෛර්යයක් තමන්ට නැත්නම් වැඩක් නැහැ නේ. මොකක්ද, පාක්ෂිකකම? මොකටද ඕක? මොකටද ඕක? වැඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක දෙයක් පැහැදිලියි. මේ රටේ සෑම විනිශ්චයකාරවරයෙකුටම, සෑම රජයේ සේවකයෙකුටම, සෑම පරිපාලන නිලධාරියෙකුටම කියන්න දෙයක් තිබෙනවා. ඒක තමයි මේ ආණ්ඩුව වෙනුවෙන්, -

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම කිව්වා. ඒ නිසා මට පොඩි වෙලාවක් දෙන්න.

කවුරුවත් හිනා වුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ point of Order එක ගත්ත වෙලාවේ මෙතුමාට කියන්න ඕනෑ, මෙතුමා මේ, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කිරීමකට යන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඒ මරණයට කවුරුවත් හිනා වුණේ නැහැ. මෙතැන ප්‍රශ්නයක් නේ ඇහුවේ. ඒ වාගේම කලින් කිව්වා ඒ මරණය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කිරීමකට යන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

(වෛද්‍ය) නජිත් ඉන්දික, ජනාධිපතිතුමාගේ මාධ්‍ය පිළිබඳ ප්‍රධාන උපදේශක. මම ඔබතුමාගෙන් ඇහුවේ එක දෙයයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අලුත් කරුණුවලට යන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අන්තරයේ සභාපතිතුමා, අන්තරයේ ප්‍රධානියා, කැඳවුම්කරු. මම ඔබතුමාගෙන් ඇහුවේ, මියගිය සහෝදරයාගේ මරණයට ගියාද කියලායි. ගියේ නැත්නම් බණට හරි යන්න, දානෙට හරි යන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අලුත් කරුණුවලට යන්නේ නැතිව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පව් ඒ මිනිස්සු. තමුන්නාන්සේලා රටට දීලා තිබෙන ආදර්ශය තමයි, තමන්ගේ සගයෙක් මැරුණාම මළ ගෙදරටවත් යන්නේ නැති මන්ත්‍රීලා, ඇමතිලා කියන එක. මෙහෙම කණ්ඩායමක් වැඩක් තිබෙනවාද?

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශයේ වාගේම අනෙකුත් අමාත්‍යාංශවලට අදාළ දෙපාර්තමේන්තුවල සිදුකරන පත්කිරීම් සම්බන්ධයෙන් මෙතැනදී වැරදි අදහසක් ඉදිරිපත් කළා, ඉහළින් පත් කළා කියලා. එහෙම නොවෙයි. *[බාධා කිරීමක්]* ඔව්, ඔබතුමා නේ මතු කළේ, අපොන්සු කියලා. එහෙම එකක් නොවෙයි, මේ තිබෙන්නේ. මේ නිලධාරියා External Resources Department එකේ වර්ෂ 10කට වැඩි කාලයක් රාජකාරි කරමින් හිටපු කෙනෙක්. ඒ නිසා වැරදි තොරතුරු කියන්න එපා. ඒ වාගේම ඔහු මේ වැඩ තනතුරට ලක් වෙනකොටත්, 2023 දී ඔය තනතුරට පත් වෙනකොටත්,- කිසිදු ආකාරයකට කවුරුත් පිටින් සම්බන්ධවෙලා ඒ පත් කිරීම සිදු කළේ නැහැ. ආයතනය ඇතුළේ තිබෙන උසස්වීම් පටිපාටිය ඇතුළේ සිදු කළ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීමක්, ඒක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි, ගරු ඇමතිතුමනි.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා කථා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, මම තවත් ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා වන හර්ෂණ සූරියප්පෙරුමගේ පුරවැසිකම ගැන. ඔබතුමා ඒකට උත්තරයක් දෙනවාද? එතුමා, ලංකාවේ පුරවැසියෙක්ද? ඕස්ට්‍රේලියානු පුරවැසියෙක්ද? ද්විත්ව පුරවැසියෙක්ද? එතුමාට එම තනතුර දරන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේක දෙපැත්තට උත්තර දෙන වෙලාවක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙනවා නම්,-

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
උත්තර දෙන්න පුළුවන්, කිසිම ප්‍රශ්නයක් නැහැ.

වෙනත් බොරු ප්‍රචාරය කරනවා වාගේම මේකත් ඉතාම අසත්‍ය ප්‍රවෘත්තියක්. එතුමා කලින් ඕස්ට්‍රේලියාවේ හිටපු කෙනෙක්. අදාළ මැතිවරණයට ඉදිරිපත් වෙනකොට ඒ පුරවැසිභාවය සම්බන්ධයෙන් නිසි ආකාරයට කටයුතු කරලා තිබෙනවා. එහෙම නැහැයි කියන්න ඔබතුමන්ලාට තොරතුරු තිබෙනවා නම් එළියේ කියන්න එපා, ඒක ඔප්පු කරන්න. එච්චරයි. එතුමා ද්විත්ව පුරවැසියෙකු නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරණය පැහැදිලියි. දිගින් දිගටම වාදයකට යන්න එපා.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, නිහඬ වෙන්න. එතුමාට බාධා කරන්න එපා. ඔබතුමන්ලා කථා කළොත් ගරු ඇමතිතුමාට කථා කරන්න බැහැ.

[අ.භා. 5.07]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝගවල කුමක් සඳහන්ව තිබුණත් කථානායකතුමා මේ විවාදයට අවස්ථාව ලබා දුන්නා. මාගේ දැනුමේ හැටියට ඕනෑ නම් එතුමාට මේ විවාදය ලබා නොදෙන්නත් අවස්ථාව තිබුණා. මොකද, සාමාන්‍යයෙන් ස්ථාවර නියෝගවල තිබෙන විධියට, සභාවේ කටයුතු පටන් ගන්න කලින් මේක දැනුම් දෙන්න ඕනෑ. නමුත් අපි ආණ්ඩු පක්ෂය හැටියට තීන්දු කළා, 'කමක් නැහැ, මේක සම්ප්‍රදායක් කර ගන්නේ නැතිව අද අපි මේ විවාදය කරමු' කියලා. අපි ඒකට ලැහැස්තියි. අද මේ පැය එකහමාර, නැත්නම් පැයයි විනාඩි 40 ඇතුළත විපක්ෂය මේ සම්බන්ධයෙන් කියන්න ඕනෑ ඔක්කෝම දෙවල් කිව්වා. *[බාධා කිරීමක්]* කියලා තිබෙන්නේ. ඊට වඩා කියන්න දෙයක් නැහැ. මොකද, මේක අමුතු දෙයකුත් නොවෙයි. ඔයගොල්ලන්ට තව පැය දෙකක් දුන්නත් මීට වඩා කියන්න දෙයක් නැහැ.

අපේ ගරු ඇමතිවරු, මන්ත්‍රීවරු පෙන්වා සිටි ආකාරයට පසුගිය අවුරුදු එකහමාර තුළ මෙතුමන්ලා විටින් විට එක එක දේවල් දමලා බලනවා, හරි යයිද කියලා. ඒවා දවස් තුනක්, හතරක්, සතියක් ඇදගෙන යන්න උත්සාහ කරනවා. නමුත් හරියන්නේ නැහැ. තමුන්නාන්සේලා "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේත් ඔය මළ බෙරයම ගහ ගහ හිටියා. අඩුම තරමින් අර පත්කර තිබෙන කමිටුවටවත් එන්නේ නැහැ. කන්ටේනර් සිද්ධියටත් එහෙම තමයි. මොකක් හරි අල්ලාගෙන තමන්ගේ දෛනික ජීවිතය පවත්වාගෙන යන්න හදනවා.

අනෙක් කාරණය තමයි, මේ රටේ ජනතාවගෙන් කවුරු හරි මේ විවාදයට ඇහුම්කන් දුන්නා නම් මේ හැසිරීම අනුව තේරෙයි, ඩොලර් මිලියන 2.5ක් අපේ භාණ්ඩාගාරයට - මුදල් අමාත්‍යාංශයට - අහිමිවීම සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරලා වැදගත් සාකච්ඡාවක් කරන්න පුළුවන් කණ්ඩායමක්ද මේ ඉන්නේ කියලා. නිලධාරියෙකු මරණයට පත් වෙලා තිබෙනවා. ඒ නිලධාරියාගේ ජීවිතය පිළිබඳවවත්, දැනට ජීවත් වන පවුලේ අය පිළිබඳවවත් යම් කම්පනයක්, වගකීමක් සහිතවද මේ අය කථා කරන්නේ? ඉතින්, මෙවැනි අයත් එක්ක අපි සයිබර් ආරක්ෂාව ගැන, මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂාව ගැන සහ මේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් විශ්වසනීයත්වයක් ඇති කරන්නේ කොහොමද කියන එක ගැන පාර්ලිමේන්තුවේ debate කරන්න පුළුවන්ද? මෙහෙමද හැසිරෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් නොලැබීම සම්බන්ධයෙන් මාර්තු 23වැනි දා වාචිකව මුදල් අමාත්‍යාංශයට වාර්තා වුණාට පස්සේ මාර්තු 24වැනි දාම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා - අධ්‍යක්ෂ ජනරාල්වරයා - විසින් ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. මතක තියාගන්න, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ ලිඛිත පැමිණිල්ල ඉදිරිපත් කළේ. ඒක තමුන්නාන්සේලා දැනගෙන හිටියේවත් නැහැ. තමුන්නාන්සේලාට ඒ ගැන මොකුත් අදහසක්වත් නැහැ.

අපේ නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කිව්වා වාගේ එදාම මුදල් අමාත්‍යාංශය තුළ මේ සම්බන්ධයෙන් තාක්ෂණික විමර්ශන කමිටුවක් පත් කළා. කවුද ඒකේ ඉන්නේ? භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු දෙදෙනෙක් ඉන්නවා. එදාම ඒ අයගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කළා. ඒ ගැන තමුන්නාන්සේලා මොකුත් දන්නේ නැහැ. ඒ මොකුත් දන්නේ නැතුවයි මේ කෑ ගහන්නේ. මාර්තු 24වැනි දා පත් කරපු එම කමිටුවේ වාර්තාව හම්බ වුණා, අප්‍රේල් 10වැනි දා. ඒ කමිටු වාර්තාවේ නිර්දේශ කිහිපයක් තිබෙනවා, මෙන්න මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. අන්න ඒ අප්‍රේල් 10වැනි දා ලැබිච්ච කමිටු වාර්තාවෙන් තමයි නිලධාරින් හතරදෙනෙක් ස්ථාන මාරු කරන්නේ. ඒ හතරදෙනා ස්ථාන මාරු කරලා අප්‍රේල් 17වැනි දා මේ පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යනකොට හතරදෙනාගේ වැඩ තහනම් කරනවා. අඩු ගණනේ ඒ හතරදෙනාගේ වැඩ තහනම් කරපු අප්‍රේල් 17 නොවෙයි, 18වත් තමුන්නාන්සේලා මේ සිද්ධිය ගැන දන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ සිද්ධිය දැනගත්තේ අප්‍රේල් 22වන දා. අපි මාසයකට අධික කාලයක් තිස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ SLCERT එක සමඟත්, ඊට පස්සේ මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරීක්ෂණයක් හැටියටත්, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් ඕස්ට්‍රේලියානු රජය ඇතුළු ආයතන ගණනාවක් සමඟත් මේ සිදුවීම පිළිබඳව සොයා බලන්න කටයුතු කළා. කොතැනද මේ වැරැද්ද සිදු වුණේ, කොතැනින්ද මේ අඩුපාඩුව සිදු වුණේ කියලා සොයා බලා ඒ අඩුපාඩුව යළි නොවන්නට, සයිබර් ආරක්ෂාව තහවුරු කරන්නට අපි කටයුතු කරමින් ඉන්නවා. එපමණක් නොවෙයි. මේ මුදල් යළි අය කර ගැනීම සඳහාත් අපි කටයුතු කරමින් ඉන්නවා. අන්න එහෙම ක්‍රියාවලියකයි අපි හිටියේ. ඩොලර් මිලියන 2.5ක් අපේ භාණ්ඩාගාරයට අහිමි වීම පිළිබඳව, එය යළි ලබා ගැනීම පිළිබඳව, ඒකට අපේ නිලධාරින් කවුරු හරි මොනයම් ප්‍රමාණයකින් හෝ ගැවිලා තිබෙනවාද කියන එක පිළිබඳව පරීක්ෂණ කරමින් හිටියේ. ගරු මන්ත්‍රීවරුනි, වගකිව යුතු රජයක් වැඩ කරන්නේ එහෙමයි. තමුන්නාන්සේලාට මේක තේරෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට මේක හිතාගන්නවත් බැහැ. ඇයි දන්නවාද?

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

2015දී මහ බැංකු බැඳුම්කර වංචාව වෙච්ච වෙලාවේ ඔයගොල්ලන්ගේ ලොකුම නායකයා වන රනිල් වික්‍රමසිංහ - එවකට අගමැතිවරයා - මොකක්ද කළේ? සිරිකොතේ නීතිඥයන් තුන්දෙනෙකුගෙන් යුත් කමිටුවක් දැම්මා. මතකද? ඒ ගැන මහ බැංකු නිලධාරින් කියද්දීත් සිරිකොතේ නීතිඥවරුන් තුන්දෙනෙකුගෙන් යුත් කමිටුවක් දැම්මා, ඉස්සෙල්ලාම. ඒක හෙළිදරව් වුණාට පසුව තමයි අවසානයේ COPE එකට ගෙන්වන්න සිද්ධ වුණේ. එහෙම නැත්නම් තමුන්නාන්සේලා ඒක වහන්නයි හැදුවේ. හැබැයි, අපට තිබුණු වුවමනාව මොකක්ද? අපට වුවමනාව තිබුණේ මේ වෙච්ච ක්‍රියාවලිය සම්බන්ධයෙන් නීතිමය පැත්තෙන්, මූල්‍යමය පැත්තෙන්, තොරතුරු තාක්ෂණය පැත්තෙන් විධිමත් පරීක්ෂණ කරලා අපේ මූල්‍ය ස්ථාවරත්වය, මූල්‍ය විශ්වසනීයත්වය හදන්න.

තැපැල් දෙපාර්තමේන්තුවෙන් US Postal Service එකට යවන්න තිබුණු ඩොලර් ලක්ෂ 6ක මුදලක් US Postal Service එකට නොලැබීම සම්බන්ධයෙන් අපි හොයා ගත්තාම පරීක්ෂණයක් ආරම්භ කළා. ඒ ගැන මම රටට කිව්වා. අපි පරීක්ෂණ කරමිනුයි හිටියේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම්දීලායි තිබුණේ. ඒක මේ අඩබෙර ගහගෙන, "අපේ තැපැල් දෙපාර්තමේන්තුව දමන සල්ලි එහේ මෙහේ යනවා, ඒ නිසා තැපැල් දෙපාර්තමේන්තුවට සල්ලි දමන්න එපා" කියලා විශ්වසනීයත්වය අහිමි කරගන්නවා වාගේ ප්‍රකාශ නිකුත් කරන්න අපි සූදානම් නැහැ. අපි බලනවා, කොතැනින්ද මේ වරද සිදු වෙලා තිබෙන්නේ, ඇත්තටම අපේ නිලධාරින් චේතනාන්විතව මේකට සම්බන්ධයිද, එහෙම නැත්නම් යම් දෝෂයක් සිදු වෙලා තිබෙනවාද, ඒගොල්ලන්ගේ තාක්ෂණික දැනුමේ යම් අඩුපාඩුවක් තිබුණාද කියලා. රටක් හැටියට අපි ඒ ගැන සොයා බලන්න ඕනෑ. අපි එහෙමයි කටයුතු කරමින් හිටියේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේක නිකම් සෙල්ලම් කරන්න පුළුවන් වෙලාවක් නොවෙයි. අපි මේ පිළිබඳව බොහොම බරපතළ ලෙස ගැඹුරෙන් පරීක්ෂණ කරනවා. මේ අනතුර අපේ ඕනෑම ආයතන පද්ධතියකට එන්න පුළුවන්. ඒක මහ බැංකුවට, භාණ්ඩාගාරයට, තැපැල් දෙපාර්තමේන්තුවට, වෙනත් ආයතනවලට පමණක් නොවෙයි, ඕනෑම ආයතනයකට එන්න පුළුවන්. මේ සයිබර් අපරාධකරුවන්ගේ මැදිහත්වීම් විටින් විට එන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ නිසා ඒවාට මුහුණ දීම සඳහා අපේ නිලධාරින් ශක්තිමත් කරන්න ඕනෑ, අපේ යන්ත්‍රණය ශක්තිමත් කරන්න ඕනෑ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සේවය කළ මේ සහකාර අධ්‍යක්ෂවරයාගේ මරණය තමුන්නාන්සේලා කොතරම් පහත් ලෙස ප්‍රචාරය කරන්න උත්සාහ කරනවාද? මේ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් සිදු කරන්න විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන්න කියලා අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දන්වනවා. ඒක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය; සාමාන්‍ය ක්‍රමය. ඒ අනුවයි කුලියාපිටිය, නිකවැරටිය, අනුරාධපුරය සහ කුරුණෑගල කියන රෝහල් හතරේ සේවය කරනු ලබන අපේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරින් - Consultant JMOsලා - 4දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරන්නේ. අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමාත් දන්නවා, ඒක ස්වාභාවික මරණයක් නොවෙයි නම්, හේතුව අපට ඇස් පනාපිටම කියන්න බැරි නම්, සාමාන්‍යයෙන් මහෙස්ත්‍රාත්වරයෙක් වාර්තා කරන්නේත්, JMO වාර්තා කරන්නේත් ඒක සැක කටයුතු - suspicious - මරණයක් හැටියට තමයි කියලා. ඒවා යන්නේ එහෙම තමයි. Suspicious murder එකක් හැටියට තමයි ඒ පරීක්ෂණ ආරම්භ කරන්නේ. ඒක කොහොම ලියැවුණත්, එහෙම තමයි පරීක්ෂණ යන්නේ. ඊට පස්සේ JMO Report එක එනවා. ඒකේ පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා, මේ මරණයට හේතු - causes of death - මොනවාද කියලා. ඒ වාගේම එතැනින් එහාට මේ මිය ගිය පුද්ගලයාගේ urine සහ blood samples DNA පරීක්ෂණයට යවලා තිබෙනවා. ඒ පරීක්ෂණ වාර්තා එන්න ඕනෑ. මේක බොහොම පැහැදිලිව සඳහන් කරනවා, ඒ පරීක්ෂණ වාර්තාත් ආ පසු අධිකරණයේ සිතාසියක් ලද විටක සම්පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අදාළ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා කියලා. මේක කියන්නේ මේ Consultant JMOsලා හතරදෙනා. දැන් මේකත් අරගෙන බොරුවට මේ එක එක සැකසංකා හදන්න උත්සාහ කරනවා නේ. මේක තමයි සාමාන්‍යයෙන් අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාවලිය. හතරදෙනෙක් මේ ගැන වාර්තා කරනවා. පසුව ඒ ගැන අධිකරණයට කරුණු වාර්තා කරනවා. දැන් එය අධිකරණයේ විභාග වන කටයුත්තක්.

එපමණක් නොවෙයි. තමුන්නාන්සේලා තව බොරු කිව්වා. තමුන්නාන්සේලා මේ ගැන කියපු සියල්ලම පාහේ බොරු. ඊළඟට කිව්වා, මේ පැමිණිල්ල කළේ මේ නිලධාරියා කියලා. මේ මරණ පරීක්ෂණය ගේන්න කිව්ව බොරුව තමයි, ඒ. ඇත්තටම ලිඛිතව මේ පැමිණිල්ල කළේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා. ඒ විතරක් නොවෙයි. මේ මරණය සැක සහිතයි කියලා බිරිඳ කිව්වා කියන එකත් බලන්න. මතක තියාගන්න, මේ සම්බන්ධයෙන් දැන් පාර්ලිමේන්තුවේ නැති දෙදෙනෙක් මාධ්‍ය හරහා ප්‍රකාශ නිකුත් කරලා තිබෙනවා. ඒ අය සම්බන්ධයෙන් නීතිමය කටයුතු අපි ආරම්භ කරනවා. මොකද, ඒ ඥාතීන්ට ප්‍රශ්නයක් තිබෙනවා. මේ රංග රාජපක්ෂ මහත්මයාගේ ඥාතීන්ට බරපතළ කම්පනයක් තිබෙනවා, මේ කියන ප්‍රකාශ ගැන. මියගිය මේ පුද්ගලයා වෙනුවෙන් අද බණත්, හෙට දානයත් පැවැත්වෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Freedom of expression.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පොඩ්ඩක් ඉන්න. Freedom of expression කියන්නේ බොරු කියන එක නොවෙයි; බොරු කියන එක නොවෙයි. මතක තියාගන්න. හරිද? අද බණ, හෙට දානය. දානය අවසන් වෙච්ච ගමන් ඒ ඥාතීන් ඇවිල්ලා ඒ කියපු අයට එරෙහිව පැමිණිලි කරනවා. මතක තියාගන්න. *[බාධා කිරීම්]*

ඒ වාගේම දැන් මේ සිද්ධියත් එක්ක මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා ඉලක්ක කරගෙන ප්‍රහාරයක් එල්ල කරලා තිබෙනවා. මම කියනවා පුළුවන් නම් ඔප්පු කරන්න කියලා, මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා ඒ ලේකම් ධුරය දරන කාලයේ හෝ නියෝජ්‍ය ඇමති ධුර දරන කාලයේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දරන කාලයේ හෝ ද්විත්ව පුරවැසියෙක් බව. පුළුවන් නම් ඒක ඔප්පු කරන්න. *[බාධා කිරීම්]* දැන් කියන්නේ නැහැ. *[බාධා කිරීම්]* සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කියනවා, දැන් එහෙම කියන්නේ නැහැ කියලා. *[බාධා කිරීම්]* ඔහොම තමයි කියන්නේ, හැමදාම. *[බාධා කිරීම්]* හැමදාම කියන්නේ මෙහෙම තමයි. නැති දෙයක් කියලා අපට කියනවා, ඔප්පු කරන්න කියලා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
රන්වල මන්ත්‍රීතුමාගේ සහතිකය තිබෙනවාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ. ඔබතුමන්ලා හොයන්න කිව්වේ නැහැ, - *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, එතැන point of Order එකක් නැහැ. *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමාට පොතක් ලියන්න පුළුවන් නේ, ඒ ගැන. *[බාධා කිරීම්]* මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ද්විත්ව පුරවැසිභාවය ගැන. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තේරෙනවාද, මාර්තු 24වන දා CID එක මුලින්ම පරීක්ෂණයක් කරන වෙලාවේ ඉඳලා, මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරීක්ෂණයක් කරන වෙලාවේ ඉඳලා මේගොල්ලන්ට මේ තොරතුරු කිව්වා නම්, මොනවා වෙයිද කියලා. *[බාධා කිරීම්]* මේ තොරතුරු කිව්වා නම්, මොනවා වෙයිද? මෙන්න මෙහෙමයි මේ අය හැසිරෙන්නේ. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, මේ ගැන හොයන්න ඕනෑ.

ඊළඟට මතක තබා ගන්න, අපේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මේ රංග රාජපක්ෂ කියන නිලධාරියා ගැන කිව්වාය කියලා තමුන්නාන්සේලාගේ කණ්ඩායමක් බොරු post එකක් දමපු බව. තමුන්නාන්සේලාට හිතවත් අය ඒක share කළ බවත් මතක තබා ගන්න. ඒක මේ නිලධාරියා සහ ඒ පවුලේ දරුවන් දැක්කා. ඒ තුළින් ඒ අයට බලවත් කම්පනයක් ඇති වුණා. බොරු post එකක් share කළා, මේ අය අත්අඩංගුවට ගන්නවා, මෙහෙම කරනවා, අරහෙම කරනවා කියලා සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා කිව්වාය කියලා. පරීක්ෂණයක් කරගෙන යන ගමන් වැඩ තහනම් කරලා විතරයි තිබුණේ; වැඩ තහනම් කළා. පරීක්ෂණයෙන් ඔප්පු වෙන්න පුළුවන් වැරැදිකරුද, නිවැරැදිකරුද කියලා. ඒක සාමාන්‍ය ස්වභාවය. හැබැයි, තමුන්නාන්සේලාගේ කට්ටිය ඒ පුද්ගලයාගේ දරුවන්ට පාරේ බැහැලා යන්න බැරි තරමටම ඒ posts share කරන්න පටන් ගත්තා. එක් දරුවෙක් campus එකේ ඉගෙන ගන්නවා. ඒ බිරිඳ රස්සාවක් කරන්න ඕනෑ; මේ අය එළියට බැහැලා යන්න ඕනෑ. සමහර fake posts ප්‍රශ්නයක් නැහැ. ඒවා නිකම් ඔහේ share වෙනවා. ඒවායෙන් කාටවත් හානියක් නැහැ. හැබැයි මතක තබා ගන්න, තමුන්නාන්සේලා මේක කරගෙන කරගෙන ඇවිල්ලා අද රජයේ නිලධාරියෙකුගේ මරණයට හේතු වන හැටියට ඒක කරලා තිබෙනවා. "NewsCenter" එකේ logo එක පාවිච්චි කළා. මම පසුව දැක්කා, "NewsCenter" එකෙන් දාලා තිබෙනවා, ඒගොල්ලන්ගේ logo එකත් වංචනිකවයි පාවිච්චි කරලා තිබෙන්නේ කියලා. මේ ගැන පරීක්ෂා කරන්න ඕනෑ. මේක share කරපු අය කවුද, මේ හරහා බරපතළ කම්පනයක් ඒ පවුලට ඇති කළේ කවුද කියන එක ගැන හොයා බලන්න ඕනෑකම තිබෙනවා. මොකද, මේවා නිකම් සිදුවීම් හැටියට ඔහේ පාවෙන්න දෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිද්ධියේදී රජය හැටියට අපි බොහොම වගකීමකින් යුතුව කටයුතු කරනවා. අපි බලනවා, මේ නිලධාරීන් මේවාට ගැවිලා තිබෙනවාද කියලා. එහෙම වෙලා තිබෙනවා නම් ඒකට දඬුවම් ලැබෙනවා. හැබැයි, නිරවද්‍ය, මේකට සම්බන්ධ නැති කිසිම නිලධාරියෙකුට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ නිසා මතක තබා ගන්න, මේක සෙල්ලම් කරන්න පුළුවන් වැඩක් නොවෙයි කියන එක. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාට මම කියන්නේ වගකීම් සහිතව හැසිරෙන්න කියන එකයි. ඔබතුමන්ලාගේ හැසිරීම විසින් මේ ප්‍රශ්නයට උත්තරයක් හොයන්න නොවෙයි පුළුවන්කම ලැබෙන්නේ මේක අවුල් කරන්න. ඒ නිසා අපි බොහොම පැහැදිලිව එතැනදී සිද්ධ වෙච්ච ක්‍රියාවලිය ගැන කියලා තිබෙනවා. ඒ වාගේම එම සිදුවීම වුණු දිනය කවදාද, වුණේ මොකක්ද කියලා කියා තිබෙනවා. දින හතරකදී, මෙන්න මේ මේ අවස්ථාවලදී මුදල් බැර වෙලා තිබෙනවා. ඒ ගැන අපි හොයා ගෙන යනවා. අපේ ඒකායන ප්‍රාර්ථනාව වන්නේ මේ ඩොලර් මිලියන 2.5 යළි අත්පත් කර ගන්නා එක සහ මේකට,- *[බාධා කිරීමක්]* ඒක තමයි, කලින් කිව්වා නම් ඔබතුමන්ලාත් කොටසක් ගන්නවා. ඒක නිසා මේ ඩොලර් මිලියන 2.5 අපි යළි අත්පත් කර ගන්නවා. ජාත්‍යන්තරව ඒ සඳහා අපි සහාය ලබා ගන්නවා. FBI එකේ සහාය ලබා ගන්නවා. එහෙම සහාය ලබාගෙන කොහොම හරි මේ ඩොලර් මිලියන 2.5 හොයා ගන්න එක තමයි අපේ පරමාර්ථය. එපමණක් නොවෙයි. අපේ රාජ්‍ය ආයතනවල පද්ධති ශක්තිමත් කරලා, මෙවැනි දෙයක් කිසිසේත්ම නොවෙන්නට අපේ සයිබර් ආරක්ෂණය ශක්තිමත් කරන්න කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Standing Order No. 91.(o) අනුව අද පස් වරු 5.30 වෙනකම් සභාව පවත්වාගෙන යන්න පුළුවන්. ඒ අනුව, තව විනාඩි 7ක් තිබෙනවා. ස්ථාවර නියෝග 92(2) යටතේ රීති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අනුව ඇමතිතුමාට කියන්න පුළුවන්ද, JMO report එක සභාගත කරනවාද කියලා?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දිගින් දිගටම බාධා කරන්න එපා. කාලය අවසානයි. ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, ඒ වාර්තා සියල්ල අධිකරණයට යවනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.22ට, 2026 මැයි 06වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 5.22 மணிக்கு பாராளுமன்றம், 2026 மே 06, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 5.22 p.m. until 9.30 a.m. on Wednesday, 06th May, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## ප්‍රධාන ආහාර ද්‍රව්‍යවලින් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා ආනයන අඩු කිරීම: ක්‍රියාමාර්ග
## பிரதான உணவுப் பொருள் உற்பத்தியில் தன்னிறைவடைய இறக்குமதிகளைக் குறைத்தல்: நடவடிக்கை
## REDUCTION OF FOOD IMPORTS TO ACHIEVE SELF-SUFFICIENCY IN STAPLE FOOD: STEPS TAKEN

1969/2026

**1.** **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආහාර ආනයනය ක්‍රමයෙන් අඩු කර සහල්, බඩ ඉරිඟු, සීනි, ධාන්‍ය වර්ග, කිරි නිෂ්පාදන, ලූනු සහ අර්තාපල් වැනි ප්‍රධාන ආහාර ද්‍රව්‍යවලින් ස්වයංපෝෂිත වීම සඳහා 2027-2040 කාලය සඳහා කාල නියමයන් සහිත ජාතික මාර්ග සිතියමක් සකස් කර තිබේද;

(ii) 2027 වර්ෂයේ සිට ආහාර ආනයන අඩු කිරීම සඳහා වාර්ෂික ප්‍රක්ෂේපිත අඩු කිරීමේ ඉලක්ක සහ ඒ සඳහා මිනුම් පදනම ලෙස යොදා ගනු ලබන වර්ෂය කවරේද;

(iii) වාරිමාර්ග නවීකරණය, යාන්ත්‍රීකරණය, පර්යේෂණ සහ සංවර්ධනය, දේශගුණයට ඔරොත්තු දෙන බීජ තාක්ෂණය, ගබඩා හා ශීතාගාර පහසුකම් සහ කෘෂි සැකසුම් ධාරිතාව සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත ප්‍රාග්ධන ආයෝජනය කොපමණද;

(iv) ගොවීන්ගේ ඉහළ ශක්‍යතාවක් සහතික කිරීම සඳහා දිස්ත්‍රික්ක අනුව සකස් කළ විද්‍යාත්මක භෝග කලාපකරණය, ගිවිසුම්ගත ගොවිතැන් ආකෘති සහ සහතික කළ මිලදී ගැනීමේ යන්ත්‍රණ ක්‍රියාත්මක කරන්නේද;

(v) ප්‍රධාන භාණ්ඩ ආනයනය සැලකිය යුතු ලෙස නතර කර, විදේශ විනිමය සංරක්ෂණය කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

(vi) මෙම උපාය මාර්ගයෙන් අතිරික්ත නිෂ්පාදනය අපනයනය කිරීමට අපේක්ෂා කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා හඳුනා ගත් භාණ්ඩ, ඉලක්කගත වෙළෙඳ පොළ සහ ප්‍රක්ෂේපිත කාල රාමු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரிசி, சோளம், சீனி, பயறு வகைகள், பால் உற்பத்திப் பொருட்கள், வெங்காயம், உருளைக் கிழங்கு போன்ற பிரதான உணவுப் பொருட்களின் இறக்குமதியைப் படிப்படியாகக் குறைத்து, 2027-2040 காலப்பகுதியில் அவற்றில் தன்னிறைவு அடைவதற்காகக் காலக்கெடுவுடன்கூடிய ஒரு தேசிய உபாயமார்க்கம் தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) 2027ஆம் ஆண்டு முதல் உணவுப்பொருள் இறக்குமதியில் எதிர்வுகூறப்பட்ட வருடாந்தக் குறைப்பு இலக்குகளையும் அத்தகைய எதிர்வுகூறல்களுக்காகப் பயன்படுத்தப்பட்ட அடிப்படை ஆண்டையும்;

(iii) நீர்ப்பாசன நவீனமயமாக்கல், இயந்திரமயமாக்கல், ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி, காலநிலை மாற்றத்துக்குத் தாக்குப்பிடிக்கும் விதைத் தொழில்நுட்பம், களஞ்சிய உட்கட்டமைப்பு, குளிர்ச்சங்கிலி முறைமைகள் மற்றும் விவசாய உற்பத்திப் பொருட்களின் பதப்படுத்தல் ஆற்றல் ஆகியவற்றுக்காகத் தேவைப்படுமென மதிப்பிடப்பட்டுள்ள மூலதன முதலீட்டையும்;

(iv) விவசாயிகளின் நிலைத்து நிற்கும் தன்மையை உறுதிப்படுத்துவதற்காக மாவட்ட ரீதியான அறிவியல் பயிர் வலயமிடல், ஒப்பந்த விவசாய மாதிரிகள் மற்றும் உத்தரவாதக் கொள்வனவுப் பொறிமுறைகள் என்பன நடைமுறைப்படுத்தப் படவுள்ளனவா என்பதையும்;

(v) முக்கியமான வியாபாரப் பண்டங்களின் இறக்குமதியைக் கணிசமானளவு இல்லாதொழித்து, வெளிநாட்டுச் செலாவணியைச் சேமிப்பதற்கு இலங்கை எந்த ஆண்டளவில் எதிர்பார்க்கிறது என்பதையும்;

(vi) குறித்த உபாயமார்க்கம் ஏற்றுமதிக்கான மிகை உற்பத்தியை எதிர்வுகூறுகின்றதா என்பதையும்;

(vii) அவ்வாறெனில், அடையாளம் காணப்பட்டுள்ள வியாபாரப் பண்டங்கள், இலக்குச் சந்தைகள் மற்றும் மதிப்பிடப்பட்டுள்ள காலச்சட்டகம் என்பவற்றையும்;

அவர் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) whether a time-bound national roadmap has been formulated for the period 2027-2040 to progressively reduce food imports and achieve self-sufficiency in major staples such as rice, maize, sugar, pulses, dairy products, onions and potatoes;

(ii) the projected annual reduction targets for food imports from 2027 onwards and the baseline year used for such projections;

(iii) the estimated capital investment required for irrigation modernization, mechanization, research and development, climate- resilient seed technology, storage infrastructure, cold-chain systems and agro-processing capacity;

(iv) whether district-wise scientific crop zoning, contract farming models and guaranteed purchase mechanisms are to be implemented to ensure farmer viability;

(v) the year by which Sri Lanka is expected to substantially eliminate imports of key commodities and conserve foreign exchange;

(vi) whether the strategy envisions surplus production for export; and

(vii) if so, the commodities identified, target markets and projected timelines?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) 2027 සිට 2029 සහල් සහ අතිරේක ආහාර භෝග සඳහා ද තුන් අවුරුදු සැලැස්මක් සකස් කර ඇත.

2040 දක්වා සැලැස්මක් සකස් කර නොමැත.

කිරි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත වීම සඳහා ද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින්, 2026 වසරේ අය වැය ඇස්තමේන්තු මඟින් වෙන් කළ රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන යටතේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

1. දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන (Dairy Hub) - රුපියල් මිලියන 1,000 කිරි ගොවීන් නඟාසිටුවීමේ අරමුණින් යුතුව 2030 වසරේදී ශ්‍රී ලංකාව කිරිවලින් සියයට 75ක් දක්වා ස්වයංපෝෂිත කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළ කිහිපයක අභිජනන ඒකක වැඩිදියුණු කිරීමේ වැඩසටහන - රුපියල් මිලියන 1,000

(ii) ආහාර ආනයන අඩු කිරීම සඳහා වාර්ෂික පුරෝකථන සැලැස්මක් සකසා ඇත. 2025 වර්ෂයේ සිට 2029 දක්වා සාදන ලද ආයතනික ප්‍රතිඵල රාමුව - Organizational Result-based Framework - අනුව එහි පදනම් වර්ෂය 2024 වේ.

(iii) මේ සඳහා 2027 වසරේ සිට 2030 වසර දක්වා පහත කාර්යයන් සිදු කිරීමට සැලසුම් කර ඇත.

1. රට තුළ කෘෂි යාන්ත්‍රීකරණය වේගවත් කිරීම සඳහා ගොවි ජනතාවට නියමිත වේලාවට ගුණාත්මක සේවාවක් ලබා ගත හැකි මට්ටමේ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබා දෙන මධ්‍යස්ථාන - Agricultural Machinery Hubs - 200ක් පමණ දිවයින පුරා පිහිටුවීමට සැලසුම් සකස් කර ඇත. මේ සඳහා රුපියල් මිලියන 2,000ක් පමණ යෙදවීමට අපේක්ෂිතයි.

2. කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවීමට නිපුණතාව සහිත ක්‍රියාකරුවන් 2,000ක් පමණ පුහුණු කරවීම සඳහා රුපියල් මිලියන 20ක් පමණ යෙදවීමට අපේක්ෂිතයි.

3. කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි නඩත්තු කිරීම හා ඒවා නිසි ලෙස ක්‍රියා කරවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ මුළු පැවැත්වීමට රුපියල් මිලියන 20ක් යෙදවීමට අපේක්ෂිතයි.

4. කෘෂි යාන්ත්‍රික ක්ෂේත්‍රයේ පර්යේෂණ හා නව යන්ත්‍ර සූත්‍ර ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීමේ කටයුතු සඳහා රුපියල් මිලියන 500ක් පමණ යෙදවීමට අපේක්ෂිතයි.

- අතිරේක ආහාර භෝග සඳහා සුදුසු යන්ත්‍රෝපකරණ පැකේජ භාවිත කරමින් ක්ෂේත්‍ර ආදර්ශන පැවැත්වීම. (පාත්ති සැදීමේ ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන්, බීජ යෙදීමේ ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන්, ඩ්‍රෝන තාක්ෂණය භාවිතය පිළිබඳ ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන්, අස්වනු නෙළීම සඳහා ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන්) සඳහා රුපියල් මිලියන 100ක් පමණ යෙදවීමට අපේක්ෂිතයි.

(iv) භෝගයක මනා වර්ධනය හා ඉහළ ඵලදාවක් ලබා ගැනීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමත් පාරිසරික තත්ත්වයන් මනාව කළමනාකරණය කර රැක බලා ගැනීමත් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සුදුසු ඉඩම් හඳුනා ගැනීම සිදු කිරීම සඳහා ඉඩම් පිහිටීම, පස, ජල ප්‍රභවය හා අනෙකුත් පාරිසරික සාධක සලකා බැලීම සිදු කරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන භෝග 12ක හා ප්‍රධාන පලතුරු භෝග 07ක සුදුසු ප්‍රදේශ හඳුනා ගෙන ඇති අතර ඒවායේ සිතියම් නිර්මාණය කර ඇත. ඊට අමතරව ග්‍රාම නිලධාරි මට්ටමින් සුදුසු භෝග, වගා කාලයන් හා අනෙකුත් තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් (https://csrforgnd.doa.gov.lk/) නිර්මාණය කර අවශ්‍ය ඕනෑම අයෙකුට තොරතුරු ලබා ගත හැකි ලෙස පවත්වා ගෙන යයි.

(v) නිශ්චිත වර්ෂය දැනට සඳහන් කිරීමට නොහැක.

කෘෂිකාර්මික ප්‍රතිපත්ති වෙනස්කම්, දේශගුණික තත්ත්වයන්, තාක්ෂණික දියුණුව සහ ආර්ථික වර්ධනයන් ඇතුළු විවිධ සාධක හේතුවෙන් විදේශ විනිමය සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාව ප්‍රධාන ආහාර භෝග ආනයනය සැලකිය යුතු ලෙස නතර කරන නිශ්චිත වර්ෂය පුරෝකථනය කිරීම අභියෝගාත්මකය. මැද කාලීන ප්‍රවණතා අනුව ශ්‍රී ලංකාව සහල්, පලතුරු සහ එළවලු වැනි ප්‍රධාන ආහාර භෝගවල ස්වයංපෝෂිතභාවය සඳහා ආසන්න මට්ටමේ කටයුතු කරමින් සිටින නමුත් සම්පූර්ණ ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සංකීර්ණ හා ක්‍රමානුකූල ක්‍රියාවලියකි. දේශීය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට, ඵලදායිතාව වැඩිදියුණු කිරීමට සහ ආනයන මත යැපීම ඉතා අවම කිරීමට උත්සාහයන් අඛණ්ඩව සිදු වෙමින් පවතී. භෝග වගාව සඳහා ඉඩම් සීමිත වීම, වැසි ජල කළමනාකරණ ගැටලු, කාලගුණ විපර්යාස, වගාවට අවශ්‍ය යෙදවුම් සපයා ගැනීමේ ගැටලු, වෙළෙඳ පොළ මිල විචලනයන් යනාදිය හේතුවෙන් එක් එක් භෝගයේ වගා ඉලක්කවල වෙනස්කම් සිදු වේ. එම නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අස්වනු පුරෝකථනය උපයෝගී කරගෙන අදාළ වර්ෂය තුළ කාලෝචිතව ක්ෂේත්‍ර භෝග ආනයනය පිළිබඳ තීරණ ගෙන විදේශ විනිමය සංරක්ෂණය කිරීමක් මේ වනවිට සිදු වෙමින් පවතී.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

පසුගිය වසර 10ක නිෂ්පාදන දත්ත අනුව, ශ්‍රී ලංකාව තුළ වගා කරන ක්ෂේත්‍ර භෝග අතරින් තල, රට කජු, රතු ලූනු, කව්පි සහ මුංඇට යන භෝගවල දේශීය නිෂ්පාදනය එහි වාර්ෂික අවශ්‍යතාවෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කරයි. මෙහිදී තල භෝගය ස්වයංපෝෂිත මට්ටමට ළඟා වී ඇති අතර තල අපනයනයක් ද සිදු වේ. ඊට අමතරව රට කජු, උඳු, රතු ලූනු, කව්පි සහ මුංඇට යන භෝගවලටද ස්වයංපෝෂිත මට්ටමට ළඟා වීමට අවශ්‍ය වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. නමුත් බඩ ඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු සහ සෝයා බෝංචි යන භෝගවල වාර්ෂික අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේදී දේශීය නිෂ්පාදනයට වඩා වැඩි ප්‍රමාණයක් ආනයන මඟින් සම්පූර්ණ කරයි. එසේම බඩ ඉරිඟු සහ උඳු අවශ්‍යතාව ද දේශීය වශයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සපුරා ගනු ලැබේ.

| භෝගය | වාර්ෂික නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)* | වාර්ෂික අවශ්‍යතාව (මෙට්‍රික් ටොන්)* | ස්වයංපෝෂිත අනුපාතය (%) |
|---|---|---|---|
| බඩ ඉරිඟු | 272,523 | 700,000 | 39 |
| අර්තාපල් | 67,462 | 225,000 | 30 |
| ලොකු ලූනු | 36,013 | 325,000 | 11 |
| රතු ලූනු | 55,767 | 80,000 | 70 |
| සෝයා බෝංචි | 5,769 | 13,000 | 44 |
| මුංඇට | 13,533 | 25,000 | 54 |
| කව්පි | 11,872 | 18,000 | 66 |
| උඳු | 9,807 | 25,000 | 39 |
| රට කජු | 29,129 | 40,000 | 73 |
| කුරක්කන් | 7,781 | 10,000 | 78 |
| තල | 10,466 | 7,000 | 150 |

(* 2016-2025 දක්වා වසර 10ක නිෂ්පාදනයේ සාමාන්‍ය අගය සලකා ඇත.)

(vi) දැනට තලවල අතිරික්ත නිෂ්පාදනය අපනයනය සිදු කරයි.

| වර්ෂය | අපනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2021 | 2,736 |
| 2022 | 7,488 |
| 2023 | 2,189 |
| 2024 | 173 |
| 2025 | 4,249 |

(vii) දැනට 2027-2040 කාල රාමුවට අදාළ ඉලක්කගත වෙළෙඳ පොළ සහ ප්‍රක්ෂේපිත කාල රාමු සකස් කර නොමැති බැවින් මෙම සභාවට ඉදිරිපත් කළ නොහැක.

(ආ) 2027-2040 කාල රාමුවට අදාළ ඉලක්කගත වෙළෙඳ පොළ සහ ප්‍රක්ෂේපිත කාල රාමු ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ.

(அ) (i) 2027 முதல் 2029 வரை நெல் மற்றும் உப உணவுப் பயிர்களுக்கான மூன்றாண்டுத் திட்டம் தயாரிக்கப்பட்டுள்ளது.

2040ஆம் ஆண்டு வரை எந்தத் திட்டமும் தயாரிக் கப்படவில்லை.

பாற்பொருட்களில் தன்னிறைவு அடையும் பொருட்டு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு, கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களம், மாகாண கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களங்கள், தேசிய கால்நடை அபிவிருத்திச் சபை ஆகியவை 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடு களில் ஒதுக்கப்பட்டுள்ள 2,000 மில்லியன் ரூபாய் நிதியின்கீழ் பின்வரும் நிகழ்ச்சித் திட்டங்களைச் செயற்படுத்தி வருகின்றன.

1. உள்ளூர் பால் உற்பத்தியை அதிகரிக்கும் நிகழ்ச்சித்திட்டம் (Dairy Hub) - 1,000 மில்லியன் ரூபாய் பாற்பண்ணை யாளர்களை மேம்படுத்தும் நோக்கில், இலங்கை 2030ஆம் ஆண்டுக்குள் பாலில் 75% தன்னிறைவு அடைவதை நோக்கிச் செயற்பட்டு வருகின்றது.
2. தேசிய கால்நடை அபிவிருத்திச் சபைக்குச் சொந்தமான பல பண்ணைகளிலுள்ள இனப்பெருக்க அலகுகளை மேம்படுத்து வதற்கான நிகழ்ச்சித்திட்டம் - 1,000 மில்லியன் ரூபாய்

(ii) உணவு இறக்குமதியைக் குறைப்பதற்காக ஓராண்டு முன்கணிப்புத் திட்டம் தயாரிக்கப் பட்டுள்ளது. 2025 முதல் 2029 வரை தயாரிக்கப்பட்ட நிறுவன விளைவு அடிப்படை யிலான கட்டமைப்பின்படி (Organizational Result based Framework), அதன் அடிப்படை ஆண்டு 2024 ஆகும்.

(iii) இதன்பொருட்டு, 2027 முதல் 2030 வரை பின்வரும் பணிகளை மேற்கொள்ளத் திட்டமிடப் பட்டுள்ளது:

1. நாட்டில் விவசாய இயந்திரமயமாக்கலை விரைவுபடுத்தும் பொருட்டு, தீவு முழுவதும் சுமார் 200 விவசாய இயந்திர நிலையங்களை (Agriculture Machinery Hubs) தாபிக்கத் திட்டமிடப்பட்டுள்ளது. இந்த நிலையங்கள், விவசாயிகளுக்குத் தரமான விவசாய இயந்திரங்களை வாடகை அடிப்படையில் வழங்கி, அவர்கள் சரியான நேரத்தில் தரமான சேவையைப் பெற வழிவகை செய்யும். இதற்காக சுமார் 200 கோடி ரூபாய் செலவிடப்படுமென எதிர்பார்க்கப்படுகின்றது.
2. விவசாய இயந்திரங்களை இயக்குவதற் கான திறன்களையுடைய சுமார் 2,000 இயக்குநர்களுக்குப் பயிற்சியளிக்க, ஏறத்தாழ 2 கோடி ரூபாய் செலவிடப் படுமென எதிர்பார்க்கப்படுகின்றது.
3. விவசாய இயந்திரங்களை முறையாக பராமரிப்பது மற்றும் அவை சீராக இயங்குவது குறித்த விழிப்புணர்வு பயிலரங்

குகளை நடத்துவதற்கு 20 மில்லியன் ரூபாய் செலவிடப்படுமென எதிர்பார்க்கப்படுகின்றது.

4. விவசாய இயந்திரங்களை கள ரீதியில் ஆராய்ச்சி செய்வதற்கும், விவசாய சமூகத் தினரிடையே புதிய இயந்திரங்களை ஊக்குவிப்பதற்கும் சுமார் 50 கோடி ரூபாய் செலவிடப்படுமென எதிர்பார்க்கப் படுகின்றது.

- மேலதிக உணவுப் பயிர்களுக்குப் பொருத்தமான இயந்திர தொகுப்பு களைப் பயன்படுத்தி கள செயல் விளக்கங்களை நடத்துவதற்கு (பாத்தி தயாரித்தல் குறித்த கள செயல்விளக்க நிகழ்ச்சித்திட்டங்கள், விதை இடுதல் குறித்த கள செயல்விளக்க நிகழ்ச்சித் திட்டங்கள், 'ட்ரோன்' தொழில்நுட்பப் பயன்பாடு குறித்த கள செயல்விளக்க நிகழ்ச்சித்திட்டங்கள், அறுவடைக்கான கள செயல்விளக்க நிகழ்ச்சித்திட்டங்கள்) சுமார் 10 கோடி ரூபாய் செலவிடப் படுமென எதிர்பார் க்கப் படுகின்றது.

(iv) ஒரு பயிரின் முறையான வளர்ச்சிக்கும் அதிக விளைச்சலுக்கும் பொருத்தமான நிலங்களைக் கண்டறிவதும், சுற்றாடல் நிலைமைகளை நன்கு நிருவகித்துப் பராமரிப்பதும் அவசியமாகும். அதன்படி, பொருத்தமான நிலங்களைக் கண்டறிய நிலத்தின் அமைவிடம், மண், நீர்மூலம் மற்றும் பிற சுற்றாடல் காரணிகள் கருத்திற்கொள்ளப்படுகின்றன. இலங்கையில் 12 முக்கிய பயிர்களுக்கும் 7 முக்கிய பழப்பயிர் களுக்கும் பொருத்தமான பகுதிகளை விவசாயத் திணைக்களம் கண்டறிந்து, அவற்றின் வரைபடங்களைத் தயாரித்துள்ளது. மேலும், பொருத்தமான பயிர்கள், விளைச்சல் காலங்கள், பிற தகவல்கள் என்பவற்றைக் கொண்ட ஓர் இணையத்தளம் (https://csrforgnd .doa.gov.lk/) கிராம அலுவலர் மட்டத்தில் உருவாக்கப்பட்டு பேணப்பட்டு வருகின்றது. இதன்மூலம் தகவல் தேவைப்படும் எவரும் அதனை அணுக முடியும்.

(v) தற்பொழுது சரியான ஆண்டைக் குறிப்பிட இயலாதுள்ளது.

விவசாயக் கொள்கை மாற்றங்கள், காலநிலை நிலவரங்கள், தொழில்நுட்ப முன்னேற்றங்கள், பொருளாதார அபிவிருத்திகள் என்பன உள்ளிட்ட பல்வேறு காரணிகளால் அந்நியச் செலாவணியைச் சேமிப்பதற்காக இலங்கை அதன் பிரதான உணவுப் பயிர்களின் இறக்கு மதியை எப்போது கணிசமாகக் குறைக்கும் என்பதைத் துல்லியமாகக் கணிப்பது சவாலான தாகும். நெல், பழங்கள், காய்கறி போன்ற பிரதான உணவுப் பயிர்களில் இலங்கை தன்னிறைவை நெருங்கிவிட்டதாக இடைக் காலப் போக்குகள் சுட்டிக்காட்டினாலும், முழுமையான தன்னிறைவை அடைவது ஒரு சிக்கலான மற்றும் படிப்படியான செயன்முறை யாகும். உள்ளூர் விவசாயத்தை ஊக்குவிக்கவும் உற்பத்தித் திறனை மேம்படுத்தவும் இறக்கு மதியில் சார்ந்திருப்பதைக் குறைந்தபட்ச அளவுக்குக் குறைக்கவும் முயற்சிகள் மேற் கொள்ளப்பட்டு வருகின்றன. பயிர் விளைச் சலுக்கு வரையறுக்கப்பட்ட நிலம், மழைநீர் முகாமைத்துவ சிக்கல்கள், வானிலை மாற்றங்கள், பயிர்ச்செய்கைக்கான உள்ளீடு களைப் பெறுவதிலுள்ள பிரச்சினைகள், சந்தை விலை ஏற்ற இறக்கங்கள் போன்றவை ஒவ்வொரு பயிரின் பயிச்செய்கை இலக்கு களிலும் மாற்றங்களுக்கு வழிவகுக்கின்றன. எனவே, விவசாயத் திணைக்களத்தின் அறுவடை முன்னறிவிப்பைப் பயன்படுத்தி, அந்நியச் செலாவணியைச் சேமிக்கும் வகையில், சம்பந்தப்பட்ட ஆண்டில் களப் பயிர்களை உரிய நேரத்தில் இறக்குமதி செய்வது குறித்த முடிவுகள் தற்போது எடுக்கப்பட்டு வருகின்றன.

கடந்த 10 ஆண்டுகளினது உற்பத்தித் தரவுகளின்படி, இலங்கையில் பயிரிடப்படும் களப் பயிர்களில் எள், நிலக்கடலை, சின்ன வெங்காயம், கௌபி, பயறு ஆகியவற்றின் உள்ளூர் உற்பத்தி, அதன் வருடாந்த தேவையில் 50%க்கும் அதிகமானதைப் பூர்த்திசெய்கின்றது. இங்கு எள் பயிர் தன்னிறைவு நிலையை எட்டியுள்ளதுடன், எள் ஏற்றுமதியும் செய்யப் படுகின்றது. மேலும், நிலக்கடலை, சோளம், சின்ன வெங்காயம், கௌபி, பயறு ஆகிய பயிர்களிலும் தன்னிறைவு நிலையை எட்டுவதற் கான பணிகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இருப்பினும், சோளம், உருளைக்கிழங்கு, பெரிய வெங்காயம், சோயாபீன்ஸ் ஆகிய பயிர்களின் வருடாந்தத் தேவை உள்ளூர் உற்பத்தியைவிட இறக்குமதிமூலமே பூர்த்தி செய்யப்படுகின்றது. இதேபோல், சோளம் மற்றும் உளுந்தின் தேவையும் தேசிய உற்பத்திமூலம் கணிசமான அளவு பூர்த்திசெய்யப்படுகின்றது.

| பயிர் | வருடாந்த உற்பத்தி (மெ. டொ.)* | வருடாந்த தேவை (மெ. டொ.)* | தன்னிறைவு சதவீதம் (%) |
|---|---|---|---|
| சோளம் | 272,523 | 700,000 | 39 |
| உருளைக் கிழங்கு | 67,462 | 225,000 | 30 |
| பெரிய வெங்காயம் | 36,013 | 325,000 | 11 |
| சின்ன வெங்காயம் | 55,767 | 80,000 | 70 |
| சோயா போஞ்சி | 5,769 | 13,000 | 44 |
| பயறு | 13,533 | 25,000 | 54 |
| கௌபி | 11,872 | 18,000 | 66 |
| உளுந்து | 9,807 | 25,000 | 39 |
| நிலக் கடலை | 29,129 | 40,000 | 73 |
| குரக்கன் | 7,781 | 10,000 | 78 |
| எள் | 10,466 | 7,000 | 150 |

( *2016-2025 வரையிலான 10 ஆண்டுகளுக்கான உற்பத்தியின் சராசரிப் பெறுமானம் கணக்கில் எடுத்துக்கொள்ளப்பட்டுள்ளது.)

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(vi) தற்போது, அதிகப்படியாக உற்பத்தி செய்யப் படும் எள் ஏற்றுமதி செய்யப்படுகின்றது.

| ஆண்டு | ஏற்றுமதி செய்த அளவு (மெ. டொ.) |
|---|---|
| 2021 | 2,736 |
| 2022 | 7,488 |
| 2023 | 2,189 |
| 2024 | 173 |
| 2025 | 4,249 |

(vii) 2027 - 2040 காலகட்டத்துக்கான இலக்குக் கொள்ளப்பட்ட சந்தையும் உத்தேசிக்கப்பட்ட காலக்கெடுவும் நிர்ணயிக்கப்பட்டு அறிக்கை தயாரிக்கப்படாததால், அவற்றை இந்தக் குழுவிடம் சமர்ப்பிக்க இயலாது.

(ஆ) 2027 - 2040 காலகட்டத்துக்கான இலக்குக் கொள்ளப் பட்ட சந்தையும் உத்தேச காலக்கெடுவும் எதிர் காலத்தில் நிர்ணயிக்கப்பட்டு அறிக்கை தயாரிக்கப் படுமென எதிர்பார்க்கப்படுகின்றது.

(a) (i) A three-year plan had been prepared for rice and additional food crops from 2027 to 2029.

A plan up to 2040 has not been prepared.

In order to achieve self-sufficiency in dairy products, the following programmes are currently being implemented with the provisions of Rs. 2,000 million allocated from the 2026 Budget Estimates by the Ministry of Agriculture, Livestock, Land and Irrigation, the Department of Animal Production and Health, the Provincial Departments of Animal Production and Health and the National Livestock Development Board:

1. Programme for Enhancing Local Dairy Production (Dairy Hub) - Rs. 1,000 million

   This programme is implemented with the aim of uplifting dairy farmers and making Sri Lanka 75 per cent self-sufficient in milk by the year 2030.

2. Programme for Improving Breeding Units at Several Farms Belonging to the National Livestock Development Board - Rs. 1,000 million

(ii) An annual forecast plan has been prepared to reduce food imports. According to the Organizational Result-based Framework developed from 2025 to 2029, its baseline year is 2024.

(iii) The following tasks are planned to be carried out from 2027 to 2030 for this purpose:

1. In order to accelerate agricultural mechanization in the country, plans are underway to establish approximately 200 Agricultural Machinery Hubs Island-wide, through which farmers can obtain quality services on a rental basis at the required time. It is expected to spend about Rs. 2,000 million for this purpose.
2. It is expected to spend approximately 20 million rupees to train about 2,000 skilled operators to operate agricultural machinery.
3. It is expected to spend Rs. 20 million to conduct awareness workshops on the proper maintenance and functioning of agricultural machinery.
4. Approximately 500 million rupees is expected to be spent on research in the field of agricultural mechanization and for promoting new machinery among farming community.
   - Approximately Rs. 100 million is expected to be spent for conducting field demonstrations using suitable machinery packages for additional food crops (field demonstration programmes on bed preparation, field demonstration programmes on seed application, field demonstration programmes on the use of drone technology and field demonstration programmes on harvesting).

(iv) In order to achieve proper crop growth and a high yield, it is essential to identify suitable lands and to properly manage and preserve environmental conditions. Accordingly, when identifying suitable lands, factors such as location of land, soil, water source and other environmental factors are taken into consideration. The Department of Agriculture has identified and mapped suitable areas for 12 major crops and seven major fruit crops in Sri Lanka. In addition, a website (https://csrforgnd.doa.gov.lk/) containing information on suitable crops, cultivation seasons and other details at the Grama Niladhari Division level has been developed and maintained so that anyone who requires information could access it.

(v) The specific year cannot be mentioned at this time. Predicting the specific year in which Sri Lanka will substantially eliminate the importation of major food crops in order to conserve foreign exchange is challenging due to various factors including changes in agricultural policies, climatic conditions, technological advancements and economic developments. Based on medium-term

trends, Sri Lanka is working towards near self-sufficiency in major food crops such as rice, fruits and vegetables. However, achieving complete self-sufficiency is a complex and gradual process. Continuous efforts are made to promote domestic agriculture, improve productivity and minimize dependence on imports. Variations in cultivation targets for each crop occur due to factors such as limited land availability for crop cultivation, rainwater management issues, climate change, difficulties in obtaining inputs required for cultivation and market price fluctuations. Therefore, at present, foreign exchange conservation is being carried out by making timely decisions regarding the importation of field crops within the relevant year, making use of the crop yield forecasts of the Department of Agriculture.

According to production data from the past 10 years, among the field crops cultivated in Sri Lanka, the domestic production of sesame, groundnuts, red onions, cowpea and green gram fulfils more than 50 per cent of their annual requirement. In this regard, the sesame crop has reached a self-sufficient level and sesame exports are also taking place. In addition, measures are being taken to achieve self-sufficiency levels for groundnuts, black gram, red onions, cowpea and green gram as well. However, in respect of crops such as maize, potatoes, big onions and soybeans, a greater proportion of the annual requirement is met through imports than through domestic production. Similarly, a considerable portion of the requirement for maize and black gram is also met domestically.

| Crop | Annual production (MT)* | Annual Requirement (MT)* | Self-sufficient Rate (%) |
|---|---|---|---|
| Maize | 272,523 | 700,000 | 39 |
| Potato | 67,462 | 225,000 | 30 |
| Big onion | 36,013 | 325,000 | 11 |
| Red onion | 55,767 | 80,000 | 70 |
| Soybean | 5,769 | 13,000 | 44 |
| Green gram | 13,533 | 25,000 | 54 |
| Cowpea | 11,872 | 18,000 | 66 |
| Black gram | 9,807 | 25,000 | 39 |
| Groundnut | 29,129 | 40,000 | 73 |
| Finger millet | 7,781 | 10,000 | 78 |
| Sesame | 10,466 | 7,000 | 150 |

**(*The average value of production for 10 years from 2016 to 2025 has been considered.)**

(vi) Currently, the surplus production of sesame is exported.

| Year | Quantity Exported (MT) |
|---|---|
| 2021 | 2736 |
| 2022 | 7488 |
| 2023 | 2189 |
| 2024 | 173 |
| 2025 | 4249 |

(vii) Since the target markets and projected timelines relating to the period 2027-2040 have not yet been prepared, they cannot be presented to this House at this time.

(b) The target markets and projected timelines relating to the period 2027-2040 are expected to be prepared in the future.

## ලියාපදිංචි නොකළ සංචාරක ආයතන:ගෙන ඇති ක්‍රියාමාර්ග

பதிவு செய்யப்படாத சுற்றுலா நிறுவனங்கள்: நடவடிக்கை

UNREGISTERED TOURISM ESTABLISHMENTS: ACTION TAKEN

1970/2026

**2.** **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ මේ වනවිට ලියාපදිංචි මුළු සංචාරක ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) නියාමන රාමුවෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන, ඇස්තමේන්තුගත ලියාපදිංචි නොකළ ක්‍රියාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) නීති විරෝධී හෝ නීතියට අනුකූල නොවන ක්‍රියාකරුවන්ට එරෙහිව පසුගිය වසර 02 තුළ ගත් ක්‍රියාමාර්ග කවරේද,

(iv) ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව සහ පනවන ලද දඬුවම් කවරේද;

(v) සංචාරක කර්මාන්තයේ නියුතු ආයතන විසින් ගෙවිය යුතු හිඟ වැට් බදු, සංචාරක සංවර්ධන බදු සහ අනෙකුත් හිඟ ව්‍යවස්ථාපිත මුදල් ඇතුළුව අයවිය යුතු මුළු හිඟ බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) පසුගිය වසර 04 තුළ ජාතික සංචාරක සංවර්ධන බද්ද මඟින් එකතු කරන ලද වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම ආදායම සංචාරකයන්ගේ පැමිණීම් වර්ධනයට සමානුපාතිකව ඉහළ ගොස් තිබේද;

(viii) මේ වනවිට ලියාපදිංචි ඇති බලපත්‍රලාභී සංචාරක මගපෙන්වන්නන් සංඛ්‍යාව සහ ඔවුන්ට එරෙහිව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ix) විනිවිදභාවය, අනුකූලතාවය සහ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා සංශෝධිත සංචාරක පනතක් හෝ නියාමන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රවී කරුණානායක මහතා]

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகார சபையின் கீழ் தற்போது பதிவுசெய்யப் பட்டுள்ள சுற்றுலா நிறுவனங்களின் மொத்த எண்ணிக்கை யினையும்;

(ii) ஒழுங்குறுத்தல் சட்டகத்திற்கு வெளியே செயற் படும் பதிவு செய்யப்படாத இயக்குநர்களின் மதிப்பிடப்பட்ட எண்ணிக்கையினையும்;

(iii) கடந்த 02 ஆண்டுகளில் சட்டவிரோத அல்லது விதிமுறைகளுக்கு இயைபுறாத இயக்குநர் களுக்கு எதிராக எடுக்கப்பட்ட நடவடிக்கை யினையும்;

(iv) மேற்கொள்ளப்பட்ட பரிசோதனைகளின் எண்ணிக்கையினையும், அவை தொடர்பாக விதிக்கப்பட்ட அபராதங்கள் எவ்வளவு என்பதையும்;

(v) சேர் பெறுமதி வரி நிலுவைகள், சுற்றுலா அபிவிருத்தி அறவீடு மற்றும் சுற்றுலா நிறுவனங்களால் செலுத்தப்பட வேண்டிய ஏனைய நியதிச்சட்டக் கட்டணங்கள் உட்பட மொத்த நிலுவையில் உள்ள வரிப் பொறுப்புகள் எவ்வளவு என்பதையும்;

(vi) கடந்த 04 ஆண்டுகள் ஒவ்வொன்றுக்காகவும் தேசிய சுற்றுலா அபிவிருத்தி அறவீட்டின் மூலம் சேகரிக்கப்பட்ட வருடாந்த வருவாய் எவ்வளவு என்பதை வெவ்வேறாகவும்;

(vii) சுற்றுலாப் பயணிகளின் வருகைக்கு விகிதா சாரமாக அத்தகைய வருவாய் அதிகரித்துள்ளதா என்பதையும்;

(viii) தற்போது பதிவுசெய்யப்பட்டுள்ள உரிமம் பெற்ற சுற்றுலா வழிகாட்டிகளின் எண்ணிக்கை யினையும் அவர்களுக்கு எதிராகப் பெறப் பட்டுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யினையும்;

(ix) வெளிப்படைத்தன்மை, இயைபுறல் மற்றும் முதலீட்டாளர் நம்பிக்கை என்பவற்றினை மேம்படுத்துவதற்காகத் திருத்தப்பட்ட சுற்றுலாச் சட்டம் அல்லது ஒழுங்குறுத்தல் மறுசீராக் கல்களை அறிமுகப்படுத்துவது தொடர்பாகப் பரிசீலிக்கப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the total number of tourism establishments currently registered under the Sri Lanka Tourism Development Authority;

(ii) the estimated number of unregistered operators functioning outside the regulatory framework;

(iii) the action taken during the last two years against illegal or non-compliant operators;

(iv) the number of inspections carried out and penalties imposed in that regard;

(v) the total outstanding tax liabilities, including VAT arrears, Tourism Development Levy and other statutory dues payable by tourism entities;

(vi) the annual revenue collected through the National Tourism Development Levy for each of the last four years, separately;

(vii) whether such revenue has increased in proportion to tourist arrivals;

(viii) the number of licensed tour guides currently registered and the number of complaints received against them; and

(ix) whether a revised Tourism Act or regulatory reforms are being considered to enhance transparency, compliance and investor confidence?

(b) If not, why?

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

(අ) (i) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ මේ වනවිට ලියාපදිංචි මුළු සංචාරක සේවා සපයන ආයතන සංඛ්‍යාව 8,322 (2026 මාර්තු මස දක්වා)

(ii) නියාමන රාමුවෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන සංචාරකයන් වෙත සේවා සපයන ආයතන සම්බන්ධව පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොමැත. Booking engines හරහා සංචාරකයින් වෙත අළෙවි කරනු ලබන සේවාවන් සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණ හා වාර්තාගත තොරතුරු අනුව ඇස්තමේන්තුගත ලියාපදිංචි නොවූ සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව දළ වශයෙන් 30,000කට ආසන්න සංඛ්‍යාවක් බව නිරීක්ෂණය වේ.

(iii) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මඟින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරින්ට සහ පොලිස් සංචාරක කොට්ඨාස වෙත නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් වන විමර්ශන බලතල, ප්‍රකාශ සටහන් කිරීම, දේපළ හෝ පුද්ගලයන් සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම, ස්ථානීය දඩ නියම කිරීම සඳහා වන ප්‍රතිපාදන ලබා දී නොමැත.

2025.09.29 දිනෙන් පසුව අධ්‍යක්ෂ නීති අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන නීතිය බලගැන්වීමේ ඒකකය මඟින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මෙතෙක් ලියාපදිංචිය ලබා නොමැති ආයතන 63ක් ස්ථානීය පරීක්ෂා සිදු කිරීමෙන් පසු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා නොගත් පුද්ගලයන්ට අදාළ නීතිමය දැනුම් දීම් (නිවේදන ලබා දීමෙන් පසු ආයතන 11 ලියාපදිංචිය සඳහා

ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අනෙකුත් ආයතන සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආයතනයේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ඉදිරියේදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නඩු පැවරීමට කටයුතු කරනු ඇත.)

සංචාරකයන් විසින් යොමු කරනු ලබන පැමිණිලි පොලිස් සංචාරක අංශය වෙත සෘජුවම යොමු කිරීමට පියවර ගනු ලැබේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ලියාපදිංචි ආයතනයක් හෝ පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන සාමාන්‍ය පැමිණිලි සුහදව/ වාචිකව විමසා බලා විසඳීමට පියවර ගනු ලබන අතර, එසේ විසඳා ගත නොහැකි ප්‍රශ්න අදාළ පොලීසිය වෙත යොමු කරන ලෙස දැනුවත් කරනු ලැබේ.

අපරාධ නීතිය යටතේ හෝ පොදු නීතිය යටතේ ගැනෙන පැමිණිලි සියල්ල සංචාරක පොලීසිය වෙත හෝ සංචාරක පොලීසිය මඟින් අදාළ පොලිස් ස්ථාන වෙත යොමු කිරීමට පියවර ගනු ලැබේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි ආයතනවල ප්‍රමිතිය හා තත්ත්වය සම්බන්ධයෙන් වන පැමිණිලි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණ අංශය වෙත යොමු කර අවශ්‍ය පියවර ගනු ලැබේ.

(iv) 2025.09.29 සිට මේ දක්වා ලියාපදිංචි නොවූ සංචාරක ආයතන සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණ 63ක් සිදු කර ඇත. "දිට්වා" සුළි කුණාටුවේ බලපෑම් හේතු කොට ගෙන සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින ආයතනවලට වූ අපහසුතා හේතු කොට ගෙන සැලකිය යුතු කාල සීමාවක් ස්ථානීය පරීක්ෂණ සිදු නොකළ අතර මේ වනවිට නැවතත් එම කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර සිදු කෙරෙමින් පවතී.

දඬුවම් මෙතෙක් පනවා නොමැති අතර ආයතන 34 සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. මේ වනවිට ඔවුන් සඳහා අවසන් නිවේදන නිකුත් කර ඇත. ඉදිරියේදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නඩු පැවරීමට කටයුතු කරනු ඇත.

(v) සංචාරක කර්මාන්තයේ නියුතු ආයතන විසින් ගෙවිය යුතු හිඟ වැට් බදු පිළිබඳව සංචාරක සංවර්ධන අධිකාරිය දැනුවත් නොමැති අතර, සංචාරක සංවර්ධන බදු මුදල්වල අයවිය යුතු හිඟ බදු මුදල් ප්‍රමාණ වේ නම් වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමේ දී අය කරනු ඇත.

(vi)

| වසර | 2025 | 2024 | 2023 | 2022 |
|---|---|---|---|---|
| වාර්ෂික ආදායම (රු.) | 2,583,658,841 | 2,582,085,320 | 1,473,821,116 | 1,440,010,646 |

(vii) 2022 සිට 2025 දක්වා සමස්තයෙන් බැලූ විට ආදායම වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්වයි. එය සංචාරක ආගමන සංඛ්‍යාව -tourist arrivals- වැඩිවීමත් සමඟ සෘජුව සම්බන්ධ වීම මෙන්ම වෙනත් සාධක බලපානු ඇත. 2023 සිට 2024 දක්වා ආදායම් වැඩිවීම, එම කාලය තුළ සංචාරකයන්ගේ පැමිණීම් හා සමානුපාතික වී තිබේ ද යන්න පිළිබඳ සොයා බැලීමට පැහැදිලි නිර්ණායක නොපවතී.

(viii) 2026.03.31 දක්වා ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී සංචාරක මඟ පෙන්වන්නන් සංඛ්‍යාව පහත පරිදි වේ.

1. ජාතික සංචාරක නියමු කථිකාචාර්ය මාර්ගෝපදේශකවරුන් - 2,037
2. රියැදුරු සංචාරක නියමු කථිකාචාර්ය මාර්ගෝපදේශකවරුන් - 1,721
3. ප්‍රාදේශීය සංචාරක නියමු කථිකාචාර්ය මාර්ගෝපදේශකවරුන් - 1,571
4. ස්ථානීය සංචාරක නියමු කථිකාචාර්ය මාර්ගෝපදේශකවරුන් - 106

මුළු සංචාරක නියමු කථිකාචාර්ය මාර්ගෝපදේශකවරුන් - 5,435

2025 ජනවාරි සිට 2026 මාර්තු 31 දක්වා බලපත්‍රලාභී සංචාරක මඟ පෙන්වන්නන් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි ප්‍රමාණය 15කි.

(ix) දැනට සංචාරක පනතේ ඇති හඳුනා ගත් අඩුපාඩු පිළිබඳව සමාලෝචනය කර විනිවිදභාවය, අනුකූලතාවය සහ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සංශෝධන සහිතව නව පනතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

(அ) (i.) 2026, மார்ச் நிலவரப்படி, இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகார சபையின்கீழ் மொத்தம் 8,322 சுற்றுலா சேவை வழங்குநர்கள் பதிவு செய்யப்பட்டுள்ளனர்.

(ii.) ஒழுங்குமுறைக் கட்டமைப்பிற்கு அப்பால் செயற்படும் சுற்றுலா சேவை வழங்குநர்கள் குறித்து விரிவானதொரு மதிப்பீடு நடத்தப் படவில்லை. இருப்பினும், முன்பதிவு இயந்திரங்கள்மூலம் சுற்றுலாப் பயணிகளுக்கு வழங்கப்படும் சேவைகள் தொடர்பான ஆய்வுகள் மற்றும் பதிவு செய்யப்பட்ட தரவுகளின் அடிப்படையில், பதிவு செய்யப் படாத சேவை வழங்குநர்களின் எண்ணிக்கை சுமார் 30,000 என மதிப்பிடப்பட்டுள்ளது.

(iii.) 2025-ஆம் ஆண்டின் 38ஆம் இலக்க சுற்றுலாச் சட்டத்தின்கீழ், இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின் மற்றும் சுற்றுலா பொலிஸ் பிரிவின் அதிகாரிகளுக்கு, விசாரணைகளை நடத்துதல், வாக்குமூலங்களைப் பதிவுசெய்தல், சொத்துக்கள் அல்லது நபர்களைச் சோதனை யிடுதல், கைதுகள் அல்லது தடுப்புக்காவலில் வைத்தல் அல்லது உடனடி அபராதங்களை விதித்தல் போன்ற சட்ட அமுலாக்கம் தொடர்பான அதிகாரங்கள் வழங்கப் படவில்லை.

2025.09.29க்குப் பிறகு, பணிப்பாளர் (சட்டம்) அவர்களின் மேற்பார்வையின்கீழ் செயற்படும் சட்ட அமுலாக்கப் பிரிவு, இலங்கை சுற்றுலா

[ගරු විජිත හේරත් මහතා]

அபிவிருத்தி அதிகாரசபையில் இன்னும் பதிவுசெய்யப்படாத 63 நிறுவனங்களில் கள ஆய்வுகளை நடத்தியது. இந்த ஆய்வுகளைத் தொடர்ந்து, பதிவுசெய்யப்படாத தரப்பினருக்குச் சட்ட அறிவிப்புகள் வழங்கப்பட்டன. இவற்றுள், 11 நிறுவனங்கள் அறிவிப்புகளைப் பெற்ற பின்னர் பதிவு பெறுவதற்கான நடவடிக்கைகளை எடுத்துள்ளன. மீதமுள்ள நிறுவனங்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை தொடங்குவதற்கு நிருவாக சபையிடம் இருந்து ஒப்புதல் பெறப்பட்டுள்ளது. அதன்படி சட்டமா அதிபர் திணைக்களத்தின் ஆலோசனையின் அடிப்படையில் எதிர்காலத்தில் சட்ட வழக்குகள் தொடர நடவடிக்கை எடுக்கப்படும்.

சுற்றுலாப் பயணிகளால் சமர்ப்பிக்கப்படும் புகார்கள், உரிய நடவடிக்கைக்காக சுற்றுலாப் பொலிஸ் பிரிவிற்கு அனுப்பப்படுகின்றன. பதிவுசெய்யப்பட்ட நிறுவனங்கள் அல்லது தனிநபர்கள் தொடர்பான புகார்கள், இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையால் தொடக்கத்தில் இணக்கமாகவோ அல்லது வாய்மொழி விசாரணை மூலமாகவோ கையாளப்படுகின்றன. அத்தகைய புகார்கள், தீர்க்க இயலாத பட்சத்தில், அவற்றை உரிய காவல்துறை அதிகாரிகளிடம் ஒப்படைக்குமாறு அறிவுறுத்தப்படுகிறது.

குற்றவியல் சட்டம் அல்லது பொதுச் சட்டத்தின்கீழ் வரும் அனைத்துப் புகார்களும் சுற்றுலா பொலிஸிற்கோ அல்லது சுற்றுலா பொலிஸ் மூலம் உரிய பொலிஸ் நிலையங்களுக்கோ அனுப்பப்படுகின்றன.

எங்கள் அதிகாரசபையின்கீழ் பதிவுசெய்யப்பட்ட நிறுவனங்களின் தர நிலைகள் மற்றும் தரம் தொடர்பான புகார்கள் உரிய நடவடிக்கைக்காக இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரச பையின் தர நிலைகள் மற்றும் தர உறுதிப் பாட்டுப் பிரிவிற்கு அனுப்பப்படுகின்றன.

(iv.) 2025.09.29 முதல் இன்றுவரை, பதிவுசெய்யப் படாத சுற்றுலா நிறுவனங்களில் 63 கள ஆய்வுகள் நடத்தப்பட்டுள்ளன. 'தித்வா' புயலின் தாக்கங்களால் சுற்றுலாத் துறை நடத்துபவர்கள் சந்தித்த சிரமங்களின் காரணமாக, கணிசமான காலத்திற்குக் கள ஆய்வுகள் மேற்கொள்ளப் படவில்லை. இருப்பினும், இந்த நடவடிக்கைகளை மீண்டும் தொடங்கித் தொடர் வதற்குத் தேவையான நடவடிக்கைகள் தற்போது எடுக்கப்பட்டு வருகின்றன.

இதுவரை எந்த அபராதமும் விதிக்கப் படவில்லை. மேலும், 34 நிறுவனங்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை தொடங்குவதற்குச் சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின் நிருவாகக் குழுவிடமிருந்து ஒப்புதல் பெறப் பட்டுள்ளது. அவர்களுக்கு இறுதி அறிவிப்புகள் ஏற்கெனவே வழங்கப்பட்டுள்ளன. சட்டமா அதிபர் திணைக்களத்தின் ஆலோசனையின் அடிப்படையில் எதிர்காலத்தில் சட்ட நடவடிக்கைகள் தொடங்கப்படும்.

(v.) சுற்றுலாத்துறையில் ஈடுபட்டுள்ள நிறுவனங் களால் செலுத்தப்பட வேண்டிய நிலுவை யிலுள்ள பெறுமதி சேர்வரி (VAT) தொடர்பிலான தகவல் எதுவும் இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபை அறிந்திருக்கவில்லை. இருப்பினும், செலுத்த வேண்டிய நிலுவையில் உள்ள சுற்றுலா அபிவிருத்தி வரி ஏதேனும் இருப்பின், அவை வருடாந்த உரிமம் வழங்கப்படும் நேரத்தில் வசூலிக்கப்படும்.

(vi.)

| வருடம் | 2025 | 2024 | 2023 | 2022 |
|---|---|---|---|---|
| வருடாந்த வருமானம் (ரூ) | 2,583,658,841 | 2,582,085,320 | 1,473,821,116 | 1,440,010,646 |

(vii.) 2022 முதல் 2025 வரையிலான மொத்தக் காலகட்டத்தில் பார்க்கும்போது, வருவாயானது அதிகரிக்கும் போக்கைக் காட்டுகிறது. இது சுற்றுலாப் பயணிகளின் வருகை அதிகரிப்புடன் நேரடியாகத் தொடர்புடையதாக இருந்த தெனலாம். இருப்பினும் ஏனைய காரணிகளும் தாக்கத்தை ஏற்படுத்தியிருக்கலாம். ஆயினும், 2023 முதல் 2024 வரையிலான காலகட்டத்தில் ஏற்பட்ட வருவாய் அதிகரிப்பு, அந்தக் காலகட்டத்தில் வந்த சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கைக்கு விகிதாசாரமாக இருந்ததா என்பதைத் தீர்மானிக்கத் தெளிவான அளவுகோல்கள் எதுவும் இல்லை.

(viii.) 2026.03.31 நிலவரப்படி பதிவுசெய்யப்பட்டுள்ள உரிமம் பெற்ற சுற்றுலா வழிகாட்டிகளின் எண்ணிக்கை பின்வருமாறு:

1. தேசிய சுற்றுலா வழிகாட்டி விரிவுரை யாளர்கள் - 2,037
2. வாகன ஓட்டுநராகவும் செயற்படும் சுற்றுலா வழிகாட்டி விரிவுரையாளர்கள் - 1,721
3. பிராந்திய சுற்றுலா வழிகாட்டி விரிவுரை யாளர்கள் - 1,571
4. களச் சுற்றுலா வழிகாட்டி விரிவுரை யாளர்கள் - 106

மொத்தம் - 5,435

2025 ஜனவரி முதல் 2026 மார்ச் 31 வரை உரிமம் பெற்ற சுற்றுலா வழிகாட்டிகள் தொடர்பாகப் பெறப்பட்ட புகார்களின் எண்ணிக்கை 15 ஆகும்.

(ix.) வெளிப்படைத்தன்மை, விதிமுறைகளுக்கு இணங்குதல் மற்றும் முதலீட்டாளர் நம்பிக்கையை மேம்படுத்தும் நோக்கில் தற்போதுள்ள சுற்றுலாச் சட்டத்தில் கண்டறியப் பட்ட குறைபாடுகளை ஆய்வு செய்ததைத் தொடர்ந்து, தேவையான திருத்தங்களுடன் ஒரு புதிய சட்டம் தற்போது உருவாக்கப்பட்டு வருகிறது.

(ஆ) பொருந்தாது.

(a) (i) As at March, 2026, a total of 8,322 tourism service providers have been registered under the Sri Lanka Tourism Development Authority.

(ii) A comprehensive assessment has not been conducted on tourism service providers operating outside the regulatory framework. However, based on surveys and recorded data relating to services marketed to tourists through booking engines, it is estimated that the number of unregistered service providers is approximately 30,000.

(iii) Under the Tourism Act, No. 38 of 2005, officers of the Sri Lanka Tourism Development Authority and the Tourist Police Division are not vested with powers related to law enforcement such as conducting investigations, recording statements, searching property or persons, making arrests or detentions or imposing on -the-spot fines.

After 29.09.2025, the Law Enforcement Unit operating under the supervision of the Director (Legal) conducted on-site inspections of 63 institutions which had not yet been registered with the Sri Lanka Tourism Development Authority. Following those inspections, legal notices were issued to the unregistered parties. Out of those, 11 institutions have taken steps to obtain registration after receiving the notices. Approval had been obtained from the Management Board to initiate legal action against the remaining institutions. Accordingly, steps will be taken to file legal cases in the future based on the advice of the Attorney-General's Department.

Complaints submitted by tourists are directed to the Tourist Police Division for necessary action.

Complaints relating to registered institutions or individuals are initially addressed amicably or through verbal inquiry by Sri Lanka Tourism Development Authority. Where such matters cannot be resolved, it is advised to refer them to the relevant police authorities.

All complaints that fall under criminal law or the general law are referred to the Tourist Police or, through the Tourist Police, to the relevant police stations.

Complaints regarding the standards and quality of institutions registered under our Authority are referred to the Standards and Quality Assurance Division of the Sri Lanka Tourism Development Authority for appropriate action.

(iv) Since 29.09.2025 to date, 63 on-site inspections have been conducted on unregistered tourism establishments. Due to the difficulties faced by tourism sector operators as a result of the impacts of Cyclone "Ditwah", on-site inspections were not carried out for a considerable period. However, necessary steps are now being taken to resume and continue those activities.

No penalties have been imposed so far, and approval has been obtained from the Board of Management of the Sri Lanka Tourism Development Authority to initiate legal action against 34 institutions. Final notices have already been issued to them. Legal proceedings will be instituted in the future based on the advice of the Attorney-General's Department.

(v) The Sri Lanka Tourism Development Authority is not aware of any outstanding VAT payable by institutions engaged in the tourism industry. However, if there are any outstanding Tourism Development Llevy payments due, they will be recovered at the time of issuing the annual licence.

(vi)

| Year | 2025 | 2024 | 2023 | 2022 |
|---|---|---|---|---|
| Annual Income (Rs.) | 2,583,658,841 | 2,582,085,320 | 1,473,821,116 | 1,440,010,646 |

(vii) When considering the overall from 2022 to 2025, revenue shows an increasing trend. This is likely to be directly associated with the increase in tourist arrivals, although other factors may also have had an impact.

However, there are no clear criteria available to determine whether the increase in revenue from 2023 to 2024 was proportionate to the number of tourist arrivals during that period.

(viii) The number of licensed tourist guides currently registered as at 31.03.2026 is as follows:

1. National Tourist Guide Lecturers - 2,037
2. Chauffeur Tourist Guide Lecturers - 1,721
3. Regional Tourist Guide Lecturers - 1,571
4. Site Tourist Guide Lecturers - 106

Total - 5,435

The number of complaints received regarding licensed tourist guides from January, 2025 to 31st March, 2026 is 15.

(ix) A new Act is currently being formulated with necessary amendments, following a review of the identified shortcomings in the existing Tourism Act in order to enhance transparency, compliance and investor confidence.

(b) Not Applicable.

## පොල් කර්මාන්තය: විස්තර
### தெங்குக் கைத்தொழில்: விபரம்
### COCONUT INDUSTRY: DETAILS

1971/2026

**3.** ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොල් කර්මාන්තය, කර්මාන්තයක් ලෙස නිල වශයෙන් පිළිගත් වර්ෂය සහ මේ දක්වා සන්ධිස්ථාන සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කවරේද;

(ii) පසුගිය වසර 50 තුළ උපරිම නිෂ්පාදනයක් වාර්තා වූ වර්ෂ නිෂ්පාදනය සමඟ සහ පසුගිය වර්ෂයේ නිෂ්පාදනය කොපමණද;

(iii) පොල් වගා කළ උපරිම ඉඩම් ප්‍රමාණය සහ එය වාර්තා වූ වර්ෂය කවරේද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය/පළාත අනුව වර්තමානයේ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය සහ කිසියම් අඩුවීමක් සිදුවී ඇත්නම් එයට හේතු කවරේද;

(v) වර්තමානයේ ජාතික සාමාන්‍ය අස්වැන්න, දිස්ත්‍රික්කය අනුව ලැබෙන අස්වැන්න, අඩුම සහ වැඩිම අස්වැන්න ලැබෙන දිස්ත්‍රික්ක 5 සහ ඇස්තමේන්තුගත අස්වැන්න අතර පරතරය කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ හා පොල් වගා කරන වෙනත් ප්‍රධාන රටවල් 6ක අස්වැන්න පිළිබඳ සංසන්දනාත්මක දත්ත සහ ඒ අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම කවරේද;

(vii) ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවන් ඇතුළුව පොල් වගාව ආශ්‍රිතව දේශීය වශයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේද කවරේද;

(viii) පසුගිය වසර 5 තුළ අපනයන ආදායම සමඟ ප්‍රධාන අපනයන වෙළෙඳ පොළ කවරේද;

(ix) ඍජු සහ වක්‍ර රැකියාවල නිරත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(x) පසුගිය වසර 10 තුළ පර්යේෂණ, නවීකරණ සහ ව්‍යාප්තිය සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தெங்குக் கைத்தொழிலானது, ஒரு கைத் தொழிலாக உத்தியோகபூர்வமாக அங்கீகரிக்கப் பட்ட ஆண்டு எது என்பதையும் இற்றைவரை அதன் பிரதான அடைவு மற்றும் கொள்கைத் தலையீடுகள் யாவை என்பதையும்;

(ii) கடந்த 50 வருடங்களில் அதிகூடிய உற்பத்தி காணப்பட்ட ஆண்டுகள் எவை என்பதையும் மிக அண்மைய வருட உற்பத்தி யாதென்பதையும்;

(iii) தெங்குப் பயிர்ச்செய்கையின் கீழ்உள்ள அதிகூடிய நிலப்பரப்பு என்ன என்பதையும் அது பதிவுசெய்யப்பட்ட ஆண்டு எது என்பதையும்;

(iv) தற்போது பயிர்ச்செய்யப்படும் நிலப்பரப்பின் விஸ்தீரணத்தை மாவட்ட/மாகாண ரீதியாகப் பிரித்து எவ்வளவு எனவும் இதில் ஏதேனும் வீழ்ச்சி ஏற்பட்டிருப்பின் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) ஏக்கர்/ஹெக்டயர் ஒன்றுக்கான தற்போதைய தேசிய சராசரி விளைச்சல், மாவட்ட ரீதியான விளைச்சல்கள், முதல் மற்றும் கடைசி விளைச்சல் பெறும் 5 மாவட்டங்கள் மற்றும் மதிப்பிடப்பட்ட விளைச்சல் இடைவெளி யாவை என்பதையும்;

(vi) இலங்கைக்கும் தெங்கு உற்பத்திசெய்யும் ஏனைய 6 முக்கிய நாடுகளுக்கும் இடையிலான ஒப்பீட்டு விளைச்சல் தரவினையும் அதன்படி இலங்கையின் தரவரிசை எது என்பதையும்;

(vii) அமுலாக்கல் காலச்சட்டகம் உள்ளடங்கலாக, உள்நாட்டில் ஏற்று நடைமுறைப்படுத்தப் படவுள்ள நடைமுறைகள் யாவை என்பதையும்;

(viii) பிரதான ஏற்றுமதிச் சந்தைகளுடன் சேர்த்து, கடந்த 5 ஆண்டுகளில் ஈட்டப்பட்ட ஏற்றுமதி வருமானம் யாதென்பதையும்;

(ix) நேரடியாகவும் மறைமுகமாகவும் தொழிலுக்கு அமர்த்தப்பட்டவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(x) கடந்த 10 ஆண்டுகளில் ஆராய்ச்சி, நவீனமய மாக்கல் மற்றும் விரிவாக்கம் என்பவற்றுக்கான கருத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the -

(i) year the coconut industry was established/ recognized and key milestones and policy interventions to date;

(ii) years of peak production in the last 50 years with output and the most recent year's production;

(iii) maximum land under coconut cultivation and the year recorded;

(iv) current extent of cultivation, disaggregated by district/province, and reasons for any decline;

(v) current national average yield per acre/ hectare, district-wise yields, top five and bottom five districts, and the estimated yield gap;

(vi) comparative yield-data between Sri Lanka and six major coconut-producing countries and Sri Lanka's ranking;

(vii) practices to be adopted locally, including implementation timelines;

(viii) export earnings in the last five years together with the major export markets;

(ix) number of persons employed directly and indirectly; and

(x) programmes for research, modernization and expansion over the last 10 years?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

(අ) (i) 1935 අංක 13 දරන පොල් නිෂ්පාදන ආඥා පනත මඟින් පොල් කර්මාන්තය කර්මාන්තයක් වශයෙන් පිළිගෙන ඇති බවත්, ඉන් අනතුරුව පොල් කර්මාන්තයේ සන්ධිස්ථාන ලෙස 1967 අංක 17 දරන පොල් කොහු පනත හා වර්තමානයේ ක්‍රියාත්මක 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත හැඳින්විය හැකි බව පොල් සංවර්ධන අධිකාරිය විසින් සඳහන් කර ඇත.

(ii) පසුගිය වසර 50 තුළ වැඩිම පොල් අස්වැන්නක් වාර්තා වූයේ 2022 වසරේදීය. (ගෙඩි මිලියන 3,351). 2025 වසරේ අස්වැන්න ගෙඩි මිලියන 2,806ක් වන අතර, එය 2022 වසරට සාපේක්ෂව ගෙඩි මිලියන 545ක අඩුවීමකි. මෙම අඩුවීම සඳහා බලපා ඇති හේතු වන්නේ,

1) කාලගුණික විපර්යාස (නිදසුන්: දීර්ඝ නියං කාල)

2) පොහොර යෙදීම ප්‍රමාණවත් නොවීම

3) වන සත්ව උවදුරු

4) පළිබෝධ හානි

(iii) 2012 වර්ෂයේදී පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් පොල් පැළ මිලියන 9.73ක් වගා කර ඇත. ඒ අනුව වගා කර ඇති ඇස්තමේන්තුගත අක්කර ගණන 152,031කි.

(iv) 2014 කෘෂි සංගණනය සහ 2014 සිට 2025 දක්වා පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ලබා දුන් පැළ සංඛ්‍යාව පදනම් කරගෙන ඇස්තමේන්තු කරන ලද පොල් අක්කර ගණන පහතින් දැක්වේ.

| දිස්ත්‍රික්කය | අක්කර ගණන |
|---|---|
| කොළඹ | 22,886 |
| ගම්පහ | 133,701 |
| කළුතර | 24,280 |
| මහනුවර | 13,015 |
| මාතලේ | 36,296 |
| නුවරඑළිය | 2,342 |
| ගාල්ල | 21,150 |
| මාතර | 18,605 |
| හම්බන්තොට | 51,124 |
| යාපනය | 15,092 |
| කිලිනොච්චි | 8,500 |
| මන්නාරම | 3,875 |
| වවුනියාව | 8,282 |
| මුලතිව් | 8,914 |
| මඩකලපුව | 13,204 |
| අම්පාර | 12,885 |
| ත්‍රිකුණාමලය | 10,795 |
| කුරුණෑගල | 432,996 |
| පුත්තලම | 195,293 |
| අනුරාධපුරය | 33,872 |
| පොළොන්නරුව | 10,814 |
| බදුල්ල | 8,897 |
| මොනරාගල | 32,181 |
| රත්නපුර | 47,273 |
| කෑගල්ල | 35,847 |
| **එකතුව** | **1,202,119** |

(v) පසුගිය වසර පහ තුළ ජාතික පොල් නිෂ්පාදනය පහත වගුව මඟින් දැක්වේ.

| වර්ෂය | ජාතික පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
|---|---|
| 2021 | 3,382.90 |
| 2022 | 3,351.80 |
| 2023 | 2,944.00 |
| 2024 | 2,745.00 |
| 2025 | 2,806.00 |

2025 වසරේදී දිස්ත්‍රික්ක අනුව ලැබුණු පොල් අස්වැන්න පහත වගුව මඟින් දැක්වේ. ඒ අනුව වැඩිම අස්වැන්න ලැබෙන දිස්ත්‍රික්ක පහ වන්නේ පිළිවෙළින් කුරුණෑගල, පුත්තලම, ගම්පහ, රත්නපුර සහ අනුරාධපුරයයි. අඩුම අස්වැන්න ලැබෙන දිස්ත්‍රික්ක වන්නේ පිළිවෙළින් මන්නාරම, නුවරඑළිය, වවුනියාව, කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්ක වේ.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

| දිස්ත්‍රික්කය | වසරකට ගසකින් ලැබෙන සාමාන්‍ය අස්වැන්න (ගෙඩි ගණන) | මුළු අස්වැන්න (ගෙඩි මිලියන) |
|---|---|---|
| පුත්තලම | 49 | 514 |
| කුරුණෑගල | 43 | 991 |
| ගම්පහ | 39 | 283 |
| කොළඹ | 41 | 47 |
| කළුතර | 41 | 50 |
| ගාල්ල | 50 | 52 |
| මාතර | 42 | 42 |
| හම්බන්තොට | 34 | 89 |
| අම්පාර | 64 | 36 |
| මඩකලපුව | 47 | 29 |
| ත්‍රිකුණාමලය | 56 | 27 |
| කෑගල්ල | 37 | 69 |
| රත්නපුරය | 55 | 136 |
| අනුරාධපුරය | 61 | 104 |
| පොළොන්නරුව | 63 | 33 |
| මොනරාගල | 50 | 82 |
| බදුල්ල | 50 | 21 |
| මහනුවර | 51 | 34 |
| මාතලේ | 41 | 80 |
| නුවරඑළිය | 51 | 5 |
| යාපනය | 46 | 27 |
| කිලිනොච්චිය | 47 | 18 |
| වවුනියාව | 44 | 16 |
| මුලතිව් | 45 | 18 |
| මන්නාරම | 25 | 4 |

පසුගිය වසර පහ තුළ මුළු අස්වැන්න හා ඇස්තමේන්තුගත අස්වැන්න අතර පරතරය පහත වගුවෙන් දක්වා ඇත.

| වර්ෂය | ඇස්තමේන්තු ගත අස්වැන්න (ගෙඩි මිලියන) | තත්‍ය අස්වැන්න (ගෙඩි මිලියන) | පරතරය | ඇස්තමේන්තු ගත අස්වැන්නට සාපේක්ෂව තත්‍ය අස්වැන්න අඩුවීම (↓) / වැඩිවීම (↑) |
|---|---|---|---|---|
| 2021 | 3,353.1 ± 29 | 3,382.9 | -29.80 | 1% ↑ |
| 2022 | 3,219 ± 29 | 3,351.8 | -132.8 | 4% ↑ |
| 2023 | 2,957 ± 40 | 2,944 | 13.00 | 0.4% ↓ |
| 2024 | 2,683 ± 34 | 2,754 | -71.00 | 3% ↑ |
| 2025 | 2,838 ± 35 | 2,806 | 32.00 | 1% ↑ |

(vi) අන්තර්ජාතික පොල් ප්‍රජාව මඟින් ප්‍රකාශිත දත්ත අනුව පොල් නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවල්වල 2019-2023 කාලය තුළ වාර්ෂික පොල් නිෂ්පාදනයන්හි මධ්‍ය අගයන් පහත දැක්වේ.

| රට | පස් අවුරුදු මධ්‍ය අගය (ගෙඩි මිලියන) |
|---|---|
| ඉන්දියාව | 20,456 |
| ඉන්දුනීසියාව | 14,526 |
| පිලිපීනය | 14,760 |
| ශ්‍රී ලංකාව | 3,111 |
| බ්‍රසීලය | 2,511 |
| පැපුවා නිව්ගිනියාව | 1,483 |
| වියට්නාමය | 1,363 |
| මෙක්සිකෝව | 908 |
| තායිලන්තය | 647 |
| මැලේසියාව | 576 |

*(2026.04.22 දින ලබා ගත් අන්තර්ජාතික පොල් ප්‍රජාව මඟින් නිකුත් කර ඇති දත්ත අනුව සකස් කරන ලදී.)*

මේ අනුව ශ්‍රී ලංකාව පොල් නිෂ්පාදනය අතින් සිව්වන ස්ථානයේ පවතී.

(vii) ***පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත පොල් වගාව සඳහා වියළි කාලයේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග***

<u>පොල් පැළ සඳහා</u>

- පැළ වගාව සඳහා ජලය සම්පාදනය කිරීම.
- තවාන්වල ඇති බීජ පැළ සඳහා සෙවණ සැපයීම.
- කාන්දු ජල සම්පාදනය - පැළ දෙපස ජලය පුරවා ඇති කළ දෙකක් වළලා දින කිහිපයකට වරක් භාජන නැවත ජලයෙන් පිරවීම. ශාකයේ සිට බඳුනේ ප්‍රතිවිරුද්ධ පැත්ත තීන්ත ආලේප කර ඇති අතර, පින්තාරු නොකළ පැත්ත පැළයට ජලය සපයයි.
- අලුතින් රෝපණය කරන ලද පොල් පැළවල අතු එකට කර බැඳීම.
- රතු කුරුමිණි හානිය පිළිබඳ අවධානය යොමු කිරීම.
- කැඩුණු පොල් අතු ඉවත් කිරීම.
- පොල් පැළ සහ ඵල දරන පොල් ගස් යන දෙවර්ගයෙහිම පොහොර කව වටා වසුන් යෙදීම.
- දහවල් සහ රාත්‍රී උෂ්ණත්ව වේගය වැඩි නිසා පොල් පැළවල ගොබ කුණුවීම පිළිබඳව අවධානය යොමු කිරීම සහ මූලික අවස්ථාවේම ඒ සඳහා ප්‍රතිකාර කිරීම.

<u>වැඩුණු වගාව සඳහා</u>

- පොල් අතු, පොල් ලෙලි, ඉවත් කරන ලද වල් පැළෑටි, පිදුරු හෝ ඕනෑම ශාක ද්‍රව්‍යයක් භාවිතයෙන් පොහොර කවය ආවරණය වන පරිදි වසුන් යෙදීම.

- ලෙලි සහ කොහුබත් වළවල් වැනි තෙතමන සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම.
- කාබනික ද්‍රව්‍ය යෙදීම.
- වියළ තත්ත්වය නිසා පොල් කොළ දළඹු හානිය සහ සුදු මැස්සාගේ හානිය ඉහළ යා හැකි බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කර මූලික අවස්ථාවේම අවශ්‍ය නිර්දේශ සඳහා යොමු වීම.

***පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත පරිදි වියළි කාලයේදී පොල් වගාව සඳහා පහත සඳහන් ක්‍රියාවන් නොකළ යුතුය.***

- ජල සී සෑම සහ ලෙලි වළවල් කැපීම වැනි කසම්පාදන පහසුකම් නොමැති නම් පොල් පැළ ක්ෂේත්‍රයේ සිටුවීම.
- රසායනික පොහොර යෙදීම.
- පස නිරාවරණය වන ක්‍රියාකාරකම් වන හැරෝ කිරීම, ටයුතු.
- වල් පැළ පාලනය, අතුරු භෝග වගාව සහ සතුන් උළා කෑම අවම කිරීම.

***පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත පොල් වගාව සඳහා වැසි සහිත කාලයේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග***

- පොහොර යෙදීම සහ ක්ෂේත්‍රයේ අලුතින් පොල් පැළ සිටුවීම.
- සමෝච්ච කාණු සහ ජලය බැස යන කානු සකස් කිරීම හෝ අලුත්වැඩියා සිදු කිරීම; ජලය බැස යන කානු කැපීමේදී අඩු බෑවුමක් සහිතව සහ බාධක සහිතව සකස් කිරීමෙන් පසට ජලය උරා ගැනීම වැඩිදියුණු කළ හැකිය.
- පොල් අතු, පොල් ලෙලි, කැපූ තණකොළ හෝ වෙනත් ඕනෑම ශාකමය ද්‍රව්‍ය යොදා පොල් ගස් වටා වසුන් කිරීම.
- පොල් ලෙලි වළවල් යෙදීම වැනි තෙතමන සංරක්ෂණ ක්‍රම භාවිත කිරීම.
- කාබනික ද්‍රව්‍ය එකතු කිරීම.
- වැසි ජලය එක්රැස් කිරීම; වැසි කාලයේදී පතස්වල ජලය එක්රැස් කිරීම මඟින් එම ජලය වියළි කාලයේදී භාවිත කළ හැක.

(viii) පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම (2021-2025)

| වර්ෂය | අපනයන ආදායම | |
|---|---|---|
| | රු.මිලියන | ඇ.ඩො.මි. |
| 2021 | 166,034.02 | 834.12 |
| 2022 | 262,933.94 | 816.99 |
| 2023 | 228,720.07 | 700.47 |
| 2024 | 257,921.14 | 854.93 |
| 2025 | 368,036.24 | 1,222.19 |

අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල්

| NO. | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| 1 | ඇමෙරිකා එක්සත් ජනපදය | ඇමෙරිකා එක්සත් ජනපදය | ඇමෙරිකා එක්සත් ජනපදය | ඇමෙරිකා එක්සත් ජනපදය | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 2 | ජර්මනිය | නෙදර්ලන්තය | ජර්මනිය | ජර්මනිය | ජර්මනිය |
| 3 | නෙදර්ලන්තය | චීනය | නෙදර්ලන්තය | නෙදර්ලන්තය | නෙදර්ලන්තය |
| 4 | චීනය | ජර්මනිය | චීනය | චීනය | චීනය |
| 5 | එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය |
| 6 | කැනඩාව | ඉන්දියාව | ඉන්දියාව | ඉන්දියාව | ඉන්දියාව |
| 7 | ජපානය | කැනඩාව | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | කැනඩාව | කැනඩාව |
| 8 | ඕස්ට්‍රේලියාව | ජපානය | කැනඩාව | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| 9 | ඉන්දියාව | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | මෙක්සි කෝව | ප්‍රංශය | ප්‍රංශය |
| 10 | මෙක්සිකෝව | ඕස්ට්‍රේලියාව | ඕස්ට්‍රේලියාව | මෙක්සිකෝව | ඕස්ට්‍රේලියාව |

මුළු අපනයන ආදායම සඳහා ප්‍රධාන රටවලින් ලද දායකත්වය (%)(2021-2025)

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ප්‍රතිශතය (%) | 64 | 64 | 63 | 63 | 65 |

(ix) පොල් වගා කිරීමේ මණ්ඩලයේ දත්ත අනුව ඇස්තමේන්තුගත රැකියා ගණන ලක්ෂ හතකට වැඩිවේ. (පොල් කර්මාන්ත හා වගා ක්ෂේත්‍රයන්ට අදාළව)

(x) ❖ පොල් වගා කිරීමේ මණ්ඩලය

පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් පසුගිය වසර 10 තුළදී පොල් වගාව ආශ්‍රිතව පහත පරිදි ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- කණ්ඩායම් ව්‍යාපෘති වැඩසටහන් පැවැත්වීම - වැඩසටහන් 16,400
- ඒක පුද්ගල හමුවීම් - හමුවීම්554,174
- බහුවිධ ප්‍රවේශ - වැඩසටහන් 20 වැඩසටහන්

  බහුවිධ ප්‍රවේශ ව්‍යාපෘති වැඩසටහන යටතේ වඩාත් පුළුල් ව්‍යාපෘති සේවාවක් වගාකරුට ලබා දීමේ අරමුණින් වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම, පොල් ඉඩම්වල පවතින ගැටලු හඳුනා ගැනීම ආදිය සිදු කරන ලදී.
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය

  පොල් වගාවට අදාළ තාක්ෂණික උපදෙස් (පොල් පැළ වර්ග, පැළ සිටුවීම හා නඩත්තුව, අතුරු වගාව හා

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

සත්ව පාලනය, සුහුරු කෘෂිකර්මාන්තය ආදී), ආයතන ව්‍යුහය හා ආයතනික තොරතුරු ද ඇතුළත් කර සකස් කර ඇති මෙම පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය (coconutsrilanka.lk) හරහා වගාකරුවන්ට අවශ්‍ය තොරුතුරු භාගත කිරීමේ හැකියාව පවතින අතර අදාළ ව්‍යාප්ති නිලධාරීන් ඍජුවම සම්බන්ධ කර ගැනීමේ හැකියාවද සපයා දී ඇත.

- "Coco App" ජංගම මෘදුකාංගය සකස් කර ජනතාව අතර ප්‍රචලිත කිරීම.

  පොල් වගාවට අදාළ සියලුම තාක්ෂණික උපදෙස් ඇතුළත් කර සකස් කරන ලද මෙම ජංගම මෘදුකාංගය හරහා වගාකරුවන්ට අවශ්‍ය දැනුම ඕනෑම වේලාවක ලබා ගැනීමට හැකියාවක් පවතින අතර යාවත්කාලීන තොරතුරු සැපයීමත් ක්ෂේත්‍රයේ පවතින ගැටලු මෘදුකාංගය හරහා ව්‍යාප්ති නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමටත් පහසුකම් සලසා දී ඇත. මෙම යෙදුම Android සහ iPhone යන මෘදුකාංග දෙකෙන්ම භාගත කර ගත හැක.

- 1916 ක්ෂණික තොරතුරු සේවාව

  දීප ව්‍යාප්තව විසිරී සිටින පොල් වගාකරුවන්ගේ පහසුව සඳහා 1916 ක්ෂණික දුරකථන ඇමතුම් ත්‍රෛභාෂිකව ලබා දීමට කටයුතු යොදා ඇත. මෙමඟින් පොල් වගාකරුවන්ගේ තාක්ෂණික ගැටලු සඳහා උපදේශන සේවාවක් සැපයීම මෙන්ම පොල් වගා කිරීමේ මණ්ඩලයේ සේවාවන් පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබා දීමට පහසුකම් සපයා ඇත.

- 1920 ක්ෂණික දුරකථන සේවාව

  1920 කෙටි දුරකථන අංකය හරහා පොල් වගාවට අදාළ ගැටලු සඳහා උපදෙස් ලබා ගැනීමේ හැකියාව පවතී. ක්ෂේත්‍රයේ අත්දැකීම්ලත් තාක්ෂණික නිලධාරීන් විසින් අදාළ තොරතුරු සැපයීම සිදු කරනු ලබයි.

- පොල් දෙසතිය ව්‍යාප්ති වැඩසටහන - වැඩසටහන් 204 (2025)

  පොල් වගාව සංවර්ධනය කිරීම වගාකරුවාට වඩාත් සමීපව ග්‍රාමීය මට්ටමින් සිදු කිරීම මූලික පරමාර්ථය කර ගනිමින් දීප ව්‍යාප්ත ජංගම වැඩසටහනක් ලෙස මෙම "පොල් දෙසතිය" වැඩසටහන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ලෙස ක්‍රියාත්මක කර ඇත. පොල් වගාව සහ පොල් වගාකරුවා මුහුණ දෙන ප්‍රධාන අභියෝග සහ ගැටලුවලට ක්ෂේත්‍ර මට්ටමේ ජංගම වැඩසටහන් මඟින් විසඳුම් ලබා දීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වේ.

- ගොවි නායක ඒකක පිහිටුවීම - ඒකක 198 (2025)

  මෙම වැඩසටහන යටතේ වගාකරුවන්ට අවශ්‍ය යෙදවුම් පහසුවෙන් ලබා ගැනීමට හා ශ්‍රමික බලකා සාමාජිකයන්ගේ සහාය අවශ්‍ය වූ විට ඒ සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම යන සේවාවන් සැපයීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ලෙස දීප ව්‍යාප්තව ගොවි නායක ඒකක පිහිටුවීමට සැලසුම් කර ඇත. මෙහිදී පොල් වගාවේ සිදු කරනු ලබන සියලු කළමනාකරණ කටයුතු ඇතුළත් ආදර්ශන සකස් කිරීම තුළින් වගාකරුවන්ට අවශ්‍ය දැනුම ලබා දීම සිදු වේ.

  පොල් වගා කිරීමේ මණ්ඩලය එම කාල වකවානුව තුළදී පොල් වැවිලිකරුවන් වෙත පහත සඳහන් සහනාධාර ලබා දී ඇත.

- ක්‍රමවත් වගාව යටතේ පොල් පැළ සිටුවීම සඳහා සහනාධාර ලබාදීම.
- පාළු පැළ සිටුවීම සඳහා සහනාධාර ලබාදීම.
- ගෙවතු වගාවට අවශ්‍ය පොල් පැළ ලබාදීම සඳහා වූ සහනාධාරය.
- පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා සහනාධාර ලබාදීම.
- ජල නළ සහනාධාරය.
- අතුරු වගා සහනාධාරය.
- ක්‍රමවත් වගාව යටතේ සිටුවන ලද පොල් පැළ නඩත්තු කිරීමේ සහනාධාරය.
- වන සතුන්ගෙන් පොල් වගාව ආරක්ෂා කිරීමේ සහනාධාරය.

❖ පොල් සංවර්ධන අධිකාරිය

